ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)
Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 MAY 2018 Issue : 102 මාසික සංග්‍රහය 2018 මැයි, 102 කලාපය 50 ¢

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

The Diamond Realty Inc.
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com




## කළු සුදු සිනමාව වර්ණවත් කළ පුරාවතක නික්ම යෑම....

# මහා සිනමාවේදියාණනි, සුභ ගමන්... !

සේයාරුව - දයාන් විතාරණ

# නිවාස වෙළඳපොළ වත්මන් තත්ත්වය !

පසුගිය වසර සහ මේ වසරේ ගෙවී ගිය මාස කිහිපය සැසඳීමේදී GTA කලාපයෙහි නගරවල දේපල මිල ගණන් සැලකිය යුතු අන්දමට පහත ගොස් මේ වන විට යම් ස්ථාවර මට්ටමකට පැමිණ ඇති බව ටොරොන්ටෝ දේපළ වෙළඳාම් මණ්ඩලය (TREB) පවසයි.

පසුගිය වසරේදී දේපළ මිල ගණන් අධිකව ඉහළ ගොස් තිබුණද නිවාස අලෙවියෙහි අඩුවක් දක්නට නොලැබුණු නමුත් වර්තමානයේදී ටොරොන්ටෝ සහ තදාසන්න නගරවල නිවාස අලෙවිය ඉතාමත් පහළ මට්ටමකට පැමිණ ඇති බව දත්ත වාර්තාවල දැක්වේ. නිවාස වෙළඳපොළ තුළ පවතින මෙම අසාමාන්‍ය තත්ත්වය පසුගිය මාසයේ සිට තව තවත් වර්ධනය වී ඇති අතර 2009 වසරින් පසු වෙළඳපොළ තුළ පවතින අවම අලෙවි මට්ටම බවට එය මේ වන විට පත්ව තිබේ. (2008 වසරෙහි අවසාන භාගයේදී කැනඩාව දරුණු ආර්ථික අවපාතයකට (recession) මුහුණ දී තිබුණි)

TREB විසින් නිකුත් කර ඇති නවතම වාර්තාවට අනුව මෙම වසරේ අප්‍රේල් මාසයේදී GTA කලාපය තුළ දේපළ වෙළඳපොළ ගනුදෙනු 7,792 ක් සිදුකොට ඇති අතර පසුගිය වසරේ අප්‍රේල් මාසයේදී දේපළ වෙළඳපොළ ගනුදෙනු 11,468 ක් සිදුකොට ඇත. ඒ අනුව වසර දෙකෙහි ඉහත සමාන කාලසීමාවේ සිදුවී ඇති ගනුදෙනු සසඳා බැලීමේදී මෙම වසරෙහි දේපළ අලෙවිය සියයට 32.1 කින් පහත වැටී ඇති බව TREB වාර්තාව සනාථ කරයි. එම සංඛ්‍යාලේඛන තොරතුරු මේ වසරේ අප්‍රේල් සහ මාර්තු සමග සසඳා බැලීමේදී අප්‍රේල් මාසයේ දේපළ අලෙවිය මාර්තු මාසයට වඩා සියයට 1.6 කින් පහත වැටී ඇති බව සඳහන් වේ.

ඒ සමගම පසුගිය වසර හා සංසන්දය කිරීමේදී නිවාස මිල ගණන්හි සාමාන්‍ය අගයද සියයට 12.4 කින් පහත වැටී ඇති අතර එය මේ වසරේ මාර්තු මාසයට වඩා සියයට 0.2 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. මෙම වාර්තාවට අනුව නිවාස මිල සාමාන්‍ය අගය ඩොලර් 804,584 ක් ලෙස දක්වා ඇත.

8 වන පිටුව බලන්න

බ්‍රින්දාවන් සුපර්මාර්කට්
BRINTHAVAN SUPERMARKET


SRI LANKAN FRESH FRUIT, VEGETABLE AND GROCERIES
An excellent news to our beloved customers! We are excited to announce that your favourite
BRINTHAVAN SUPERMARKET ! NOW OPEN AT NEW LOCATION
New establishment with a brand new look and brand new facilities
13 Fisherman Dr, Unit 11 & 12, Brampton, ON L7A 2X9 TEL : 905 495 3755


VESAK 2018
BUDDHA'S
BIRTHDAY
CELEBRATION
"Blessings on the City,
the Nation, and the World."
The Largest
Annual Canadian
Buddhist Festival
MAY 27
SUNDAY
MISSISSAUGA
CELEBRATION SQUARE
300 City Centre Drive, Mississauga
Ontario L5B 3C1
Parade: 2:00pm
Program: 3:00pm
For more information visit www.vesakcelebration.com
Co-organized by
正覺寺
Halton Peel Buddhist Cultural Society
West End Buddhist Temple
And Meditation Centre
Fo Guang Shan
Temple of Toronto
加拿大佛教会湛山精舍

# 2017 නිෂ්පාදිතය ඉහළ ගිය වසරක්

කැනඩාවේ සංඛ්‍යා ලේඛන (StatsCan) දත්ත වාර්තාවලට අනුව 2017 වසරේදී මෙරට දළ දේශීය නිෂ්පාදිතය සියයට 3.3 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. ඒ පිළිබඳව අදහස් දක්වන ආර්ථික විශ්ලේෂකයන් පවසන්නේ මෙය පසුගිය වසර 6 තුළ වාර්තා වූ ශක්තිමත්ම වර්ධන වේගය බවයි.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය මගින් රටෙහි සෑම පළාතක්ම යහපත් ආර්ථික ප්‍රතිඵල ලැබූ නමුත් යුකොන් පළාත තුළ මේ තත්ත්වයෙහි වර්ධනයක් දක්නට නොලැබුණි. ඇල්බර්ටා, බ්‍රිටිෂ් කොලොම්බියා සහ ප්‍රින්ස් එඩ්වඩ් දිවයින හොඳම දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතයක් පෙන්වූ පළාත් තුන වූ අතර නිව් බ්‍රවුන්ස්වික්, නෝවා ස්කෝෂියා, නිව්ෆන්ඩ්ලන්ඩ් සහ ලැබ්රඩෝර් දුර්වල වර්ධන අනුපාතයක් පෙන්වූ පළාත් වේ.

රටෙහි සෙසු පළාත් හා සැසඳීමේදී පසුගිය වසරේදී ඇල්බර්ටා පළාතේ ආර්ථිකය සියයට 4.9 ක ඉහළ මට්ටමකින් වර්ධනය වී තිබේ. භාණ්ඩ හා සේවා යන අංශ දෙකම මෙහිදී පුළුල් ලෙස දියුණු වී ඇත. ලෝක තෙල් මිල ඉහළ යාමත් සමග පළාතේ සීඝ්‍ර දියුණුවක් දක්නට ඇති බවත් රටේ බලශක්ති ක්ෂේත්‍රයේ ඵලදායිතාව වැඩිකිරීමට ඇල්බර්ටා දැක්වූ දායකත්වය ගැනත් StatsCan විශේෂයෙන්ම පවසා තිබුණි.

බ්‍රිටිෂ්කොලොම්බියාහි දළ දේශීය නිෂ්පාදිතය පසුගිය වසරේදී 3.9 කින් ඉහළ ගොස් ඇති අතර සේවා සපයන කර්මාන්ත, දේපළ වෙළඳාම් සහ කුලී/ලීසිං කර්මාන්ත, ප්‍රවාහන සේවාවන්, භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත මෙම පළාතේ ආර්ථික වර්ධනයට වැඩි දායකත්වයක් ලබා දී ඇත.

ප්‍රින්ස් එඩ්වඩ් දිවයිනෙහි දළ දේශීය නිෂ්පාදිතය පසුගිය වසරේ සියයට 3.2 ක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර අත්ලාන්තික් සාගර කලාපයේ වසර 4 ක් තුළ ඉහළම භාණ්ඩ නිෂ්පාදන වේගය එයින් පෙන්වා ඇත. මෙම පළාතේ කර්මාන්ත කාණ්ඩ 20 ක් අතරින් 18 ක්ම පුළුල් වර්ධන වේගයක් පසුගිය වසරේ පෙන්නුම් කර ඇත.

කැනඩාවේ විශාලතම පළාත වන ඔන්ටාරියෝවේ 2017 වසරේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 2.8 ක් ලෙස ඉහළ ගොස් ඇත. 2016 වසරේදී මෙය සියයට 2.6 ක් ලෙස පැවතුණි. ඔන්ටාරියෝවේ ආර්ථික වර්ධනයේ වැඩි කොටසක් ආවරණය වූයේ සේවා අංශය තුළිනි. සේවා අංශය විසින් පළාතේ ආර්ථිකයට සියයට 80 ක දායකත්වයක් සපයා තිබුණි.

කැනඩාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය මගින් රටෙහි කර්මාන්ත හා ආර්ථිකය කොතරම් හොඳින් සිදුවනවාද යන්න පෙන්නුම් කරන බව StatsCan පවසා සිටී. මේ ආකාරයට පළාත් හා දේශීය ආර්ථිකයේ විචල්‍යයන් අධීක්ෂණය කිරීමෙන් කැනඩා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය හා පළාත් ආණ්ඩු යන ආයතනවල මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය තීරණ ගත හැකි වේ.

# කැනඩාවට අධිවේගී දුම්රියක් !

කැනඩාවේ දුම්රිය පද්ධතියෙහි නව පිටුවක් පෙරළමින් ප්‍රථම වරට අධිවේගී දුම්රිය මාර්ගයක් ඔන්ටාරියෝ පළාතෙහි ඉදිකිරීමට පළාත් රජය කටයුතු කරමින් සිටී. මෙම දුම්රිය මග ටොරොන්ටෝව සහ වින්ඩ්සර් නගර යා කෙරෙමින් ඉදි කෙරෙන අතර ඊට ඩොලර් බිලියන 11 ක් වැයවෙනු ඇතැයි පැවසේ.

අධිවේගී දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා හොඳම කාලය මීට වසර 30 කට පෙර බවත් එය මගහැරුණු නිසා දෙවන හොඳම කාලය දැන් එළඹ ඇති බවත් මෙම දුම්රිය මග පිළිබඳ අදහස් දක්වමින් කැත්ලීන් වේන් මහඇමතිනිය පවසා ඇත. මෙම දුම්රිය මග ඉදිකර අවසන් වූ පසු නිරිතදිග ඔන්ටේරියෝව හරහා ගනුදෙනු කරන ජනතාවටත් ව්‍යාපාර කටයුතුවලටත් විශාල වාසි අත්කර ගත හැකි බවද ඇය පවසයි.

මෙම අලුත් විදුලි දුම්රිය පැයකට කිලෝ මීටර 250 ක වේගයෙන් දැනට පවත්නා ධාවන පථත් අලුතින් ඉදිවන ටොරොන්ටෝ-වින්ඩ්සර් ධාවන පථයත් භාවිත කරමින් ගමන් ගැනීමට නියමිතව ඇත. ජනතාව මහ මගට වැය කරන ගමන් කාලය අඩුකර එය රටෙහි කාර්යක්ෂමතාව වැඩිකිරීමට යොදාගැනීම මෙහි ප්‍රධානතම අපේක්ෂාව වේ. ටොරොන්ටෝ යූනියන් දුම්රිය ස්ථානය සහ ලන්ඩන් දුම්රිය ස්ථානය අතර ගමන සඳහා විනාඩි 73 ක් ගතවන බව මේ වන විට ඇස්තමේන්තුගත කොට ඇත.

මෙහි පළමු අදියරේදී ලන්ඩන්, කිචනර්, ග්වැල්ෆ් හා ටොරොන්ටෝ යූනියන් දුම්රිය නැවතුම්පොළ අතර මාර්ගය ඉදිවන අතර මෙම දුම්රිය සේවය පියර්සන් ගුවන්තොටුපොළද සම්බන්ධ වන ලෙස ක්‍රියාත්මක කෙරේ. දෙවන අදියරේදී එය වින්ඩ්සර් සහ චැතම් දක්වා දිව යාමට නියමිත වේ.

ටොරොන්ටෝ සහ ලන්ඩන් අතර අධිවේගී දුම්රිය මගෙහි පළමු අදියර 2025 වසර වන විට සම්පූර්ණ කිරීමට නියමිත අතර 2031 වසර වන විට මෙම නව අධිවේගී මාර්ගය වින්ඩ්සර් දක්වා ගෙන ගොස් නිමාව දැකීමට නියමිත වේ.

# Microplastics පිරුණු වතුර බෝතල්

නූතන ලෝකයේ සිදුවන පරිසර විනාශය නිසා අප ජීවත් වන පරිසරයෙහි සෑම තැනම මයික්‍රොප්ලාස්ටික් පවතින බව මේ වන විට විද්‍යාත්මක පරීක්ෂණ මගින් සනාථ කොට ඇත. දැන හෝ නොදැන සිදුවන අත්තනෝමතික පරිසර හානියේ ප්‍රතිවිපාකයක් ලෙස ශේෂ වන මේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් මගින් මිනිසා ඇතුළු සත්ව සංහතියටම සිදුවන්නේ විශාල හානියකි.

මෙම තත්ත්වයට සමස්ත ලෝකයම එක ලෙස ගොදුරු වී ඇති අතර කැනඩාවෙහි අලෙවියට ඇති පානීය ජල බෝතල් තුළද මෙම ක්ෂුද්‍ර ප්ලාස්ටික් අන්තර්ගතව ඇති බව පසුගියදා පැවැත්වූ වෙළඳපොළ පරීක්ෂණයකින් හෙළිදරව් වී ඇත.

මැක්ගිල් විශ්වවිද්‍යාලය (McGill University) මගින් සිදුකෙරුණු මෙම පරීක්ෂණය සඳහා Aquafina, Dasani, Eska, Naya and Nestle Pure Life යන වෙළඳ නාම සහිත ජල බෝතල් නියැදි යොදාගෙන තිබුණි. මෙම සියලුම ජල බෝතල් සමාගම් තම නිපැයුම් පිළිබඳ පාරිශුද්ධත්වය ප්‍රවර්ධන කටයුතු තුළින් වෙළඳපොළ ඉදිරියේ කුමන ආකාරයකට ඉදිරිපත් කළද ඒ පරීක්ෂා කරන ලද සියලුම ජල නියැදි තුළ මයික්‍රොප්ලාස්ටික් හමුවූ බව පර්යේෂකයින් පෙන්වා දී ඇත. ඉහත ඇතැම් වෙළඳ නාම සහිත ජල බෝතල් තම ජල නිෂ්පාදන ප්ලාස්ටික් බෝතල්වල මෙන්ම වීදුරු බෝතල්වලින්ද වෙළඳපොළට එක් කරයි. කරන ලද පරීක්ෂණවලදී එම වීදුරු බෝතල්වල ඇති ජලයෙහිද යම් තරමකට (ප්ලාස්ටික් බෝතලයේ තරම්ම නැතත්) මයික්‍රොප්ලාස්ටික් අන්තර්ගතව තිබූ බව හෙළි වී ඇත. ජලයට මයික්‍රොප්ලාස්ටික් එක්වීම සඳහා ඇසුරුමට භාවිත කරන ප්ලාස්ටික් භාජනය පමණක්ම හේතුවක් නොවන බව මෙයින් පැහැදිලි වන බව පර්යේෂකයෝ පවසති.

මෙම පර්යේෂණය සඳහා තම නිෂ්පාදන නියැදි වශයෙන් ලබා ගැනීම පිළිබඳවත් ඒවායේ මයික්‍රොප්ලාස්ටික් ඇති බව තහවුරු කරමින් වාර්තා නිකුත් කිරීම සම්බන්ධවත් අදාළ නිෂ්පාදන සමාගම් මාධ්‍ය වෙත විවිධ අදහස් දක්වා තිබුණි. එහිදී නෙස්ලේ සමාගම පවසා තිබුණේ පරිසර පද්ධතියේ ඇති ක්ෂුද්‍ර ප්ලාස්ටික් පැවැත්ම වර්තමාන සමාජය මුහුණ පා ඇති ප්‍රධාන අභියෝගයක් බවත් එය වළක්වා ගනිමින් කටයුතු කිරීම දැඩි අභියෝගයක් වුවත් ඒ සඳහා හැකි උපරිම පියවර ගන්නා බවත්ය. පෙප්සි සමාගමට අයත් Aquafina පවසා තිබුණේ, තවදුරටත් විද්‍යාත්මක විශ්ලේෂණයන් අවශ්‍ය බවත් මෙම පර්යේෂණය සමාලෝචනය කළ පර්යේෂකයන් හා පාර්ශ්වකරුවන් අතර විශාල සහයෝගිතාවක් ඇතිකර ගත යුතු බවත්ය. කොකාකෝලා සමාගමට අයත් Dasani පවසා තිබුණේ පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව අතිශයින්ම වැදගත් ලෙස සලකන නිසා මෙම කරුණ ඉතා බරපතල අන්දමට සැලකිල්ලට ලක් කරන බවයි.

මෙම වෙළඳ නාම යටතේ ඇති ජල බෝතල් කැනඩාවෙහි අලෙවි කිරීමෙන් පසුගිය වසරේදී පමණක් ලැබී ඇති ආදායම ඩොලර් බිලියන 1 කට වැඩි බව යුරෝමොනිටර් නම් ජාත්‍යන්තර ආයතනය පවසයි.

# Opioids ඖෂධ වට්ටෝරුවලට අන්තරායකර ස්ටිකර

Opioids වර්ගයේ ඖෂධ අධිමාත්‍රාවලින් ගැනීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව දිනෙන් දින වැඩි වීම කැනඩාවේ උග්‍ර සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇති බව අප කවුරුත් දන්නා දෙයකි. Opioids වර්ග මත්ද්‍රව්‍ය වශයෙන් මෙන්ම ප්‍රබල වේදනා නාශක වශයෙන්ද ගැනෙන අතර මෙහිදී මෙම ඖෂධ අධිමාත්‍රාවලින් ගැනීම සිතා මතා මෙන්ම නොදැනුවත්කම නිසා සිදුවන අවස්ථා දක්නට ලැබෙන බව සෞඛ්‍ය අංශ පවසති.

ජනතාව මෙම භයානක උවදුරෙන් මුදා ගැනීම සඳහා හෙල්ත් කැනඩා දැඩි පරිශ්‍රමයක් දරණ අතර ඒ වෙනුවෙන් විශේෂිත ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහිද අවධානය යොමු කොට ඇත. ඒ අනුව 2018 ඔක්තෝබර් සිට ක්‍රියාත්මක වන පරිදි කැනඩාව පුරා පිහිටි ඖෂධ හා වෛද්‍ය සායන ඇතුළු සියලුම සෞඛ්‍ය මධ්‍යස්ථානවලින් නිකුත් කෙරෙන ඔපියොයිඩ් වර්ගයේ ඖෂධවලට අන්තරායකාර බව ඇඟවෙන ස්ටිකරයක් ගැසීම සහ අත් පත්‍රිකාවක් ලබාදීම අනිවාර්යය කොට ඇත. දීප්තිමත් කහ පැහැති පසුබිමක කළු අකුරින් ලියවුණු මෙම ස්ටිකරයෙහි "can cause dependence, addiction and overdose." යනුවෙන් සඳහන් කර ඇත. ඔපියොයිඩ් භාවිත කරන සෑම අයෙකුටම ලබාදෙන අනතුරු ඇඟවීමේ අත් පත්‍රිකාවෙන් එම විශේෂිත ඖෂධයට අදාළ අන්තරායන් සහ අවදානම් පිළිබඳව දැනුවත් කරයි.

කැනඩාවේ ෆෙඩරල් රජයක් විසින් ඖෂධයක් පිළිබඳව අනතුරු ඇඟවීමේ ස්ටිකරයක් සහ අත්පත්‍රිකාවක් නිකුත් කිරීම අනිවාර්ය කෙරුණු පළමු අවස්ථාව මෙය බව සඳහන් වේ.

# ඔබේ දුරකථනයටත් Alert සංඥා

කැනඩාවේ භාවිත කෙරෙන මිලියන සංඛ්‍යාත ජංගම දුරකථන, ටැබ්ලට් සහ වෙනත් ජංගම පණිවිඩ හුවමාරු උපාංග සඳහා හදිසි අනතුරු ඇඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු යොදා ඇත. ඒ අනුව මෙම හදිසි අනතුරු ඇඟවීම් සංඥා සඳහා වන මුල්ම පරීක්ෂාව ඔන්ටාරියෝ හා ක්විබෙක්හි පළාත් මූලික කොට පවත්වන අතර ඒ ආසන්නතම දිනක රටෙහි සෙසු පළාත්වලද මෙම පරීක්ෂාව සිදුකරන බව විකාශන හා විදුලි සංදේශ නියාමන ආයතනය පවසා සිටියි.

මෙම පරීක්ෂණ සංඥා, Long Term Evolution (LTE) නෙට්වර්ක් හා සම්බන්ධිත සියලුම ජංගම දුරකතන හා උපාංග වෙත යැවෙන අතර එම සංඥා රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ඔස්සේද විකාශනය කෙරේ.

# මරිජුවානා නීතිගත කිරීම අනිවාර්යයි

## අගමැති පවසයි

එළඹෙන ගිම්හානයේදී මරිජුවානා නීතිගත කිරීම සඳහා තමා සහ ලිබරල් රජය ගත් පියවර කෙතරම් ගැටලු මතු වුවත් පසුපසට නොගන්නා බවත් එය අනිවාර්යයෙන්ම ගිම්හානයේදී සිදු කරන බවත් අගමැති ජස්ටින් ට්‍රෑඩෝ පවසයි.

මරිජුවානා නීතිගත කිරීම තවත් වසරකින් කල් දමන ලෙස සෙනෙට් සභිකයන්, ස්වදේශීය නායකයන් (Indigenous leaders) හා වෙනත් පාර්ශ්වයන් රැසකින් ලැබෙන ඇමතුම්වලට පිළිතුරක් ලෙස අගමැතිවරයා මේ අදහස් පළ කොට ඇත.

මරිජුවානා අලෙවිය සඳහා නීතිමය තත්ත්වයක් ලබාදීම තම රජය දුන් පූර්ව මැතිවරණ පොරොන්දුවක් බවත් දැන් එය ඉටුකිරීමට කටයුතු කිරීම ගැන කිසිවෙකුත් මවිත විය යුතු නැති බවත් අගමැතිවරයා මෙම අදහස් දැක්වීමේදී පවසා තිබුණි.

"නිසැකවම, මා බොහෝ වාර ගණනක් පවසා ඇති පරිදි මෙය සිදුවීමක් නොවේ. ක්‍රියාවලියක්. නගර, පළාත් සහ ස්වදේශීය නායකත්වය මේ සඳහා හවුල්කරුවන් වී අපි එක්ව කටයුතු කරමු. මෙම කටයුත්ත වගකිව යුතු ආකාරයකින් ඉදිරියට ගෙන යාම තහවුරු කර ගමු" යැයි අගමැතිවරයා වැඩිදුරටත් පවසා තිබුණි.

වර්තමානයේ කැනඩාව තුළ මරිජුවානා භාවිතය නීතියට පටහැනි වුවත් එය භාවිතයෙහි අඩුවක් දක්නට නොමැත. සෑම දිනකම නීතිවිරෝධී මරිජුවානා සම්බන්ධ සිදුවීම් හා අපරාධ අසන්නට ලැබේ. එවැනි තත්ත්වයක් තුළ මරිජුවානා නීතිගත කිරීම තුළින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් සිදුකරන නීතිවිරෝධී අලෙවියත් සාපරාධී සංවිධාන විසින් සිදුකරන අපරාධත් අවම කොට කැනේඩියානුවන්ට සිදුවන හානිය අඩුකර ගත හැකි බව රජයේ අදහසයි.


SRC
SCARBOROUGH
REHABILITATION CLINIC
2950 Eglinton Avenue E., Suite 04
Scarborough, ON. M1J 2E7
• PHYSIOTHERAPY
• CHIROPRACTIC
• LASER THERAPY
• MASSAGE THERAPY
• ACUPUNCTURE
• PHYSICAL THERAPY
• PSYCHOTHERAPY
• REFLEXOLOGY
• CHRONIC PAIN MANAGEMENT
• OCCUPATIONAL THERAPY
- CUSTOM ORTHOTICS
- ORTHOPEDIC SHOES
- ORTHOPEDIC MATTRESS
- COMPRESSION STOCKINGS
- TENS MACHINE
- ASSISTIVE DEVICES
WE SPECIALIZE IN
SPORTS AND WORK INJURIES
• EXTENDED HEALTH CARE
• WSIB
• MOTOR VEHICLE ACCIDENT
• SLIP AND FALL
• ODSP
• ACCEPT ALL TYPES OF WORK BENEFITS
ඔබට අවශ්‍ය උපදෙස් සිංහල භාෂාවෙන් ලබාගත හැක.
Tel: 416-335-1424 | Fax: 416-335-4542
Email: scarrehab@bellnet.ca
Please contact Rosemarie Jude for more information 416-569-7523

# ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපතිවරයා විසින් මුදල් අමාත්‍යවරයා වෙත පසුගියදා පිරිනමනු ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 68 වැනි වාර්ෂික වාර්තාව වන මෙයින් පිළිබිඹු වන්නේ 2017 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ සාරාංශයයි.

පසුගිය වසර කිහිපය තුළ වාර්තා කළ අඩුම මූර්ත වර්ධන වේගය සටහන් කරමින් 2017 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්ධන වේගය මන්දගාමීත්වයක් පෙන්නුම් කර ඇති බව මෙම වාර්තාවෙන් පැහැදිලි වේ.

මෙහි ආර්ථිකය හා රටෙහි වෙනත් තත්ත්වයන් පිළිබඳ කරුණු ගණනාවක් ඇතුළත් අතර එහි ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය වේගය පිළිබඳවද සඳහන් වේ. ඒ අනුව පසුගිය වසර දෙකක කාලය තුළ ලංකාවේ ජනගහන වර්ධන වේගය වෙනස් වී නොමැති බව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව සඳහන් කරයි. එම වාර්තාවේ මූලික සමාජ දර්ශකයට අනුව පසුගිය වසරේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 21.4 ක් ලෙස සඳහන් කරනු ලැබ ඇත. මෙම වාර්තාවට අනුව 2016 වසරේ පැවති වාර්ෂික ජනගහන වර්ධන වේගය වන සියයට 1.1 ක අගය 2017 වර්ෂයේදීද නොවෙනස්ව පැවතී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව ඇස්තමේන්තු කරන ලද ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් මිලියන 10.4 ක් එනම් සියයට 48.4 ක් පුරුෂයන් වන අතර මිලියන 11.1 ක් එනම් සියයට 51.6 ක් ස්ත්‍රීහු වෙති. 2017 වසරේ වයස අවුරුදු 15 ට අඩු පිරිස සමස්ත ජනගහනයෙන් සියයට 25.2 ක් වූ අතර අවුරුදු 15 ත් 59 ත් අතර පිරිස සමස්ත ජනගහනයෙන් සියයට 62.4 ක් විය. රටේ වැඩිහිටි ජනගහනය එනම් අවුරුදු 60 වැඩි පිරිස සමස්ත ජනගහනයෙන් සියයට 12.4 ක් ලෙස මහ බැංකු වාර්තාව සඳහන් කරයි.

මහ බැංකු වාර්තාවේ 2017 වසරේ ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒකපුද්ගල ආදායම ලෙස සඳහන්ව ඇත්තේ ඇමරිකානු ඩොලර් 4065 කි. මෙය 2016 වසරේදී ඩොලර් 3857 ක් ලෙස ඒ වසරේ වාර්තාවේ සඳහන් විය.

ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ගේ දුරකථන භාවිතයෙහි දත්ත තොරතුරුද එහි අඩංගු කොට ඇති අතර ඊට අනුව පුද්ගලයන් 100 ක් අතර දුරකථන 143.6 ක් භාවිතයේ පවතී. තවද පුද්ගලයන් 100 ක් ගත් විට 12.1 කට ස්ථාවර දුරකථන හිමිව ඇති අතර පුද්ගලයන් 100 ක් ගත් විට 27.5 දෙනෙකුට අන්තර්ජාල පහසුකම් පවතී.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දත්ත වාර්තා පිළිබඳවද මහ බැංකු වාර්තාවේ සඳහන්ව ඇති අතර, ඊට අනුව එක් වෛද්‍යවරයකුගෙන් සේවය ලබාගන්නා පුද්ගලයන් සංඛ්‍යාව 1054 ක් බවත් පුද්ගලයන් 1000 කට පවතින රෝහල් ඇඳන් සංඛ්‍යාව 3.6 ක් ලෙසත් පුද්ගලයන් 10,000 කට සිටින හෙද සේවකයන් සංඛ්‍යාව 16.0 ක් බවත් එහි දැක්වේ. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වෙන් කර ඇති මුදල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 1.5 ක් ලෙස මෙවර මහ බැංකු වාර්තාව සඳහන් කරයි.

# අවප්‍රමාණය වන අපේ රුපියල

පසුගිය සති කීපය තුළ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම ඉහළ ගොස් ඇති බව ඒ පිළිබඳව ඇති වාර්තා පෙන්වා දේ. මේ අනුව පසුගිය අප්‍රේල් තුන්වන සතියේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ විකුණුම් අගය රුපියල් 158.69 ක් ලෙස සඳහන් විය.

ආනයනකරුවන් අතර ඇමරිකානු ඩොලරයට ඇති ඉල්ලුම ඉහළ යෑමත් සමග මෙවැනි තත්ත්වයක් ඇති වූ බව ආර්ථික විශේෂඥයින් පවසා ඇත. තවද වෙළඳපොළ තුළ ඇමරිකානු ඩොලර් හිඟයක්ද පවතින බව ඔවුන් පවසා සිටී.

2015 වසරේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල ස්ථාවර අගයක පැවතී ඇති අතර එහිදී රුපියලේ අගය රුපියල් 131 ක් ලෙස දැක්විණි. මේ ආකාරයට ඩොලරය ඉහළ යෑම ඛනිජ තෙල් ඇතුළු පිටරටින් ගෙන්වන භාණ්ඩවල මිල ඉහළ යෑමට බලපානු ඇතැයි සඳහන් වේ.

# ග්ලයිෆොස්පේට් සහ තේ රබර්

ග්ලයිෆොස්පේට් සඳහා රජය පනවා තිබූ තහනම තේ සහ රබර් වගාව සඳහා පමණක් ඉවත් කිරීමට තීරණය කර ඇතැයි වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම වගා දෙකට පමණක් අවශ්‍ය ග්ලයිෆොස්පේට් ආනයන සඳහා මැයි 02 දා සිට අවසර ලබාදෙන බවත් වී ඇතුළු සෙසු කෘෂි වගාවන් සඳහා එය කිසිවිටෙකත් යොදා නොගන්නා බවත් ඇමතිවරයා කියයි.

රජරට ප්‍රදේශය මූලිකව ශ්‍රී ලංකාව පුරා සීඝ්‍රයෙන් වකුගඩු රෝගය පැතිර යෑමත් සමග විෂ රසායනයන්ගෙන් තොර කෘෂි කර්මාන්තයක් අරමුණු කොට ග්ලයිෆොස්පේට් ශ්‍රී ලංකාවට ගෙන්වීමත්, බෙදාහැරීමත්, අලෙවි කිරීමත් 2015 වසරේ සිට සම්පූර්ණයෙන්ම තහනම් කෙරුණි. මෙම රසායනය තහනම් කිරීමත් සමග ඊට විකල්ප ආදේශකයක් හඳුන්වා නොදීම නිසා තේ වගාවට විශාල බලපෑමක් එල්ල වී ඇති බව පසුගිය කාලයේදී නිතර නිතර වාර්තා පළ විය. මෙයට විසඳුමක් ලෙස ග්ලයිෆොස්පේට් තේ සහ රබර් සඳහා පමණක් භාවිත කිරීමට අවසර ලබාදීමට රජය තීරණය කොට ඇත.

මේ ආකාරයට වගාවන් දෙකක් සඳහා වුවත් සෞඛ්‍යයට දැඩි අහිතකර ග්ලයිෆොස්පේට් නැවතත් ශ්‍රී ලංකාවට ගෙන්වීම සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වවලින් මේ වන විට දැඩි විරෝධය පළ කෙරෙමින් ඇත.

# ළඟදීම මන්නාරම් ද්‍රෝණියෙන් විදුලිය

2009 සිට 2015 දක්වා මන්නාරම් ද්‍රෝණියේ සිදුකරන ලද ගවේෂණ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස එහි ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන ඇති බව ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සඳහන් කරයි. පෞද්ගලික සමාගමක් විසින් සිදුකරන ලද ගවේෂණවලදී මෙම වායු නිධි දෙක පිළිබඳ තොරතුරු අනාවරණය කොට ගෙන ඇත.

ඒ අනුව මෙම වායු නිධි දෙක උපයෝගී කොට ගෙන 2023 වසර වන විට ජාතික විදුලි පද්ධතියට අවශ්‍ය විදුලිය ලබාදීමට අපේක්ෂා කරන බව අමාත්‍යාංශය වැඩිදුරටත් සඳහන් කරයි. මෙම විදුලිය උත්පාදනය සඳහා සිදුකරන සංවර්ධන කටයුතුවලට ඇමරිකානු ඩොලර් මිලියන 700 කට වැඩි මුදලක් වැය වෙන බව අමාත්‍යාංශය පෙන්වා දේ.

මන්නාරම් ද්‍රෝණියේ M 2 කොටසේ කැණීම් කටයුතු සඳහා ලංසු කැඳවීමටද මේ වන විට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර මැයි දෙවැනි සතිය වන විට ඊට අදාළ ලංසු කැඳවීම සිදුකිරීමට නියමිත වේ.

# ශ්‍රී ලංකාවේ ගුරු හිඟය

ශ්‍රී ලංකාවේ රජයේ පාසල් අතරින් පාසල් 3148 ක් ගුරුවරුන් 10 දෙනෙකුට අඩු සංඛ්‍යාවකින් ක්‍රියාත්මක වන බව හෙළිදරව් වී ඇත. පසුගියදා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2017 වාර්ෂික වාර්තාවේ දත්තවලින් හෙළිවී ඇති මෙම තොරතුරු මගින් ශ්‍රී ලංකාවේ ගුරු හිඟය කෙතරම්දැයි පෙන්නුම් කෙරේ.

ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා 13 වසර දක්වා පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීමට රජය පියවර ගත්තද උගැන්වීම සඳහා ගුරුවරුන් නොමැති වීම අධ්‍යාපනයේ ප්‍රමිතිය පහත වැටීමට බලපානු ලබන බව අධ්‍යාපනඥයින් පෙන්වා දේ.

මේ වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2018 වසරේදී අනිවාර්ය විෂයයන් 9 ක් සහ වෘත්තීය විෂයයන් 26 ක් ඇතුළත් නව විෂය ධාරාවක් සංවර්ධනය කොට ඇත. මේ සඳහා ගුරුවර ගුරුවරියන් 522 ක් පුහුණු කිරීමටද බලාපොරොත්තු වේ. මෙම නව විෂය ධාරා ව්‍යාපෘතිය මේ වසරේදී රට පුරා පාසල් 150 ක ක්‍රියාත්මක කිරීමට නියමිත අතර 2019 වසරේදී පාසල් 500 ක් දක්වාද 2020 දී පාසල් දහසක් දක්වාද ව්‍යාප්ත කිරීමට නියමිතව ඇත. 2017 මහ බැංකු වාර්තාවට අනුව පසුගිය වසරේදී පාසල් ළමුන් 43 ලක්ෂයකට නිල ඇඳුම් ලබා දී ඇති අතර ළමුන් හයලක්ෂ පනස්දහසකට පාවහන් ලබා දී තිබේ.

# ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස ඉදිරියට

2018 ලෝක ජනමාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකයේ (World Press Freedom Index) පැවති ස්ථානයෙන් ස්ථාන 10 ක් ඉදිරියට ඒමට ශ්‍රී ලංකාව සමත් වී ඇත.

මෙසේ ස්ථාන 10 ක් ඉදිරියට පැමිණියද එම දර්ශකයේ රතු කලාපයෙන් බැහැර වීමට ශ්‍රී ලංකාවට තවමත් නොහැකි වී ඇත. රට රටවල පවතින ජනමාධ්‍ය නිදහසේ ස්වභාවය අනුව සුදු, කහ, තැඹිලි, රතු සහ කළු ලෙස මෙම දර්ශකය කොටස් 05 කට වෙන් කර ඇත.

මෙම දර්ශකය සැකසීම සඳහා ලෝකයේ රටවල් 180 ක ජනමාධ්‍ය නිදහස පිළිබඳ දත්ත අධ්‍යයනය කොට ඇති අතර ජනමාධ්‍ය නිදහස, ජනමාධ්‍යයේ ස්වාධීනත්වය, ව්‍යවස්ථාදායක රාමුව, මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව වැනි කරුණු පිළිබඳව සිදුකරන ගැඹුරු අධ්‍යයනයක් මත පදනම්ව රටවල් වර්ගීකරණය කෙරේ.

මෙම වසරේ ජනමාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකයේ පළමු ස්ථාන පහ පිළිවෙළින් 1. නෝර්වේ 2. ස්වීඩනය 3. නෙදර්ලන්තය 4. ෆින්ලන්තය 5. ස්විස්ටර්ලන්තය යන රටවල් වෙත හිමි වී තිබේ. ජනමාධ්‍ය නිදහස් දර්ශකයේ කැනඩාවට හිමිව ඇත්තේ 18 වන ස්ථානයයි. ඇමරිකා එක්සත් ජනපදය පසුවන්නේ 45 වන ස්ථානයේය. අවම මාධ්‍ය නිදහස සහිත රටවල් පහ පිළිවෙළින් 176. චීනය 177. සිරියාව 178. ටර්ක්මෙනිස්තානය 179. එරිත්‍රියාව 180. උතුරු කොරියාව වේ.

මෙම දර්ශකයේ දකුණු ආසියානු කලාපයේ රටවල් වන ඉන්දියාව 138, පාකිස්තානය 139, බංගලාදේශය 146 වන ලෙසින් ස්ථාන හිමිකරගෙන සිටී. ශ්‍රී ලංකාව මේ වසරේදී 131 වන ස්ථානයේ පසුවන අතර පසුගිය වසර දෙකේදී (2016/17) මෙහි ශ්‍රී ලංකාව හිමිව තිබුණේ 141 වෙනි ස්ථානයයි. 2015 වසරේදී මෙම දර්ශකයේ ශ්‍රී ලංකාව 165 වන ස්ථානයේ පසු විය.

Reporters Without Borders (RSF) නමැති ජාත්‍යන්තර සංවිධානය විසින් මෙම දර්ශකය සකස් කරනු ලබයි.

# මගීන්ගේ ගමන් මලු නැතිවන ගුවන් තොටුපොළ

පසුගිය මාස තුනක කාලය ඇතුළත කටුනායක ගුවන් තොටුපොළට පැමිණෙන මගීන්ගේ ගමන් මලු නැතිවීම් සම්බන්ධ පැමිණිලි 75 ක් ලැබී ඇති බව කටුනායක ගුවන් තොටුපොළ පොලීසිය පවසා සිටී.

ආසන්නතම සිදුවීම අප්‍රේල් 25 වෙනිදා සිදුවී ඇති අතර එහිදී මැදපෙරදිග සිට කටුනායකට පැමිණි ගුවන් මගියෙකුට අයත් විදේශීය මුදල් සහ වටිනා දේවල් තිබූ ගමන් මල්ලක් ගුවන් තොටුපොළේ බැගේජ් බෙල්ට් අසලදී නැති වී ඇත. මේ සම්බන්ධයෙන් ගුවන් තොටුපොළ ආරක්ෂිත කැමරා නිරීක්ෂණය කර ඇති අතර එහිදී එම ගමන් මල්ල රැගෙන ගිය පුද්ගලයා සොයා ගැනීමට හැකි වී ඇත.

මෙවැනි සිදුවීම්වලදී ඇතැම් අවස්ථාවල අතපසු වීමෙන් ගමන් මලු රැගෙන ගිය අවස්ථා වාර්තා වී ඇතත් ඇතැම් අවස්ථාවලදී හිතාමතාම ගමන් මලු රැගෙන ගොස් ඇතැයි පැවසේ. මේ ආකාරයට නැති වන ගුවන් මලු සොයා ගැනීම අපහසු වී ඇති බවත් දින 21 කට පසු එම නැති වූ ගුවන් මලුවලට රක්ෂණ වන්දි ලබා ගැනීම සම්බන්ධව ගුවන් සමාගම් සමග කටයුතු කිරීමේදී ගැටලු මතුව ඇති බවත් පොලිසිය පවසයි.

සාවද්‍ය පරිහරණය හා විශ්වාසය කඩ කිරීම යන කරුණු මත අන් අයෙකුට අයත් ගමන් මලු හෝ දේපළ රැගෙන ගොස් ඇති සිද්ධිවලට සම්බන්ධ ඇතැම් පුද්ගලයන් හඳුනාගැනීමෙන් පසු ඔවුන්ට නඩු පැවරීමට කටයුතු කර ඇති බවත් පොලිසිය පවසයි.

දසත Dasatha
2018 මැයි May 2018

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editor - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara
-----------------------------------------
114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada
-----------------------------------------
Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the financial support of the Government of Canada.
«Nous reconnaissons l'appui financier du gouvernement du Canada'
www.canada.ca

# රට අවුලට හෙළූ ප්‍රාදේශීය ඡන්ද ක්‍රමය

කොතෙකුත් අප මවුබිමේ උන්නතිය ගැන නොව අවනතිය ගැනම කථා කරන්නට සිදුව තිබීම කොතරම් නම් අවාසනාවක්ද? කවර රටක සිටියද අප මවුබිම එවැනි තත්ත්වයකට පත්ව තිබීම අපගේද වේදනාවට, පසුතැවිල්ලට හේතු වන බව අමුතුවෙන් කිව යුතු නැත.

පසුගිය පෙබරවාරි මාසයේ ශ්‍රී ලංකාවේ පැවැත්වුණු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම රටේ අවනතියට හේතු වන තවත් එක් කරුණක්ව තිබීම රට ගැනත් ජනතාව ගැනත් දේශපාලනඥයන්ගේ නොසැලකිලිමත් බව විදහා පාන තවත් කදිම සාධකයක් වන්නේය.

මෙම ඡන්ද විමසීම පවත්වන ලද්දේ 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුවය. අප දන්නා අන්දමට පනතක් සම්මත වන්නේ පාර්ලිමේන්තුවේ පක්ෂ-විපක්ෂ කාගේත් වාද විවාද මැදය. වර්තමාන පාර්ලිමේන්තුවේ සිටින බහුතරයක් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු අවුරුදු පහළොව විස්ස පාර්ලිමේන්තුවට අරක් ගෙන සිටින අයයි. ඇතැම් ඇමතිවරු අවුරුදු විසිපහ තිහ ඇමතිකම් දැරූ අත්දැකීම් ඇති අයයි. පාර්ලිමේන්තුවේදී ගෙන එන පනතක් යනු පක්ෂ, විපක්ෂ කවුරුත් රටේත් ජනතාවගේ සුභසිද්ධිය උදෙසා සීරුවෙන් කල්පනා කොට බලා අනුමත කළ යුත්තකි. එහෙත් අදාළ පනතට අනුව පැවැත්වුණු ගත වූ ප්‍රාදේශීය සභා මැතිවරණය මාස තුන හතරක් ගත වනතුරුත් විසඳිය නොහැකි බරපතල ගැටලු මතු කරන්නක් වී තිබීම ඉහත කී මැති ඇමතිවරු කොතරම් නොසැලකිලිමත් ලෙස පාර්ලිමේන්තුවේ කටයුතු කරන්නේද යන්නට කදිම සාධකයක් නොවන්නේද? දැනට මතුව ඇති ගැටලු රාශිය දෙස බැලීමේදී පනත දෙස දූරදර්ශී ඇසින් බැලූ එකදු අයෙක්වත් නොසිටියේද යන සැකය අප තුළ ඇති වෙයි. ඒ හැරත් මේ පනත කෙටුම්පත් කිරීමේ සිට අනුමත වන අවස්ථා දක්වා කොතරම් නම් මහජනතාවගේ මුදල් වැය වන්නට ඇද්ද යන්න සලකා බැලීමේදී මේ සඳහා සහභාගිත්වය දැක්වූ පක්ෂ-විපක්ෂ සෑම අයෙකුම පසුගියදා ජනාධිපතිවරයා විසින්ද කියා තිබුණු පරිදි අපාගත වන පවක් කරගත් අය නොවන්නෝද?

නව මැතිවරණ පනත සකසන්නට හේතු වූයේ පෙර පැවති මනාප ඡන්ද ක්‍රමයෙහි වූ යම් යම් අහිතකර අත්දැකීම් පදනම් කරගෙනය. එහෙත් නව ක්‍රමයෙන් පැන නැඟී ඇති ගැටලු නිසා මෙහි 'නව' යන වචනය පමණක් ඉතිරිව තිබෙන තැනට කටයුතු යෙදී තිබීම කොතරම් නම් අවාසනාවක්ද?

මෙම නව ඡන්ද ක්‍රමය සැකසුණේ කොට්ඨාස ක්‍රමයත් සමානුපාතික ක්‍රමයත් මිශ්‍ර වූ ඡන්ද ක්‍රමයක් හැටියටයි. කොට්ඨාස ක්‍රමය යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසයකට වග කියන නියෝජිතයෙකු පත් කර ගත හැකියි. එහෙත් සමානුපාතික ක්‍රමය ඊට ඈඳීම නිසා තවමත් නියෝජිතයින් පත් කර ගත නොහැකි ප්‍රාදේශීය සභා රාශියක් රට පුරා බිහි වී තිබේ. එසේම සමානුපාතික ක්‍රමය නිසා වැඩි ඡන්ද ලබා ජයග්‍රහණය කරන පක්ෂත් අපේක්ෂකයනුත් පසෙකට විසි වී ගොස් ඡන්ද නොලබා පරාජයට පත් වූ පක්ෂ එක් වී ආයතනවල බලය පිහිටුවා ගත් අවස්ථා රාශියක් ගැනත් අසන්නට ලැබේ. මේ හැරත් දැනට බලය පිහිටුවා ගත් ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා රාශියකම පරාජිතයින් එක්ව කොයි මොහොතේ බලය අස්ථාවර කරාවිද යන සැකය ඇති වී තිබේ. මේ හේතූන් නිසා සුභවාදී වූ කොට්ඨාස ක්‍රමය පිළිබඳ වූ බලාපොරොත්තුද සුන් වී තිබේ.

බලය පිහිටුවීමෙහි ලා ඇති වී තිබෙන මේ ගැටලු මෙන්ම තෝරා ගනු ලබන නියෝජිතයන්ගේ සංඛ්‍යාවද විහිළු සහගත ලෙස වැඩි වීමද ජනතාවගේ බලවත් අප්‍රසාදයට හේතු වී තිබේ. පෙර පැවති ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව පුරා වූ සියලු ආයතනවල නියෝජිතයින්ගේ සංඛ්‍යාව හාරදහස් හත්සියයක් වූ අතර නව පනතට අනුව එම සංඛ්‍යාව දෙගුණයකින් වැඩි වී නවදහස් හාරසියයක් බවට පත්ව තිබේ. රටේ ජනතාව දැඩි ආර්ථික පීඩනයකට පත්ව සිටියදී මෙතරම් සංඛ්‍යාවක් නඩත්තු කිරීමට යන වැය පක්ෂය පනත සම්මත කිරීමේදී නිකමටවත් සිතන්නට තරම් කිසිදු මන්ත්‍රීවරයකුට නොහැකි වීම රටේ අවාසනාව විය යුතුය. ඒ හැරත් පූර්වයෙහි වූ පනත පරිදීද පත් වූ හාරදහස් හත්සියයකින් රටට වී ඇති සේවය නිකමටවත් තක්සේරු කර බැලුවේ නම් 'මෙතරම් සංඛ්‍යාවක් කුමටද?' යන ප්‍රශ්නය එක් අයෙකු තුළවත් මතු නොවීම ප්‍රශ්නකාරී නොවේද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ කාර්යය පක්ෂ-විපක්ෂ වශයෙන් බෙදී කා කොටා ගැනීමට වඩා රටේ වැසියන්ගේ යහපත උදෙසා කටයුතු කිරීම යයි මතක් කර දෙන්නට ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ඇති වී තිබෙන මේ තත්ත්වය උපකාරී වුවහොත් එයද රටට සේවයක් වනු ඇත.

මේ තත්ත්වය මත මතු වී තිබෙන තවත් අවාසනාවන්ත කරුණක් නම් ඉදිරියේ පැවැත්වෙන පළාත් සභා මැතිවරණය කිසිදු වෙනසකින් තොරව පෙර පැවති හුදු සමානුපාතික ක්‍රමය යටතේම පැවැත්විය යුතුය යන අදහස ඉදිරිපත්ව තිබීමයි. ඒ අනුව 'මනාප ක්‍රමය' නරක යයි කියා අයින් කළ හුදු සමානුපාතික ක්‍රමයම යළි කරලියට පැමිණෙනු නොවැලැක්විය හැකිය. එසේ නම් සැකසූ නව පනතින් ඇති ඵලය කුමක්ද? එය හුදු මහජන මුදල් සමග සෙල්ලම් කිරීමක් පමණක්ම නොවන්නේද? එය 'වටම ගොස් ගෙටම ආවා' යන සිංහලයින්ගේ කියමන සිහිපත් කිරීමක් වන්නේය. එවිට කොට්ඨාසයේ ඡන්දදායකයින්ගේ යහපත සඳහා යයි සැකසූ කොට්ඨාස ක්‍රමයට වන්නේ කුමක්ද? කොට්ඨාසයට වග කියන නියෝජිතයාට වන්නේ කුමක්ද?

මේ අනුව දැන්වත් දෙපිළ බෙදී ගහ-බැණ ගැනීම වෙනුවට දෙපිළම එක් වී ජනතාවට හිතකර ඡන්ද ක්‍රමයක් ඉදිරි පළාත් සභා මැතිවරණයේදීවත් සකසා ගැනීමට කටයුතු කරන්නේ නම් එය කාගේත් හිත සුව පිණිස වනු ඇත.

# ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ

# 20 වෙනි සංශෝධනය

■ දූරදර්ශී විසිනි

අවුලෙන් අවුලට පත්ව තිබෙන ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයෙහි අලුතෙන්ම හොල්මන් කරන්නට පටන් ගෙන ඇති මාතෘකාව නම් විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ 20 වෙනි සංශෝධනය පිළිබඳ මාතෘකාවයි. මෙම මාතෘකාවට මුල් වී තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණයි.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳ කතාබහ ශ්‍රී ලංකාවාසීන්ට අලුත් දෙයක් නොවේ. එය 1978 ජේ. ආර්. ජයවර්ධන මහතා ජනාධිපති වූ දා පටන්ම ඇන්. ඇම්. පෙරේරා මහතා ආදීන් විසින් දිගට හරහට කතා කළ මාතෘකාවකි. චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනියත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත් තමන් මෙය ආහෝසි කරන බවට ප්‍රතිඥා දුන්නද එය කිසිදා ඉටු වූයේ නැත. මෙවර ජනතා විමුක්ති පෙරමුණ නැවත කතා කරන්නේත් ඒ අහෝසි කිරීම ගැනමය.

ජනතා විමුක්ති පෙරමුණ මෙම අදහස එළියට දමනාවත් සමගම කවදත් දඩිබිඩි ප්‍රකාශ කොට පොට වරද්දා ගැනීමට ප්‍රසිද්ධියක් උසුලන ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරිකයකු හා මාධ්‍ය ප්‍රකාශකයාද වන බන්ධුල ගුණවර්ධන මහතා 'ඒකාබද්ධ විපක්ෂය ජනතා විමුක්ති පෙරමුණේ මේ යෝජනාවට සහයෝගය දෙන බවත් ඒ එක් කොන්දේසියක් මත බවත්' මාධ්‍යවලට පැවසීය. කොන්දේසිය නම් 'ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත වනවාත් සමගම පවත්නා ආණ්ඩුවද විසුරුවා හැරිය යුතුය' යන්නයි. විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම එකකි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අනෙකකි. බළලා මල්ලෙන් එළියට පැන්නාක් මෙන් ඔහු කළ මේ එකකට එකක් සම්බන්ධ නැති පරස්පර කතාවෙන් විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමෙන් රටටත් ජනතාවටත් වන ගුණාගුණ කුමක් වුවත් ඔහුගේ ප්‍රමුඛ අවශ්‍යතාව ආණ්ඩුව විසුරුවා හැරීම බව එළියට පැන්නේය.

මේ අතර ඒකාබද්ධ විපක්ෂයේ නායක හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජාතික සංවිධාන එකතුමුතුවේ ප්‍රකාශයකට පිළිතුරු දෙමින් සඳහන් කළේ ඒකාබද්ධ විපක්ෂය ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාව සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැති බවත් තම මන්ත්‍රී කණ්ඩායම රැස්ව තීරණයක් ගන්නා බවත්ය.

මේ අතරම ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවට ප්‍රබලතම විරෝධය එල්ල කළේ ඒකාබද්ධ විපක්ෂයේම අයෙකු වන ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතාය. විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ 20 වෙනි සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙන ඒමේ කොන්ත්‍රාත්තුව ජනතා විමුක්ති පෙරමුණ භාර ගෙන ඇතැයිද ඊට කොන්දේසි සහිතව සහයෝගය ලබාදෙන බව ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීන් කීප දෙනෙකුම ප්‍රකාශ කර ඇතත් ඊට සහාය දීම සඳහා ඒකාබද්ධ විපක්ෂය තීරණයක් ගන්නේ නම් තමන් ඊට දැඩි ලෙස විරෝධය පළ කරන බවත් කියා සිටියේය. ජනතා විමුක්ති පෙරමුණ මේ සැරසෙන්නේ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ මුවාවෙන් ශ්‍රී ලංකාවේ ඒකීය රාජ්‍ය සංකල්පය අහෝසි කිරීමට යයිද ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය. මෙම යෝජනාව පිළිබඳ රජය කරවන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ එක්සත් ජාතික පක්ෂයේ අදහස කුමක්දැයි මෙය ලියන මොහොත දක්වාම ප්‍රකාශයට පත්වී නැත. මේ අතර ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මහතා පවසා ඇත්තේ තමන් මේ යෝජනාව ගෙන එන්නේ වර්තමාන ජනාධිපති තුමාගේ ධූර කාලය නිම වීමෙන් පසුව ක්‍රියාත්මක වන අන්දමට බවය.

ජනතා විමුක්ති පෙරමුණ ගෙන එන්නට යන යෝජනාව කුමක් වුවත් දඩිබිඩි වී, කටට එන එන දේ එළියට දමා වැඩ අවුල් කරගෙන ඇති වෙනත් දේශපාලන කරුණු මෙන් නොව, මෙය ඉක්මන් නොවී පුළුල් සාකච්ඡාවකට බඳුන් කොට රටේත් ජනතාවගේත් අනාගත සුභසිද්ධිය සඳහා ගත යුතු, මැදිහත් තීරණයකට එළඹ ක්‍රියාවට නැගිය යුතු කරුණක් බව අපිදු කියනු කැමැත්තෙමු. මෙය පවතින ආණ්ඩුවට පක්ෂ නිසාවත් විපක්ෂ නිසාවත් එක්සත් ජාතික පක්ෂයේ ජේ. ආර්. ජයවර්ධන මහතාගේ අදහසක් නිසාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එය පවත්වාගෙන ගිය නිසාවත් තමන් කැපී පෙනෙන්නට වත් අනුන්ට පහර ගැසීමට වත් නොව, ප්‍රබුද්ධ දේශපාලනඥයන් වශයෙන් තම තමන් සතු පක්ෂ හා පෞද්ගලික මතභේද සියල්ල අමතක කොට පක්ෂ, විපක්ෂ කවුරුත් විවෘත සාකච්ඡා මණ්ඩපයකට එක්රැස්ව දෙස් විදෙස් විද්වත් ජනයාගේ අදහස්ද එක් කොටගෙන ගත යුතු බරපතල තීරණයක් බව පෙන්වා දෙනු කැමැත්තෙමු. හුදෙක් මෙහිදී කාගේත් මනස් ගත විය යුත්තේත් රටේත් ජනතාවගේත් ඉදිරි යහපතයි. මේ වන විට මෙම විධායක ජනාධිපති ධූරයට වසර 40 ක් ගතව ඇති හෙයින් තමන් ලත් අත්දැකීම් තුළින් බුද්ධිමත් ජනයාට මේ පිළිබඳව අපමණ අදහස් ඉදිරිපත් කරන්නට තිබිය හැකිය. ඒ සියල්ල එක්තැන් කොට ගරා, පෙරා තීන්දුව ගත යුතු බව අපි නැවතද කියන්නෙමු.

ශ්‍රී ලංකාවේ 'ජනාධිපති ධූරය' අපට උරුම වූයේ 1946 දී එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඇමතිවරුන් විසින් සකස් කරන ලදැයි (සැබවින්ම

20 වන පිටුව බලන්න

# මවුවත් බවට පිදෙන උපහාරය

■ තරිඳු ලකල් ජයතිලක

යම් කලක මුළු ලොවම ඔබව පිළිකෙව් කළද, අතැර පළා ගියද, ඔබට එරෙහිව සටන් වැදුනද, එක් ගැහැනියක ඔබ අතැර නොගොස් ඔබ අසල ඔබ සමග නොසැළී, දයා හදැතිව හිඳිනු ඔබට පෙනේවි. 'මවන්නිය' හෙවත් 'මවය' ඈ.

ඇය මවන්නේ දරුවන්ය. දරුවන්ගේ සන්තානයට මෛත්‍රියේ, කරුණාවේ, උපේක්ෂාවේ හා මුදිතාවේ 'අ'යනු 'ආ'යනු රැගෙන එන්නී ඇයයි. නිස්සරනාධ්‍යාසයෙන් කැපවීමේ ගුණය පිළිබඳ උත්තර ප්‍රතිමූර්තිය ඇයයි. ඇය පමණ අනත් දුක් ඉහිලූ උහුලන කිසිවකු බුදුබව පතන බෝසත්වරුන් මිස නැත. ඇය දයාවේ මකරන්ද මුහු සිහිල වූ දියවරව දාරක අධ්‍යාත්මය මානව ප්‍රේමයේ සිහිලසින් පිරිමදියි. රෝ, දුක් බියෙන්, ආතුර වන දරුවන්ගේ සෝ පිරිපත බර තම කරපිටට ගෙන මිහිකත සේ විඳ දරාගෙන ඈ හිඳින්නීය.

ජගත් මාතා, හෙවත් මව්දෙවඟන පිදීමෙහි හැරුණු විට මවට නිසි තැන ලබාදී ඇති දහමකි බුදු දහම. සෑම නිවසකම බුදු කෙනෙකු වැඩ වසන බවත් ඒ මව්තුමිය බවත් අමාමෑණී තිලෝනා බුදුහිමි දේශනා කිරීමෙන්ම බුද්ධත්වයේ හා මව්වත් බවේ සාම්‍යත්වය දැක්වීමට උන්වහන්සේ නිහතමානී වූ බව පැහැදිලි වෙයි. පවුලක එකිනෙකා ස්නේහයෙන් ඇද බැඳ වෙලා තබනා ආදරයේ රන්මුවා රැ හැන්පොටද මවම මිස අන් කවුරුද? පහත වැකියෙන් හැඟෙන්නේ බුදුහිමි එය අවබෝධ කරගෙන සිටි බවයග

'මාතා සචේ මිත්තංඝරෙ' - නිවසෙහි මිතුරිය මවයි.

දරු වියොවින් ලය වාවනු නොහැකිව හඬා වැටෙන අසරණ මවකගේ විලාපය මද්‍රීනම් මවගේ මුවින් මෙසේ නික්මෙයි

ඇවිත් හිමාලේ තපසේ උනිම් අනේ
ඇවිත් ලිහිණියෙක් ගෙන ගියෙදෝ නොදැනේ
සවිත් නැත බලා ඇවිදින්නා දෙවියනේ
ඇවිත් පෙනීයව් සුරතල් දෙදරුවනේ
- වෙස්සන්තර ජාතක කාව්‍ය

සිය බිසව හා දරු දෙදෙනා සමග රජකමද රාජ්‍යයද අතහැර ආරණ්‍යගතවන වෙසතුරු රජු සිය බිසව (මද්‍රී දේවිය) පළවැල නෙලාගෙන ඒමට ගිය විටක බුදුබව පතා දාසයින් ඉල්ලා පැමිණෙන ජූජක බමුණාට ජාලිය හා ක්‍රිස්නජිනා යන තම දරු දෙදෙනා දන් දෙයි. පළවැල රැගෙන මද්‍රී නම් ඒ මව පැමිණ දරුවන් සොයයි. දරුවන් උදෙසා රසබර පළවැල රැගෙන පැමිණි කරුණාබර මව තම අතුරුදන් වී ඇති දරුවන් සොයමින් වනයේ දසත සැරූවද ඔවුහු දැක්මට ඇගේ ඇස පින් කර නැත. දරුවන් වනයේ කොහේ ගියේදැයි සොයමින් දුව ඇවිද ඇය ගත විඩාවෙන් රිදුම් දෙයි. දරු පැටව් කුමන අනතුරක් කරගෙනද, ලිහිණියෙක්වත් පැමිණ තම රුදු නිය පහුරට හසුකරගෙන රැගෙන ගියේද? ඇය බියපත්ව ඇත. සොව සමග මුහු වූ ඒ බිය ඇය තවත් අසරණ කර ඇගේ ගතෙහි ඉතිරිව තිබූ සවියද හීන කර දමා ඇති සේය. ඇය අවසන දරු දෙදෙනාට මෙසේ ආයාචනා කරයි. 'ඇවිත් පෙනීයව් සුරතල් දෙදරුවනේ'

තනේ කිරි දිදී ඇති කළ දෙදරුවනේ
වනේ වනේ පලවැල ගෙන රැකි මෙ වනේ
දැනේ දැනේ කෙළ කෙළ උන්නා මෙතැනේ
අනේ අනේ දූ ක්‍රිස්ණාජිනාව නේ
-වෙස්සන්තර ජාතක කාව්‍යය

සිරුරෙහි රතු රුහිරු දරු පෙමින් සුදුම සුදු කිරි බිඳු බවට පෙරලීමෙහි මහා පෙළහර කරමින් ඒ කිරෙන් තම දරුවන්ගේ සුදහගිනි නිවූ වචනයේ පරිසමාප්ථ අර්ථයෙන්ම මවක වූ ඇයට, වනයෙහි පළවැල නෙලාගෙන සෙනෙහෙන් දරු දෙදෙන පෝෂණය කොට වැඩූ ඇයට, කෙළිමතින් වන අරමෙහි දුවපැන ඇවිදිමින් තුටින් කෑ කෝගසමින් දරුවන් හුන්තැන් යළි යළිදු දැකුමෙන් දරු වියොවේ ළසෝ  දුක්ගිනි නිවෙනු වෙනුවට ලැව්ගින්නක් සේ මද්‍රී මව්තුමියගේ ළය දව දවා ඇවිලි ඇවිලියේග තමන්ට ආදරය කළ දරුවන් හා බැඳුණු පරිසරය ඇයට පෙනෙයිග එහෙත් ඒ පරිසරයෙහි තම දරු පැටව් දෙදෙනා දැන් නැත. අසපුව අසල පරිසරය දරු වියොව නම් ගින්න ඈ ළයෙහි අවළුවන්නෙක් වී ඇත. ක්‍රිස්ණාජිනා දියණියගේ සිඟිති මුදු මුව මඬල ඇයට සිහි වේ. ඇය හැඬුම් අතරින් ක්‍රිෂ්ණාජිනාවන්ට අමතන්නීයග 'අනේ අනේ දූ ක්‍රිස්ණාජිනාවනේ' දරු වියොව මව්වරු කොතරම් අසරණ කරත්ද?



තමන් ආදරය කළ තමන්ට ආදරය කළ දරුවන් ඇතුළු සියළු දෙනා මරණයට පත්ව දරු වියොවින් උමතු වූ පටාචාරා නම් අවාසනාවන්ත මව්තුමිය වෙත බුදුන්වහන්සේ මෙසේ දේශනා කළ සේක.

න සන්ති පුත්තා තාණාය - න පිතා නපි බන්ධවා
අන්ත කෙනාධි පන්නස්ස - නත්ථි ඤාතිසු තාණතා

'පුත්‍රයන්ගේ මරණය හේතුවෙන් කඳුළු හෙළන්නේද එසේම පුත්‍රයන්, ඥාතීන් ආදීන්ගේ මරණයෙන් හෙළන ලද කඳුළු සාගර ජලයටද වඩා අධිකය'

මෙතුළින් ගම්‍ය වන්නේ දරුවන් කෙරෙහි ඇගේ සිත පතුලින්ම මෝරා පුබුදු වූ පමණ කළ නොහැකි ආදරය පිළිබඳ කෙටි පටුනකි. තමන් දැඩිව ආදරය කළ යමෙකු නොඑන්නටම මෙලොව හැරගිය කල ඇතිවන්නේ දැඩි සොවකි. මවද දරුවන්ට පමණ කළ නොහැකි සේ ආදරය ඇත්තියකි. දරුවකුගේ මරණය හෙවත් දරුවා සදහටම නොඑන්නට ජීවිතයෙන් වෙන්වීම පමණ කළ නොහැකිව දරුවන් උදෙසා ඈ හදෙහි උපන් සෙනෙහස නොවෑවෙන ශෝකයෙහි වෙස් ගෙන නෙත් කෙවෙනි අග්ගිහෙන් වැගිරෙයි. සසර පුරා මව්වත් බව ලබා එවන් දුක්වලට භාජන වී සසර පුරාවට මවක් හැඬූ කඳුළුවල අපමණ බව සාගර ජලයටද අධික බව කීමෙන් සාගරයට අසාධාරණයක් සිදුවී නොමැති බව හැඟෙයි. අසාධාරණයක් සිදුවී ඇත්තේ මව් හැඬූ කඳුළුවලටය.

ප්‍රාණය නිරුද්ධ තම සිඟිති සුරතල් දරු පැටියාගේ සිරුර ඔසවාගෙන ඔහු සුවකර දෙන්නැයි අයදිමින් බුදුහිමි වෙත පැමිණි කිසා ගෝතමියද දරු දුක වාවනු නොහී උමතු වූ මවක් පිළිබඳ උදාහරණයකි. බුදුහිමියන් උපක්‍රමශීලීව ඇගේ බුද්ධියට ආමන්ත්‍රණය කොට දරු ශෝකය සන්හිඳුවා නිවන් මාර්ගයේ දොරටු හැර දුන් සේකග

මවක් තම එකම දරුවා කෙරෙහි දක්වන්නාවූ මෛත්‍රී ගුණය කොතරම් ප්‍රබලදැයි කිවහොත් තම අනුගාමිකයන්ට මෛත්‍රී භාවනා වැඩීමේදී සියලු සත්වයන් වෙත අප්‍රමාණව මෛත්‍රී භාවනාව වැඩිය යුත්තේ මවක තම එකම පුත්‍රයාව ආදරයෙන් රැකගන්නා ආකාරයෙන් යැයි බුදුරදුන් දේශනා කළ සේක.

'මාතා යථා නියං පුත්තං
ආයුසා ඒක පුත්ත මනුරක්ඛෙ
එවම්පි සබ්බ භූතේසූ
මානසං භාවයේ අපරිමානං
- කරණීයමෙත්ත සූත්‍රය

'මවක් තම එකම පුත්‍රයා සෙනෙහසින් රැකගන්නේ යම් සේද එසේ සියලු සත්වයින් වෙත අප්‍රමාණ මෛත්‍රිය වැඩිය යුතුය'

අඩුම තරමේ ආගමික නායකයාගේ මවට හැරුණු විට තමන් දස වධ විඳ දරා මොලොවට බිහිකර ඇති දැඩි කළ මෑණියන්ද පූජණීයත්වයෙන් සලකමින් වන්දනාමාන කිරීමක් බොහෝ ආගම්වල දැකිය නොහැක. එහෙත් බුදුසමය ඊට හාත්පසින්ම වෙනස්ය. බුදුදහම පිළිපදින්නන් තම මවද පූජනීයත්වයෙන් වන්දනාමාන කරයි. මේ ඒ සඳහා සාක්ෂියකි.

දසමාසේ උරේකත්වා - පෝසේසි වුද්ධිකාරණං
ආයුදීඝං වස්ස සතං - මාතු පාදං නමා මහං

'දස මසක් කුසෙහි දරාගෙන සිටි, පෝෂණය කොට වැඩූ මව්තුමියගේ පා වදිමි'

තම දුදන දුඹුල් මිත්‍රයන්ගේ අමන උපක්‍රමයන් නිසා මිනීමරුවකු වූ අහිංසක නම් අසරණයා අතින් ඔහු මෙලොවට ගෙන් වූ ඔහුගේ මවද මියෙන බව දැන රහත් වීමට පින් බල ඇති අංගුලිමාල (අහිංසක) සිය මව මරා දැමීමෙන් ආනන්තර්ය පාපකර්මය සිදු කරගෙන අපාගත වන බව දැන මිනීමරු අංගුලිමාල (අහිංසක) පහදවාගෙන බුදු සසුනේ පැවිදි කළ සේක. එයින් අංගුලිමාල (අහිංසක) අතින් මවු මැරීමේ ආනන්තර්ය පාපකර්මය සිදු නොවේ.

ලොව උතුම් මවු පදවිය කෙලෙසූ මවුවරුන්ගේ කතාද බුදුසමයේ එයි. නූතනයේ මෙන් බුදුන් ධර්මාන කාලයේද කසළ ගොඩවල් අසල දරුවන් දමාගිය මවුවරු සිටි බව පෙනේ. දඹදිව විසූ බුදු හිමිට පවා වෙදකම් කළ ජීවක නම් අතිදක්ෂ වෛද්‍යවරයා ගණිකාවක කුසින් ඉපදීමේ පාපයෙන් මහමග කසළ ගොඩක දමා ගිය බිළිදෙකි. සිග්මන් ෆ්‍රොයිඩ්ගේ 'ඊඩිපස් සංකීර්ණය' යන මනෝවිද්‍යාත්මක මතවාදය සිග්මන් ෆ්‍රොයිඩ්ටද පෙර බුදු සමය තුළ විවරණය කර ඇති කතා ජාතක කතා පොතෙහි එයි. තම මව බව නොදැන මවද සොහොයුරිය යැයි නොදැන සොහොයුරියද විවාහ කරගන්නා තරුණයකු පිළිබඳ කතාව එවැන්නකි. අසාතමන්ත ජාතකය තුළින් මතුවන්නේ අනුරාගය තරුණ වියෙහි පමණක් නොව මරණාසන්න මහලු කාලයේදීද පවතින බවත් එය මවු පදවියේ ගෞරවයද කෙලෙසා දැමීමට තරම් බලවත් බලවේගයක් බවට පත්විය හැකි බවත්ය. අසාතමන්තය ඉගෙනීමට පැමිණි සිසුවාට බෝසත් දිසාපාමොක් ඇදුරුතුමාගේ මහලු බවට අත් පා මෙහෙවර කරන කල වියපත් මවට තම පුත්‍රයාගේ සිසුවා කෙරෙහි අනුරාගයක් ඇතිවෙයි. ඈ සිත ඇතිවන අනුරාගය තමාට අත් පා මෙහෙවර කරන තම පුත්‍රයාගේ සිසුවා සමඟ ජීවත්වීම සඳහා තමාගේ පුත්‍රයා මරා දැමීමට තැත් කිරීමට තරම් ඇගේ සිත සැහැසි වෙයි.

මවකගේ වෛරයකට අවැසි නම් මුළු ලොවක් වුව දවා හළු කළ හැකිය. ඕනෑම හස්ථි රාජයකු කෙසඟ තමන් ඉදිරියෙහි දණගැස්වීමට ඇයට හැකිය. ඒ බව ජාතක පොතෙහි එන ලටුකික ජාතකයෙන් අපූරුවට කියවෙයි. තම කුරුළු පැටවුන් නසා දැමූ ඇතෙක් උපක්‍රමශීලීව නසා දැමූ කුරුළු මවක් එම කතාව තුළින් ඉස්මතු වෙයි.

කුමාර කාශ්‍යප භික්ෂුණිය පැවිදි බව ලැබූ තම පුතු දැක දරු සෙනෙහෙ වාවනු නොහී සිවුරෙහි තුටු කඳුළු හා කිරි වගුරුවමින් පැවිදි පුතු අසලට දිවගිය අයුරු, පැවිදි බව නිවන පවා නැගී එන දරු සෙනෙහස ඉදිරියේ මවට තරම් නොවන බව කියාපාන්නේ නොවේද? සිය මව තම මැදුරින් පලවා හරිනු ලබන සිටු කුමරකුට අවවාද කරන බුදු හිමි මව නැවත ඔහුගේ මැදුරට ගෙනගොස් බුදුන් වහන්සේ කෙනෙකුට මෙන් ගරු සත්කාර කරමින් පෝෂණය කරන මෙන් දේශනා කළ සේක. තම පුත්‍ර පෙම නිසාවෙන් නිවනද පමාකොට දරුවන් කෙරෙහි කැපවෙන මවුවරුන් පිදිය හැකි උසස්ම ආකාරයද එය පමණි.

මවකගේ හද පතුළින්ම දරුවෙකු උදෙසා කෙරුණු ආශිර්වාදයක් එක් තරුණ පුත්‍රයෙක් අසාර සසරින් ඉවත් කොට තුන් ලොවටම ශ්‍රේෂ්ඨ වූ අනුපමේය බුද්ධත්වයට පත්කිරීමට තරම් විය. ඒ අප කවුරුත් අසා ඇති මාතුපෝෂක ජාතක කතාවයි. වෙළෙඳ පුත්‍රයකු හා ඔහුගේ මව නැවකින් සමුදුරු තරණය කරද්දී නැව කුණාටුවකට හසුවී විනාශ වෙයිග මව කරපිට තබාගෙන දින ගණනක් තෙරක් නොපෙනෙන ක්ෂිතිජය හැරුණු කොට ඉන් ඉමක් මායිමක් නොපෙනෙන සයුරෙහි පිහිනා වෙරළකට පැමිණි කළ වෙළඳ පුත්‍රයාගේ මව තම ජීවිතය රැක දුන් සෙනේබර පුත්‍රයාට දිය හැකි උත්තරීතරම ත්‍යාගය අමිල වූ

20 වන පිටුව බලන්න

# ඓතිහාසික කොරියානු නායක හමුව: ජාත්‍යන්තර ප්‍රතිචාර

(බී.බී.සී. සිංහල පුවත්)

කොරියානු රාජ්‍යයන් දෙකේ නායකයන්ගේ හමුව සම්බන්ධයෙන් ලෝක නායකයන්ගේ ප්‍රතිචාර පළවෙමින් පවතී.

එම ඓතිහාසික හමුව පිළිබඳව ප්‍රකාශයක් කරන චීනය 'කොරියානු නායකයන් දෙදෙනාගේ දේශපාලන අධිෂ්ඨානය සහ ධෛර්යය ඓතිහාසික පියවරක් ලෙස' හඳුන්වනු ලැබ ඇත. එම ඓතිහාසික හමුව මගින් කොරියානු අර්ධද්වීපයේ දිගුකාලීන ස්ථාවරභාවය සම්බන්ධයෙන් සංධිස්ථානයක් සනිටුහන් කෙරෙනු ඇතැයි බේජිං පාලනය බලාපොරොත්තු තබන බව චීන විදේශ අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරන ලද නිවේදනයක දැක්වෙයි. උතුරු කොරියාවේ මිසයිල තර්ජනයට නිරන්තරයෙන්ම ගොදුරු වෙමින් පැවති රටක් වන ජපානයේ අගමැති ෂින්සෝ අබේ (Shinzo Abe) ප්‍රකාශයක් කරමින් කොරියානු රාජ්‍යයන් දෙකේ නායක හමුව විග්‍රහ කර තිබුණේ 'ශුභවාදී පියවරක්' ලෙසය. තව දුරටත් අදහස් දක්වන ජපානයේ අගමැතිවරයා, දෙන ලද ප්‍රතිඥා ඉටු කිරීමෙහි ලා 'පියෝන්ග්යැන්' පාලනය ස්ථිරසාර ක්‍රියාමාර්ග ගනු ඇතැයි දැඩිව බලාපොරොත්තු තබන බවත් සඳහන් කරයි.

මේ අතර 'ට්විටර්' පණිවුඩයක් නිකුත් කරන ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මෙසේ සඳහන් කර තිබිණි. 'සිදු වෙමින් පවතින්නේ යහපත් දෙයක්. එහෙත් සියල්ල කාලය විසින් තීන්දු කරනු ඇත.' කොරියානු නායක හමුව යථාර්ථයක් බවට පත් කර ගැනීම පිණිස චීන ජනාධිපති ෂී ජින් පින් ලබා දුන් සහයෝගය ද අමතක කළ නොහැකි බවත් ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පවසයි.

රුසියාව විසින් කොරියානු රාජ්‍ය නායක හමුව හඳුන්වා දෙන ලද්දේ 'ඉතා ශුභවාදී වර්ධනයක්' හැටියටය.

සෝල් අගනුවර සිටින බීබීසී වාර්තාකරුවෙක් තොරතුරු ඉදිරිපත් කරමින්, කොරියානු අර්ධද්වීපය න්‍යෂ්ටික අවිවලින් තොර කලාපයක් කිරීමේ අභිප්‍රාය මුදුන් පත් කර ගනු ලබන්නේ කෙසේද? යන්න පිළිබඳ තොරතුරු තවමත් පැහැදිලි නැති බව සඳහන් කළේය.

ප්‍රකාශිත අරමුණු සම්බන්ධයෙන් කැපවීම සඳහා 'පියෝන්ග 'යැන්' පාලනය තුළ පවතින උනන්දුව සම්බන්ධයෙන් බොහෝ විශ්ලේෂකයෝ සැක සහිත තත්ත්වයක පසුවෙති.

මේ අතර ප්‍රකාශයක් කරන නේටෝ යුද හවුලේ මහලේකම් ජෙන්ස් ස්ටොල්ටෙන්බර්ග් (Jens Stoltenberg) කොරියානු නායක සමුළුවේ තීරණ සම්බන්ධයෙන් සතුට පළ කළේය. එහෙත් තවත් ගතයුතු බොහෝ පියවර ඇති බවත් නේටෝ මහලේකම්වරයා පෙන්වා දෙයි.

# දත්ත අපහරණය ගැන ෆේස්බුක් ප්‍රධානියා සමාව ඉල්ලයි

(බී.බී.සී. සිංහල පුවත්)

කේම්බ්‍රිජ් ඇනලිටිකා (Cambridge Analytica) සමාගම ෆෙස්බුක් ග්‍රාහකයන් දශලක්ෂ ගණනක පුද්ගලික දත්ත රැස්කිරීමේ චෝදනාව පිළිබඳව ෆේස්බුක් සමාගමේ ප්‍රධානියා දෙවැනි දිනයේත් සමාව ඉල්ලා සිටියේය.

දත්තවල ආරක්ෂාව සම්බන්ධ "සිය වගකීම ගැන පුළුල් අදහසක් නොතිබීම" පිළිබඳ බදාදා (අප්‍රේල් 11) යළිත් වරක් සමාව ඉල්ලා සිටි ෆෙස්බුක් ආයතනයේ නිර්මාතෘ මාක් සකර්බර්ග් අනාගතයේදී එම ගැටලු විසඳීමට පියවර ගන්නා බවට ප්‍රතිඥාවක් දුන්නේය.

මාක් සකර්බර්ග් එම ප්‍රකාශය කළේ ඇමෙරිකානු කොංග්‍රස් කමිටුවක් හමුවේ දෙවෙනි දිනයටත් සාක්ෂි දෙමිනි. අඟහරුවාදා (අප්‍රේල් 10) මුලින්ම කමිටුව ඉදිරියේ පෙනී සිටි ඔහුගෙන් පැය පහක් මුළුල්ලේ ප්‍රශ්න කරනු ලැබුණි. සිය සමාජ මාධ්‍ය ජාලය අනිසි ලෙස යොදා ගැනීමට උත්සාහ දරන රුසියාවේ හැකරුන් සමග නිරන්තර අරගලයක නිරත වෙමින් සිටින බවත් එම ප්‍රශ්න කිරීම් හමුවේ ඔහු කියා සිටියේය.

"මේක ආයුධ තරඟයක් වගෙයි. ඔවුන් නිරන්තරයෙන් අලුත් ක්‍රමයක් හොයා ගන්නවා" ෆෙස්බුක් ආයතනයේ නිර්මාතෘ මාක් සකර්බර්ග් පවසයි.

2016 ඇමෙරිකානු ජනපතිවරණයට රුසියාව බලපෑම් කළේද යන්න පිළිබඳ පරීක්ෂා කරන විශේෂ පරීක්ෂක රොබට් මලර් ෆෙස්බුක් ආයතනයේ සේවකයන්ගෙන්ද කරුණු විමසූ බවත් ඔහු අනාවරණය කළේය. කෙසේ වුවත්, තමන් එසේ කරුණු විමසූ පිරිස අතරින් කෙනෙකු නොවන බව සඳහන් කළ ඔහු වැඩිදුරටත් කියා සිටියේ, සිය සමාගම රොබට් මලර් සමග පවත්වන අදහස් හුවමාරුව රහසිගත වුවක් බැවින් ඒ ගැන වැඩිදුර විස්තර හෙළි කළ නොහැකි බවය.

2016 ජනපතිවරණයට බලපෑම් කිරීම සම්බන්ධයෙන් රොබට් මලර්ගේ කාර්යාලය මේ වසරේ පෙබරවාරි මාසයේදී රුසියානු සමාගම් තුනකට සහ රුසියානු ජාතිකයන් දහතුන් දෙනෙකුට එරෙහිව නඩු පැවරීය.

ව්‍යාජ ෆෙස්බුක් ගිණුම් හඳුනා ගැනීම පිණිස නව මෙවලම් වර්ධනය කරමින් සිටින බවද මාක් සකර්බර්ග් අඟහරුවාදා කොන්ග්‍රස් කමිටුව හමුවේ සාක්ෂි දෙමින් කියා සිටියේය. සිය සමාගම සම්බන්ධයෙන් නොමඟ යවන සුළු ආකාරයේ හෝ සාවද්‍ය වාර්තා පළ කළහොත් ඒ සම්බන්ධයෙන් "දැඩි ක්‍රියාමාර්ග" ගන්නා බවට අනතුරු අඟවමින් කේම්බ්‍රිජ් ඇනලිටිකා සමාගමේ නීතිවේදීන් බීබීසී ඇතුළු මාධ්‍ය ආයතන වෙත ලිපියක් යොමු කර ඇත. මේ අතර ෆේස්බුක් සමාගම වෙත විවෘත ලිපියක් යොමු කරන ශ්‍රී ලංකාවේ සිවිල්, කාන්තා සහ තරුණ සංවිධාන 13 ක් ලිංගිකත්වය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, සමකාමී සහ සංක්‍රාන්ති ලිංගිකයන් ඇතුලු ජනකොටස්වලට එරෙහි ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන මෙන්ම වෛරී භාෂාව යොදාගන්නා ෆේස්බුක් පිටු ගැන කරන පැමිණිලි සම්බන්ධයෙන් සමාගමෙන් පළවන මන්දගාමී ප්‍රතිචාරය පිළිබඳ කනස්සල්ල පළ කර තිබුණි.

විශේෂයෙන්ම සිංහල භාෂාවෙන් පළ කෙරෙන ෆේස්බුක් පිටු පිළිබඳ උදාහරණ සහිතව අවධානය පළ කරන ඉහත කී සංවිධාන, සිංහල භාෂාවෙන් පළකෙරෙන එවැනි ෆේස්බුක් පිටු අධීක්ෂණය පිණිස කෙතරම් පිරිසක් පත්කරනු ලැබ තිබෙන්නේද යන්න සහ ඔවුන් සේවය කරන්නේ කුමන ස්ථානයකද සහ ඔවුන්ගේ ලිංගිකත්වය අනාවරණය කරන මෙන්ද ආයතනයෙන් ඉල්ලීමක් කරයි.

# දරුවන්ට WhatsApp තහනම්

(බී.බී.සී. සිංහල පුවත්)

යුරෝපා සංගමයට අයත් රටවල වෙසෙන වයස අවුරුදු දාසයට අඩු දරුවන් සිය පණිවුඩ හුවමාරු ජාලය භාවිත කිරීම තහනම් කිරීමට WhatsApp ජාලය කටයුතු කරමින් සිටී. වයස අවුරුදු දහතුනට අඩු දරුවන්ට දැනටමත් WhatsApp පණිවුඩ හුවමාරු ජාලය භාවිත කිරීමට අවසර නැත. එහෙත් දත්තවල පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් යුරෝපා සංගමය ලබන මැයි මාසයේ නව විධිවිධාන ක්‍රියාවට නැගීමට පෙර සිය නීති සංශෝධනය කිරීමට 'වට්ස්ඇප්' ජාලය සූදානම් වෙයි. එහෙත් යුරෝපය හැර ලොව පුරා සියලු රටවල් සම්බන්ධයෙන් අවුරුදු 13 වයස් සීමාව සංශෝධනය කිරීමේ සැලසුමක් නැත. වට්ස්ඇප්, ෆෙස්බුක් සමාගම සතු ජනප්‍රිය ක්ෂණික පණිවුඩ හුවමාරු ජාලයකි. ඉදිරි සති කීපය තුළ නව කොන්දේසි හඳුන්වා දෙන විට සිය වයස තහවුරු කරන මෙන් ග්‍රාහකයන්ට දැනුම්දීම WhatsApp ජාලයේ සැලසුම වී ඇත. එහෙත් නව වයස් සීමාව ක්‍රියාත්මක කරන්නේ කෙලෙසද යන්න ප්‍රකාශයට පත්කර නැත.

1 වන පිටුවෙන්

## නිවාස වෙළඳපොළ....

GTA හි නිවාස වෙළඳපොළෙහි වර්තමානයෙහි දක්නට ඇති මිල පහත වැටීම දෙස බැලීමේදී විශාලතම වාර්ෂික මිල පහත වැටීම සිදුවී ඇත්තේ යෝර්ක් පළාතෙහි (York Region) දේපළවල බව පැහැදිලි වේ.

මෙම තත්ත්වය පිළිබඳව අදහස් දක්වන TREB වෙළඳපළ විශ්ලේෂණය පිළිබඳ අධ්‍යක්ෂ ජේසන් මර්සර් පවසන්නේ, නිවාස මිල යම් තරමකට අඩු වී ඇතත් නිවසක් මිල දී ගැනීමේදී සපුරාගත යුතු වෙනත් තත්ත්වයන් නිසා ඉදිරියේදී කොන්ඩොමිනියම් වැනි අඩු මිල නිවාස මිල ගණන් ඉහළ යා හැකි බවයි.

මේ වන විට නිවාස වෙළඳපොළෙහි පවතින අවිනිශ්චිතභාවය ජූනි පැවැත්වෙන ඔන්ටාරියෝ මැතිවරණයේද තීරණාත්මක සාධකයක් හෙයින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස සියලු පක්ෂ වෙතින් TREB ඉල්ලීමක් කොට ඇත. වත්මන් ලිබරල් රජය විසින් පසුගිය වසරේ අප්‍රේල් මාසයේ සිට දේපළ වෙළඳපොළ තුළ ක්‍රියාත්මක කර ඇති ක්‍රියාමාර්ග (පදිංචියක් නොමැති නිවාස සඳහා බදු අයකිරීම - vacant properties tax, නේවාසික නොවන්නන් මිල දී ගන්නා දේපළ සඳහා බදු අයකිරීම- non resident speculation tax වැනි) සම්බන්ධයෙන් නැවතත් සිතා බැලිය යුතු බව බොහෝ දෙනෙකුගේ අදහසයි.

එසේම මේ වසර ආරම්භයේදී ෆෙඩරල් රජය විසින් නිවාස උගස් ණය සම්බන්ධයෙන්ද විවිධ පියවර රැසක් ගැනුණු අතර එහිදී පොලී අනුපාතයන් ඉහළ දැමීමත් ණයක් ගැනීමේදී සොයා බැලෙන යෝග්‍යතා මට්ටම් ඉහළ දැමීමත් සිදුකෙරුණි. ඊට සමගාමීව ආතති පරීක්ෂණයද හඳුන්වා දෙනු ලැබුණි. මෙම ආතති පරීක්ෂාව අනාරක්ෂිත ණය (සියයට 20 ට වැඩි මුල් ගෙවීමක් (down payment) කරන පුද්ගලයන්) සඳහාද සිදුකිරීම නිසා තත්ත්වය තවත් ව්‍යාකූල විය.

මේ පිළිබඳව අදහස් දක්වන ටොරොන්ටෝ දේපළ වෙළඳාම් මණ්ඩලයේ සභාපති ටිම් සිරියනෝස් පවසන්නේ, දේපළ වෙළඳපොළ තුළ මතුවෙමින් පවතින දුෂ්කරතා අඩුකර ගැනීම සඳහා ඊළඟ පියවරේදී දේපළ ගනුදෙනු සිදුකරන ජනතාවට බදු සහන ලබා දිය යුතු බවයි. විශේෂයෙන්ම ඉඩම් පැවරීමේ බද්ද, පළාත් හා ටොරොන්ටෝ ඉඩම් පැවරීමේ බද්ද සඳහා සහනයක් ලබාදිය යුතු බව ඔහුගේ අදහසයි. එසේම ටොරොන්ටෝහි දේපළ වෙළඳාම හා ටොරොන්ටෝ ආර්ථිකය අතර ඇති සෘජු සබඳතාවත් ටොරොන්ටෝහි ආර්ථිකය ඔන්ටාරියෝ පළාතට වැදගත් වන ආකාරයත් සලකා බලා ටොරොන්ටෝ ඉඩම් පැවරීමේ බදු වැඩි කිරීමේදී ඒ සඳහා පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගත යුතු බව තම විශ්වාසය බව සභාපතිවරයාගේ අදහසයි.

# පිළිකා රෝගීන්ට මරු කැඳවූ පරිගණක දෝෂය

2009 වසරේ සිට 2018 වසරේ මුල් කාලය තෙක් බ්‍රිතාන්‍යයේ පියයුරු පිළිකා වැළඳුණු කාන්තාවන් 270 දෙනෙකු අකාලයේ මිය ගොස් ඇත්තේ පරිගණක මගින් සිදුවූ අතපසු වීමකින් බව බ්‍රිතාන්‍ය රජය අනාවරණය කොට සිටී. එක්සත් රාජධානියේ සෞඛ්‍ය ලේකම් ජෙරමි හන්ට් විසින් පසුගියදා මේ අසමර්ථතාව පිළිබඳ නිවේදනය නිකුත් කරනු ලැබුණි.

එහි සඳහන් වූයේ ඉහත කාල සීමාව ඇතුළත කාන්තාවන් 450,000 කට පමණ පියයුරු පිළිකා නිවාරණය සඳහා යවන අවසන් කැඳවුම් ලිපි නොලැබී ඇති බවයි. මෙය පරිගණක දෝෂයක් ලෙස දක්වා ඇති අතර ඒ පිළිබඳව ස්වාධීන පරීක්ෂණයක් කැඳවා ඇති බවද ඔහු පවසා සිටී.

මෙම කාලය ඇතුළත පියයුරු පිළිකා සෑදී මියගිය කාන්තාවන් පිළිබඳ සමීක්ෂණය කරද්දී ඉන් 270 දෙනෙකුට අවසන් නිවාරණ ලිපි ලැබී නොතිබුණු බව හෙළිදරව් වී ඇත. එම කාන්තාවන් 50-70 ත් අතර වයස් කාණ්ඩයේ පසුවූවන් වන බවත් මෙම අතපසු වීම සිදුනොවුණේ නම් ප්‍රතිකාර ලබාගැනීම තුළින් දීර්ඝ කාලයක් ජීවත් වීමට ඔවුන්ට හැකියාව තිබුණු බවත් රජය පවසයි. සිදුවූ අවාසනාවන්ත තත්ත්වය සම්බන්ධයෙන් රජය බලවත් කණගාටුව පළ කරන බව සෞඛ්‍ය ලේකම්වරයා පාර්ලිමේන්තුවේදී පවසා තිබුණි.




**OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL) • VANCOUVER: 604 771 0026 (Sunny)**

**CALGARY: 403 971 6721 (SAMAN) • WINNIPEG: 204 800 2364 (MANGALIKA) • ALBERTA : 403 971 6721 (SAMAN)**

**Trico Maritime Customer Services & Warehouses in Sri Lanka**

**HEAD OFFICE**
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000

**COLOMBO WAREHOUSE**
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000

**KURUNEGALA WAREHOUSE**
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967

**GALLE WAREHOUSE**
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841

Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Intersection: Markham Road/Nashdene Road

Tel: 413 335 8800
Fax: 416 335 8848

email: info@tricomaritime.ca
www.tricomaritime.ca

# 'බුද්ධ' යනු බුදුරජාණන් වහන්සේද?



■ ලලීන්ද්‍ර සන්නස්ගම

"'බුද්ධ' යනුවෙන් අදහස් කරන්නේ කවුද?" වරක් බුදුරජාණන් වහන්සේගෙන්ම මෙම පැනය ඇසූ එක්තරා මානවයකු "ඔබ දෙවියෙක්ද? මනුෂ්‍යයෙක්ද? යක්ෂයෙක්ද? ගාන්ධර්වයෙක්ද?" යනාදී ප්‍රශ්න ඇසුවේය. උන්වහන්සේ ඒ සියල්ලටම "නැත" යන පිළිතුර දුන් සේක. බොහෝ නූතන විචාරකයන් බුදුන්වහන්සේ 'අසිරිමත් මනුෂ්‍යයෙකු' ලෙස හඳුන්වා දෙයි. නමුත්, උන්වහන්සේම තමන්වහන්සේ මනුෂ්‍යයකු නොවන බව දේශනා කර ඇත. එසේ නම් උන්වහන්සේ කවරෙක්ද? 'ඕඝතරණා සූත්‍රයේ' තමන් වහන්සේ 'ගැලවුම්කරුවකු' නොවන බව ප්‍රකාශ කළ බුදුරජාණන් වහන්සේ 'මග පෙන්වන්නෙක්' පමණක් බවත් දේශනා කර ඇත.

බුදුරජාණන් වහන්සේ සහ මනුෂ්‍යයන් අතර සබඳතාවය කදිමට පැහැදිලි කරන නෙළුම් මලේ උපමාව මෙහිදී වැදගත්ය. එම උපමාවට අනුව මනුෂ්‍ය සමාජය නමැති නෙළුම් විලේ ඉපදුන උන්වහන්සේ මනුෂ්‍යයන් අතරින් උසස්තත්ත්වයකට පත්ව ඇත. එය මඩේ හැදෙන නෙළුම මඩෙන් ඉහළට එසවී පිපී සුවඳවත් වන්නා සේය. මේ නිසා බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ පසු තවදුරටත් මනුෂ්‍යයකු නොවේ. එම තත්ත්වය "බුද්ධ" ලෙසම හැඳින්වේ. මේ "බුද්ධ" යනුවෙන් අදහස් කරන්නා කවරෙක්ද? නව අරහාදී බුදුගුණ වැල "සම්මා සම්බුද්ධ ලෙස අදහස් කරන්නේ" දත යුතු සියලු දේවල් තමන් විසින්ම අවබෝධ කරගත් තැනැත්තා යන අදහසෙන්ය. "බුද්ධ" යන සංකල්පීය පුද්ගලයකු ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම සාකච්ඡා වූ බව උපනිෂද් ග්‍රන්ථවලින් පැහැදිලි වෙයි. මේ නිසා තත්කාලීන භාරතීය ආගමික ප්‍රබෝධය විසින් බුද්ධ යන තැනැත්තා පහළ වනතුරු බලා සිටියේය. මේ සමාජගත වූ බුද්ධ නමැති සංකල්පීය පුද්ගලයා එදිනෙදා ව්‍යවහාරයට ගැලපෙන ලෙස සම්මත ලෝකයට ගලපා සිද්ධාර්ථ ගෞතමයන් සඳහා සංඥා නාමයක් ලෙසත් (බුද්ධ යන්න) ව්‍යවහාර කර ඇත. සුදත්ත සිටුතුමා " බුද්ධ" වචනය ඇසීමෙන් ප්‍රීතියට පැමිණ එම රාත්‍රියේම සීත වනයේ සිටි සිද්ධාර්ථ ගෞතම උතුමාණන් සොයා ඇවිද ගොස් ඇත. මේ නිසා "බුද්ධ" යනුවෙන් එදිනෙදා ව්‍යවහාරයට ගෙන ඇත්තේ පුද්ගලයකු හැඳින්වීමටයි.

සම්මත ලෝකය තුළ "බුද්ධ" යනුවෙන් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ හැඳින්වුවද "පරමාර්ථ" දේශනාවේදී ඊට එකහෙළාම වෙනස් අදහසකින් "බුද්ධ" යන වචනය භාවිත කර ඇති සේක.

"යමෙක් ධර්මය දකීද, හෙතෙම මා දකින්නේය" යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කර ඇති සේක. මෙහි අරුත වන්නේ ලෙයින් මසින් හැදුන සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ බාහිර රූපකාය ඇත්ත වශයෙන්ම "බුදුන්" නොවීමයි. මෙහි සරල අදහස "බුද්ධ" යනුවෙන් හඳුන්වන්නේ වාස්තවික යමක් නොවන බවයි. මේ නිසා බුද්ධ ලෙස අදහස් කරන දේ ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැකගත නොහැක. සංජානනය නොවේ. බුදුන් වහන්සේම පරමාර්ථ දේශනාවේදී භෞතික වශයෙන් ඉන්ද්‍රිය ගෝචර වන දෙය බුද්ධ නොවන බවට දේශනා කර ඇත. වක්කලී නමැති එක්තරා භික්ෂූන් වහන්සේ කෙනෙකු ගෞතමයන් වහන්සේ දෙස බලා සිටීම පුරුද්දක් කරගෙන තිබිණි. බුදු සිරුර දෙස බලා මහා සතුටක් ලැබූ උන්වහන්සේට "දිරා යන ජරාවට පත්වන යමක් දෙස බලා සිටින බව" බුදුන් වහන්සේම අවබෝධ කර දී ඇත.

ධම්ම පදට්ඨ කතාවේ ධම්මාරාම වත්ථුවේ මෙය වඩාත් නිරවුල් ලෙස ප්‍රකාශ කර ඇත. එනම්, "මල්, සුවඳ දුම් ආදියෙන් මට පුද පූජා පවත්වන්නෝ නියම ලෙසින් මා පුදන්නෝ නොවෙති. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නෝ නියම ලෙසින්ම මා පුදන්නෝ වෙති." මේ ප්‍රකාශය නිසා පිළිම වන්දනාව බුදුදහම තුළ කිසිම වටිනාකමක් නැති නිස්සාර දෙයක් බව පසක් වෙයි.

බුදුන් යනුවෙන් අදහස් කරන්නේද පුද්ගලයකු නොවේ නම් එලෙස සලකා පිළිමයකට පුද පූජා කිරීම සැබවින්ම ප්‍රඥාව පදනම් කර ගත්තක් නොවේ. එය කුසලය වඩන්නක් නොවේ. "බුද්ධ" යනුවෙන් අදහස් කරන්නේ උන්වහන්සේ දෙසූ ධර්මයටයි. ධර්මය වාස්තවික නැත. එහි යම් යම් අංග ක්‍රියාවට නඟන්නාගේ අද්දැකීම් බවට පත්වෙයි. එසේ නම් ධර්මය කුමක්ද?

මේ පිළිබඳ නිරවුල් සටහනක් කරමින් බුදුන් වහන්සේම මෙසේ ප්‍රකාශ කළේය. "යමෙක් පටිච්ච සමුප්පාදය දකීද, හේ ධර්මය දකී". පටිච්ච සමුප්පාදය යනු ධර්මයයි. ධර්මය දැකීම බුදුන් දැකීමකි. එබැවින් "බුද්ධ" යන්නෙහි අරුත පටිච්ච සමුප්පාදය නොවේද? එය තමා විසින්ම අවබෝධ කරගත් නිසා සිද්ධාර්ථ ගෞතම බෝසතාණන්ද "බුද්ධ" ලෙස හැඳින්වීය. මේ නිසා බුද්ධ යනුවෙන් අදහස් කර ඇත්තේ පටිච්ච සමුප්පාද ධර්මයයි. එනම් ලෝකයේ යථා ස්වභාවය පිළිබඳ මූලික තත්ත්වය පිළිබඳ අවබෝධයයි.

එබැවින් "බුද්ධ" යනු ගතික ප්‍රපංචයක් මිස වාස්තවික යමක් නොවේ. තවත් ලෙසකින් කිවහොත් "බුද්ධ" යනුවෙන් අදහස් කර ඇත්තේ මහා ප්‍රඥාව, මහා කරුණාව ආදී ගුණ සමුදායක් මිස, උත්තරීතර ශාස්තෘවරයකුගේ බාහිර පෙනුම නොවේ.

මේ දැනුම නිසා බුදුන් ජීවමාන කාලයේත් අශෝක අධිරාජ්‍යයාගේ කාලය දක්වාත් පිළිමයකින් බුදුන් දැකීමට ලාමක ප්‍රයත්නයක් දැරුවේ නැත. ඒ යුගයේ මිනිස්සුන් බුදුන් දැකීමට උන්වහන්සේ අනුදත් පිළිවෙත් පුරා ඇත. එහි ප්‍රතිඵලය බුදු දහම ප්‍රායෝගික භාවිතයේ පැවැතීමයි.

නමුත් බුදු පිළිමය හඳුන්වාදීමත් සමග ඒ සියල්ල වෙනස් විය. ඉමහත් වෙහෙසක් දරා ලබන අධ්‍යාත්මික තත්ත්වයක් වෙනුවට කලා කෘතියකින් ඕනෑම අයකුට " බුද්ධ" දැකගත හැකි විය. මෙහි අනිවාර්ය ප්‍රතිඵලය එම පිළිමයට ජීවමාන බුදුන්ට කරන ගරුසැලකිලි දක්වා ආමිස පූජා පැවැත්වීමයි. ඊට සමාන්තරව බුදුන් වහන්සේ අනුදත් වදාළ දර්ශනය හැදෑරීමට සහ ඊට අනුගතව ජීවත්වීම අතහැර දමන ලදී. බුදු පිළිමය නිපදවූයේ නැතිනම් මිනිසුන් උන්වහන්සේ අනුදත් වදාළ ධර්මය ගවේෂණයට මීට වඩා පෙළඹෙන්නට ඉඩ තිබිණි. බුදු පිළිමය අභියස සිටින මිනිසා බුදුන් ලෙස වරදවා හඳුනාගන්නේ පිළිමයකි. ගස්, ගල්, පිළිම ආදිය වන්දනා කරන්නේ බියපත් ජනයා මිස ශ්‍රද්ධාවන්ත බෞද්ධයා නොවේ.

පිළිමය තුළින් අප දකින්නේ කලාකරුවකු අඹන ලද බුදුන්ය. එම නිසා එම පිළිමය අඹන කලාකරුවාගේ පෞද්ගලික දෘෂ්ඨිය පිළිමයට නැගීමේ හැකියාව මත අපගේ බුදුන් දැකීම තීරණය වෙයි. මේ හැකියාව කොතෙක් ඉහළ අගයක් ගත්තද බුද්ධ ලෙස අදහස් කරන දේ හැබෑවටම ඉන්ද්‍රිය ගෝචර ලෙස පෙන්විය නොහැකිය. මේ නිසාම ජේතවනාරාමයේ බුදුන් වහන්සේ නොමැති අවස්ථාවල පැමිණෙන බැතිමතුන්ට බුදුන්වහන්සේ වෙනුවට වන්දනා කිරීමට බෝධි වෘක්ෂයක් යෝජනා කර ඇති සේක. මේ අනුව ශ්‍රීමා බෝධි අංකුරයක් ගෙන්වා රෝපණය කර ඇත. එය ආනන්ද බෝධි රෝපණයයි. බෝධියක් දුටුවිට සංකේතයක් සේ සිතා වන්දනා කරන බැවින් ඇස පිනවීමක් සිදු නොවේ. මේ නිසා බෝධිය බුදුන්ගේ සංකේතයක් ලෙස සලකා වඳින ශ්‍රද්ධාවන්තයා බුදුන් පිළිබඳ වැරදි වැටහීම් ඇති කර නොගනී.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර 250 කට පසුව බිහිවූ සාංචි ස්ථූප කැටයම්වල පවා බුද්ධ රූප නැත. එම කැටයම්වල බුදුන් වහන්සේ යෙදිය යුතු තැන්වල උන්වහන්සේගේ සංකේතයක් ලෙස බෝධිය, ශ්‍රී පතුල්, වජ්‍රාසනය, ධර්මචක්‍රය ආදිය භාවිත කර ඇත. නමුත් ක්‍රි.ව. 1 වැනි සියවස වයඹ දිග ඉන්දියාවේ පෙෂවෝර් අගනුවර කනිෂ්ක අධිරාජයා බුද්ධ රූපය මනුෂ්‍ය විලාශයෙන් කැටයමට නැගීය. කනිෂ්ක මහායාන බෞද්ධයෙකි. ඔහු ගේ රන් කාසිවල ග්‍රීක අක්ෂරවලින් "බුද්ධෝ" යන පාඨය සහිතව රශ්මිමාලා සහිතව බුදුන්ගේ රූපය කැටයම් කර ඇත. ඔහුගේ අනුග්‍රහය ලබා ග්‍රීක ශිල්පීන් නිර්මාණය කළ බුද්ධ රූප ග්‍රීක දෙවි දේවතාවන්ට සමානය. පසු කාලයේ මථුරා නගරයේද බුද්ධ රූප කැටයම් කිරීමට පටන් ගත්තේය. ඒවා ඉන්දු නිම්න යුගයේ සිට පැවත එන ඉන්දීය කලා ශෛලියක සංවර්ධනයකි. එහි උච්චතම දියුණුව ලෙස ක්‍රි. ව. හතරවන සියවසදී සාරානාත් වැනි උසස් බුදුපිළිම නිර්මාණය විය. ලංකාවේද එබඳු උසස් පිළිම ලෙස තොලුවිල සමාධි පිළිමය, සමාධි පිළිමය, පන්කුලිය හිඳි පිළිමය ආදී පිළිම හැඳින්විය හැකිය. ඒවා පුද්ගලයකුගේ බාහිර සිරුර පෙන්වීමට වඩා අධ්‍යාත්මික ගුණධර්ම ඉස්මතු කිරීමට ගත් විශිෂ්ට කලා කුසලතාවකි. ඒවා කලාකරුවකුගේ උසස් ප්‍රතිභාවක් විය හැකිය. නමුත් "බුද්ධ" ලෙස අදහස් කරන්නේ වාස්තවිකව පෙන්විය හැකි යමක් නොවේ.


SPECIAL RATE
ON RENEWALS
&
INSURED
MORTGAGES
ANTON DHARMASEELAN
MORTGAGE AGENT
LIC #M14000425
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST FOR ALL
YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS - BEST RATES
ANTON@MYHOMEMLS.CA
MORTGAGE ALLIANCE
FAX: 1-800-566-3068

**කැනේඩියානු සංචාරයක මතකය .....**

# රොකී කඳුවැටිය වටේ රවුමක් - 1



## Cosmic කිරණ පර්යේෂණ කළ Sulphur කඳු මුදුනේ සිට Banff වන පෙතට හෙලන බැල්මක් .......

■ සටහන සහ සේයා රූ
**අනුරුද්ධ වැලිගමගේ**

1957 සිට 1978 දක්වා කොස්මික් කිරණ අහසට මුදාහරිමින් පර්යේෂණ කල මධ්‍යස්ථානයක් කැනඩාවේ රොකී කදුවැටියේ සල්පර් කඳු මුදුනේ මීටර් 2283 ක් උසින් පිහිටා තිබුණා. සෞරග්‍රහ මණ්ඩලයේ ශක්තීන්, තාරකා සහ නොයෙකුත් තොරතුරු මේ හරහා ලෝකය එකතු කරගෙන තිබෙනවා. විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයේදී මේ පරිශ්‍රය කැනඩාවට පමණක් නොව මුළු ලෝකයටම වැදගත් වෙනවා. අප අද සංචාරයක මතකය තුළින් පැමිණ සිටින්නේ බැන්ෆ් නගරයටයි.



අපි රොකී කඳු වටා යන ගමන පටන් ගත්තේ ටොරොන්ටෝවේ සිට කැල්ගරි නගරය දක්වා කල ගුවන් ගමනකින් පසුවයි. කැල්ගරි ගුවන් තොටුපළේදී කුළියට ගත් අර්ධ උපයෝගීතා වාහනය (semi utility vehicle) දිනකට අසීමිත දුරක් ධාවනය කළ හැකි වීම අපට පහසුවක් වුණා. කැනඩාවේදී අත්විඳින්නට වන එක් දිශාවකට පමණක් යාමේදී අය කරන අධික ගාස්තුවෙන් මිදෙන්නට අපට රථය ආපසු කැල්ගරිවලට බාර දිය යුතුව තිබුණා. (නොඑසේ නම් අපට වැන්කූවර් නගරය දක්වා ගොස් එය භාරදිය හැකිව තිබුණා) එනිසා අපේ ගමන් මග කැල්ගරි සිට බැන්ෆ් දක්වාත්, බැන්ෆ් සිට ජැස්පර් දක්වාත්, ජැස්පර් සිට කැම්ලුප්ස් දක්වාත්, කැම්ලුප්ස්වලින් ආපසු කැල්ගරි දක්වාත් අදියර කිහිපයකින් කළ එකක් වුණා. මුළු ගමනේ දුර ප්‍රමාණය කිලෝමීටර් 1500 කට වඩා වැඩි එකක්.

ගමනේ ආරම්භය ලෙස අප ගියේ කැල්ගරි නගරයේ සිට කිලෝමීටර් 127 ක් දුරින් පිහිටි බැන්ෆ් නගරයටයි. ලංකාවේ කඳුකරය බලන්නට යන බොහෝදෙනා නුවරඑළියට ගොස් හැරී එන්නා සේ කැනඩාවේ බොහෝ දෙනෙක් රොකී කඳු බලනවා කියා කරන්නේ බැන්ෆ්වලට ගොස් ආපසු ඒමයි. සැබැවින්ම බැන්ෆ් මනස්කාන්ත පරිසර පද්ධතියක්. හිමෙන් පිරුණු කඳු, හරිත පැහැයෙන් පිරි ඉමක් නොපෙනෙන වනාන්තරය නෙතට රසඳුනක් මවන්නේ චිත්‍ර දහස් ගණනක් මවමින්. අප කලින් සඳහන් කළ සල්පර් කඳු මුදුන පිහිටියේ බැන්ෆ් නගරය අසලමයි. අප එහි ගිය අගෝස්තු මුල් සතියේ පවා එහි දැඩි උණුසුමක් දැනුණේ නැහැ.

### බැන්ෆ් - Banff

අද වනවිට බැන්ෆ් කැනඩාවේ අනෙකුත් නගර සමග සම්බන්ධ වන්නේ Trans Canada අධිවේගී මාර්ගය හරහා. එහෙත් අද මෙන් වාහන බහුල නොවූ අතීතයේදී බැන්ෆ්, කැනඩාවේ පමණක් නොව යුරෝපීයන්ගේ පවා ජනාදරය දිනූ දුම්රියෙන් සම්බන්ධ වූ සංචාරක නගරයක්. එදා කැනේඩියන් පැසිෆික් දුම්රියෙන් පැමිණි බොහෝ දෙනා නවාතැන් ගත්තේ 1887 දී ඇමෙරිකානු ගෘහ නිර්මාණ ශිල්පී Bruce Price විසින් නිර්මාණය කල Banff Springs Hotel තුළ. 1939 දී හයවන ජෝර්ජ් රජතුමා සහ එළිසබෙත් රැජන මෙහි සංචාරය කර තිබෙනවා. බෝ නදිය අසබඩ, බෝ දිය ඇල්ල අසල මේ හෝටලය ඇත්තේ මනරම් පරිසරයක් තුළයි. ඉතා අධික මිල ගණනකට කාමර වෙන් වන මෙහි ආලින්දය බලන්නට වටින තැනක්.

එදා මෙන්ම අදත් රොකී කඳුකරයේ අසිරිය සැබැවින්ම විඳින්නට නම් භාවිත කළ යුත්තේ දුම්රියයි. බැන්ෆ් සිට වැන්කූවර් දක්වා යන අතිසුඛෝපභෝගී දුම්රිය ගමන ඉතා ඉහළ ලන්සුවකට අලෙවි වන්නේ ඒ නිසා. බැන්ෆ් දුම්රිය ස්ථානයත්, පෞද්ගලික දේපළක් වන බැන්ෆ් ස්ප්‍රින්ග් හෝටලයත් මේ වනවිට ජාතික වස්තූන් ලෙස නම් කර ඇත්තේ එහි ඇති වටිනාකම නිසා.

### සල්පර් කන්ද - Sulphur Mountain



අප මේ ලිපිය ආරම්භයේදී සඳහන් කළ සල්පර් කන්දට නැගුනේ බැන්ෆ් ගොන්ඩෝලාවක නැගී. ගොන්ඩෝලාව ටිකෙන් ටික ඉහළට යද්දී විදි පරිසරයේ අපූර්වත්වය වචනවලින් විස්තර කළ නොහැකි එකක්.

ගොන්ඩෝලාව නවත්වන කඳු මුදුන් මධ්‍යස්ථානය ඔබට කෑම බීම සහ සියලු පහසුකම් ඇති තැනක්. එතැන් සිට කිලෝමීටරයක් තරම් දුර ඇවිදින මංපෙත නැරඹුම් අට්ටාල සහිතව සකස් කර තිබෙන්නේ ඔබට රොකී කඳුවල සුවඳ, පාට සහ සීතල හොඳට දැනෙන විදිහටයි. ඔබේ කැමරා, ජංගම දුරකථනවලට අමතර මතක පතක් (Memory Card) ගෙන යාම සුදුසු වන්නේ ඔබ නිසැකවම වීඩියෝ සහ සේයා රූ එකතු කර ගන්නා නිසා.



දුරක සිට තමන්ගේ සහ කණ්ඩායමේ සංචාරක අත්දැකීම මතකයේ රඳවා ගන්නට selfie stick ගෙනයාම වඩාත් සුදුසුයි.

මේ කඳු මුදුනේ සිට බලන විට කැනඩාවේ පළමු සහ ජනප්‍රියම වනෝද්‍යානය වන බැන්ෆ් වන පියසේ අසිරිය මැනැවින් විඳින්නට පුළුවන්.

### Cave & Basin ඓතිහාසික පරිශ්‍රය

1885 දී කැනේඩියන් පැසිෆික් දුම්රිය සේවයේ



සේවකයින් තිදෙනෙකුට දකින්නට ලැබුණේ සල්පර් කදු අතර ගුහාවක ඇති උණු දිය ජලාශයක්. 1914 සිට 1994 දක්වා පොදු නාන තටාකයක් ලෙස මහජනතාවට පහසුකම් සැලසූ එය අද දිය නෑම සඳහා වසා දමා තිබෙනවා. එහෙත් උමග දිගේ ගොස් අපූරු අත්දැකීමක් ලබන්නටත්, යුනෙස්කෝව විසින් ප්‍රකාශයට පත් කළ ලෝක උරුමය බලන්නටත් ඔබට බාධාවක් නැහැ. බැන්ෆ්හිදී ඔබට උණු දිය උල්පතක පහස ලබන්නට නම් කිලෝමීටර 5 ක පමණ දුරින් පිහිටි Banff Upper hot springs වෙත යන්නට පුළුවන්. එහි පාලිත උෂ්ණත්වය සෙල්සියස් අංශක 38 ක්.

මේ ප්‍රදේශයේ ඇති සංචාරයට සුදුසු තවත් තැන්

- මිනවන්කා විල - Lake Minnewanka
- ටූ ජැක් විල - Two Jack Lake
- කැනේඩියානු රොකී ප්‍රදේශය පිළිබඳ වයිට් කෞතුකාගාරය - Whyte Museum of Canadian Rockies
- සහෝදරියන් තිදෙනා කදු මුදුන් - Three sisters mountain

**ඔබේ ඉල්ලීම් සහ තොරතුරු සදහා අලුත් විද්‍යුත් ලිපිනයක් පටන් ගත්තා. dasatha.sancharayakamathakaya@gmail.com විස්තර සදහා ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.**

**මීළග කලාපයෙන් බැන්ෆ් සිට ජැස්පර් වෙත යන ගමනේ අසිරිය විඳින්න අප හා එක්වන්න.**

# වචනයෙහි බලය

**පුංචි දුවේ පුතේ මේ වෙසක් මාසයයි. ඒ නිසා අද අපි පන්සිය පනස් ජාතක පොතේ එන ජාතක කතාවක් කියවමු.**

ඈත අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් සිටියා. ඒ රජතුමාගේ මංගල හස්ථි රාජයා වුණේ මහිලාමුඛ නම් ඇතෙක්. මේ මහිලාමුඛ ඇතා ඉතාමත් ලස්සනයි. බොහොම ප්‍රතාපවත්. ඒ වගේම කරුණාවන්තයි. කීකරුයි. හැමෝටම ආදරෙයි. මහිලාමුඛගේ මේ ගතිගුණ නිසා රජතුමාත් ඇත්ගොව්වාත් අනික් හැමෝමත් මේ හස්ථියාට හරිම ආදරෙයි.

එක්තරා දවසක සොරකමේ ගිය සොරු රැළක් මහිලාමුඛ ඇතා සිටි ඇත්ගාල සමීපයට ආවා. එදා රෑ සිදුකරන්නට සැලසුම් කරන සොරකමක් ගැනයි ඔවුන් කතා කළේ. ඒ කතාබහ හරිම දරුණුයි. රළුයි.

"අද රෑට අපි ඒ සිටුමැදුරට හොරෙන්ම ඇතුළු වෙනවා. එතනට ගියාම උඹලා කිසිම දේකට බයවෙන්න එපා. හසුවන හැම වටිනා දෙයක්ම සොරා ගනිල්ලා. අපේ හඬ ඇසී කවුරුන් හෝ ආවොත් දෙසැරයක් නොසිතා පහර දීපල්ලා. කඩුවලින් කපා කොටාපල්ලා. වද දීපල්ලා...." මෙන්න මේ වගේ දේවල් තමයි සොරුන් කතා කළේ.

මහිලාමුඛ ඇතා මේ කතාබහ අසා සිටියා. මින් පෙර කිසිම දාක ඒ වගේ නපුරු කතාබස් මහිල මුඛට ඇසී නෑ. ඒ නිසා ඇත් රාජයා තවත් හොඳින් සවන් දුන්නා. නරක, නපුරු වචන ගොඩාක් ඇතාගේ කණට වැටුණා.

දෙවෙනි දවසෙත් මේ සොර නඩය ඇත් ගාල අසළට ආවා. ඇවිත් පුරුදු විදියටම සැර පරුෂ දේවල් කතා කළා.

"ගහපල්ලා, මරපල්ලා, කොටපල්ලා...." වගේ හිංසා, පීඩා සිදුකරන වචනම තමයි ඒ අය නිතරම කියෙව්වේ.

මේ සියල්ල අසාගෙන සිටිය ඇතාට මෙහෙම හිතුණා.

"මේ අය හරිම දරුණුයි. ඒ වගේම හරිම නිර්භීතයි වගේ. කිසිම කෙනෙකුට භය නෑ. ඒත් හැමෝම මේ අයට භයයි. මාත් මේ වගේ නපුරු වෙන්න ඕන. එහෙම වුණාම හැමෝවම භය කරගන්න පුළුවන්. මාත් හැමෝටම පහර දෙන්න ඕන"

පසුදාට පහන් වුණා. එදින උදෑසනත් සුපුරුදු පරිදි ඇතාගේ කටයුතු සිදුකිරීමට ඇත්ගොව්වා මහිලාමුඛ ඇතා ළඟට ආවා. ඒත් මහිලාමුඛ වෙනදා වගේ යහපත් විදියට හැසිරුණේ නෑ. මහා රෞද්‍ර විලාශයකින් ඇත් ගොව්වාට පහර දුන්නා. ඇත් ගොව්වා ඔසවා වීසි කළා. බිම දමා පෑගුවා.

මහිලාමුඛ විසින් ඇත්ගොව්වාට පහර දෙන හැටි දැක්ක ඇත්ගාලේ සිටි අනිත් ඇත්ගොව්වන් දුව ආවා. ඒත් වියරු වැටී සිටි මහිලාමුඛගෙන් ඇත් ගොව්වාව ගලවා ගැනීමට ඒ අයට හැකි වුණේ නෑ. ඇතා ඒ අයටත් පහර දීමට දිව ආවා. හැමෝම හිස් ලූ ලූ අත දිව ගියා. මර බියෙන් විළාප තිව්වා.

ඇත්ගාලේ සිදුවන මේ කලබලය රජතුමාටත් සැළ වුණා. ඉතාමත් කීකරුව හිටපු තමන්ගේ මංගල ඇත් රාජයා මහිලාමුඛ මේ වගේ හැසිරෙන්නේ ඇයිද යන්න රජතුමාට විශාල ප්‍රශ්නයක් වුණා.

රජු අමාත්‍යවරුන් කැඳවූවා. ඇතා පිළිබඳ විමසුවා.

"කිසිමදාක නපුරු නරක දඩබ්බර අකීකරු හැසිරීමක් නොපෙන්වපු මහිලාමුඛට කුමක් සිදුවීද? වහාම මේ පිළිබඳව සොයා බැලිය යුතුයි" රජු පැවසුවා.

රාජකීය සත්ව වෛද්‍යවරයාත් කැඳවූවා. ඇතාව පරීක්ෂා කරන ලෙස අණ කළා.

වෛද්‍යවරයා ඇතා අසළට ගොස් පරීක්ෂා කළා. ඇතා ශාරීරිකව ඉතාමත් නිරෝගීව සිටින බව තේරුම් ගත්තා. ඒ නිසා මේ වෙනස කිසියම් බාහිර බලපෑමක් නිසා සිදුවන්නට ඇති බව තීරණය කළා. එය රජතුමාට සැළ කර සිටියා.

"දේවයන් වහන්ස, මංගල හස්ථියාට කිසිම ශාරීරික රෝගයක් ඇති බව පෙනෙන්නේ නෑ. මෙතෙක් කලක් ඉතාමත් හොඳින් සිටි ඇතාගේ වෙනස් වීමට බාහිරින් යම් දෙයක් සිදුවී තිබිය හැකියි. ඒ නිසා අපි ඒ ගැන සොයා බලමු"

රජු වහාම ප්‍රධාන අමාත්‍යවරයා කැඳවූවා.

"ඇමතිය, මේ ගැන වහාම සොයා බලනු" රජු අණ කළා.

ඇතාගේ වෙනසට හේතුව සොයාගැනීමට ඇත්ගාල වටා රැකවල් තර කිරීමට අමාත්‍යවරයා කටයුතු කළා. සේවා කණ්ඩායම් දිවා - රෑ දෙකේම ඇත්ගාල අසළ රැක සිටියා.

ඇතා නපුරු වීමට හේතුව වුණු සොරු මේ බව දැනගෙන සිටියේ නෑ. දවස් දෙකකට පසු සොර රැළ නැවතත් ඇත්ගාල අසළට ආවා. ඇවිත් සුපුරුදු විදියටම නපුරු දුෂ්ට වචන කතා කළා. අපරාධ සැලසුම් කළා. මේ සියල්ල ඇතා හොඳින් අසා සිටින බව රැකවල් ලා සිටි පිරිස දැක්කා. ඔවුන් මේ බව අමාත්‍යවරයාට දැනුම් දුන්නා. අමාත්‍යවරයා එය රජතුමාට දැනුම් දුන්නා.

"දේවයන් වහන්ස, මංගල හස්ථියා නපුරු වුණේ නපුරු සොරු කණ්ඩායමක් නිසා. ඔවුන් ඇත්ගාල අසළ හිඳිමින් සැර පරුෂ කතා පවසනවා. ඇතා ඒවා අසා සිටීම නිසයි වෙනස් වුණේ. ඇතාට යහපත් වචන අසන්නට සැලැස්විය යුතුයි"

රජතුමා වහාම ඒ සඳහා පියවර ගත්තා. සිල්වත් බමුණන් ගෙන්වා ඇත්ගාල සමීපයේ රඳවා ප්‍රිය වචන, යහපත් දේවල් කතා කළා.

"අපි හැමෝම සමග හොඳින් ජීවත් විය යුතුයි. කිසිවෙකුට හිංසා පීඩා කරදර නොකළ යුතුයි. ඒවා පව් සිදුවන දේවල්. හැමෝටම දයාව, කරුණාව, ආදරය දැක්වුවහොත් අපිටත් හැමෝම ආදරය කරනවා. අපේ නිර්භීත කම විය යුත්තේ එයයි. අපි වැරදි දේවල්, නරක, නපුරු දේවල් කිරීමට බිය විය යුතුයි. හොඳ දේවල් වැඩි වැඩියෙන් කළ යුතුයි"

මේ වගේ කතා සෑම මොහොතකම ඇතාට ඇසෙන්නට සැලැස්වූවා. තමා හැසිරෙන විදියේ තියෙන වැරැද්ද ටිකෙන් ටික ඇතාට තේරුණා.

"මම මොනතරම් වැරදි දෙයක්ද කළේ... හැමදාම මාව ආදරයෙන් බලාගත්ත ඇත්ගොව්වාට මම පහර දුන්නා. මම ලොකු පවක් කර ගත්තා. මම නැවතත් කිසිමදාක ඒ වගේ වැරදි කරන්නේ නෑ. මෙතැන් පටන් මම යහපත් වෙනවා. ඉස්සර වගේ හැමෝටම ආදරය කරනවා"

මේ විදියට කල්පනා කළ ඇතාගේ හැසිරීම නැවතත් හොඳ පැත්තට හැරුණා. සන්සුන් වුණා. කීකරු වුණා. කිසිම කෙනෙකුට වරදක් කළේ නෑ.

## බුද්ධ දිවාකරයාණෝ

**පාරමිතා බල පූජිත පූරිත**
**බුද්ධ දිවාකරයාණෝ**
**වෙසක් පොහෝ දින දිනූ සේක ලොව**
**බුද්ධ දිවාකරයාණෝ**

**සැනසෙමු පුද දී මුනි සිරිපාදේ**
**පිහිනමු පිහිනමු බුදු ගුණ මුහුදේ**

**පාරමිතා බල.....**

**සනසා මුළු ලොව නිවන් ලබා දී**
**පුණ්‍ය මහෝදධි ශාන්ත සමාධි**
**සනරාමර ගුරු ලෝක ශිවංකර**
**බුද්ධ දිවාකරයාණෝ**

**මාර පරාජය කළ මුනිඳුන්ගේ**
**කරුණා සීතල මෙත් දහරා**
**ගලා බසී තුන් ලෝ තලයේ දුක්**
**ගිමන් නිවා අම සෙත සාදා**

**බුදු රැස් කැටි වී නැඟි ආලෝකේ**
**පිස යයි දුකඳුරු මුළු තුන් ලෝකේ**

**පාරමිතා බල.....**

**පද පෙළ: ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ**
**ස්වර රචනය : පණ්ඩිත් අමරදේව සූරීන්**
**ගායනය: පණ්ඩිත් අමරදේව, නන්දා මාලනී අතුළු පිරිස**
**(මෙය 'රන්මුතු දූව' චිත්‍රපටයෙහි එන ගීතයකි)**



# මෙහෙ හිටියත් ලංකාවට හිතැති ඩෙන්සිල් පී. අබේවර්ධන

**ලෝකය දෙස විමසිලිමත්ව බැලීමේදී කලාව හා සම්බන්ධ නොවන කිසිම දෙයක් එහි නොමැති බව ඔබට වැටහෙනු ඇත. එය එසේ නම්, මෙලොව වසන සියල්ලන්ම කලාව පිළිබඳ යම්තාක් වූ අවබෝධයකින් පසුවන බවත් සෑම අයෙකු තුළම කිසියම් හෝ කලා කුසලතාවක් ඇති බවත් අප පිළිගත යුත්තකි. එසේ ලොව සෑම දෙයක්ම කලාවකට අනුව සිදුවුවත් කලාව සියල්ලන් තුළම ඉබේම පිහිටියත් එම කලාත්මක හැකියාවන් අදාළ ආකාරයට යොදාගත හැකි මිනිසුන් මෙලොව කෙතරම් අල්පද? අද අප 'දසත' සංවාදය විවර කරන්නේ, තම කලා හැකියාවන් ලොවට පෙන්වූ ස්වල්පයක් මිනිසුන් අතර සිටින තවත් එක් දීරිය මිනිසෙකු පිළිබඳව කතා කිරීමටයි. ඔහු නමින් ඩෙන්සිල් පී. අබේවර්ධන. ටොරොන්ටෝවේ අප සමග ජීවත් වන මේ නිහතමානි කලාකරුවා, සුන්දර මිනිසා කොතෙක් හමු වී තිබුණත් ඉසිඹුවක් ගෙන ඔහු සමග කතා කිරීමට අවස්ථාවක් මින් පෙර අපට ලැබී නොතිබුණි. එම අඩුව පුරවා ගනිමින් ශ්‍රී ලංකාවේ චිත්‍රපට කලා ලොවෙහි විවිධ අංශයන් සම්බන්ධයෙන් ඇසූ පිරූ තැන් ඇති ඔහු සමග මඳක් කතා කිරීමට අපි මෙසේ ඉඩකඩ විවර කරගතිමු.**

**එක අහසයි එක පොළොවයි**
**එක හිරු සඳු දෙන එළියයි**
**නොයෙකුත් වෙස් මුහුණු බැඳන්**
**නැටුවත් හැමතැනම ඉඳන්**
**ඉරණමකට පෑගිය හැකි**
**ජීවිතයම ජෝගියකි.....**

**Q ප්‍රේමකීර්ති ද අල්විස්ගේ පද රචනයකට වික්ටර් රත්නායක, ෆ්‍රෙඩී සිල්වා, සී. ඩී. ෆොන්සේකා සහ වින්සන්ට් ප්‍රේමසිරි යන ගායන ශිල්පීන් ගායනා කරන මේ ගීතය, ඔබ අධ්‍යක්ෂණය කළ '24 පැය' චිත්‍රපටයේ එන්නක්. අපේ මේ කතාබහ ඔබ කලා ජීවිතය ආරම්භ කරපු ඒ ඈත අතීතයෙන්ම පටන් ගමු.**

ඔව්... ඇත්තටම හරිම සුන්දර අතීතයක්. මේ කැනඩාවේ කොපමණ සැප සම්පත් තිබුණත් මේක නොවෙයි මගේ ජීවිතය. කලාවත්, කලා ලෝකයත් අතහැරලා ගෙවන මේ ජීවිතේ ඉඳගෙන අතීතානුස්මරණය කරනකොට ඒ කාලය කොපමණ කාර්යබහුලව සහ එලක් ඇති ලෙසත් ගෙවුනද කියා සිතෙනවා. මෙහෙ ජීවිතය කාර්යබහුල නෑ කියල නෙවෙයි මම කියන්නෙ. ඒත් ඉතිං මෙහෙදි අපි කාර්යබහුල වෙන්නෙ අපිට අදාළ විෂයයන්වලින් නෙවෙයිනෙ. ඒ නිසා ඒක ආත්ම තෘප්තියක් ලබාගන්න පුළුවන් තත්ත්වයක් නෙවෙයි. මේ අවුරුද්දෙ මැයි මාසෙ 18 වෙනිදාට මට අවුරුදු 70 ක් වෙනවා. ඇත්තටම මම ගෙව්ව මේ ජීවිත කාලය තුළදි මම කලාවේ රැඳිල හිටිය කාලයේ සිනමා කලාවට මගෙන් සිද්ධ වුණු සේවාව ගැන සිහිපත් වෙද්දි මට තියෙන්නෙ පුදුමාකාර සතුටක්. ඒත් මෙහෙට වෙලා සිටීමෙන් මගෙන් අතහැරුණු කාලය ගැන තියෙන්නෙ කියන්න බැරි තරම් වේදනාවක්.

**Q ඔබගේ උපන්දිනය ළඟ බව මෙතෙක් අප දැන සිටියේ නෑ... ඩෙන්සිල් අබේවර්ධන මහතාණෙනි, මැයි මස 18 වෙනි දින සමරණ ඔබේ 70 වෙනි උපන් දිනය සඳහා දසත පාඨක සෑම වෙනුවෙන් සුභ පැතීමට අප මෙය අවස්ථාවක් කර ගන්නවා. ඔබට චිර ජීවනය සැලසේවා. නිදුක් නිරෝගි සුවය සහිතව ගතවන සෑම මොහොතක්ම සතුටින් සිටීමට ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.**

බොහොම ස්තුතියි. ඇත්තටම මේ විදියට කතා කිරීමට ලැබීමම මටත් සතුටක්.

**Q අපි කැමතියි ඔබේ ගම් පළාත, පාසල ගැන තොරතුරු ටිකක් දැනගන්න**

මම ඉපදිලා තියෙන්නෙ කොට්ටාවෙ. ඒ වුණත් මම දන්න කියන කාලෙ ඉඳලම හිටියේ කොළඹ. මගේ පාසල වුණේ කොළඹ කේරි කොලේජ් එක. අපි ඉස්කෝලෙ යන කාලෙ පාසලේ දැන් ඔය තියෙන විශාල ගොඩනැගිලි හැදිල තිබුණෙ නෑ. කලා කටයුතු කරමින් ගොඩනැගිලි අරමුදලක් ආරම්භ කරන්න අපියි මුලික වුණේ. ඒ සඳහා අපි විවිධ ප්‍රසංග වගේ නොයෙක් දේවල් සංවිධානය කළා. කලාව කියන දේ මගේ ඔළුවට ආවෙත් ඒ වැඩ කටයුතු නිසාම තමයි. ඇත්තටම ඒ කාලෙ මට ආශාව තිබුණෙ රඟපාන්න. නළුවෙක් වෙන්න. ඒ වුණාට මගේ අම්මා හරිම අකමැතියි මම රඟපෑම්වලට, කලා වැඩවලට යනවට...

**Q ඒ ඇයි..?**

වෙන හේතුවක් නිසා නොවෙයි. මම අධ්‍යාපනය කඩාකප්පල් කර ගනීවි කියලා. මගේ අම්මා රෝහල් සේවයේ සිටි ප්‍රධාන හෙද නිලධාරිනියක්. ඇයට ඕන වුණේම මාව අධ්‍යාපනය අතින් ඉහළට යවන්න. අම්මා සේවය කළ රෝහලේ තිබුණ ගෙවන වාට්ටුවට වරින් වර කලාවට සම්බන්ධ නොයෙක් තරාතිරම්වල කලා කාරයෝ ප්‍රතිකාර සඳහා ඇතුළත් වුණා. මේ අය ආවම අම්මා ගෙදර ඇවිත් කියනවා. මාත් සමහර වෙලාවට ගිහින් ඒ අය එක්ක කතාබහ කරනවා. මාවත් කලා වැඩවලට සම්බන්ධ කරගන්න කියන ඉල්ලීමත් ඇතැම් අයට කියනවා. ඒත් ඒ අය අපේ අම්මගෙ තිබුණු අකමැත්ත දැනගෙන හිටියා. ඒ නිසා අම්මට ඉහළින් ගිහින් මාව ඒ වැඩවලට ගන්න කැමති වුණේ නෑ.

**Q ගෙදරින් මෙතරම් අකමැති වෙනකොට ඔබ අදහස අතහැර ගන්න ඇති....**

මොන.... කොළු කාලෙනෙ... ඔළුවට ඇවිල්ලා තිබුණු නළුවෙක් වීමේ අදහස ලේසියෙන් අතහැර ගන්න බැරි වුණා. ගෙදරට කිය කියා ඉන්න ගියොත් කවදාවත් ඒ අරමුණට යන්න බැරි වෙන බවත් තේරුණා. ඒ නිසා මම ගෙදරට හොරෙන් ගිහින් ටවර්හෝල් නාට්‍ය කණ්ඩායමට සම්බන්ධ වෙලා නීතිඥ ජෝන් ද සිල්වාගේ 'රාමායණය' නාට්‍යයේ රඟපෑවා. ඒකෙ භරත කුමාරයගේ චරිතය තමයි මම කළේ. මට මතක හැටියට ඒ 1966 වගේ කාලෙ.

**Q ගෙදරට හොරෙන් ගිහින් කළ රඟපෑම ඉදිරියට ගෙන ගියේ කොහොමද?**

මම රාමායණයේ රඟපාන කාලෙදි ඒ නාට්‍යයේ හිටපු පිරිසක් එකතු වෙලා අලුත් නාට්‍යයක් කළා. ඒකෙ රඟපෑමට ඔවුන් මාවත් එකතු කරගත්තා. ඒත් මේ කණ්ඩායම නාට්‍යයක් කරන්න පටන් ගත්තට එහි බරපැන දරාගැනීමට තරම් වත්කමක් ඒ අයට තිබුණේ නෑ. ඒ නාට්‍ය වේදිකාගත කරගැනීම සඳහා ශාලාවක් ලබාගැනීමට වත් මේ අයට සල්ලි තිබුණෙ නෑ. ඒත් නාට්‍යයේ පුහුණුවීම් කටයුතු ඇතුළු සියලුම දේවල් ඉතාමත් උනන්දුවෙන් අපි හැමෝම සිදු කළා. අන්තිමේදී මේ නාට්‍යය එළිදැක්වුයේ වෙසක් දවසක නොමිලයේමයි. එදා මේ නාට්‍ය බලන්න ලයනල් ගුණසේකර පැමිණ සිටියා. ඔහු නාට්‍ය ලියන, අධ්‍යක්ෂණය කරන කෙනෙක්. එතනදි මාව දැකලා ඔහුගේ නාට්‍යයකට මාව සම්බන්ධ කරගත්තා. ඒ නාට්‍යයේ නම 'හෙට පායන හිරු'. මම ඒ නාට්‍යයේ රඟපාන අතර ඔහු මාත් සමග හොඳටම හිතවත් වුණා. එතනදි වේදිකා නාට්‍ය කලාව ගැන හුඟාක් දේවල් මම ඉගෙන ගත්තා. ඇතැම් අවස්ථාවලදී එම නාට්‍යයේ අධ්‍යක්ෂණ කටයුතු පවා මගේ අතින් සිදුවුණා. ඔහු රඟපාපු චරිතයත් මට රඟපෑමට සිදුවුණා. 'හෙට පායන හිරු' දේශපාලනය තේමා කරගත් නාට්‍යයක්. වාමාංශික පැත්තට බරයි. අපිත් ඒ කාලෙ වාමාංශික අදහස් එක්ක ජීවත් වුණේ. ඉතින් ඒ නාට්‍යයෙන් පස්සෙ මට දිගටම ලැබුණේ ඒ වගේ චරිත. ෆ්‍රැන්සිස් වන්නිආරච්චි විසින් කරපු 'කළොත් තර්ජන නොවේ මර්ධන' කියන නාට්‍යය කළේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයොත් එක්කමයි. ඒකත් දේශපාලන පසුබිමක් සහිත නාට්‍යයක්. තවත් එවැනිම නාට්‍යයක් තමයි 'අපිට පුතේ මගක් ඇතේ'. එහි මම රඟපෑවේ ස්වාමි කෙනෙකුට. ඒ නාට්‍යයේ කතා තේමාව ඒ කාලෙ තිබුණු රජය කොතරම් නොරිස්සුවාද කිව්වොත් ඒ නාට්‍යය සම්පූර්ණයෙන්ම තහනම් කළා. මට මතකයි ඒ නාට්‍යය තහනම් වුණාම එහි අධ්‍යක්ෂවරයා ඒකෙන් පොතක් ගහලා ප්‍රසිද්ධ කළා.



පුවත්පතක පළවූ නවකතාවකට තම රුව එක් කළ තරුණ ඩෙන්සිල් අබේවර්ධන



'හෙට අලුත් දවසක්' නාට්‍යයේ ප්‍රවීණ සංගීතඥ රෝහණ වීරසිංහයන් රඟ පෑ අවස්ථාවක්

**Q මේ අතර ඔබ වේදිකා නාට්‍යය අධ්‍යක්ෂණයටත් එක් වෙනවා නේද?**

ඔව්... මේ විදියට කලා කටයුතුවල නිරත වී සිටින ගමන්ම මාත් නාට්‍යයක් අධ්‍යක්ෂණය කිරීමට හිතුවා. 'හෙට අලුත් දවසක්' මගේ නාට්‍යයේ නම. එහි පිටපත ලිව්වෙත් මමයි. අධ්‍යක්ෂණය කළෙත් මමයි. මට ඕන වුණේ මේ නාට්‍යය ප්‍රේක්ෂකයින් බහුතරයක් වෙතට ගෙන යන්න. ඒ සඳහා මම ඒ කාලෙ හිටිය ප්‍රසිද්ධ නළු නිළියන් යොදාගත්තා. මොකද අපි කොපමණ හොඳ නිර්මාණයක් කළත් අපිව දන්නෙ නැති නිසා මිනිස්සු නාට්‍ය බලන්න එන්නෙ නෑ. අලුතින් ක්ෂේත්‍රයට එන අය තමන්ගෙ නිර්මාණ සඳහා ප්‍රේක්ෂකයන් ගෙන්වා ගන්න ප්‍රයෝග, උපක්‍රම භාවිත කළ යුතුයි. මගේ නාට්‍ය සඳහා ඒ කාලෙ වේදිකාවේ ප්‍රබල චරිතයක් වෙලා හිටිය මර්සි එදිරිසිංහ වැනි නිළියක් සම්බන්ධ කරගත්තේ ඒ අරමුණින්. ආර්. ආර්. සමරකෝන් වැනි ප්‍රසිද්ධ නාට්‍යවේදීන් මගේ නාට්‍යය හරියට අගය කරමින් කතා කළා. 'හෙට අලුත් දවසක්' නාට්‍යයේ නිර්මාණාත්මක පැත්ත වගේම ඒ සඳහා යොදාගත්ත තාක්ෂණ ක්‍රමවේදයන්, විශේෂයෙන්ම ආලෝකකරණය වගේ දේවල් ඉතාමත් ඉහළින් අගය කෙරුණා. නාට්‍යකරණය පිළිබඳ පුහුණුවෙන අයට එම නාට්‍යය නරඹන ලෙස බොහෝ විචාරකයින් පවසා තිබුණා. ඒ නාට්‍යයත් එක්ක අමතක නොවන සිදුවීම් රාශියකුත් තියෙනවා.

**Q අපේ පාඨකයිනුත් කැමති වෙයි ඒ සිදුවීම් දැනගන්න...**

හොඳයි.... මම එක සිද්ධියක් කියන්නම්. මේ නාට්‍යයේ දර්ශන වාරයක් තිබුණුදාට පහුවදා තමයි මැතිණිගෙ ආණ්ඩුව බලයට පත්වුණේ. අපි ඒ වෙනකොට නාට්‍යයේ ප්‍රචාරක කටයුතු කරමින් සිටියේ. එදා අපි නාට්‍ය පෙන්වන පළාතේ විතරක් නෙවෙයි මුළු රට පුරාම යන බස් රථවල 'හෙට අලුත් දවසක්' කියන පෝස්ටරය ගැහුවා. ඒ වෙලාවෙ තිබුණු වාතාවරණයත් එක්ක බැලූ බැල්මට මේක නාට්‍යයක ප්‍රචාරක පෝස්ටරයක් කියල කාටවත් හිතෙන්නෙ නෑ. මැතිණිය පත්වීමත් එක්කම මාව පොලිස් අත්අඩංගුවට ගත්තා. එතකොට මම කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක්. පස්සෙ අපේ පක්ෂයේ අය පීටර් කෙනමන්ට කතා කරලා ඔහු මැතිණියට කතා කරල සෑහෙන කරුණු පැහැදිලි කරල දීල තමයි මාව නිදහස් කරගත්තෙ.

**Q 'හෙට අලුත් දවසක්' නාට්‍යයෙන් පස්සෙ තවත් නිර්මාණ කළාද?**

ඔව්... ඒ ලැබුව පන්නරයත් එක්ක මම දිගටම නාට්‍යකරණයේ යෙදුණා. 'ලෝක ලෙඩක්', 'බිඳුණු බඳුනක්'... මේ නාට්‍ය දෙක කෙටි නාට්‍ය විදියට නිෂ්පාදනය වුණේ. ඒ නිසා දෙකම එකට වේදිකාගත වුණා. මේ නාට්‍යයේත් මට අමතක නොවන විශේෂ සිදුවීමක් තියෙනවා. ලංකාවේ ප්‍රධාන පෙළේ පුවත්පතක් වන සිළුමිණ පත්තරයේ මුල් පිටුවේ 'බිඳුණු බඳුනක්' නාට්‍යයේ ඡායාරූපයක් පළ වුණා. පුවත්පත් ඉතිහාසයේ සිනමා පුවත්පත්වල හැරුණු විට ප්‍රවෘත්ති පුවත්පතක වේදිකා නාට්‍යයක ඡායාරූපයක් මුල් පිටුවේ පළවුණු ප්‍රථම අවස්ථාව එයයි. මම තව කළා 'දෙයියො මමයි' කියල නාට්‍යයක්. එතෙක් කල් සමාජ ගැටලු ගැන වැඩියෙන් කතා වුණු නාට්‍ය කරපු මම 'දෙයියො මමයි' නාට්‍යය කළේ හාස්‍යෝත්පාදක තේමාවක් සහිතවයි.

**Q මේ විදියට වේදිකා නාට්‍ය ලෝකයේ හිටිය ඔබ සිනමාවට ආවෙ කොහොමද?**

ඇත්තටම මේ විදියට නාට්‍ය වැඩවල යෙදෙන කොට ඒ සම්බන්ධව ඇති සියලුම කලා කටයුතුවල යෙදෙන්න ලොකු ආශාවක් ඇති වුණා. ඊට පස්සෙ ඒ සම්බන්ධයෙන් සොයා බලමින් තව තවත් අංශවලට යොමු වුණා. මම මුලින්ම සිනමාවට සම්බන්ධ වුණේ කේ. ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතාගේ චිත්‍රපටවල වැඩ කරමින්. එතනදි මම සිනමාවේ තාක්ෂණ පැත්ත සම්බන්ධව ගොඩක් දේවල් ඉගෙන ගත්තා. හැම අංශයකම මම වැඩ කළා. මට ඒ කාලෙදි චිත්‍රපටයක තිරපිටපතක් continuity කරන විදිය මුල සිට අග දක්වාම ඉතාමත් පිළිවෙළට ලියන්න ලොකු හැකියාවක් තිබුණා. සෑම පුංචි තැනක්ම හොඳින් පැහිදිලි වෙන විදියට ඒක මම කළා. ඒ විදියට ලිව්ව පිටපතක් දැනුත් මගේ ළඟ තියෙනවා. මේ පිටපත බොහෝ දෙනෙකු අගය කළා. ඇතැම් අය ඒ වගේ දෙයක් කරන්නෙ කොහොමද කියන දේ මම කළ දේවල් බලා ඉගෙන ගත්තා.

**Q ඔබ ෆිල්ම් ලොකේෂන් ආයතනයටත් සම්බන්ධ වෙනවා නේද?**

ඔව්. මම කැනඩාවට එනතුරුම ෆිල්ම් ලොකේෂන් හා වැඩකටයුතු කරනවා. එහි casting director හැටියටයි මම කටයුතු කළේ. ඒ කාලෙ ලංකාව ඇතුළේ නිෂ්පාදන කටයුතු කළ සියලුම විදෙස් චිත්‍රපටවලට අවශ්‍ය ශ්‍රී ලාංකික නළු නිළියන් තේරීම සම්බන්ධ කටයුතු සිදුකළේ මමයි. ලෝක ප්‍රසිද්ධ චිත්‍රපට රැසකට මේ හරහා එකතු වන්න මට අවස්ථාව ලැබුණා. Crystal Book, The Street Child, Good Marriages, Friends for Life, Shadow of the Cobra, Ordinary Magic, Spooks, The Iron Triangle ඇතුළු විදෙස් චිත්‍රපට හා ටී.වී. කතාංග ගණනාවක මම කාස්ටින් ඩිරෙක්ටර් හැටියට වැඩ කරල තියෙනවා. ඇත්තටම ලෝක සිනමාවේ බොහෝ දෙනෙකු හමුවීමට අවස්ථාව මේ නිසා මට ලැබිල තියෙනවා.

**Q මේ ලැබුව පෙරහුරුව අප මේ සාකච්ඡාව ආරම්භයේදී සඳහන් කළ ඔබේම චිත්‍රපටය '24 පැය' නිර්මාණය කිරීමේදී යොදාගත්තෙ කොහොමද?**

ඇත්තටම මගේ ජීවිතයේ ලොකුම අවස්ථාව වුණේ මගේම චිත්‍රපටයක් නිර්මාණය කිරීමට ලැබීමයි. '24 පැය' චිත්‍රපටය සිංහල සිනමාවේ 426 වෙනි චිත්‍රපටය විදියට 1979 දී තිරගත වුණා. මේ චිත්‍රපටයේ කතාව, තිර රචනය, දෙබස් හා අධ්‍යක්ෂණය සියල්ල කළේ මමයි. ගාමිණී එදිරිසිංහ එහි නිෂ්පාදකවරයා ලෙස කටයුතු කළා. ජෝ අබේවික්‍රම, නීටා ප්‍රනාන්දු, පතිරාජ එල්. එස්. දයානන්ද, සිරිල් වික්‍රමගේ, සෝමසිරි දෙහිපිටිය, රෙක්ස් කොඩිප්පිලි, ෆ්‍රෙඩී සිල්වා, දෙනවක හාමිනේ, පර්ල් වාසුදේවි, ආනන්ද වික්‍රමගේ, ධර්මදාස කුරුප්පු, උපාලි අත්තනායක ඇතුළු සිනමාවේ ප්‍රවීණයෝ රැසක් රඟපෑවා. කැමරා අධක්ෂණය ඩොනල්ඩ් කරුණාරත්න විසිනුත් සංගීත අධක්ෂණය වින්සන්ට් ප්‍රේමසිරි විසිනුත් සිදු කළා. පණ්ඩිත් අමරදේව, වික්ටර් රත්නායක, එච්. ආර්. ජෝතිපාල, ඇන්ජලින් ගුණතිලක, මිල්ටන් පෙරේරා, මර්වින් පෙරේරා, ෆ්‍රෙඩී සිල්වා වගේ ප්‍රවීණ ගායක ගායිකාවන් රැසක් ගී ගැයුවා.

**Q '24 පැය' චිත්‍රපටයෙන් පස්සෙ ඔබ චිත්‍රපට හැදුවෙ නැද්ද?**

මා දැන් ඔබට පෙන්නුව ඉතාමත් පිළිවෙළට continuity ලියපු තිර පිටපත, 'රතු රෝස' තමයි මා දෙවනුවට කරන්න සූදානම් වුණු චිත්‍රපටය. මා ඉතාමත් වෙහෙසක් අරන් එකින් එක, ඉතාමත් සූක්ෂ්මව, පිළිවෙළින් එම තිර පිටපත සකස් කළා. ඒ චිත්‍රපටයේ භාගයක් පමණ කැමරාගත කළා. ඒත් අතරමගදි ඇති වුණු ගැටලු කීපයක් නිසා එම චිත්‍රපටය නිමා කරගන්න ලැබුණෙ නෑ. රතු රෝස චිත්‍රපටයේ ටෝනි රණසිංහ, සුවිනීතා කෝන්ගහගේ, ස්වර්ණා මල්ලවආරච්චි, සමන් බොකලවෙල වගේ විශාල නළු නිළි පිරිසක් හිටියා. මම අදටත් කණගාටු වෙනවා ඒක ඉවර කරගන්න නොලැබුණු එක ගැන. ඒ චිත්‍රපටයේ වැඩ කටයුතු අතරමග නතර වුණාට පස්සෙ මම තවත් චිත්‍රපටයක් කරන්න හැදුවා. ඒක 'අහිමි සෙවණැලි'. ඇත්තටම ඒකෙත් මූලික කටයුතු කරල නළු නිළියන්ට අත්තිකාරම් මුදලුත් ගෙවල මුහුරත් උළෙලත් පැවැත්වුවා. ඒකට මම තෝරගෙන හිටියේ සනත් සහ සබීතා. ඒකේ නිෂ්පාදකවරයා වුණේ චන්ද්‍රන් රත්නම්. ඒත් කැනඩාවෙ පදිංචියට ඒමට ගත්ත හදිසි තීරණය නිසා ඒ චිත්‍රපටයේ වැඩත් නැවතුණා. ඒවා මගේ ජීවිතයේ සිදුවුණු ලොකු අතපසුවීම් වගේම අවාසනාවන්ත සිද්ධි විදියට පසුපසට හැරී බලද්දි මට දැනෙනවා.



**Q ඒ චිත්‍රපට දෙක මගහැරුණට නැවත අලුතෙන් චිත්‍රපටයක් කරන්න ඔබට පුළුවන්නෙ. කැනඩාවට ආවට පස්සෙ මේ රටත් අදාළ වෙන විදියේ ලස්සන නිර්මාණයක් කරන්න ඔබට හිතුනෙ නැද්ද?**

මම කැනඩාවට ආවේ 1994 දි. මෙහෙ පදිංචියට ඒමට ගත්ත තීරණය හරි එකක්ද කියා අදටත් මම හිතනවා. මම මුලිනුත් කිව්ව වගේ මගේ ජීවිතය තිබුණේ ලංකාවෙදි මම කළ වැඩකටයුතු එක්ක. ඔබ කිව්ව වගේ මෙහෙ ආවට පස්සෙ මෙහෙත් සම්බන්ධ කරගත්ත නිර්මාණයක් කරන්න ඕන කියන එක සෑහෙන්න හිතුණා. කතා තේමාවන් කිහිපයක්ම ඔලුවෙ තිබුණා. ඒත් මේ රටේ පවතින තත්ත්වයන් එක්ක ගැටෙමින්, සටන් කරමින් ජීවත් වෙනකොට ඒ දේවල් ටිකෙන් ටික පස්සට ගියා. ඇත්තටම ඒ වගේ දේකට නිදහස් වෙන්න තරම් කාල වේලාව හරිම අඩුයි මේ රටේදී. අනිත් එක එහෙම දේවල් මේ රටේදි ආවට ගියාට කරන්න බෑ. කලාව හා සම්බන්ධ යූනියන්වලට බැඳී කටයුතු කළ යුතුයි. අවශ්‍ය බලපත්‍ර ලබාගත යුතුයි. ඒවා කිරීමට කාලය, මුදල්, ශ්‍රමය යහමින් වැය කරන්න ඕන. දැන් නම් මම නිවාඩු පාඩුවේ ඉන්නවා. ඒත් මගේ අසනීප තත්ත්වය දැන් ඒ වගේ දේවල්වල යෙදීමට තියෙන අවස්ථාව අහුරනවා. ඒත් මගේ හිතේ නොයෙක් අදහස් තියෙනවා. ඉඩක් ලැබුණොත් ඒවා කිරීමට තාමත් ලොකු ආශාවකින් මම ඉන්නෙ.

**Q මීට වසර කීපයකට පෙර ඔබට සිදුකළ හෘද සැත්කම අතරතුර සිදුවූ අනතුර පිළිබඳව අපට දැනගන්නට ලැබුණා. ඇත්තටම ඒ සිදුවීම වූ මුල් වකවානුට වඩා ඔබ දැන් හුඟාක් නිරෝගීව පසුවන බව අපට පේනවා...**

අපොයි ඔව්... මම දැන් හුඟාක් නිරෝගියි. ඇත්තටම ඒක මේ රටේ කලාතුරකින් සිදුවන කණගාටුදායක සිදුවීමක්. ඒ ශල්‍යකර්මයෙන් පස්සෙ මාව දැඩි ලෙස ඔත්පල වුණා. මගේ ශරීරයේ පැත්තක් පන නැති වුණා. ඇස් පෙනීම ඉතාමත්ම දුර්වල වුණා. කතා කරගන්න බැරි වුණා. මතක ශක්තිය, කල්පනාව නැතිව ගියා. ඇත්තටම මේ දේවල් මට සිද්ධ වෙලා තියෙන බව මම දැනගත්තෙත් පහුවෙලා. ඒ තරමටම මගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහිලයි තිබුණේ. ඇත්තටම අද මම මේ විදියට කතාබහ කරල ඉන්න එක ගැන මුලින්ම මම කෘතගුණ පළ කරන්න ඕන මගේ බිරිඳ නීලා ට. මගේ රෝගී තත්ත්වය ගැන තේරුම් අරන් මාව ගොඩ ගැනීමට ඇය පුදුම ඉවසීමකින් දැඩි වෙහෙසක් කැප කිරීමක් කළා. දැන් නම් මට හුඟාක් සුවයි. ඇස්වල පෙනීම සෑහෙන්න සාමාන්‍ය තත්ත්වයට පත්වෙලා. මට හැමවෙලේම හිතන්නෙ ඒ සිද්ධ වුණු දෙයින් පස්සෙ මම මේ තත්ත්වයෙන් පසුවීම ප්‍රාතිහාර්යයක් කියලයි. මාව අසනීප වුණු මොහොතේ පටන් අපේ විහාරස්ථානවල ස්වාමින්වහන්සේලාගේ සිට දන්න නොදන්න හැම කෙනෙක්ම මාව සුවපත් වෙන්න කියා ආශිර්වාද කළා. ඒ හැම දෙයක්ම නැවතත් ප්‍රකෘති තත්ත්වයට පත්වීමට මට බලපාන්න ඇති. ඒ හැමෝටම ස්තූති කරන්නත් මම මෙය අවස්ථාවක් කරගන්නවා.

**කාලය කෙමෙන් ඉක්ම ගොසිනි. ඉතින් අප දැන් නික්ම යා යුතුයි. ඩෙන්සිල් අබේවර්ධන මහතාණෙනි, ඔබ සමග ගත කළ සුළු කාලය තුළ ඔබ පිළිබඳවත් සිනමාව පිළිබඳවත් බොහෝ තොරතුරු අප දැනගත්තා. ඒ අතර ඔබ අතින්ම සෑදූ ප්‍රණීත තේ කෝප්පයක රස විඳීමටත් අපට අවස්ථාව ලැබුණා. මෙවැනි රසවත් අර්ථවත් හෝරා කිහිපයක් ගත කිරීමට ඔබ දුන් සහයෝගයට බෙහෙවින්ම ස්තූතියි. ඒ වගේම ඔබේ සෙවණැල්ල මෙන් නිරතුරුව ළඟින් සිටිමින් ඔබව සුවපත් කිරීමට වෙහෙසෙන අතර මෙම පිළිසඳර සඳහා මූලික සම්බන්ධීකරණ කටයුතු සිදුකළ ඔබගේ ප්‍රියාදර බිරිඳ නීලා අබේවර්ධන මහත්මියටත් දසත අප විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා.**



**70 වසරක දිවි ගමන තුළ ඔබ විසින් වේදිකාව, සිනමාව ඇතුළු සමස්ත කලාවට කළ සේවය පිළිබඳව අප නැවතත් ස්තූති පූර්වක ගෞරවය පිරිනමනවා. ඔබට නිදුක් නිරෝගීභාවය හා චිර ජීවනය සැලසේවා ! යි නැවත නැවතත් ප්‍රාර්ථනා කරනවා.**

**සාකච්ඡා කොට සටහන් කළේ**
**චමරි අබේසිංහ**

# කැනඩාව නම් උතුරු ඇමෙරිකානු රාජ්‍යය

■ ආනන්ද විජේසිංහ විසිනි

සිංහල භාෂාව කතා කරන එකම රට වූ අපේ සුන්දර, ආදරණීය මවුබිමෙන් බැහැර වැ විශ්වගෝලයේ ඉඳුරා මැ අනෙක් පැත්තේ පිහිටි, සුන්දරත්වයෙන් පමණක් නොවැ සත්කාරයෙන් ද අග්‍රගන්‍ය උතුරු අමෙරිකාවේ නොහොත් කැනඩාවේ පදිංචි අපේ පාඨක භවතුන්ගේ පහන්සංවේගය මෙන් මැ දැනුම වැඩුම පිණිස මෙවන් ලිපි පෙළක් පලකිරීම අපේ සංක්‍රමණික ජනසමාජයට ඉමහත් සේවයක් ඉටුකරන 'දසත' මාසික පුවත්පත ඉදිරිපත් වීම භාග්‍යයෙකි.

කැනඩාව පිළිබඳව අපේ මවුබසින් පළ වූ පොතක් මෙතෙක් මා දැක නැති හෙයින්ද මෙවැන්නක් කළොත් මැනවැයි අදහසක් පහළ විය. එබැවින්, කැනඩාවේ පුරවැසිභාව පූර්ව විභාගය ලිවීමට බලාපොරොත්තු වන පාඨක භවතුන්ට වුවද තරමක් හෝ ප්‍රයෝජනවත් විය හැකි අයුරින් මෙම ලිපි පෙළ ලිවීමට  උත්සාහ කරමි.

## විශාලත්වයෙන් දෙවැනි තැන

ලෝකයේ දෙවැනි විශාලතම රට වශයෙන් ගැනෙන කැනඩාව වූ කලි  ඇමෙරිකා මහාද්වීපයේ උත්තරාර්ධය වූ උතුරු ඇමෙරිකාව ලෙස හැඳින්වෙන රටවල් තුනෙන්  විශාලතම  රාජ්‍යයයි. අනෙක් අතට උතුරු ඇමෙරිකාව යනු පෘථිවියේ උත්තරාර්ධගෝලය තුළ පිහිටි මහාද්වීපය යැයිද කිව හැක. කෙසේවුවද, උතුරු ඇමෙරිකාව යනු කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය සහ මැක්සිකෝ යන රටවල් තුන (3) ය.

## ප්‍රාන්ත සහ අනුබද්ධිත ප්‍රදේශ

කැනඩාව ප්‍රාන්ත රාජ්‍ය 10 කින්ද මෙම සුවිසල් ෆෙඩරල් රාජ්‍යයට අනුබද්ධ එහෙත් රාජ්‍ය තාන්ත්‍රික නොවන තවත් ප්‍රදේශ (ටෙරිටරි) 3 කින්ද සමන්විතය. ප්‍රාන්ත දහය ෆෙඩරල් රජයෙන් එක එල්ලේම බලය ලබන අතර අනෙකුත් ප්‍රදේශ තුන සිය බලතල ලබන්නේ ව්‍යවස්ථාදායක ආඥා පනතිනි. (from the Constitution Act)

## ෆෙඩරල් ප්‍රාන්ත දහය (10)

ඇල්බර්ටා
බ්‍රිටිෂ් කොලොම්බියා
සශ්කැචුවාන්
මැනිටෝබා
ඔන්ටේරියෝ
කුබෙක්
නිව් බෲන්ස්වික්
නෝවා  ස්කෝෂියා
ප්‍රින්ස් එඩ්වර්ඩ් දිවයින
නිව්ෆෞන්ඩ්ලන්ඩ් හා ලැබ්‍ර්දෝරය

## අනුබද්ධ ප්‍රදේශ (ෆෙඩරල් ටෙරිටරිස්) තුන (3)

යුකෝන්
නුනවුට්
නොර්ත්වෙස්ට්  ටෙරිටරීස්

විශාලත්වයෙන් බටහිර යුරෝපය තරම් යැයි කියන නුනවුට්, කැනඩාවේ අඩුම ජනගහනයක් ඇති ප්‍රදේශයයි. සියයට අසූවක් පමණ (80%) ප්‍රංශ භාෂාව කථාකරන කූබෙක්හි රාජ්‍ය  භාෂාවද ප්‍රංශ වේ. ඉංග්‍රිසි දෙවැනි බසය.

මැනිටෝබා, සශ්කැච්වාන් සහ ඇල්බර්ටා යන  ප්‍රාන්ත තුන ලෝ ප්‍රකට සුවිසල් තණබිම් සහිත ප්‍රේරි-ප්‍රාන්ත යනුවෙන් හැඳින්වේ. අතිබහුල ලෙස ජනාකීර්ණ වූ ටොරොන්ටෝ සහ ජාතික අගනුවර වූ ඔටාවා යන නගරද්වය ඔන්ටේරියෝ ප්‍රාන්තයට අයත් ය.




# අසාමාන්‍ය ලෙස තමා ගැන වර්ණනා කිරීමත් එක්තරා රෝගයකි !



■ අමා රූසිරි සිත්මල් සුබසිංහ
(මානසික සෞඛ්‍ය උපදේශිකා)

මනෝවිද්‍යාත්මක විග්‍රහයට අනුව මනුෂ්‍යයන් එකිනෙකාට අසමසම වීම සඳහා පුද්ගල පෞරුෂය ගොඩ නැඟී ඇති ආකාරය බෙහෙවින් බලපානු ලබයි. එනම් සෑම පුද්ගලයකුටම තමාට ආවේණික වූ පුද්ගල විශේෂත්වයක් ඇත. විවිධ පුද්ගලයන් හැසිරෙන අකාරය, තීරණ ගන්නා ආකාරය මෙන්ම පිරිසක් සමඟ ක්‍රියාකරන ආකාරය යනාදිය විවිධ වන අතර, එකී විවිධත්වය සඳහා පුද්ගල පෞරුෂය (Presonality) සෘජු දායකත්වයක් දරයි.

පෞරුෂ අක්‍රමතාව - Personality disoder යනු පුද්ගල පෞරුෂය හා සබැඳි මානසික රෝගී තත්ත්වයකි. මේ රෝගී තත්ත්වය වෙනත් මානසික රෝග මෙන් නොව, හඳුනාගැනීමට පවා තරමක් අපහසු වන බව කිව යුතුය. හුදෙක් මිනිස් හැසිරීම හා එදිනෙදා ක්‍රියා කරන ආකාරය අනුව ඇතැමකු එම රෝගී තත්ත්වයට පත් වී ඇතැයි යන්න නිගමනය කළ හැකිය. පෞරුෂ අක්‍රමතා ප්‍රධාන වශයෙන් සයාකාර වන අතර, ඒ අතුරින් සමාජයේ පුද්ගලයන් තුළ බහුලව දැකිය හැකි Narcissistic Personality Disoder නමැති පෞරුෂ අක්‍රමතාව පිළිබඳව දැනුවත් වීම යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම උදෙසා දායක වනු ඇත.

Narcissistic Personlity Disoder නමැති මානසික රෝගයට ගොදුරුව සිටින පුද්ගලයෝ සැම විටම තමා උසස් යැයි සිතා කටයුතු කරති. අන් අය අවතක්සේරුවට ලක් කිරීමත්, තමා පිළිබඳව අධිතක්සේරුවකින් පසුවීමත් මොවුන් තුළ දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණයකි. සෑම විටම තමාට වඩා ඉහළින් කිසිවකු නොමැති යැයි සිතන ඔවුන් නිතර අන් අය සමඟ වාද කරගැනීමට සැබෑ හපනුන්ය.

පොදුවේ ඕනෑම පුද්ගලයකු තමා උසස් කොට දැක්වීමෙහි කිසිදු දොසක් නොමැති අතර එය උදාර චේතනාවක් යැයි කිව යුතුය. එහෙත් සෑම අවස්ථාවකම තමා පිළිබඳව අධිතක්සේරුවකින් පසුවීම හා අන් අය අවතක්සේරුවට ලක් කිරීමත්, තමා සර්වසම්පූර්ණ යැයි සිතා ක්‍රියාකිරීමත් මෙකී පෞරුෂ අක්‍රමතාවේ කැපී පෙනෙන ලක්ෂණයක් වේ.

මීට අමතරව මෙකී පුද්ගලයන් තම දක්ෂතා, ශක්තීන්, සාර්ථකත්වය යනාදිය පිළිබඳව අතිශයෝක්තියෙන් පුරසාරම් දෙඩීමට දැඩි රුචිකත්වයක් දක්වන අතර, තමා පිළිබඳව අන් අයගේ ප්‍රශංසා දැඩි ලෙස අපේක්ෂා කරති. තමා ඉතා සුවිශේෂී පුද්ගලයකු යැයි සිතන ඔවුහු අන් අයගේ ගෞරවය, කැමැත්ත නිතර බලාපොරොත්තු වෙති.

මේ පෞරුෂ අක්‍රමතාවට ගොදුරු වී සිටින්නන් අන් අයගේ අදහස් කිසිසේත් නොපිළිගන්නා අතර, ඔවුන් පවසන පරිදි සියල්ල විය යුතුය යන දැඩි මතයක එල්බ සිටිති. නායකත්වය පිළිබඳව කිසිදු අවබෝධයක් නොමැති වුවද, නායකත්වය අනෙකෙකු වෙත පැවරීමට කිසිසේත් ඉඩ නොදීම මොවුන්ගේ කැපී පෙනෙන ලක්ෂණයකි. තමා සියල්ල දන්නා බවත්, අන් අය තමාට වඩා දුර්වල බවත් තරයේ විශ්වාස නොකරන මොවුන් සෙසු අය සමග කටයුතු කිරීමේදී නිතර ගැටුම් ඇති කරගනිති.

තාර්කිකත්වයට රුචියක් දැක්වුවද, ඔවුන් ඉදිරිපත් කරන ඇතැම් තර්ක හාස්‍යෝත්පාදක මෙන්ම අර්ථ විරහිත බවද කිය යුතුය. තවද දැඩි තීරණයන්හි එල්බ සිටින ඔවුන් ගන්නා තීරණද හර සුන් වන අවස්ථාද විරල නැත. අන් අය තමා කෙරේ ඊර්ෂ්‍යා කරන බව තරයේ සිතන මොවුන් එය ඇතැම් පුද්ගලයන්ගේ මුහුණටම පැවසීම සුලබව දැකිය හැකි නමුත් සත්‍ය වශයෙන් සිදුවන්නේ මේ පුද්ගලයන් අන් අය කෙරේ ඊර්ෂ්‍යාවෙන් පසුවීමයි.

බාහිර සමාජයේ පුද්ගලයන් සමඟ යහපත් සබඳතා පැවැත්වීම මොවුන්ට විශාල අභියෝග යක් වේ. මන්ද ඔවුන් සංවේදීත්වයෙන් තොර දැඩි සිතැති පුද්ගලයන් වන බැවිනි. මේ රෝගී තත්ත්වයන් පසුවන පුද්ගලයන්ගෙන් කිසිවකුට කිසිදු හිරහැරයක් සිදු නොවන නමුත්, සමාජය තුළ ඔවුන් සමඟ කටයුතු කිරීමේදී, ඔවුන් නම්‍යශීලීත්වයෙන් තොර දෘඪ ගති පැවතුම් හේතුවෙන් පුද්ගලයන් දැඩි සේ අපහසුතාවයට පත් වන අවස්ථා පවතී.

Narcissistic Personlity Disoder නම් වූ මේ පෞරුෂය පදනම් වී ඇති වන මානසික ව්‍යාකූලතාවට සෘජුවම බලපානු ලබන සාධක කිහිපයක් දැනට මනෝවිද්‍යා පර්යේෂණ ඔස්සේ සොයාගෙන ඇත. ළමා වියේදී අත්‍යවශ්‍ය මාපිය අවධානය නොලැබීම, ළමා වියේදී නොසලකා හැරීමට භාජන වීම, චිත්තාවේගික අපහසුතාවන්ට ලක්වීම, ළමා අවධියේ සිටම අධික ලෙස අන් අයගේ වර්ණනාවට ලක්වීම මෙන්ම මාපිය හැසිරීමෙන් ලබන ආභාෂය ආදිය මේ පෞරුෂය සම්බන්ධ ගැටලුවට සෘජුවම බලපානු ලබයි.

මෙය හුදෙක් මිනිස් සිතිවිලි හා ආකල්ප තුළ ගැබ් වී පවතින යථානුරූපී නොවන ආත්මවිශ්වාසයන් හේතු කොටගෙන හටගන්නා රෝගයක් වන බැවින්, මනෝ චිකිත්සක ප්‍රතිකාර (Psychotherapy) සඳහා යොමු වීම කාලෝචිත වේ.

චර්යාත්මක වශයෙන්, සමාජය තුළ ජීවත් වීමේදී අන් අයට ඇහුම්කන් දීමට, අන් අදහස්වලට ගරු කිරීමට, සාමූහිකත්වයෙන් ක්‍රියා කිරීමට මෙන්ම සංවේදීභාවය ගොඩනැගීමටත් මනෝ චිකිත්සකවරුන් මෙන්ම මනෝ උපදේශකවරුන් කටයුතු කරන අතර, රෝගියා සතුව ඇති අතාර්කික විශ්වාසයන් මඟහැරවීම සඳහා යථාර්ථවාදී නොවන අදහස් අභියෝග යට ලක්කිරීම හා සිතිවිලි සටහන් (Thought charts) උපයෝගී කරගනිමින් අනවශ්‍ය සිතිවිලි, විශ්වාසයන්, ආකල්ප ආදිය බැහැර කිරීමටත් ඉන් අවකාශය සැලසේ.

යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමේදී පුද්ගල අන්තර් සහයෝගීතාව අත්‍යවශ්‍ය වන බැවින් මෙවන් පෞරුෂ අක්‍රමතා ඇත්නම් ඒවා මඟහරවා ගැනීම ඉදිරි දිවිය ඵලදායී කර ගැනීමට මනාව ඉවහල් වනු ඇත.

WOW! FREE OFFER! FOR A LIMITED TIME ONLY.

WAADIYA ලකුණ දරණ යාපන තුනපහ මිශ්‍රණයක් (Jaffna Curry Powder) මිල දී ගන්නා විට
WAADIYA ලකුණ දරණ ජැක් මැකරල් ටින් එකක් නොමිලේ

ශ්‍රී ලංකාවේ තුනපහ අතර අනර්ඝතම නාමයක් දිනා ඇති 'වාඩිය යාපන තුනපහ' සඳහා සෑම විටෙකම විශිෂ්ටතම කුළුබඩු වර්ග යොදාගන්නා අතර ඒ සඳහා නියමිත සාම්ප්‍රදායික වට්ටෝරුවලට අනුව නිෂ්පාදන කටයුතු සිදු කෙරේ.

PREMIUM QUALITY

Buy this & Get this Free!




100% NATURAL

NON G.M.O.

GLUTEN FREE

NO ARTIFICIAL: FOOD COLOURS FLAVOURS OR PRESERVATIVES

'වාඩිය යාපන තුනපහ' වරක් රැගෙන රස බලන්න. ඔබ කිසිදා වෙනත් තුනපහ වර්ගවලට නොයනු ඇත.

අපගේ සියලුම නිෂ්පාදන ශ්‍රී ලංකා වෙළඳසල්වලින් දැන් ලබාගත හැක.

MARKETED AND DISTRIBUTED BY GEESHAFOODS INTERNATIONAL INC. FOR MORE INFO 416.804.0762 WWW.GEESHAFOODS.COM

# 'ගී අරුන්දතී' තුළින් ඔබ අමතන 'ශ්‍රීලාල්'



**ශ්‍රීලාල් අමරජීව ෆොන්සේකාගේ ගී ප්‍රසංගය 'ගී අරුන්දතී මියැසි වලාව 2018 ජූනි මස 16 වෙනි සෙනසුරාදා මිසසාගා** Maja Prentice Theatre **හිදී පැවැත්වේ. මේ පිළිසඳර ඒ වෙනුවෙනි.**

ඔහු භෞතික විද්‍යා උපාධිධරයෙකි. කොළඹ සරසවියේ ආදි විද්‍යාර්ථියෙකි. දශක දෙකකට ආසන්න කාලයක් කටුනායක ගුවන්යානා මෙහෙයුම් පාලක මැදිරියේ සිට ගුවන් ගමන් පාලනය කළ පාලකවරයෙකි පරිපාලකයෙකි. වර්තමානයේ ටොරොන්ටෝවල පරිගණක විසඳුම් නිර්මාණ ශිල්පියෙකි (computer solution architect). ඒ සියලුම තනතුරු මැද සුගායනයෙන් අප සවන් මියුරු රසයෙන් මත් කළ ආනන්දයෙන් ප්‍රඥාව කරා අප සිත් පුබුදවාලූ සුන්දර කලාකරුවෙකි. තමාගේම ගීත ගයමින් සුභාවිත ගීතයෙන් අප සැනසීම සඳහා තෙවැනි වතාවටත් ගී අරුන්දතී ප්‍රසංගය ඉදිරිපත් කිරීම සඳහා මේ දිනවල සූදානම් වන ඔහු අප කවුරුත් හොඳින් හඳුනන ශ්‍රීලාල් අමරජීව ෆොන්සේකා.

ගී අරුන්දතී ගැන දැනුවත් වීමටත් මේ සුන්දර දිරිය මිනිසාගේ කලාවට කැපවූ දිවියේ එදා සොඳුරු මතකයන් අවදි කිරීමටත් අද කරන දේ විමසීමටත් හෙට තිබෙනා බලාපොරොත්තු දැනගැනීම සඳහාත් දසත පුවත්පත වෙනුවෙන් ශ්‍රීලාල් සමග සොඳුරු පිළිසඳරක යෙදෙන්නට අදහස් කළා.

**Q ආයුබෝ වේවා ශ්‍රීලාල් දසත වෙනුවෙන් මේ පිළිසඳර සඳහා ඔබව ආදරයෙන් පිළිගන්නවා.**

ආයුබෝවන් ඔබටත්.

**Q ඔබගේ අධ්‍යාපනය, රැකියාව ගායන ලෝකයට සෘජු සම්බන්ධයක් නොමැති ක්ෂේත්‍රයක්. එහෙත් ඔබ කලාකරුවෙකු, ගායකයෙකු ලෙස අප බොහෝ දෙනෙක් හඳුනන සුන්දර මිනිසෙක්. මම දැනගන්න කැමතියි ගායනයට සම්බන්ධ වීම පිළිබඳ ඔබේ මතකයන්**

කුඩා කාලයේ සිටම මට ගායන හැකියාවක් මෙන්ම චිත්‍ර ඇඳීමේ හැකියාවක් තිබුණා. ගුවන්විදුලියෙන් ඇසෙන සිංදු මම අහළ පහළ ගෙවල්වලටත් ඇහෙන තරමට හයියෙන් කියනවා. මගේ හැකියාවන් මගේ දෙමාපියන් හඳුනාගත්තත් ඒ කාලයේ තිබුණ සමාජයේ විවිධ අදහස් නිසා ඔවුන් ඒ සඳහා මාව දිරිගැන්වූයේ නැහැ. ඔවුනට අවශ්‍ය වුණේ මාව වෛද්‍ය ක්ෂේත්‍රයට යොමුකරන්න අවශ්‍ය විද්‍යා අධ්‍යාපනය ලබාදෙන්න. එහෙම වුණත් මට සහජයෙන් ලැබුණ හැකියාව නොනැසී පැවතුනා. මූලික අධ්‍යාපනය ලැබූ වලහපිටිය මහ විදුහලේදිත් ද්විතියික අධ්‍යාපනය ලැබූ නාත්තන්ඩිය ධම්මිස්සර මධ්‍ය මහා විදුහලේදිත් මගේ ගායන හැකියාව හඳුනාගත් ගුරුවරුන් සහ සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉල්ලීම සහ අවශ්‍යතාවය මත පාසලේ විවිධ උත්සවවලදි, සංගම්වලදි මට ගායනා කරන්න අවස්ථාවක් ලැබුණා. චිත්‍ර ඇඳීමට වඩා ගායනයට තමයි මගේ වැඩි කැමත්ත තිබුණේ. දෙමාපියන් මාව වෛද්‍ය අංශයෙන් ඉගෙනීමට උනන්දු කළත් මම කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්නේ භෞතික විද්‍යා අංශයෙන් උපාධිය ලබාගන්න. කොළඹ සරසවියේ අධ්‍යාපනය ලැබීමට ලද අවස්ථාවත් සමගම නැවත වතාවක් මා තුළ සැඟවී සිටි ගායකයා ඉස්මතු වුණා. විද්‍යා පීඨයේ අධ්‍යයනය ලැබුවත් මම වැඩි හරියක් කාලය ගත කළේ කලා පීඨයේ භක්ති ගීත ගායනා ඇතුළු විවධ කලා සංස්කෘතික වැඩසටහන්වලට ගායකයෙකු ලෙස එක්වෙමින්. 1983 දී කලා පීඨයේ තිබූ පෙරදිග සංගමය මගින් සරසවි සිසුනගේ ගීත අඩංගු සංයුක්ත තැටියක් කළා. එයට මගේ ගීතයකුත් ඇතුළත් වුණා. මගේ පළමුවෙනි සිංදුව වුණ එම සිංදුවෙන් තාත්තා ගැන කියවෙන්නෙ. මම සරසවියට ඇතුළත් වන විට මගේ තාත්තා ජීවතුන් අතර නෑ.

මේ අතර මට ආරාධනයක් ලැබෙනවා විමුක්ති ගායක කණ්ඩායමට එකතු වන්නට. ගායනා කිරීමට තිබුණ දැඩි ආශාව නිසා මම ඔවුනට එක් වී විමුක්ති ගී ගායක කණ්ඩායමත් සමග ප්‍රසංග පහළොවක පමණ ශ්‍රී ලංකාවේ බොහෝ නගරවල ගී ගයමින් සංචාරය කළා. සරසවියෙන් පිට වී ගුවන් ගමන් මෙහෙයුම් නිළධාරියෙකු ලෙස සේවයට යාමත් සමග මගේ ගායන දිවිය නැවතත් යම් යටපත් වීමක් සිදුවුණා. ඒ වුණත් මා සේවය කළ ආයතනයේ බොහෝ දෙනෙක් මගේ ගායන හැකියාව දැනගත් පසු විවධ උත්සව සම්භාෂණවලදි ඔවුන් මගෙන් ගායනයන් බලාපොරොත්තු වුණා. ඉන්පසු මම කැනඩාවට සංක්‍රමණය වීමෙන් පසු සමහර අවස්ථාවලදි, උත්සවවලදි යම් යම් ගායනා කළා. ඔය විදිහට මගේ ගායන දිවිය මතුවෙමින් නැවත යටපත් වෙමින් ආයෙත් මතුවෙමින් දිගටම ගලාගෙන ගියා.

**Q ඔබ කැනඩාවට පැමිණි පසු සංගීත දිවියේ විශේෂයෙන් ගායන දිවියේ සුවිශේෂි වෙනස්කම් සහ දියුණුවක් සිදුවූවා යැයි මම හිතනවා. මම කැමතියි දසත පාඨකයින් වෙනුවෙන් දැනගන්න කැනඩාවට පැමිණි පසු ඔබගේ කලා කටයුතුවල සිදුවූ පරිවර්තනය.**

ඇත්තටම කියනවනම් කැනඩාවට පැමිණියාට පසු තමයි මගේ ගී ගායනය නියම විදිහට සක්‍රිය වුණේ. මට ගී ගායනයට සහජ හැකියාවක් තිබුණත් ගීතයක තනුව රිද්මය හඳුනා ගැනීමට ඉව තිබුණත් මම සංගීතය ඉගෙනගෙන තිබුණේ නෑ. කැනඩාවට පැමිණි පසු වරින්වර ගීත ගායනා කළත් පසුව මට හිතුන සංගීතය විශේෂයෙන් ගායනය ශාස්ත්‍රීය මට්ටමින් යම් ප්‍රමාණයකට හෝ ඉගෙන ගතහොත් මට වැදගත් වෙයි කියල. ඒ නිසා මම ගියා ශාස්ත්‍රීය ගායනය ඉගෙන ගැනීමට කැනඩාවේ ජීවත් වන දක්ෂ සංගීත ශිල්පියෙකු වන ඉන්දීය ජාතිකයෙකු වූ අන්ජු චෞද්රි මාස්ටර් ළඟට. ඔහු ඉන්දියාවේ සිටි මන්නාඩේ නම් ප්‍රවීණ ගායකයාගේ හොඳම ගෝලයෙක්. එතනදි මම ගායනය පමණක් නොවෙයි සර්පිනාව වැයීමටත් ඉගෙන ගත්තා. අවුරුදු එකහමාරක් වැනි කාලයක් තුළ රාගධාරී සංගීතය පිළිබඳව මම ලැබූ ඒ පුහුණුව මට මගේම ගීත සමුච්ඡයක් ඉදිරිපත් කිරීම සඳහාත් ගී ප්‍රසංගයක් පැවැත්වීම සඳහාත් ප්‍රයෝජනවත් වුණා. සංගීතය ඉගෙන ගැනීමත් හිතමිත්‍රාදීන්ගෙන් ලැබුනු දිරිගැන්වීමත් සමගම මට අවශ්‍ය වුණා මගේම ගීත කිහිපයක් නිර්මාණය කරන්න සහ මතු දවසක සංයුක්ත තැටියක් නිකුත් කරන්න. 2010 වසර පමණ වන විට මම මගේම ගීත කිහිපයක් නිර්මාණය කළා. දැනටත් වරින්වර මගේම ගීත නිර්මාණය කරමින් සිටිනවා. මගේම ගීත එළිදැක්වූවාට පසු හිතවතුන් සහ සුභ පතන්නන්ගේ දිරිගැන්වීම සහ සහයෝගය මත ගීත ප්‍රසංගයක් පැවැත්වීමට මම තීරණය කළා. 2014 දී පළමු ගී අරුන්දතී ප්‍රසංගය පැවත්වූවා.



**Q මම හිතනවා අපේ පිළිසඳර දැන් වඩාත් වැදගත් සංධිස්ථානයකට එළඹුනා කියල. අපි දන්නවා අරුන්දතී කියන්නෙ තාරකාවක්. හරියටම කියනවනම් යා යුතු මග පෙන්වන තාරකාව. මම කැමතියි විස්තර දැනගන්න ගී අරුන්දතී ප්‍රසංගය ගැනත් එයට අරුන්දති නම ලැබුණු ආකාරය ගැනත්. (ශ්‍රීලාල් මට පැවසූ බොහෝ දේ සාරාංශ කර මම මෙසේ ඔබට ලියමි.)**

2014 වනවිට මගේම ගීත 7 ක් පමණ නිර්මාණය කර තිබුණා. මට අදහසක් ආසාවක් ආව ගිත ප්‍රසංගයක් කරන්න. එතකොට මගේ ළඟින්ම හිටිය හිතවතුන් කිහිපදෙනෙක් මාව මේ සඳහා උනන්දු කළා සහ සහයෝගය දුන්නා. නම් කියන්න ගියොත් සමහර නම් ගිලිහී යන්න පුළුවන් වුණත් ආරම්භයේදිම මේ සඳහා දිරිගැන්වූ බිරිඳත්, රංජිත් සහ දර්ශි තිලකරත්න යුවලත්, සුනිමල් බාලසූරියත්, ප්‍රසංගය සඳහා නම දුන් යාත්‍රා පුවත්පතේ සංස්කාරක ප්‍රවීණ ලේඛක චන්ද්‍රරත්න බණ්ඩාරත් සඳහන් කළයුතු යැයි මම හිතනවා. එයට අමතරව තවත් හිතවතුන් බොහෝ දෙනෙක් මෙය සාර්ථක කරගැනීමට උදව් වුණා. ගී අරුන්දතී තුළින් මගේ බලපොරොත්තුව තමයි සුභාවිත ගිතය තුළින් රසිකයාට ආනන්දයක් ලබාදීම මෙන්ම මණැස පුබුදුවා අරුන්දතී තාරකාව මෙන් මග පෙන්වීමක් කරන්න. සංගිතය කියන්නෙ මිනිසුන්ව මෝහනය කළහැකි භාවනාවකට ගෙන යා හැකි කලාවක්. තෙවැනි වරට පවත්වන ගී අරුන්දතී ප්‍රසංගයේදි මගේම ගීත දහසයක් පමණ සහ ප්‍රවීණ ගායික ගායිකාවන් ගැයූ ගීතද සමග ගීත විසිපහක් පමණ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. කැනඩාවේ අප අතර ජීවත් වන දක්ෂ තරුණ, වැඩිහිටි මෙන්ම ළමා ගායන ශිල්පීන් කිහිපදෙනෙක් යුග ගායනාවලදි සහාය වෙනවා. සංගීතය සැපයීම කරන්නේ දක්ෂ ප්‍රවීණ වාදක මණ්ඩලයක් වන ප්‍රිය මිතුරෝ. බන්දුල කුරුවිටආරච්චි ප්‍රවීණ කළාකරුවා වේදිකා සැලසුම් සහ අලංකරණයද හිතවත් සුනිමල් බාලසූරිය වැඩ සටහන ඉදිරිපත් කිරීමේ පූරකයා ලෙසද කටයුතු කරනවා.

රෂාන්ති හෙට්ටිආරච්චිගේ රංගාරා නැටුම් ශිල්පීන් සමහර ගීත සඳහා අවශ්‍ය නර්තනයන් ඉදිරිපත් කරනවා. තව බොහෝදෙනෙක් මෙහි සාර්ථකත්වය සඳහා ඇප කැපවී කටයුතු කරනවා. සියලුදෙනාගේම නම් ලියන්න ඔබට ඉඩ මදි වේවි. යම් හිතවතෙකුගේ නමක් අතපසු වුවහොත් මා සමග අමනාපවෙන එකක් නෑ කියල මම හිතනවා. මේ ප්‍රසංගය සාර්ථක කරගැනීමට හිතවතුන් රැසක් මට උදව් වෙනවා. මේක භාරදූර වැඩක්. ධනය ශ්‍රමය කාලය විශාල ලෙස වැය වෙන අභියෝගාත්මක වැඩක්. හැමදෙනාගේ උදව්වෙන් එය සාර්ථක කරගන්නවා.

**Q ගීත ගායනයේදි ඔබට ආදර්ශයක් වූ තවත් විදිහකට කියනවනම් මමත් මෙන්න මේ වගේ ගායකයෙක් වෙනවා යැයි ඔබට හිතුන ඔබ ප්‍රියකරන, ඔබ ආදරය කරන ගායකයින් කවුද කියල දැනගන්න කැමතියි.**

පළමුවෙනි තැනට එන්නෙ පණ්ඩිත් අමරදේවයන්. එතුමා වගේ වෙන්න අපට බැහැ. ඒ වුණත් එතුමා තමයි මා ආදර්ශයට ගන්නා මා ප්‍රිය කරන පළමුවෙනියා. මගේ ළමා කාලයේ සිටම මම එතුමාගේ ගීතවලට ආසා කළා. ඉස්සර මම උත්සාහ කළා එතුමා වගේ එතුමාගේ හඬ වගේ ගයන්න. මගේ යහළුවො සමහර අවස්ථාවලදි මට විහිළු කළා අමරදේව වගේ වෙන්න යන්න එපා මගේ විදිහට කියන්න කියල. ඒ වගේම මම ප්‍රියකරන ගායකයන් තමයි වික්ටර් රත්නායක, සුනිල් එදිරිසිංහ සහ ටී එම් ජයරත්න. ගායිකාවන් අතර නන්දා මාලිනිය ඉදිරියෙන් සිටිනවා. මා ප්‍රියකරන මා ආදරය කරන ගායක ගායිකාවන් ආදර්ශයට ගත්තත් මම මගේම ශෛලියක් ආරක් අනුගමනය කරනවා. මම විශ්වාස කරන්නෙ සුභාවිත ගීතයේදි පදමාලාව පමණක් නොවෙයි සංගීතය සහ ගායනයත් එක වගේ වැදගත් කියල. ඒ වගේම පදමාලාවේ රචකයා ආධුනිකද ප්‍රවීණද යන්න නොවෙයි වැදගත්. අන්තර්ගතයයි වැදගත් කියල.

**Q සුභාවිත ගීතය ගැනත් පද මාලා තෝරාගැනීම ගැනත් ඔබගේ අදහස දැනගන්න කැමතියි.**

ඔබ මතුකෙරුවේ ඉතාමත් වැදගත් අදහසක්. මමත් හිතන්නෙ සුබාවිත ගීතයේදි පදමාලාව, සංගීතය,

19 වන පිටුව බලන්න

## 'ගී අරුන්දතී'...

18 වන පිටුවෙන්

ගායනය යන ත්‍රිත්වයම වැදගත් කියල. ආනන්දයත් මෙන්ම ප්‍රඥාවද රසිකයාට ලැබීම වැදගත්. කඩාගෙන බිඳගෙන ඉදිරියට යන්න මගේ බලාපොරොත්තුවක් නෑ. හොඳ පද රචනාවක්, හොඳ සංගීතයක් සමග මගේ ගායන හැකියාව තුළින් හොඳ ගීතයක් රසිකයාට දීම තමයි මගේ බලාපොරොත්තුව. ගුණාත්මක දෙයක් දීම මගේ අරමුණ නිසා කවුද ලියන්නෙ කියන එකට වඩා මොනවද ලියල තියෙන්නෙ කියලයි මම බලන්නේ. මමත් නවකයෙක්නේ. මගේ මුල් ගීතවල පද රචකයන් අතර කැනඩාවේ සහ වෙනත් රටවල ජීවත් වන ආධුනික පද රචකයන් සිටියා. ඒ වගේම ප්‍රවීණයන් වන රත්න ශ්‍රී විජේසිංහයන්, චන්ද්‍රරත්න බණ්ඩාර, ධම්මික බණ්ඩාර සහ ගරු රඹුකන සිද්ධාර්ථ හිමියන්ද අයත් වෙනවා. මගේම ගීතවලදි යුග ගී ගායනයෙදි විශාරද ශිල්පිනියන් මෙන්ම ආධුනික ශිල්පිනියන්ද සිටිනවා. මගේ ගිත වැඩිප්‍රමාණයක් සංගීතවත් කරල තියෙන්නෙ විශාරද රෝහණ ධර්මකීර්ති. එයට අමතරව ආචාර්ය රෝහණ වීරසිංහයන් සහ විශාරද දර්ශණ වික්‍රමතුංග සංගීත නිර්මාණය කර තිබෙනවා.

**Q අවසාන වශයෙන් ඔබේ පෞද්ගලික ජීවිතය ගැනත් ඔබේ අනාගත බලපොරොත්තු ගැනත් ඒ වගේම රසිකයන්ට යමක් පැවසීමට ඇත්නම් ඒ ගැනත් රසිකයන් දැනගැනීමට කැමති ඇතැයි මා සිතනවා.**

මම දැනට පරිගණක වැඩසටහන් සැකසීම පිළිබඳ රැකියාවක නිරත වෙනවා. කැනඩාවට පැමිණි පසු මගේ දැනුම සහ සුදුසුකම් වර්ධනය සඳහා පරිගණක පාඨමාලාවක් හැදෑරුවා හම්බර් විද්‍යාලයේ. මගේ බිරිඳ රෝහිනී මගේ මේ සියලු කලා කටයුතු සඳහා කැප වෙනවා. උදව් වෙනවා. දුව සහ පුතා උසස් අධ්‍යාපනය හදාරනවා.

දැනට මගේ සින්දු කිහිපයක් යූ ටියුබ් ඔස්සේ අන්තර්ජාලයට එක්කර තිබෙනවා. දැනට මගේම සින්දු දහ හතක් පමණ නිමකරල තියෙන නිසා ඒ සින්දු ඇතුළත් සංයුක්ත තැටියක් නිකුත් කිරීමට අදහස් කරගෙන සිටිනවා. ඒ සඳහා දැන් වැඩ කටයුතු ආරම්භ කරල තියෙන්නෙ. හැකි ඉක්මනින් එය රසිකයන් අතරට නිකුත්කරන්න බලාපොරොත්තුවෙනවා. ඒ වගේම මගේ ප්‍රසංගය දිගටම කරගෙන යන්නත් හිතාගෙන ඉන්නවා. සිංදු පටිගත කළ හැකි කුඩා ශබ්දාගාරයක් මා නිවසේ සකස් කරගෙන තියෙනවා. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණ දැනුමත් මා ළඟ තියෙනවා. රසිකයන්ගෙන් මම ඉල්ලන්නෙ මේ ප්‍රසංගය බලන්න එන්න. ගීත රස විඳින්න. ඔබගේ අදහස් දැනුම් දෙන්න. අවසාන වශයෙන් මම දසත පත්‍රයටත් මා සමග පිළිසඳරේ යෙදුන ඔබටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**අප සැමගේ හිතවත් ශ්‍රීලාල් අමරජීව ෆොන්සේකාගේ ප්‍රසංගය 'ගී අරුන්දතී මියැසි වලාව' ට එක් වී ගී රස විඳින්න ඔබ සැමට ආරාධනා කරමින් මේ සටහන නිම කරනවා.**



**ශ්‍රීලාල් සමග පිළිසඳරේ යෙදී දසතට සටහන් කළේ ආචාර්ය ජගත් රූපසිංහ.**

ශ්‍රී ලංකාවේ සියලුම රූපවාහිනී නාලිකා
ක්‍රීඩා / ක්‍රිකට් / පුවත් / චිත්‍රපට / ටෙලිනාට්‍ය
දේශීය සහ විදේශීය දහසක් වැඩසටහන් ඇතුළුව

500 කට අදික රූපවාහිනී නාලිකා සජීවීව
1000 කට අදික නවීණ 2D සහ 3D චිත්‍රපට
නරඹන්න

දැන් ඔබට මසකට වියදම් වන්නේ
$. 15.00 පමණී

අමතන්න
647 403 2259

IF WE DO THE CONSTRUCTION WE WILL GET YOUR
BUILDING PERMIT FREE
BUILDING PERMIT APPROVAL
LEGAL BASEMENT
BASEMENT DESIGN, RENOVATION & CONSTRUCTION
SIDE ENTRANCE
FOR FREE CONSULTATION AND ESTIMATES
CALL
647 403 2259
WeDesignBuild Inc.
www.wedesignbuild.ca

MATHEMATICS
A+
NEED AN ONTARIO CERTIFIED TEACHER AS YOUR MATH TUTOR?
Ms. Pamudi Sathsarani
(OCT, HBSc, BEd)
- Grade 9
- Grade 10
- Grade 11
- Grade 12 (MCV/MHF/MDM)

Derry and Winston Churchill
math.tutorpp@gmail.com
905 824 9650

# ඔබ පාරිභෝගික යෝජනා පැහැර හරින්නෙක් වන්නේ කෙසේද?



ඔබ විසින් ගොනු කරන ලද පාරිභෝගික යෝජනාව එක් වරක් ඔබගේ ණය හිමියා විසින් පිළිගතහොත් ඔබ හා ඔවුන් අතර නීත්‍යානුකූලව සම්බන්ධයක් ඇති වේ. එම ගිවිසුමේදී එකඟ වූ ආකාරයට ඔවුන්ට ගෙවීම් කළ යුතු අතර ඔබ එසේ කරන තුරු ඔබට විරුද්ධව පියවර ගැනීමට ණය හිමියාට නොහැක. කෙසේ වෙතත් අවසානය තෙක් ගිවිසුමට අනුව කටයුතු කිරීමට ඔබට නොහැකි වුවහොත් මෙම තත්ත්වය වෙනස් වේ.

ඔබගේ ගෙවීම් කාලය තුළ නීත්‍යානුකූලව කිසිම දැනුම් දීමකින් තොරව ගෙවීම් වාරික දෙකක් දක්වා ඔබට අතපසු විය හැකිය.(නමුත් ඔබ දිගටම ගෙවීම් කල යුතුය. ගෙවීම් කාලය අවසානයේ ඔවුන් එය අමුණනවා ඇත.) නමුත් තුන් වන ගෙවීමද අතපසු වූ ඕනෑම අවස්ථාවක ඔබගේ යෝජනාව අවලංගු විය හැකිය. එනම්, ආපසු මුදල් ගැනීමට හෝ ඔබට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමට ණය හිමියාට හැකියවක් ඇත.

ඔබගේ යෝජනාවේ භාරකරු නිතරම ක්‍රියා කරනුයේ ඔබ සහ ණය හිමියා යන දෙපළටම, ණය හිමියා හට(නැවත ගෙවිය හැකි ලෙස), ඔබට (මුදල දැරිය හැකි ලෙස) ගැලපෙන අයුරින් යෝජනාව සෑදීමටය. නමුත් ඇතැම් විට මෙම කරුණු වෙනස් විය හැකිය. ඔබගේ රැකියාව අහිමි වීම, මූල්‍යමය වශයෙන් සිදුවන කඩා වැටීම් ආදියයි. ඔබට එක් වාරිකයක් දෙකක් ගෙවීමට තිබුණත් මෙවැනි දෙයක් සිදු වුවහොත් ඉක්මනින්ම ඔබගේ යොජනාවේ භාරකරු දැනුවත් කළ යුතුය. ඔබගේ තත්ත්වයට අනුව යෝජනාව සංශෝධනය කළ හැකිය. ඔබ එවැනි තත්ත්වයක සිටියදීත් ඔබ බලා සිට ඔබගේ යෝජනාව අවලංගු වුවහොත්, ඔබට නැවත අලුත් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැක.

සැලකිය යුතුයි: යෝජනාව සංශෝධනය වීම සරලව නොගත යුතුයි. සංශෝධිත යෝජනාවක් ඔබ ඉදිරිපත් කළහොත් තවදුරටත් ඔබගේ වර්තමාන යෝජනාව වලංගු නොවේ. ඔබගේ සංශෝධිත යෝජනාවට ණය හිමියාගේ අනුමැතිය ලබාගත යුතු අතර ණය හිමියා එය ප්‍රතික්ෂේප කළහොත් ඔබට කලින් තිබූ කොන්දේසිවලට යා නොහැක. සංශෝධනය කිරීම හොඳද නරකද යන්න ගැන සැකයක් තිබේ නම් යෝජනාවේ භාරකරු සමඟ කතා කළ යුතුය.

යෝජනාවට අනුව ඔබට ණය ගෙවීමට නොහැකි නම් ඔබ බංකොලොත් වූ බවක් එයින් අදහස් නොවේ. ඔබට ණය හිමියාට අවනත වීමට නොහැකි නම් ඔබගේ ඊළඟ පියවර ලෙස බංකොලොත් වීමක් ඉදිරිපත් කළ හැකිය. මෙම තීරණය සම්බන්ධව නැවතත් ඔබට උදව් කිරීමට ඔබගේ යෝජනාවේ භාරකරුට හැකිය.

අවවාදයයි: ඔබ යෝජනාව සංශෝධනය කරනවා නම්, එයින් අදහස් වනුයේ ඔබගේ මුල් පිටපත තවදුරටත් වලංගු නොවන බවයි. ඔබගේ සංශෝධිත යෝජනාවට ණය හිමියාගේ අනුමැතිය ලබාගත යුතු අතර ණය හිමියා එය ප්‍රතික්ෂේප කළහොත් ඔබට කලින් තිබූ කොන්දේසිවලට යා නොහැක.

**Please call MARK @ 416-489-2000, GTA Credit Solutions and for more information please refer to the page # 23**

## ශ්‍රී ලංකාවේ...

6 වන පිටුවෙන්

එය ඇමතිවරුන් විසින් සකසන ලද්දක් නොව පේරාදෙණි විශ්වවිද්‍යාලයේ උප කුලපතිව සිටි අයිවෝ ජෙනිංස් විසින් සකසන ලද්දකි) කියන සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි. 1972 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති සමගි පෙරමුණු රජය විසින් ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වාගේ නායකත්වයෙන් සම්පාදිත ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්ද එයම අනුමත කරන ලදී. එහෙත් මේ අවස්ථා දෙකේදීම පැවති ජනාධිපති ධූරය රටේ වැඩි බලයක් හිමිකර ගන්නා අගමැතිවරයා විසින් නම් කරනු ලබන (මහජන ඡන්දයකින් නොවේ) නාම මාත්‍රික ධූරයකි. රාජ්‍යයේ පූර්ණ පාලන බලය හිමිවූයේ අගමැති වරයා ප්‍රමුඛ ඇමති මණ්ඩලයටත් පාර්ලිමේන්තුවටත්ය.

1978 දී රටේ තුනෙන් දෙකක ඡන්ද බලය හිමිකර ගත් එක්සත් ජාතික පක්ෂයේ ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රථම වරට විධායක ජනාධිපති ධූරය බිහි කළේය. එය පාලන බලයෙහි ලා අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලයටත් පාර්ලිමේන්තුවටත් ඉහළින් සිටින තනතුරක් විය. එම ව්‍යවස්ථාවෙහි 10.1 වගන්තිය විධායක ජනාධිපති ධූරය හඳුන්වා දුන්නේ 'ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියාද විධායකයේ ප්‍රධානියාද ආණ්ඩුවේ ප්‍රධානියාද සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයාද වන්නේය' යනුවෙනි. එහිම 33, 34, 35 යන වගන්තිවලින් කියවෙන ජනාධිපතිවරයා සතු කාර්ය පද්ධතියෙන්ද තවදුරටත් ඔහු සතු විධායක බලයෙහි ස්වභාවය මැනවින් ප්‍රකාශ වන්නේය. මෙහි විස්තර වන අන්දමට ඔහු සතු පූර්ණ බලැති බලතලවල ස්වභාවය කෙබඳුද යන්න බ්‍රිතාන්‍ය මහ රැජිනට මෙන් අධිකරණයෙහි ඔහුට විරුද්ධවද නඩු පැවරිය නොහැකිය යන 35.1 උප වගන්තියෙන් වුවද සලකා ගත හැකිය.

මේ තනතුර සතුව මෙබඳු අනර්ථකර බලතල ඇතිවාක් මෙන්ම ශ්‍රී ලංකාවේ ඉතිහාසයට එක්ව ඇති වර්ධරාජා පෙරුමාල් උතුරු නැගෙනහිර පළාත් සභාව අනිසි ලෙස විසුරුවා හැරි මොහොතේ ආණ්ඩුකාර පාලනයකට නතු කොට ඔහුගේ ක්‍රියා කලාපය මර්ධනය කළ හැකි වූයේත් වසර 30 ක් පැවති කුරිරු, ම්ලේච්ඡ යුද්ධය මර්ධනය කළ හැකි වූයේත් ජනාධිපති සතු වූ විධායක බලතල පැවති නිසා යැයි ඇතැමෙක් පෙන්වා දෙති.

ඒ හැරත් දැනට ක්‍රියාත්මකව පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය එසේම තිබියදී 20 වෙනි සංශෝධනය මගින් විධායක ජනාධිපති ධූරය පමණක් අහෝසි කළහොත් ඇතිවිය හැකි ප්‍රතිඵල භයානක වනු ඇතැයිද ඇතැම් දේශපාලන විචාරකයෝ පෙන්වා දෙති. දැනට පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) 2 වගන්තියට අනුව පළාත් සභාවේ ප්‍රධානියා වන ආණ්ඩුකාර වරයා ජනාධිපතිවරයාගේ විධායක බලයට යටත්ව තම පළාත තුළ විධායක බලය ක්‍රියාත්මක කරන බැවින් ශ්‍රී ලංකාවේ ඒකීය බව නොනැසී පවතින බවට විනිසුරු සර්වානන්ද ප්‍රමුඛ විනිසුරුවන් පළ කළ අදහස් මෙහි ලා ඔවුහු නිදසුන් කොට ගනිති. විධායක ජනාධිපති ධූරය අහෝසි කළහොත් ඔහු සතු මේ බලයද අහෝසි වන හෙයින් පළාත් පාලනයෙහි ලා ඇතිවිය හැකි ප්‍රවණතා පිළිබඳව ඔවුහු බිය පළ කරති.

මේ අනුව මෙහි මුලදීත් අප කීවාක් මෙන් ප්‍රබල සංවාදයක් තුළින් විධායක ජනාධිපති සතු අනිසි බලතල සීමා කරමින්, අර්ථවත් බලතල රැක ගනිමින්, සංවර්ධනාත්මක නව බලතල එක් කරමින් ගෙන එන සංශෝධනයකට යෑම වඩාත් උචිතය යනු අපගේද අදහස වේ. එසේ නැතිව පටු කල්පනා මත කටයුතු කරන්නට ගියහොත් රටටත් ජනතාවටත් නොසිතූ විරූ විපත්වලට අනාගතයේදී මුහුණ දෙන්නට සිදුවනු නොවැලැක්විය හැකිය.

## මවුවත් බවට...

7 වන පිටුවෙන්

ආශිර්වාදය කළාය. "මගේ පුතා බුදුවේවා !" සරාසැකි කප්සුවහසක් ඇවෑමෙන් සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ මෙකප බුදු වූයේ එදා ඒ මව තම පුත්‍රයාට කළ ආශිර්වාදයේ බලයෙනි. එකල ඒ වෙළෙඳ පුතු මෙකල අප බුදු හිමි වියග

ගැබ පෙළහැර පැවැත්වීම වැනි දරුවන් ලැබීමට ආසන්න කාලයේ මවගේ සිත සතුටු කිරීම සඳහා පවත්වනු ලැබූ පුරාණ චාරිත්‍ර බුදුසමය කිසි විටෙක ප්‍රතික්ෂේප කරන්නේ නැත. එවැනි චාරිත්‍ර බුදු සමයට අනුගත කරනු ලැබීය. දරු ගැබක් පිහිටි කල මවට ඇතිවන ආශාවන් ඇයට ඉටුකරදීම බුදුසමය අනුමත කළ සමාජ චාරිත්‍ර ධර්මයකි. සිදුහත් බෝසතුන්ගේ මවට ඇතිවූ දොළදුක් සංසිඳ වූ අයුරු කවි කිහිපයකින් යසෝදරාවතෙහි මෙසේ දැක්වෙයි.

දොළ උපතක් වුණි මායා  බිසවුන්ට
අරිති වහති වාසල් දොර නුවර  වට
දොරටු සතර වාසල් හැර දන්  දෙන්ට
දොළ සන්සිඳුනි මහමායා  බිසවුන්ට

දෙවනු දොළක් හටගත්තේ  බිසවුන්ට
නුවර සැමතැනම දිවපුරයක්  ලෙසට
පවර උතුන් මණ්ඩපයක් සොඳ  රුවට
නුවර වට ඇවිද වැඩියා  මන්ඩපෙට

සල් උයනට යන්නට දොළදුක් උනිය  මට
රන් රිදියෙන් සරසන්නේ උයන  වට
සතර වරන් දෙවියෝ මුර ජාම  වට
සන්තොස වෙමින් වැඩමෙව්වා උයන  වට

යසෝදරාවත ලියූ කවියා තම සිතෙහි ඇතිවූ හිතළු හා පුරානෝක්ති එක්ව ගෙන අතිශෝක්තියෙන් නිමැ වූ කවි වශයෙන් මෙම කවි දැක්විය හැකි වුවද මහමායා දේවියගේ දොළ සංසිඳුවීමේ සිද්ධියක් කවියට ඇතුළත් කර තිබීමෙන් බුදුසමය හා මවුවත් බව සමඟ දොළදුක සන්සිඳුවීමේ චාරිත්‍රයද සහජීවනයෙන් පැවැති බව දක්වයිග මවක වීමේ සිහින මවන සිතින් දරු සුරතල් බලන හදින් මවුවරුන්ම වූ මවුවරුන්ගේ සිහිනද මහාමායාව දුටු පහත දැක්වෙන දරු සීන ලෙසම විය නොහැකිද?

රිදී යහන සැතපෙන කල  බිසවුන්ට
පිරි දෙතන කිරි එරිලා  කරඬුවට
රිදී කඳකි නයි පැටියෙකි දරණ  වට
නෑරිය දරු සීන පෙනුණා  බිසවුන්ට

නේරංජනන් ගංගාවේ  සුදුවැල්ලේ
නේරංජනන් ඉස්නානේ  නෑවිල්ලේ
පැන්නා වට කරට සුවඳට මහ  ලොල්ලේ
පෙන්නා දිදී දරු සීනය පෙළින්  පෙළේ

මහාමායා මවුතුමියගේ මුවින් සැගැසුණු සේ ලියැවී ඇති මෙකවි දරු සම්පත් පතන මවකගේ හදවතේ ඇඳුනු දරු සිහිනමය. කවර මවක වුවද පතනුයේ උතුම් වූ දූ පුතුන්ට තමන් හිමිකාරියක වේවා යන්නය. එය රිදී යහනෙහි සැතපෙන බිසොවුන්ට පමණක් නොවේ ගෝනි කඩමල්ලක දපන අවශේෂ බිසොවුන්ටද එක සේ අදාළය. එයයි සත්‍යය. එයයි මවුවත් බවේ පොදු ධර්මතාවය. 'රිදී කඳකි නයි පැටියෙකි දරණ වට' යන පදයෙන් කවියා ඉඟිකරන්නේ උතුම් පුතකුට මවක වීමේ භාග්‍යය ඇයට හිමි බවයග ඇය නම් මහාමායාවයි. හිමිදිරියේ යන්තමින් ඇසෙන මුදු ඉගැඹුරු සිත් නිවා සනහාලන සෙත් පිරිත් පද සේ, සිහිල් වූ පිරිත් පැන් කළයක පිවිතුරු සිහිලස සේ, ලෝකයට ජීවය සුන්දරත්වය සිහිලස පිඹ නැගිටුවා ලොව වඩන්නට උගන්වන්නී ඇයයි. මොලොව පවතින්නේ ඈ දෝත මතය.

බුදු සමයේ ආභාෂය ලද ගැමි කවියකු තම මවට දොස් නගන තම සෝයුරාට මෙසේ පවසයි.

මල්ලියෙ ඔහොම නොකියන් අපෙ  අම්මාට
දෙතනේ කිරි දුන්නෙත් අපි  දෙන්නාට
තියෙන දෙයක් දෙන්නෙත් අපි  දෙන්නාට
බුදුන් වදින ලෙස වැඳපන්  අම්මාට

බුදු සමයේ ශික්ෂිත සංවේදී බෞද්ධයකුගේ ආධ්‍යාත්මයෙහි තම මව කෙරෙහි පවත්නා ගෞරවය, භක්තිය හා ආදරයේ ළයාන්විත රිද්මය මේ ගලන්නේ බුදු සමය හා මවුවත් බව බෞද්ධ සාහිත්‍ය තුළින් මට වැටහුණු යමක් වේ. ඒ මෙයයි,

'මවුවරුනි ලොව මැවූ මැවුම්කරුවෝ ඔබලායග සර්වබලධාරී දෙවියන් වහන්සේද මහා බ්‍රහ්මයාද මවුවත් බවය. මවුවත් බවමය'

LESSON 10



Hope you can count fluently up to hundred in French now! Can you also name parts of your body in French? At the same time, you should also be able to name the days of the week and the months of the year. You could use them in your daily use and try to remember them more. The more you use the more it will register in your mind. You could use the words and numbers learnt so far among a group of people who study French. Hope you keep on name tagging things around you in order to remember well. As we always say, practice and dedication is the most important factor in learning a foreign language. Your dedication will definitely result in an impressive improvement in you.

This month's Dasatha issue consists of a vocabulary section and a grammar section. Vocabulary section presents a lesson on directions. Conversation section will continue again in future issues after presenting you with these important vocabulary lists as said before. The grammar lesson continues as usual to improve your grammar knowledge and help you converse and write correctly in French. Enjoy learning! Thank you!




## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary

The vocabulary section of this months's Dasatha issue presents a lesson on directions. Learning how to say directions makes learning an interesting experience. Once you familiarise with the vocabulary list furnished below, you can walk with much confidence in to a French speaking community or a country. You will be able to help a French speaker find his way in an English-speaking environment. In return, you will be never lost in a French speaking country. We present you with correct questions to ask to get the directions, few names of some important places that you should know when you are a foreigner or a traveller and the phrases that explain where certain places are located and how to find your way there.

Indiquer le chemin en français (ඇන්දිකෙ ල ෂමැං ඕං ෆ්‍රොන්සෙ) / Les directions (ලෙ දිරෙක්සියොං)
Est-ce que je peux vous demander mon chemin ? (එස්ක ජ ප වූ දමොංදෙ මොං ෂමැං?) - May I ask you for directions ?
Pouvez-vous me dire où ça se trouve ? (පූවෙ වූ ම දීර් ඌ සා ස තෘව් ?) - Can you tell me where that is ?
Pouvez-vous me montrer où ça se trouve ? (පූවෙ වූ ම මොන්ත්‍රෙ ඌ සා ස තෘව් ?) - Can you show me where that is ?
**Où se trouve.. (ඌ ස තෘව්..) /Où est... (ඌ ඒ...) ?**

la banque (ලාබොංක්) - bank
le salle de bain (ලසල්දබැං) / la toilette (ලාතුවාලෙත්) - washroom
l'église (f) (ලෙග්ලීස්) - church
l'épicerie (f) (ලෙපිසරී) - grocery store
l'hôpital (m) (ලොපිතාල්) - hospital
l'hôtel (ලොතෙල්) - hotel
le musée (ලමියුසෙ) - museum
le bureau de change (ලබියුරොදෂොංෂ්) - money exchange
le cinéma (ලසිනෙමා) - movie theater
le parc (ලපාක්)- park
le commissariat (ලකොමිසරියා) / le poste de police (ලපොස්ත් ද පොලිස්)- police station
le bureau de poste (ලබියුරො ද පොස්ත්) - post office
le restaurant (ලරෙස්තොරොං) - restaurant
l'aéroport (ලෙරොපොර්)- airport
l'arrêt de bus (ලරෙදබියුස්) - bus stop
la station de métro (ලාස්තාසියොං ද මෙත්‍රො) / la gare (ලාගාර්) - train station
l'école (f) (ලෙකොල්) - school
le théâtre (ලතෙආත්‍ර)- theater

**C'est... (සෙ...) / Il est... (ඉල් ඒ...) - It is...**
à gauche (ආගොෂ්) - to / on the left
à droite (ආදාවත්) - to / on the right

tout droit (තූදාවා) - straight ahead
à côté de (ආකොතෙද) - next to
devant (දවොං) – infront of
derrière (දෙරියෑර්) – behind
en haut (ඔන්ඕ) - up
en bas (ඔන්බා) - down
près de (ප්‍රෙද) - near
loin d'ici (ලුඅැංදිසී) - far from
au nord (ඔනෝර්) - to the north
au sud (ඔසියුද්) - to the south
à l'est (ආලෙස්ත්) - to the east
à l'ouest (ආලුවෙස්ත්) - to the west
tournez à droite (තූර්නෙආදාවත්) - turn right
tournez à gauche (තූර්නෙආගොෂ්) - turn left
au coin de (ඔකුඅැංද) - at the corner of
la prochaine rue (ලාප්‍රොෂැං රියු) - the next street
là-bas (ලාබා) - over there
le centre-ville (ලසොන්ත්‍රවිල්) - downtown
le kilomètre (ලකිලොමෙත්‍ර) - kilometer
en face de (ඕංෆාස්ද) - in front of
la rue suivante (ලාරියුසුයිවොන්ත්) - the street after the next
au bout de (ඔබුද) - at the end of
au début de (ඔදෙබියුද) - at the beginning of

## Grammaire (ග්‍රාමෑර්) Grammar

From Last Lesson

| Vouloir (වුලුවාර්) – to want | |
|---|---|
| je veux (ජව) | nous voulons (නු වුලොං) |
| tu veux (තියුව) | vous voulez (වු වුලෙ) |
| il/elle/on veut (ඉල්/එල්/ඔන් ව) | ils/elles veulent (ඉල්/එල් වල්) |

Hope you studied the irregular –ir verbs presented in the last issue of Dasatha! That completes the lesson on irregular –ir verbs. It is inclusive only of the most commonly used irregular verbs of the –ir group. As said before, in order to hold a conversation or to construct sentences in French, along with enriching vocabulary, it is important to know the verbs and their conjugations. French irregular verbs are numerous and it is simply by memorizing that you could remember the conjugations of these verbs. There is no rule that you could follow in order to remember these conjugations. As you might have noticed in last few issues, an effort has been made in regrouping the irregular verbs that are being conjugated in a similar pattern. Try constructing small sentences on your own using all the verbs you learnt so far to improve your writing skills. This month we are learning the conjugations of the irregular –re verb group, the third and the last group of verbs. It is impossible to list all the irregulars in a verb group. We are presenting you the most frequently used and the most important irregulars in this group as well.

### The first group of irregular -re verbs :

**Verbs like Prendre are conjugated like regular -re verbs in the singular, but not in the plural.**

| Prendre (ප්‍රොංද්‍ර) - to take | |
|---|---|
| je prends (ජ ප්‍රොං) | nous prenons (නු ප්‍රෙනොං) |
| tu prends (තියු ප්‍රොං) | vous prenez (වු ප්‍රනෙ) |
| il/elle/on prend (ඉල්/එල්/ඔන් ප්‍රොං) | ils/elles prennent (ඉල්/එල් ප්‍රෙන්) |

Verbs conjugated like Prendre include:

Apprendre (අප්‍රොංද්‍ර) - to learn
Comprendre (කොම්ප්‍රොංද්‍ර) - to understand
Surprendre (සියුර්ප්‍රොංද්‍ර) - to surprise

### The second group of irregular -re verbs

| Mettre (මෙත්‍ර) - to place, put | |
|---|---|
| je mets (ජ මෙ) | nous mettons (නු මෙතොං) |
| tu mets (තියු මෙ) | vous mettez (වු මෙතෙ) |
| il/elle/on met (ඉල්/එල්/ඔන් මෙ) | ils/elles mettent (ඉල්/එල් මෙත්) |

Other verbs like Mettre include:

Admettre (අද්මෙත්‍ර) - to admit
Permettre (පැර්මෙත්‍ර) - to permit
Promettre (ප්‍රොමෙත්‍ර) - to promise
Remettre (රමෙත්‍ර) - to turn in (a report), to postpone

The third group of irregular -re verbs

| Suivre (සුයිව්ර) - to follow | |
|---|---|
| je suis (ජ මෙ) | nous suivons (නු මෙතොං) |
| tu suis (තියු මෙ) | vous suivez (වු මෙතෙ) |
| il/elle/on suit (ඉල්/එල්/ඔන් මෙ) | ils/elles suivent (ඉල්/එල් මෙත්) |

Vivre is the only verb which conjugated like Suivre :

| Vivre (වීව්ර)- to live, to be alive | |
|---|---|
| je vis (ජ වී) | nous vivons (නු විවොං) |
| tu vis (තියු වී) | vous vivez (වු විවෙ) |
| il/elle/on vit (ඉල්/එල්/ඔන් වී) | ils/elles vivent (ඉල්/එල් වීව්) |

*The verb falloir takes only one subject pronoun.*

**Kumudu Abeywardena**
Masters (French Literature), BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com



# හෘදයාබාධයකදී දැනෙන්නේ අලියෙක් පපුව පාගාගෙන ඉන්නවා වගේ වේදනාවක්

■ රමණී සුබසිංහ

**Q වැඩි දෙනෙක් හාට්ඇටෑක් ලෙස හඳුන්වන හෘදයාබාධ ගැන සරල පැහැදිලි කිරීමක් කළ හැකිද?**

හෘදයෙහි මාංශ පේශීන්ට රුධිරය සපයන රුධිර නාළයක් අවහිර වී එම රුධිර නාළය මගින් රුධිරය සැපයූ හෘදයෙහි කොටසක් මිය යාම හෘද අකරණිය ලෙස හැඳින්වෙනවා. හදවත අපගේ සිරුරෙහි ක්‍රියාකාරීත්වය සඳහා ඉතා වැදගත් ඉන්ද්‍රියයක්. එය අකර්මණ්‍ය වූයේ නම් සිරුරේ සෑම අවයවයකටම රුධිරය සමග ඔක්සිජන් සහ ග්ලූකෝස් සැපයීම ඇණහිටිනවා. වෛද්‍ය විද්‍යාත්මකව එය ඉතා හදිසි තත්ත්වයක්. එවැනි අවස්ථාවක අදාළ පුද්ගලයා සිරුර වෙහෙසවා තවදුරටත් හදවත වෙහෙසට පත් කළේ නම් හදවතෙහි ක්‍රියාකාරිත්වය ඇන හිට විනාඩි කිහිපයකදී වුවද මිය යා හැකියි.

**Q හෘද අකරණියක් ගැන කල්තියා දැනගත හැකිද?**

එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්. බොහෝ අයට හදවතේ අකර්මණ්‍යතාවක් සිදුවේ යැයි කල්තියා දැනගත හැකි අනතුරු හැඟවීමේ ලක්ෂණයක් වන්නේ හදවතෙහි වේදනාවයි. වෙහෙසට පත් වූ විට හෝ සිත තැතිගත් අවස්ථාවන්හිදී පපුවේ මැද කොටසේ හටගන්නා වේදනාව විනාඩි කීපයක් පැවතී උරහිසට අත්වලට හා බෙල්ල දෙසට පැතිරී යා හැකියි. ඒ වේදනාව හඳුන්වන්නේ Angina (ඇන්ජයිනා) නමින්. එවැනි රෝග ලක්ෂණ මතුවන අය වහාම වෛද්‍යවරයෙක් වෙත යා යුතුයි. එමගින් අනාගතයේදී ඇතිවිය හැකි හෘද අකර්මණ්‍යතාවකින් බේරී සිටීමට පුළුවන්. මීට අමතරව සමහර අයට හෘදයාබාධයක් සිදුවන බවට කිසිදු හෝඩුවාවක් නොලැබී වුවද රෝගී විය හැකියි.

**Q හෘද අකර්මණ්‍යතාවකදී හදවතෙහි සිදුවන ක්‍රියාවලිය මොන වගේද?**

අපගේ මුළු සිරුරටම රුධිරය පොම්ප කරන්නේ හදවතෙන්. එහි ජීවය රැක ගැනීම සඳහාද මනා රුධිර සැපයුමක් අත්‍යවශ්‍යයි. හෘදයට රුධිරය සපයන ප්‍රධාන රුධිර නාළ හෙවත් ධමනි දෙකක් දක්නට ලැබෙනවා. මේ රුධිර නාළවල බිත්තියේ කාලයක් තිස්සේ කොලෙස්ටරෝල් නම් මේදය තැන්පත් වීමෙන් 'ඇතරෝමා' (Atheroma) නම් තෙල් කැටියක් හට ගන්නවා. ඒ තෙල් කැටිය නිසා හෘද රුධිර නාළ හිරවුවහොත් ඉන් ඔබ්බට රුධිරය ගලා යා නොහැකියි. එසේ හිර වූ ධමනියෙන් රුධිරය සැපයුණු කොටසේ සෛල මිය යාම සිදුවෙයි. රෝගියාට පපුවේ තද වේදනාවක් ඇතිවන්නේ එවිටයි. යම්හෙයකින් ඒ තත්ත්වයට පත්වී රෝගියා තවදුරටත් ජීවත් වන්නේ නම් මියගිය පේශිය ඇති ස්ථානයේ තන්තු පටක තැන්පත් වී කැළලක් හටගන්නවා. එහි නැවත පේශි වර්ධනය නොවන නිසා හෘදයේ රුධිරය පොම්ප කිරීමට ඇති ශක්තියද හීන වී යනවා.

**Q හෘද අකර්මණ්‍යතාවක අවදානම වැඩි කාටද?**

මැදිවියෙහි සිටින පිරිමි අයට සහ අවුරුදු 50 පසු කළ (ආර්තවය නතර වූ) කාන්තාවන්ට හෘද අකර්මණ්‍යතාවක් ඇති වීමේ ප්‍රවණතාව වැඩියි. විශේෂයෙන් දුම්පානය කරන අය, වැඩිපුර තෙල් සහ මේදය සහිත ආහාර ගන්නා අය, කලබලකාරී ජීවන රටාවකට හුරු වූ අය, අධික සිත්තැවුලෙන් කල්ගෙවන අය අතර මේ රෝගය ඇතිවීමේ ඉඩ වැඩියි. මාස් ශුද්ධිය සිදුවන කාන්තාවන් අතර සහ අවුරුදු 35 ට අඩු පිරිමි අය අතර හෘදයාබාධ පිළිබඳව අසන්නට ලැබෙන්නේ කලාතුරකින්. අවුරුදු 30 - 40 දී මෙම රෝගයට ගොදුරු වන්නේ නොයෙකුත් හේතු සාධක ඇති අයයි. දියවැඩියාව, අධික රුධිර පීඩනය, රුධිරයේ කොලෙස්ටරෝල් වැඩිවීම, අධික ලෙස දුම්පානය කිරීම ආදී හේතු සාධක නිසා අඩු වයසෙන් හෘදයාබාධ ඇතිවීමට පුළුවන්. මීට අමතරව සමහර පවුල් අතරද හෘදයාබාධ ඇතිවීමේ ප්‍රවණතාව ඉහළයි.

**Q ආර්තවය හා හෘදයාබාධ අතර සම්බන්ධයක් තිබෙනවාද?**

ස්ත්‍රීන්ගේ ශරීරයේ ඇති ඊස්ට්‍රජන් හෝමෝනය නිසා ඔවුන්ට ආර්තවය පවතින කාලයේ හෘදයාබාධ හැදෙනවා අඩුයි. ඊස්ට්‍රජන් හෝමෝනය නිසා කිරීටක ධමනිවල මේද තැන්පත් වීම අඩු වීම ඊට හේතුවයි. ආර්තවය නැවතුණු පසු විශේෂයෙන් කාන්තාවන්ට හෘදයාබාධ හටගැනීමට ඇති ඉඩකඩ වැඩියි.

**Q හෘදයාබාධයකදී වේදනාව දැනෙන්නේ පපුවේ කුමන පැත්තකද?**

වැඩිපුරම වේදනාව දැනෙන්නේ පපුවේ මැද. ඒ වේදනාව ඇතැම්විට අලියකු විසින් පපුව පාගා සිටිනවා වැනි දැඩි වේදනාවක් විය හැකියි. එහෙත් වයසක අයට සහ දියවැඩියාවෙන් පෙළෙන අයට වේදනාවක් නොදැනීම හෘදයාබාධයක් ඇතිවිය හැකියි. ඒ වගේම පපුවේ වම්පසින් දැනෙන වේදනාවක් හෘදයාබාධයක ලක්ෂණයක් වීමට පුළුවන්.

**Q හෘදයාබාධයට හේතු වන කොලෙස්ටරෝල් අවම කිරීමට ආහාර ගත් විගස උණුවතුර වීදුරුවක් පානය කිරීම හොඳයි කියන කතාව ඇත්තද?**

නෑ. එම ප්‍රකාශය කිසිදු විද්‍යාත්මක පදනමකින් තොරව පැතිරුණ මතයක්.

**Q හෘදයක ප්‍රමාණය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්ද?**

ඔව්. පුද්ගලයාගෙන් පුද්ගලයාට පමණක් නොවෙයි වයස අනුවත් එය වෙනස් වෙනවා. පොදුවේ යම් පුද්ගලයකුගේ පපුවේ පළලෙන් භාගයක ප්‍රමාණයක් හෘදයේ පළලට සමානයි. ඊට වඩා හෘදය විශාල වේ නම් එය හෘදයේ ඉදිමීමක් විය හැකියි.

**Q හෘදය අකර්මණ්‍ය වූ මොහොතක ජලය පෙවීම අහිතකරද?**

සාමාන්‍යයෙන් හෘදය අකර්මණ්‍ය වීමත් සමග රෝගියා සිහි මූර්ජාවට පත්වෙනවා. එවැනි අවස්ථාවක ජලය පෙවීම ඉතා නුසුදුසුයි. හෘදයේ වේදනාවක් දැනෙන මොහොතක බොහෝ අය සිතන්නේ එය ගැස්ට්‍රයිටිස් නිසා ඇති වූ තත්ත්වයක් බවයි. ඒ නිසා ජලය පානය කරන අතරම යෝගට් ආදිය ආහාරයට ගන්නවා. එවැනි ප්‍රතිකාරයකින් පසුත් වේදනාව දිගින් දිගටම පවතී නම් එය හෘදයාබාධයක ලක්ෂණයක් විය හැකියි. එවැනි අවස්ථාවක වහාම වෛද්‍යවරයකු වෙත යොමු විය යුතුයි.

**Q පපුවේ වේදනාවක් දැනෙන මොහොතක වෛද්‍ය නිර්දේශයකින් තොරව ඇස්ප්‍රින් පෙත්තක් බීම සුදුසුද?**

එහි වරදක් නෑ. ඇස්ප්‍රින් ලබාදීමෙන් රුධිර කැටි ගැසීම වැළැක්වෙනවා.

**Q හෘදයාබාධයක් හටගත් රෝගියකුට ලබාදිය හැකි ප්‍රථමාධාර මොනවාද?**

හෘදයාබාධයකදී බොහෝ සංකූලතා ඇති වන්නේ පළමු පැය තුන තුළදීයි. ඒ පැය තුන මඟ හැරුණා නම් අදාළ රෝගියාට රෝහලක විශේෂ හෘද ප්‍රතිකාර ඒකකයක ප්‍රතිකාර කිරීම අවශ්‍ය නැති තරම්. එහෙත් මේ පිළිබඳව තීරණ ගත යුතු වන්නේ වෛද්‍යවරයා පමණයි. විශේෂයෙන් සුදුසුකම් ලත් වෛද්‍යවරයකු විසිනුයි. ඔහු රෝගියාගේ තත්ත්වය පරීක්ෂා කර බලා (නාඩි, රුධිර පීඩනය, ශ්වසන ශබ්ද ආදිය) අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙනු ඇති. වඩාත් සුදුසු වන්නේ ළඟම ඇති රෝහලකට ගෙන ගොස් එහිදී ප්‍රතිකාර ලබා දීමයි.

**Q හෘද අකරණියක් ඇති රෝගියකු රෝහල වෙත ගෙන යා යුතු වන්නේ කෙසේද?**

මෙහිදී ඉතාම වැදගත් වන්නේ රෝගියා මහන්සි වීම වළක්වා ඇඳ විවේකයෙහි තැබීමයි. රෝගියාට ඇවිදින්නට දීම කිසිසේත් සුදුසු නොවන අතර ඔසවාගෙන යා යුතුයි.

**Q හෘදයාබාධයක් වළක්වා ගැනීමට ගත යුතු පියවර මොනවාද?**

දුම්පානයේ දී රුධිර නාළ සිහින් වීම සහ ඝන වීම ඇති කරයි. එය හෘදයාබාධ ඇතිවීමට ප්‍රධාන හේතුවකි. ඒ නිසා ඔබ දුම්පානය කරන කෙනෙක් නම් වහාම එය නතර කළ යුතුයි. අප ගන්නා ආහාරයේ ඇති සත්ව තෙල් හා කොලෙස්ටරෝල් අඩු කිරීමෙන්ද හෘදයාබාධ ඇති කරන 'ඇතරොමා' නම් තෙල් කැටිය හට ගැනීම වැළැක්විය හැකියි. ඒ නිසා බිත්තර කහමදය, සත්ව තෙල් වර්ග, හා රතු පැහැති මස් වර්ග අනුභවය අඩු කිරීම හෝ නවතා දැමීම වැදගත්. හෘදයාබාධ වළක්වාලීමේ සුවිශේෂී පියවරක් වන්නේ ව්‍යායාමයයි. අඩුම තරමින් සතියකට තුන් වරක් පමණවත් පැය භාගයක පමණ කාලයක් ව්‍යායාමයන්හි නිරත වීම ඉතා වැදගත්. පිහිනීම, බයිසිකල් පැදීම සහ සෙමෙන් දිවීම හෝ වේගයෙන් ඇවිදීම පහසුවෙන් කළ හැකි ව්‍යායාම කිහිපයක්. එසේ නොවේ නම් ඔබට ගැළපෙන ව්‍යායාමය කුමක්දැයි වෛද්‍යවරයකු හමු වී උපදෙස් ලබාගත හැකියි.

**Q ක්‍රියාකාරී දිවි පෙවෙතක් ගත කළ කෙනෙකුට හෘදයාබාධයකින් පසු වෙනදා මෙන් වැඩ කිරීම නුසුදුසුද?**

එවැනි රෝගියෙක් වැඩපළවල නිරත විය යුතු වන්නේ අනිවාර්යයෙන්ම වෛද්‍ය උපදෙස් ඇතිවයි. සමහර හෘදයාබාධ රෝගීන් මාස තුනක් ඇතුළත සාමාන්‍ය ජීවිතයට පුරුදු වෙනවා. රෝහල් ගත වී සිට නිවසට ආ පළමු සති දෙක තුළ සමතලා පොළොවේ සෙමෙන් ඇවිදීම (මීටර් 800 ක් පමණ. දිනෙන් දින ක්‍රමයෙන් වැඩි කරමින්) කළ හැකියි.

මාස දෙකක් පමණ ඉක්ම වූ විට වත්ත පිටියේ සරල වැඩක්, සෙමෙන් බයිසිකල් පැදීම ආදිය කළ හැකියි. එහෙත් අධික ලෙස එකවර මහන්සි නොවීම ඉතාම වැදගත්. එකවර බර ඔසවන්නට යාම, වාහන තල්ලු කිරීම කිසිසේත්ම නොකළ යුතුයි. වැඩ කිරීමේදී වුවද එක දිගට වැඩයේ නිරත නොවී විනාඩි දහයකට වරක් හෝ විවේක ගනිමින් වැඩ කිරීම වැදගත්.

**Q හෘදයාබාධයකින් පියා මියගිය පවුලක දරුවකුට හෘද අකරණියක් ඇති වීම වළක්වා ගත හැකි වන්නේ කෙසේ ද?**

එවැනි අය පවුලේ වෛද්‍යවරයා සමඟ තමන්ගේ ගැටලුව විවෘතව සාකච්ඡා කිරීම ඉතා වැදගත්. නිතිපතා රුධිර පීඩනය පරීක්ෂා කරගැනීම, හා රුධිර පීඩනය වැඩි නම් ඖෂධ භාවිත කිරීම, රුධිර කෙලෙස්ටරෝල් මට්ටම පරීක්ෂා කරවා ගැනීම ආදියට වැඩි අවධානයක් යොමු කිරීම වැදගත්. දියවැඩියාවෙන් පෙළෙන්නන් හෘදයාබාධවලට ගොදුරු වීමේ ඉඩ වැඩි නිසා දියවැඩියාවට ප්‍රතිකාර ගත යුතු අතරම ස්ථූල බවින් පෙළෙන්නේ නම් එය පාලනය කිරීම සඳහා ආහාර පාලනය කළ යුතුයි. ව්‍යායාමද ඉතා වැදගත්. අද බොහෝ දෙනෙක් විවිධ වැඩ කටයුතු නිසා අවිවේකයි. අවිවේකී බව වගේම නින්ද අඩුකම, මානසික අසහනය ආදියත් හෘදයාබාධවලට හේතු සාධක වෙනවා. එම නිසා කලබලකාරී වාතාවරණයෙන් දුරස් වී විනෝදයට, විවේකයට කාලය වෙන් කිරීමද ඉතා වැදගත්.

සාමාන්‍යයෙන් බොහෝ දෙනෙක් කල්පනා කරන්නේ 'මට හෘදයාබාධයක් හැදෙන එකක් නෑ' කියලයි. එහෙත් අයහපත් පුරුදු නිසා තමන් නොදැනීම වුවද එවැනි තත්ත්වයක් ඇතිවිය හැකියි. හදිසියේ හෝ හෘද අකරණියක් ඇති වූයේ නම් කළ යුතු දේ ගැන පවුලේ වෛද්‍යවරයා සමඟ සාකච්ඡා කර තිබීම වැදගත්. එය ඔබ අනාගතයේ ජීවිත අවදානමකින් මුදවා ගන්නට සමත් වෙනවා.

**Q මත්පැන් හා හෘදයාබාධ අතර සම්බන්ධයක් තිබෙනවාද?**

මත්පැන් හා හෘදයාබාධ අතර සම්බන්ධයක් නැතත් මත්පැන් පානය නොකිරීම යහපත් සෞඛ්‍ය තත්ත්වයකට ඉතා සුදුසුයි.

**Q හෘදයාබාධ රෝගීන්ගේ ආහාර රටාව කෙබඳු විය යුතුද?**

ආහාර රටාව වගේම ජීවන පුරුදුත් ඉතා වැදගත්. දියවැඩියාව, කොලෙස්ටරෝල්, අධි රුධිර පීඩනය යන රෝගාබාධ හෘදයාබාධ සමඟ සම්බන්ධ නිසා ඒ අනුව ආහාර පාලනය ඉතා වැදගත්. විශේෂයෙන් සමබල ආහාර රටාවකට හුරු වීම මෙන්ම ව්‍යායාමයද හදවතට හොඳයි.

# MONEY PROBLEMS?™

ඔබගේ සියලුම ණය එක් කුඩා මාසික වාරිකයකින් ගෙවන්න

**ඔබගෙන්ම විමසන්න....**



- ඔබගේ බැංකු අයිරාව **(overdraft)** සෑම විටම භාවිත කරන්නේද?
- ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
- ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
- ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටීද?
- ඔබගේ ණය තක්සේරුව **(credit rating)** සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
- ඔබගේ වාහනය, නිවස, **RRSP**, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
- ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
- ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටීද?

gta™ credit

**ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න**



**Scarborough / Downtown Toronto: 416-489-2000**
**Mississauga / Brampton: 416-650-5400**



**Scarborough**
201-4433 Sheppard Ave. E
Scarborough, ON, M1S 1V3

**Toronto/Downtown**
800-120 Eglinton Ave. E
Toronto, ON, M4P 1E2

**North York**
306-1280 Finch Ave. W
North York, ON, M3J 3K6

**Mississauga**
110-93 Dundas Street E.
Mississauga, ON, L5A 1W7

**Brampton**
201-7990 Kennedy Rd. South,
Brampton, Ontario, L6W 0B3

**Mark Shamly**
*Sinhalese Consultant*

*Proudly Served over 10,000 clients since 2004*
**Visit : GtaCredit.Com**

**Ajay Oberoi**
*Government Certified Counsellor*



TB
TISSA BOYAGODA, LLM

# KNOW YOUR RIGHTS



**TISSA BOYAGODA, LLM**
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka

**Areas of Practice**
- Criminal Law
- Family Law
- Real Estate
- Immigration Matters
- Civil Litigation
- Small Claim Court Matters
- Power of Attorneys
- Last Wills
- Notarizations

GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED

**1965 Britannia Road West, Suite 208**
**Mississauga, ON, L5M 4Y4**

**100 Consilium Place, Suite 200**
**Scarborough, ON, M1H 3E3**

**TEL: 416.627.6090**
**FAX: 289.997.3426**
**EMAIL: tboyagoda@gmail.com**

**www.tissaboyagodalaw.com**

# අසිරිමත් සිදුවීම් රැසක් එක් කළ

# වෙසක් පුන් පෝය







■ ශාස්ත්‍රපති
වතුරුවිල හේමාලෝක නායක ස්ථවිර

**මේ වෙසක් සමයයි. සම්බුදු පියාගේ තෙමඟුල සමරමින් බෞද්ධ අබෞද්ධ ලෝකවාසී ජනතාවම පෙළ ගැසෙන මාසයයි. ලොව තුළ පැවැති සජීව අජීව හැම වස්තුවක්ම නිවී සැනහීම් බවට පත් කළ, ශාන්ත ධර්මයේ ආලෝකයෙන් මුළු තුන් ලොවම සතුන්ගේ සිත් සතන් පහන් කළ, වීතරාගී මහා කාරුණිකයාණෝ ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම සිදුවූ උතුම් දින උදාවන කාලයයි. ලංකාවාසී ජනතාවම දාන, සීල, භාවනාමය වශයෙන් ප්‍රතිපත්ති පූජාවේ මෙන්ම තොරණ සැරසිලි බැති ගී ආමිස පූජාවන් ආදි විවිධ පිංකම්වල මෙන්ම විවිධ පරාර්ථ චර්යාවන්හි යෙදෙමින් මහා කෘතවේදීත්වය පළකරන වකවානුවයි.**

සැදැහැවත් බෞද්ධ ජනතාව අනුස්මරණය කරනුයේ බුද්ධෝත්පත්තිය, සම්මා සම්බුද්ධත්වය, පරිනිර්වාණය පමණක් නොව ඒ හා බැඳුණු අති විශාල ශ්‍රේෂ්ඨ උදාරත්වයෙන් පිරුණු සිදුවීම් රාශියකි.

■ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා සමතිංසත් පාරමිතාවන් පිරීමටත් ගෞතම නමින් ලොව්තුරා බුදුවීමටත් දීපංකර බුදුරජුන්ගෙන් සුමේධ තාපසයාව විවරණ ලැබුවේ වෙසක් පුන් පොහෝදාකය.

■ දස බිම්බරක් මාර සෙනග දමනය කර තණ්හා, රතී, රඟා යන මාර දූවරු පරදවා සකල ක්ලේශයන් දවා හළුකර උතුම් වූ ලොව්තුරා බුද්ධ රාජ්‍යයට පත් වූයේද වෙසක් පුන් පොහෝදාකය.

■ මහා පෘථිවිය කම්පිත කරවමින් සුදොවුන් රජුට දාව මහා මයා දේවිය කුසින් එළිය දුටු බෝධිසත්වයෝ (සිද්ධාර්ථයන්) 'අග්ගෝ හමස්මි ලෝකස්ස' යන අභීත සීහ නාදය පැවැත්වූයේත් සත් පියුම් මත පා තබා ඇවිද ගියේත් වෙසක් පුන් පොහෝදාකය.

■ මානයෙන් උදම් වී නොමඟ ගිය ශාක්‍ය වංශිකයන් හමුවීමට කිඹුල්වතට වැඩම කර ලොවුතුරා බුදු බලය පෙන්වා මානය දුරු කර සැබෑ මනුෂ්‍ය ගුණ ධර්මයේ මිහිර විඳීමට ශාක්‍යයන්ට පාඩම කියා දුන් යමාමහ පෙළහර පෑවේද වෙසක් පුන් පොහෝදාකය.

■ 'හන්දදානි, භික්ඛවේ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ....'' සියලු සංස්කාරයෝ අනිත්‍යය. පමා නොවී කටයුතු කරන්න. සිය ශ්‍රාවකයන්ට අවසාන අවවාදය ලබා දෙමින් පන්සාලිස් වසක් තුරිත අතුරිත වශයෙන් ගම් නියම්ගම් දනව් සැරිසරා ලෝවැසියාට ජීවිතයේ යථාර්ථය පෙන්වූ ලොවුතුරා අමාමෑණී බුදුපියාණන් වහන්සේ අනුපදිශේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑවේ වෙසක් පුන් පොහෝදාකය.

■ කතරගම තිස්සමහාරාම කිරිවෙහෙර ඇතුළු සොළොස්මස්ථානවලට වැඩම කර සමවත් සුවයෙන් කාලය ගත කළ ලොව්තුරා බුදුපියාණන් වහන්සේ එම උතුම් පූජනීය ස්ථාන පිහිටිය යුතු තැන් බුදු පහසින් ස්පර්ශ කළේද වෙසක් පුන් පොහෝදාකය.

■ සම්මා සම්බුද්ධත්වයෙන් 8 වැනි අවුරුද්දෙහි තෙවැනි වර ශ්‍රී ලංකාවට වැඩම කර මණිඅක්ඛික නා රජුගේ ආරාධනයෙන් කැලණියට වැඩම කිරීම හා සුමන සමන් දිව්‍ය රාජයාගේ ආරාධනයෙන් සමනොල ගිරට වැඩම කර ශ්‍රීපාද ලාංඡනය තබා පූජනීය වස්තුවක් ලෙස ශ්‍රී ලාංකික ජනතාවට දායාද කළේ උතුම් වෙසක් පුන් පොහෝදාකය.

■ සම්බුද්ධ පරිනිර්වාණයට සූදානම් අමාමෑණී බුදු පියාණන් ශ්‍රී ලංකා ධරණීතලය බුදු දහමින් පාරිපෝෂිතව බැබළෙන බව බුදු ඇසින් දැක සක් දෙවිඳුන්ට ශ්‍රී ලංකාව ආරක්ෂා කරන ලෙස භාර කළේද වෙසක් පුන් පොහෝදාකය.

■ විජය රජ සත් සියයක් පිරිවර සේනා සමඟ ලක්දිව තම්බපණ්ණියට ගොඩ බැස අනුරාධපුර රාජධානිය අරඹා හෙළ සංස්කෘතිය නව මාවතකට යොමු කළ සිංහල ජාතියේ සමාරම්භය සිදුකළ විජයාවතරණය සිදුවූයේ වෙසක් පුන් පොහෝදාකය.

■ පළමු ධර්ම සංගායනාවට විශාල දායකත්වයක් දුන් ධර්ම භාණ්ඩාගාරික ධුරයෙන් පිදුම් ලැබූ ආනන්ද මහරහතන් වහන්සේ වසර 120 ක් ආයු වළඳා සම්බුදු පරිනිර්වාණයෙන් වසර 40 කට පසුව රෝහිණී නදිය අසබඩදී තේජෝ කසිණ සමවතට සමවැදී පිරිනිවන් පෑවේද වෙසක් පුන් පොහෝදාකය.

■ මහා මහේන්ද්‍ර මහරහතන් වහන්සේ විසින් ගෙනෙන ලද සම්බුද්ධ ශාසනය ගෞරවයෙන් පිළිගත් දෙවන පෑතිස් රජු ධර්මාශෝක චක්‍රවර්තීන් විසින් තිළිණ කළ පඤ්ච කකුධ භාණ්ඩ සහිතව ද්විතීය රාජාභිෂේකය උත්සවශ්‍රීයෙන් සිදුකළේ වෙසක් පුන් පොහෝදාකය.

■ දෙවන පෑතිස් නිරිඳාණන් අනුගමනය කරමින් හෙළ රාජවංශයේ හා සියලුම නරපතීන් රාජාභිෂේකයෙන් පිදුම් ලැබුවේ වෙසක් පුන් පොහෝදාකය.

■ පන්සැත්තෑ වසරකට අධික කාලයක් පරසතුරු උවදුරින් පීඩා විඳි හෙළ බෞද්ධ ජනතා බලය පෙන්වා රට එක්සේසත් කළ දුටුගැමුණු මහා නරේන්ද්‍රයාණන් අනුරපුර මහමෙවුනා උයනෙහි දිදුළමින් වැඩ වසන මහා ස්ථූපය රුවන් වැලි සෑ රජුන් සාදන්නට විසා නැකතින් මුල් ගල් තැබුවේද වෙසක් පුන් පොහෝදාකය.

■ සූ විසිවසරක් රට පාලනය කළ දුටුගැමුණු රජතුමා 24 වාරයක්ද, භාතිය රජතුමා 28 වාරයක්ද, වසභ රජතුමා 44 වාරයක්ද, වෝහාරිකතිස්ස, ගෝඨාභය, ජෙට්ඨතිස්ස, දළ මුගලන්, දෙවැනි සේන, මහා පරාක්‍රමබාහු, දෙවැනි පරාක්‍රමබාහු ආදී සියලු නරපතීන් රාජ්‍යත්වය පැවැති වසර ගණනාවක් පුරා මහා උත්සවශ්‍රීයෙන් සැමරූ උත්සවය වූයේද වෙසක් පුන් පොහොයයි.

■ ශ්‍රී ලංකා ශ්‍යාමෝපාලි මහා විහාරවංශික භික්ෂූන් වහන්සේලා වාර්ෂිකව පවත්වන උපසම්පදා මහෝත්සවය ආරම්භ වූයේද වෙසක් පුන් පොහෝදාකය.

මේ ආකාරයට වෙසක් පුර පසළොස්වක් පෝය මෙරට සිංහල බෞද්ධ ජනතාවට පමණක් සීමා නොවී ලෝක බෞද්ධ ජනතාවටද විශේෂ දිනයක් වූ බව ඉහත සිදුවීම් තුළින් මනාව පැහැදිලි වේ. රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ ගෞරවාදරයට හා මනා සැලකිල්ලට බඳුන් වූ වෙසක් පුන් පෝය සියවස් ගණනාවක් පුරාම විවිධ ආමිස හා ප්‍රතිපත්ති පූජාවලින් සමලංකෘතව පවත්වන බව වර්තමානයේදීත් දැකිය හැකිය.

සම්බුද්ධ ජීවිතයේ සුවිශේෂී අවස්ථා රැසක් මුල් කරගෙන පවත්වනු ලබන මෙම ජාතික හා ආගමික මහෝත්සවය ශ්‍රී ලංකාවාසී බෞද්ධයෝ අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට නොපසුබට වන්නේ මෙහි ඇති අතිඋතුම් වැදගත්කම නිසාමය. දුප්පත් පැල්පතේ සිට මහා මන්දිරය දක්වා පොල්තෙල් පහනක් දැල්වෙනුයේ, පැන් බඳුනක් හෝ පූජා කරනුයේ සීලයෙන්, ගුණයෙන් පිරී ගිය දෛනික දිවියක්ගත කරනුයේ වෙසක් පෝය දින ඇති වැදගත්කම නිසාමය.


AJITH BERAGAMA LL.B, LL.M
BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC
experienced, quality, knowledgeable and affordable service
Ajith Law Office
Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law
Wills & Estates Law
Immigration Law
Family Law
24/7 Hotline - 647 328 6623
10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6
OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM


LAL LAW OFFICE
Real Estate
Mortgages
Immigration Law
Family Law
Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com


ADVICE FROM SOMEONE YOU CAN TRUST
Wherever you are in life, strengthening your plan today will help give you and your family a brighter tomorrow.
Life insurance • Critical illness insurance • RRSPs/RRIFs
Kasun Kirtisinghe
Tel: 416-708-7255
kasun.kirtisinghe@sunlife.com
www.sunlife.ca/kasun.kirtisinghe
35 Wolfe Street, Unit 2
Frankford, ON K0K 2C0
Sun Life Financial
Life's brighter under the sun
Sun Life Assurance Company of Canada is a member of the Sun Life Financial group of companies.
© Sun Life Assurance Company of Canada, 2018.

IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage,**
**Refinancing, Second Mortgage,**
**First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

**Abby Sri Haran**
Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)



- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT

ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

## පසුගියදා ටොරොන්ටෝහි පැවති
# Back To Hantana 2018
## ප්‍රසංගයෙහි විවිධ අවස්ථා....

පේරාදෙණිය සරසවිය විද්‍යාර්ථීන්ගේ සංගමයේ ටොරොන්ටෝ සහ අවට ප්‍රදේශ නියෝජනය කරන ශාඛාව මගින් සෑම වසරකම විවිධ තේමාවන් ඔස්සේ Back To Hantana සංවිධානය කරනු ලබයි.

ඒ අනුව එම සංගමය විසින් මෙවර තේමාව ලෙස තෝරාගෙන තිබුණේ, ඈත සහ මෑත අතීතයෙහි සිංහල වේදිකාව හැඩ කළ වේදිකා නාට්‍ය රංගනයන් පිළිබඳ මතකය අනුස්මරණය කිරීමයි. ඒ සඳහා සුදුසුම පුද්ගලයන් යොදා ගැනීමටද ඔවුන් අමතක කර නොතිබීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. මේ වන විට ටොරොන්ටෝවට ආගන්තුකයකු නොවන ප්‍රවීණ රංගනවේදී ආචාර්ය ජයලත් මනෝරත්නයන් සමග ප්‍රවීණ රංගන ශිල්පිනී මාධනී මල්වත්තගේ එක්ව හැඩ ගැන්වූ මේ ප්‍රසංග වේදිකාවට මෙහි සිටින පේරාදෙණිය සරසවි විද්‍යාර්ථීන් රැසක්ද එක්ව සිටිනු දක්නට ලැබුණි. අප අතර සිටින ඔවුන් එදින වේදිකාව මත ඉතාමත් විශිෂ්ට අන්දමින් රංගනයෙන් හා ගායනයෙන් තම දක්ෂතා ඉදිරිපත් කිරීම බොහෝ දෙනෙකුගේ පැසසුමට ලක් විය. ඒ සමගම ප්‍රසංගය සඳහා සංගීතය සැපයූ ප්‍රිය මිතුරෝ සංගීත කණ්ඩායම කළ කාර්යභාරයද අගය කළ යුතුවම ඇත.

එදින මෙම ප්‍රසංගය වේදිකාගත කිරීම දක්වා කාලය, ශ්‍රමය වැය කරමින් වෙහෙසුණු සියලුම දෙනා තමන්ට හිමි කාර්යය මැනවින් ඉටු කර ඇති බවට සාක්ෂි ප්‍රසංගය නැරඹීමට ශාලා පරිශ්‍රයට ඇතුළු වීමේ සිටම අපට දක්නට ලැබුණි. ශාලාවට ඇතුළු වීමට පෙර නිර්මාණය කර තිබූ සරසවි උයන දුම්රියපොළ බොහෝ දෙනෙකු අතීතයට ගෙන ගියාට සැකයක් නොමැත.

ඉතාමත් කලබලකාරී කාල චක්‍රයක ගෙවෙන ජීවන රටාව ඇතුළෙහි මඳක් සිත පහන් කර ගැනීමට ලැබුණු අගනා අවස්ථාවක් ලෙස මෙවර Back To Hantana හැඳින්විය හැක.





න අන්තලික්ඛේ න සමුද්ද මජ්ඣේ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සෝ ජගතිප්ප දේසෝ
යත්ථට්ඨිතං නප්පසහේථ මච්චු

ආකාශයෙහි, මහා සමුදුරෙහි, කඳු කුහරයෙහි හෝ අන් කිසියම්ම හෝ තැනක සිටියද මාර මුඛයෙන් මිදී සිටීමට කිසිවකුටත් නොහැක.

# ආදරණීය රේණුකා අමරසිංහ සොයුරිය
# ඔබට නිවන් සුව අත් වේවා!







'දසත' සාතිශය සංවේගය


ගී අරුන්දතී
මියැසි වලාව 2018
ශ්‍රීලාල් අමරජීව ෆොන්සේකා
Live Music by 'Priya Mithuro'
2018 ජූනි 16 සෙනසුරාදා
7.00pm @ Maja Prentice Theatre
3650 Dixie Road, Mississauga
(South West Corner of Dixie & Burnhamthorpe Intersection)
Tickets & Inquiries:
Chamila Rajapakse: 416 705-8983
Nalin Gunasekara: 289 983-7614
Dharmaraja Senarath: 416 300-2768
Niranjali Alwis: 416 995-7936
Rashanthi Hettiarachchi: 416 432-1532
Jayalath Samarakkody: 647 293-8793
$25 Complimentary Snack Included
https://www.facebook.com/geearundathie/
හමුවෙමු නැවතත්...වර්ණ සිත්තම් මැවුනු හැන්දෑවේ...


tv
තරු පිරිවරක මියැසි පෙළහර...
දෙවෙනි ඉනිම
Live in Concert
TORONTO
CANADA
09th June 2018
2450 birchmount Road
Scarborough
M1T2M5
Contact for Tickets
West End Buddhist Temple 905 891 8412
Touchdown Food 416 293 4440
Banana Leaf 416 439 8000
Nilanthi Hettige 416 499 2284
Rashanthi Hettiarachchi 416 432 1532
Neville 647 382 2801




EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



**We'll Target The Best Rates!**

Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

**Mortgage Renewals and Refinancing**

First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

**Investment Properties**

Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

**Safe and Secure Application**

Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca




මේබලා සහ සඳරුවන් දිනකට දෙවතාවක් පමණ දුරකථනයෙන් හමු වූහ. මේබලා බලාපොරොත්තු වන්නා වූ සියලු දෙයින්ම පරිපූර්ණ වූ සඳරුවන්ට ඇය ඉතසිතින්ම කැමති වුවත් එය එකවරම හෙළිකිරීමට ඇය මැළි විය. තමා හට වඩා වත්පොහොසත්කමින් සඳගිරි වලව්ව ඉහළින් සිටින නිසා එකවරම කැමැත්ත දීම ඇයට මදිකමක් ලෙස ඇය සැලකුවාය. සඳරුවන් ටික දොහක් තමා පසුපස ආවාට පසු තම කැමැත්ත ප්‍රකාශ කිරීම ඇගේ අභිලාෂය විය. ඇය නිතරම සඳරුවන්ට කීවේ තමාට කිසිම දෑවැද්දක් නැති බවත්, දෑවැද්දක් බලාපොරොත්තු වෙන්නෙකු තම සැමියා ලෙස තෝරා නොගන්නා බවත්ය. සඳරුවන් ඒ සෑම විටෙකම මේබලාට පැවසුවේ තමන්ද දෑවැද්දට ගෑනුන් සොයන කෙනෙකු නොවන බවයි.

“මට දෑවැද්ද නෙමෙයි ඕන. මම හොයන හොඳ කොලිටීස් ටිකක් තියෙනවා. අන්න ඒ ටික තියෙන ගෑනියෙක් විතරයි. හැබැයි ඒ ගෑනිට යම් වැදගත් කමක් තියෙන්න ඕනි. හොඳ උගත් කමකුත් ඕනි. මම ඕන්නම් ඔයාට දෑවැද්දක් දීලා ඔයාව අරගෙන එන්නම්. මොකද මට මදියි නොකියන්න හැමදේම තියෙනවා”

දෙමසක පමණ කාලයක් ගත වුවද සඳගිරි වලව්වට මනාලියගේ පිරිස පැමිණීමට දිනයක් තවම දන්වා එවා නැත. ලොකු මැණිකේ තුළ මේ ගැන යම් කුකුසක්ද ඇති වූ හෙයින්, ඇය සඳරුවන්ගෙන් ඒ ගැන විමසා සිටියාය.

“මොකද පුතේ කළුතර කට්ටිය අකමැතිව වද්ද? තවම හෝඩුවාවක්වත් නැත්තේ”

“නැහැ නැහැ අම්මෙ.... මේබලාට මේ දවස්වල විභාග යක්. ලබන මාසෙ අන්තිමට වගේ මගෙ හිතේ ඒ කට්ටිය එන්න හිතාගෙන ඉන්නෙ”

“ඒ ළමයා පුතත් එක්ක නිතරම කථා කරනවද?”

“ආ... ඔව්”

“ඉතින් දැන් දෙන්නම එහෙනම් කැමතියි”

“ඔව්... මේබලාගේ කියන්න වරදක් නැහැ”

මෙදින උදෑසන සුපුරුදු දිනචර්යාව පටන්ගත් අතර පුෂ්පා අඟර දඟර පා ජයසේනගෙන් කිරි බෝතල් දෙක රැගෙන මුළුතැන්ගෙට පා තබන විටම,

‘දඩාස්’ ගා ශබ්දයක් සමඟම,

“අයියෝ..... පුෂ්පා....” යනුවෙන් ලොකු මැණිකේ කෑගසන හඬක් ඇසුණාය.

පුෂ්පාද ලහිලහියේ කිරි බෝතල් දෙක මේසය මත තබා හඬ ආ දෙසට දුව ගියාය. පුෂ්පා දුටු දර්ශනයෙන් ඇයද,

“අය්යෝ ... ලොකු මැණිකේ” කියමින් මහ හඬක් නැංවූවාය. මේ හඬට ඉහළමාලයේ සිටි සඳරුවන්ද මුළුතැන්ගෙයි සිටි කරලැයින්ද විදුලි වේගයෙන් ඒ දෙසට ආවෝය.

ලොකු මැණිකේ නිදන කාමරයත් නාන කාමරයත් අතර වැටී සිටියාය. ඇයගේ හිසෙන් ලේ ගලමින් ඇත. ඇය නැගිටීමට තැත් කළත් නොහැකිව වැටුණු තැනම එලෙසම සිටියාය.

සඳරුවනුත්, පුෂ්පාත් ලොකු මැණිකේ වත්තන් කරගෙන ඇඳ මත තබා ලේ ගලන නළලේ තුවාලය බරපතල වූ හෙයින් ඉක්මනින් නැවතත් ඇයව වත්තන් කරගෙන සඳරුවන්ගේ රථය තුළට නංවා ගත්හ. පිටුපස අසුනේ පුෂ්පාගේ උකුළ මත ඇය හිස තබාගෙන ගිය අතර සඳරුවන් ඉදිරි අසුනේ වාඩිවිය. රියැදුරු රථය ඉක්මන් වේගයෙන් මීරිගම රෝහල වෙත මෙහයවනු ලැබුවේය. පුෂ්පාගේ ඔඩොක්කුවද ලේවලින් පෙඟී ඇත. සඳරුවන් අයිස් බෑග් එකක් තබමින් අම්මාගේ හිසෙන් ගලන ලේ ධාරාව නැවැත්වීමට උත්සාහයක නිරත විය. සිද්ධිය සිදුවී විනාඩි ගණනකින් ලොකු මැණිකේ රෝහලට ගෙන ගියත් ඒ වන විට ඇය සිහිසුන්ව සිටියාය.

හිසට මැහුම් දහයක් දැමීමට තරමටම තුවාලය විශාලය. සඳරුවන් මවට සිහිය එනතුරුම තම මව ළඟ රැඳී සිට, ඇය වාට්ටුවට ඇතුළු කළ පසු පුෂ්පා ඇය ළඟ රඳවා ඉක්මනින් ගියේ දිවුලපිටියේ සිටින තම සොහොයුරිය ජානකී අක්කා සොයාගෙනය. ඇයද මේ ආරංචිය සැල වූ සැණින්ම ඇඳ පැලඳ තම සොහොයුරා සමඟ රෝහල වෙත පිටත් වූයේ දරුවන්ගේ කටයුතු තම සැමියාට පවරමින්ය.

ලොකු මැණිකේට සිහිය ආවත් ඒ වන විටදීද සිටියේ කම්පන තත්ත්වයෙනි. ඇය සාත්තු සේවිකාවකට පමණක් භාර දී යාමට ඔහු අකමැති විය.

“එහෙනම් පොඩි අක්කෙ, මම පුෂ්පව ගෙදරට ඇරලනවා. මොනවද මම්මට ගේන්න ඕනි”

“පුෂ්පා, මම්මගෙ ඇඳුම් දෙක තුනක් අරන් එන්න. හොඳ එළවළු සුප් එකකුත් හදාගෙන එන්න. දවල් දොළහට බලන වෙලාවට එන්න”

“මල්ලියෙ අම්මට බොන්න හොඳ කිරි එකක් ඔය කැන්ටිමෙන්ම ගෙනත් දීල යන්න. නෙස්ටමෝල්ට් එකක් හොඳයි”

සඳරුවන් පුෂ්පා වාහනයේ රඳවා තබා එළවළු මාර්කට් එකට ගොස් සුප් එකට කලමනාද රැගෙනම නිවස වෙත ගියේය.

“පුෂ්පා ඔය ලේ තැවරිච්ච ඇඳුම් අයින් කරල නාගන්න. ඊට පස්සෙ මේ සුප් එක හොඳට හදන්න.” කියා ඔහුද ඇඳුම් මාරුකර ගැනීමට උඩුමහලට ගියේය.

මෙතුවක් වේලා ඇගේ ලේ වතුර වී ගැහෙමින් සිටි කරලැයින්,

“මොකද පුෂ්පා.... ලොකු හාමුට. කෝ කෝ හාමු. එයාට හුඟක් අමාරුද?” කලබලයෙන් විමසුවාය. කරලැයින්ගේ ඇස් දෙකෙන් කඳුළු වැගිරෙමින් ඇය ගැහෙමින් සිටී.

“බය වෙන්න එපා නැන්දෙ. දැන් ලොකු මැණිකෙට සනීපයි. තුවාලෙට මැහුම් දැම්ම. යනකොට නම් සිහිය තිබුණෙත් නැහැ”

“අනේ අප්පේ වෙච්ච දෙයක්. දෙවියන්ගේම පිහිටයි. ඉක්මනට ලොකු මැණිකෙට සුවවෙන්න ඕනි” කියමින් ඕ සුසුම් ලෑවාය.

මේ වන විට කරලැයින් දුන් ආරංචිය මත වලව්වට සේවය කරන දහ පහළොස් දෙනෙක්ද වලව්වට පැමිණ සිටියහ.

පුෂ්පා ලහිලහියේ ලොකුමැණිකේට සුප් එක පිළියෙල කර බෝතලයක දමා,

“පුංචි හාමු මෙන්න සුප් එක හරි” කියා මේසය මත තැබීය.

“පුෂ්පා උණුවතුර බෝතලයට කිරි තේ එකක් දාන්න. ලොකු වතුර බෝතලයකුත් ලෑස්ති කරල දෙන්න”

“පුංචි හාමුට උදේට මුකුත් කන්න හදන්නද?”

“එපා... එපා... මට කෑම. මම දැන් ඉස්පිරිතාලෙට යනවා. යන ගමන් මොනව හරි මගින් කන්නම්. පුෂ්පා ජානකී නෝනටත් එක්ක කෑම හදන්න. ලොකු මැණිකෙටත් කෑම ටිකක් පිඟානකට දාල ලෑස්ති කරල ඉස්පිරිතාලෙට යන්න බලාගෙන ඉන්න. ජානකී නෝනා ගෙදර ගිහින් රෑට නවතින්න එයි”

“හොඳයි පුංචි හාමු”

පුෂ්පා සාදා දුන් ආහාරද රැගෙන රෝහල වෙත නැවතත් ගිය සඳරුවන් වාට්ටුව භාර වෛද්‍යවරයා මෙන්ම ලොකු මැණිකේට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා සමඟද කථාබහ කර ඇයව පෞද්ගලික සාත්තු නිවාසයකට මාරු කර ගැනීමට පියවර ගත්තේය. ඒ අනුව සවස ගිලන් රථයකින් සාත්තු නිවාසය වෙත රැගෙන ගියාය.

ජානකී සඳරුවන්ගේ රථයෙන් තම නිවස බලා ගියේ රාත්‍රිය සාත්තු නිවාසයේ නැවතීමට එන බවට සඳරුවන්ට පවසමින්ය. එතෙක් පුෂ්පා ලොකු මැණිකේ ළඟ නතර වූවාය. රාත්‍රියේ පුෂ්පාත්, සඳරුවනුත් නිවසට පැමිණි අතර,

“මට රෑට මුකුත් කෑම එපා. මට ඔය සුප් ටිකක් තියෙනවනම් රත්කරල ගේන්න. මම තව ටිකකින් ආයෙත් නර්සිං හෝම් එකට යනවා” යි කියමින් සඳරුවන් උඩුමහලට ගියේ පොඩි විවේකයක් ගැනීමටය.

රාත්‍රී අටට පමණ පහත මාලයට ආ සඳරුවන් “මම යනවා පුෂ්පා හොඳට දොර ජනෙල් වහගන්න. මුරකාරයට කියන්න මොනවා හරි වුවමනාවක් තිබුණොත්” කියමින් පිටව ගියේය.

රාත්‍රී එකොළහට පමණ නැවතත් ඔහු නිවසට පැමිණියේය.

“පුෂ්පාට අද තවමත් නින්දක් නැහැ. දැන් හුඟක් රෑවෙලා. ගිහින් නිදියගන්න. මම නර්සින් හෝම් එකෙන් එනකොටත් රෑ දහයත් පහුවෙලා. දැන්නම් මම්ම හොඳට කථා බහ කරනවා. ඒත් තව දවස් හතරක්, පහක් ගිහින් තමයි එක්ක එන්න වෙන්නෙ. මොකද හුඟක් ලේ ගිහින්. මම්ම හොඳටම දුර්වලයි කියල ඩොක්ටර් කිව්වා” කියමින් ඔහු උඩුමහලට ගියේය. කරලැයින්ද පුෂ්පා පිටුපසින් සිටගෙන එය අසා සිටියාය.

“අනේ සාදු, නෝන හාමුට දෙවි පිහිටයි කිසි කරදරයක් වෙන්න එපා” කියමින් දෙවියන් යදිමින්ම ඔවුහු නින්දට ගියහ.

මේ ආරංචිය සැල වී රත්නපුරයේ සිටින මේනකාද මංජුල සමඟ උදෑසනින්ම පිටත්ව නර්සිං හෝම් එකට ළඟා වූවාය. ජානකී මම්මා ළඟ සිටිනු දැක ඇයට සතුටක් දැනුණාය.

“මොකද මම්මට වුණේ නංගියෙ”

“බාත්රූම් එකේ ලිස්සල වැටිල. මම හිතන්නේ කකුලෙ සබන් තියෙන්න ඇති”

“ඉතින් කවුද දැකල තියෙන්නෙ”

“මම්ම කෑ ගහල. ඒ වෙලාවෙ සිහිය තිබිල තියෙනවා. ලේ දැක්කම තමයි සිහිය නැති වෙලා තියෙන්නෙ. හොඳ වෙලාවට මල්ලි ගෙදර ඉඳල”

32 වන පිටුව බලන්න



# ප්‍රාර්ථනා මල්...

31 වන පිටුවෙන්

"මදෑ මෙයින් බේරුණා"

"නංගියෙ, ඔයා ඊයෙ උදේ ඉඳල, රෑත් ඉඳල එහෙනම් ඔයා ගෙදර යන්න. මම මම්ම ළඟ නවතින්නම්. මංජුල එළියෙ ඉන්නවා"

"කවුද පණිවිඩේ කිව්වෙ අක්කට"

"මල්ලි. ගෙදරට ෆෝන් කරනකොට අපි ගෙදර හිටියෙ නැහැ. ඊයෙ උදේ අපි මඟුල් ගෙදරක ගියා. ඇහැලියගොඩ. එනකොට හොඳටම හවස් වුණා. මංජුල ටිකක් බීලත් හිටියෙ. රෑ එමු කිව්වම අදිමදි කළා. මම මල්ලිට කථා කරල විස්තර දැනගත්තා. නංගි ළඟ ඉන්නවා. අම්ම හොඳට කථා බහ කරනව කිව්ව නිසා මම උදේ එන්න හිතුවා. නැත්නම් මම පාල එක්ක හරි රෑම එනවා"



"ඔව් මල්ලි මම්ම ළඟ නර්ස් කෙනෙකුත් නතර කළා. අන්තිමට මමයි නර්සුයි දෙන්නම ඊයෙ රෑ හිටිය"

"ආ... කෝ නර්ස්"

"එයා උදේ හයටම ගියා. හවස හයේ ඉඳල උදේ හයට. ගාණ එක්දාහයි"

"එහෙම තමයි. අමාරු වැඩක්නෙ. ලෙඩ්ඩු බලාගන්න එක"

"අක්ක එහෙනම් අද උදේ වරුව ඉන්න. මම අදත් රෑට ඉන්න එන්නම්. මොකද ළමයි දෙන්න මොනව කරනවද මන්ද"

"නංගියෙ මම ඇඳුම් අරගෙනමයි ආවේ. දවස් තුන හතරක් නවතින්න බලාගෙන. මංජුලට මම යන්න කියනවා"

"එහෙනම් මම්ම නැගිට්ටහම මම මංජුල අයියත් එක්ක ගෙදර යන්නම්. දැන් මල්ලිත් මග එනවා ඇති"

ලොකු මැණිකේ අවදි වූ පසු අක්ක නගෝ එකතු වී අම්මාව පිරිසිදු කර සඳරුවන් ගෙනත් තිබූ කැඳ වීදුරුව පෙව්වාය.

තම නපුරු දියණිය තමන් දුකට පත් වූ විට තමාට සැලකූ ආකාරය ලොකු මැණිකේට පුදුම සහගතය. නිතරම තමාට දුන් දේවල් මදි බව කියමින් ඇයව තලා පෙලන දියණිය, කඳුළු පිරි දෙනෙතින් යුතුව මල්ලි සමඟ එක්වී තමාට සත්කාර කළ අයුරු සිහිනයක්දැයි ඇයට සිතුණි.

සඳරුවන් පුෂ්පා පිළියෙල කර දුන් කැඳත්, සුප් සහ ආප්ප කෙසෙල් ගෙඩිත් රැගෙනවිත් තිබුණේය. අක්කලා දෙදෙනා මම්මා ළඟ සිටිනවා දුටු ඔහු මවිත විය. "මේ තරම් උදෙන් කොහොම රත්නපුරයෙ ඉඳල ආවද?"

"ලොකු අක්කා මේ තරම් උදෙන්ම"

"ඔව් මල්ලියෙ මම මල්ලි කථා කරපු වෙලේම පිටත් වෙනවා. කොහෙද ඉතින් ඩ්‍රයිවර් ඊයෙ මඟුල් ගෙදර ඉඳල එන ගමන් මගදිම බැහැල ගෙදර ගියා. මංජුල රෑට වාහන එලවන්න කම්මැලියි. නිදිකිරා වැටෙනවා කියලා වාහනවල. අද ඉරිදා හින්ද ඩ්‍රයිවර් එන්නෙ නැහැ. මල්ලි විස්තරේ කිව්වම මටත් සිහි නැහැ එනකල්. ඉතින් මමයි, මංජුලයි පාන්දර හතරාමාරට එහෙන් පිටත් වෙලා ආවා"

"වේගයෙන් ඇවිත් තියෙනවා"

"ඔව් පැය දෙකක්වත් ගියෙ නැහැ"

"මම්මට දැන් සනීපයි හුඟක්. මම බය වුණේ ඔළුව ඇතුළට තැල්ම බලපාල කියල. ඒත් ඩොක්ටර් කිව්ව එහෙම වෙලා නැහැ. තුවාලෙ බරපතලයි. ඒ වගේම ලේ හුඟක් ගිහින් හින්ද තව දවස් හතරක් විතර මෙතන තියන්න කියල. එයාට දවසට තුන්පාරක්ම බලලා යන්න පුළුවන් කියල"

"ඔව් ඉතින් අපි හදිස්සි කරන්නෙ මොකටද? ඊටත් අපේ මම්ම ගෙදර ගියොත් විවේකයෙන්ම ඉඳී. එයාට තරම් වැඩ වෙන කාටවත් නැහැනෙ"

"ඒකත් ඇත්ත"

"කෝ අක්කේ මංජුල අයිය"

"උදේ කහට තේ එකක් බීලනෙ පිටත් වුණේ. මම හිතන්නෙ මොනව හරි කන්න යන්න ඇති කොහාට හරි"

"එහෙනම් මම මම්ම ළඟ ඉන්නම්. නංගි මල්ලිත් එක්ක හරි මංජුල එක්ක හරි ගෙදර යන්න"

"මම දවල්ට කෑම මම්මටයි, අක්කටයි එවන්නම් මල්ලියෙ"

"හා හොඳයි මම්මට සුප් එකක් හදල එවන්න"

"හා... අර පුෂ්පා එවන සුප් එක මොකක්ද වතුර හැළියක්නෙ. මම හොඳට හදල එවන්නම්. ඒකිට කියන්න සුප් හදන්න එපා කියල අද. මම රෑට එනකොට සුප් එකක් හදාගෙන එන්නම්"

"නංගියෙ අද රෑත් මමම ඉන්නම්"

"හා... එතකොට මම හෙට උදේ ඇවිත් අක්කට ගෙදර ගිහින් ටිකක් නිදාගන්න පුළුවන්. මම කෝකටත් කෑම අරගෙන හවස ඇවිත් යන්න එනවා"

"හොඳයි, හොඳයි නංගියෙ එහෙනම් මංජුල අයියත් එක්ක යන්න. එයා ඔයාව ඇරලගෙනම රත්නපුරේ යයි"

**ලබන කලාපයෙන් හමුවෙමු**





# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2018 මැයි 01 දින සිට මැයි 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 9 වැන්නේ ගමන් කරයි. විවාහ අපේක්ෂිත අයට මංගල යෝග උදාවිය හැකි මාසයකි. රැකියා, ව්‍යාපාර කටයුතුවල දියුණුව ඇති වේ. නව ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමටද ශුභයි. තනතුරු උසස්වීම් ලැබීමේ භාග්‍යය ඇත. ගේ දොර ඉඩකඩන් ගැනීමටද වාසනාව ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ලග්නාධිපති කුජ කර්මස්ථානයේ උච්ච වීමද ශුභ වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු ලග්නයේ ගමන් කරයි. පදිංචියේ වෙනසක් ඇතිවිය හැක. රැකියා, ව්‍යාපාර කටයුතුවලට ශුභයි. අධ්‍යාපන කටයුතුවල දියුණුව ඇති කෙරේ. මැයි 02 වන දින කුජ භාග්‍යස්ථානයේ උච්ච වීම ශුභ වේ. දැනට අෂ්ටම ඒරාෂ්ඨකය ලබා ඇති සඳු කේන්ද්‍රයේ 8 වැන්නේ නම් ප්‍රවේසම් විය යුතුය. ආදායම් මාර්ග සරු වේ.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 10 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ඉතා ශුභ කාලයකි.රැකිරක්ෂා කටයුතු දියුණු වේ. තනතුරු, උසස්වීම් ලැබීමේ භාග්‍යය සහිතයි. කලාව සම්බන්ධ කුසලතා වර්ධනය වේ. රැකියා අපේක්ෂිත අයට රැකියා ලබාගැනීමට අවස්ථාව සැලසේ. ආදායම් මාර්ග සරු වේ. හදිසි ධන ලාභ ඇත.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 4 වැන්නේ ගමන් කරමින් මාසය ආරම්භ වේ. රැකීරක්ෂා දියුණුව හා උසස්වීම් ලැබිය හැක. රැකියා අපේක්ෂිත අයට බලාපොරොත්තු ඉටුවිය හැක. සතුරු කරදර අඩුය. අවිවාහක අයට මංගල යෝග උදා වේ. අධ්‍යාපනය සාර්ථකව කර ගැනීමට හැක. නව ආදායම් මාර්ගවලට යොමුවිය හැක. දියුණුව ඇති කෙරේ. ආදායම සරු වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 9 වැන්නේ ලග්නයේ උච්ච වී ගමන් කරයි. වෙළඳ ව්‍යාපාර කටයුතුවලත් රැකියා කටයුතුවලත් දියුණුව ඇති කෙරේ. රැකියා අපේක්ෂිත අයට එම බලාපොරොත්තු සාර්ථක කරගැනීමට පුළුවන. උසස් තනතුරු, ජයග්‍රහණ ලැබිය හැකි කාලයකි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. සමාජ සේවා කටයුතුවල නිරත වේ. මිතුරු ඇසුර ලැබේ. ආදායම් මාර්ග සරු වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 7 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. රැකියාවේ, පදිංචියේ වෙනසක් ඇතිවිය හැක. රැකියාවේ දියුණුව සැලසේ. උසස් වීම්, කීර්ති ප්‍රශංසා ලැබිය හැක. ආදායම් මාර්ග සරු වේ. ධන ලාභ ඇත.

### තුලා ලග්නය

ලග්නාධිපති කිවි 8 වැන්නේ ගමන් කරයි. රැකී රක්ෂා, ව්‍යාපාර දියුණුව ඇති කෙරේ. ඉඩකඩම්, දේපළවල දියුණුව ඇති වේ. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. සතුරු පීඩා අඩු වේ. ආදායම ශුභ වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 2 වැන්නේ ගමන් කරයි. රැකියා වෙළඳ ව්‍යාපාර දියුණුවට ශුභයි. ඉඩකඩම්, දේපළ ගැනීමට හැකියාව ලැබේ. ලග්නාධිපති කුජ වික්‍රමස්ථානයේ උච්ච වීමෙන් විශිෂ්ට ශුභ ඵල ලැබිය හැක. අධ්‍යාපන කටයුතුවලට ඉතා ශුභයි. සමාජ සේවා කටයුතුවල යෙදේ. පිරිස් බලය ලැබේ. සතුරු කරදර අඩු වේ. දියුණුව ඇති කෙරේ. ආදායම ශුභ වේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 11 වැන්නේ ගමන් කරයි. රැකියා අංශ තුළ දියුණුව ඇති කෙරේ. තනතුරු අපේක්ෂිත අයට ලැබීමේ භාග්‍යය ඇත. අධ්‍යාපන කටයුතු ශුභ වේ. ආදායම් මාර්ග සරු වේ. හදිසි තීරණ ගැනීමට පුළුවන. වචනය බලවත් වේ. ලග්නයේ සඳු ඇත්නම් ලග්න-ජන්ම ඒරාෂ්ටක දෙකම බල පවත්වන බැවින් වඩා ප්‍රවේසම් වීම මැනවි.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. දෙස්-විදෙස් සංචාරක ගමන් යෑමට අවස්ථාව ලැබිය හැක. ලග්නයේ කුජ උච්ච වීමෙන් චිත්ත ධෛර්යය වැඩි වේ. රැකී රක්ෂා දියුණුව ඇති කෙරේ. දියුණුවට ශුභයි. අධ්‍යාපනයට ශුභයි. ඉක්මන් කෝපය, හදිසි තීරණ ගැනීම ආදියට යොමුවිය හැක. ආදායම් මාර්ග සරු වේ.

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. භූමි ලාභ ඇත. ගේ දොර ඉඩකඩම් ගැනීමේ භාග්‍යය ඇත. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. රැකී රක්ෂා, වෙළඳ ව්‍යාපාර කටයුතු ශුභ වේ. තනතුරු ලැබීමට පුළුවන. පිනට දහමට වඩා යොමු වේ. ආදායම් මාර්ග ශුභ වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 8 වැන්නේ ගමන් කරයි. බුද්ධිමත්ව සාර්ථකව තම වැඩ කටයුතු කරගැනීමට හැක. රැකියා, ව්‍යාපාර කටයුතුවල දියුණුව ඇති වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. වචනය බලවත් වේ. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. පිනට දහමට වඩා යොමු වේ. ආදායම ශුභ වේ.


**එම්. වයි. ධර්මවිජය**
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca




# සාමයේ පරෙවියො



■ මැදගම ධම්මානන්ද හිමි

සාමයේ සංකේතය ලෙස දැනට ලොව පුරා භාවිත වන්නේ පරෙවි රුවකි. එම සංකේතයේ නිමැවුම්කරුවා වන්නේ 'පැබ්ලෝ පිකාසෝ' නමැති ලොව පසිඳු සිත්තරාය. හොටයේ දැවටූ ඔලිව් අත්තක් සහිත පරෙවි සිත්තම ප්‍රංශයේ පැවැති ජාත්‍යන්තර සාම කවුන්සිලයට ඔහු විසින් ඉදිරිපත් කරන ලද්දේ 1949 පෙබරවාරි මස 25 වනදාය. ඉන්පසු පරෙවියා සාමයේ සලකුණ ලෙස සම්මත කෙරුණි. මේ වන විට සාම පරෙවියාගේ වයස අවුරුදු හැට එකකි. පැබ්ලෝ පිකාසෝ සාම පරෙවි රූපය අඳින්නට පදනම් කරගෙන තිබෙන්නේ බයිබලයේ උත්පත්ති කතාවේ සඳහන් පුවතකි.

මහා ජලගැල්මක් සිදුවන වෙලාවේ ගොඩබිමක් තිබේදැයි සොයන්නට නෝවා තම නැවේ සිටි පරෙවියකු මුදාහැරි බව බයිබලයේ සඳහන් වෙයි. 'පරෙවියා සවස් වේලෙහි ඔහු වෙතට ආවේය. අමු ඔලිව් කොළයක් උගේ තුඩෙහි තිබුණේය. බලව, මෙසේ පොළොවෙන් ජලය බැස ගිය බව නෝවා දැනගත්තේය.' (උත්පත්ති 8.11)

ඔලිව් අත්තක් සහිත පරෙවි රුව පිකාසෝ විසින් සාමය සඳහා ඇඳාගන්නා ලද්දේ මෙම බයිබල් පාඨය මුල්කරගෙනය. පරෙවියා ඔලිව් අත්තක් රැගෙන ඒම නුදුරින් ගොඩබිමක් තිබෙන බවට ලැබුණ හෝඩුවාවකි. ජල ගැල්මට ගොදුරුව සිටි නෝවා ඇතුළු පිරිසට ජීවිතය පිළිබඳ බලාපොරොත්තුවක් ඇතිවුණේ පරෙවියා දැකීමෙනි. ඒ නිසා බලාපොරොත්තුව, සශ්‍රීකත්වය, නිරුපද්‍රිතභාවය, නිදහස යන අදහස් එයින් මතුවෙයි. දෙවියන් වහන්සේ මනුෂ්‍යයා කෙරෙහි දැක්වූ ශාපය ඉවත් කිරීම මිස ඔලිව් අත්තක් තුඩෙහි රැඳුන පරෙවියාගෙන් සාමය උදාවීමක් ගැන කියැවෙන්නේ නැත. එසේ වුවද, මනුෂ්‍යයා සහ දෙවියන් වහන්සේ අතර පැවැති යුද්ධය නිමා කෙරුණ බවක් පරෙවියාගෙන් නිරූපණය වන්නේ යැයි කෙනකුට තර්ක කළ හැක. ජලගැල්ම නිමවුණ පසු නැවෙන් පිටතට පැමිණි නෝවා සිවුපාවුන් හා කුරුල්ලන් දැවීමෙන් දෙවියන් වහන්සේට පුළුටු පූජාවක් සිදු කළේය. එයින් සතුටට පත් දෙවියන් වහන්සේ මනුෂ්‍යයා කෙරෙහි දැක්වූ ශාපය ඉවත් කළ බව උත්පත්ති කතාවේ විසිවන වගන්තියේ සිට විස්තර කෙරේ.

'නෝවා ස්වාමීන්වහන්සේට පූජාසනයක් ගොඩනගා සියලු පවිත්‍ර සිවුපාවුන්ගෙන්ද සියලු පවිත්‍ර පක්ෂීන්ගෙන්ද රැගෙන පූජාසනය පිට දවන පූජා පිදුවේය. ස්වාමීන්වහන්සේ මිහිරි සුවඳ සිඹ තමන් වහන්සේගේ සිත තුළ කතා කරමින් මනුෂ්‍යයා නිසා භූමියට තවත් ශාප නොකරන්නෙමි. මක්නිසාද? බාල වයසේ පටන් ඔහුගේ සිතේ කල්පනා නපුරුව තිබේ. තවද, මා විසින් කළ ලෙස නැවත ජීවමාන සියල්ලන්ට පහර නොදෙන්නෙමි.' එම විස්තරය අනුව, දෙවියන් වහන්සේ මිනිසාට පහරදීම නතර කළේ පරෙවියාගේ පැමිණීමෙන් පසු නෝවා සතුන් පුළුස්සා උන්වහන්සේට පුළුටු පූජා පැවැත්වූ බැවිනි.

පරෙවියා සහ කොබෙයියා හැඳින්වීමට යෙදෙන 'පිජන්' (Pigeon) හා 'ඩව්': Dove) යන ඉංග්‍රීසි වචන දෙක ඇතැම් බයිබල් පිටපත්වල පැටලී තිබීම නිසා නෝවා පිටත් කළේ පරෙවියෙක්ද? නැතිනම් කොබෙයියෙක්ද? යන්න පිළිබඳව මතභේද ඇත. ඔලිව් අත්ත ගෙනාවේ කොබෙයියකු නම්, වර්තමාන භාවිතය අනුව සාම කුරුල්ලා විය යුත්තේ පරෙවියකු නොව කොබෙයියෙකි. බයිබලයේ ලෙවී කතාවේ කිහිප තැනකම සඳහන් වන අන්දමට දෙවියන් වහන්සේට පුළුටු පූජාව කළ යුත්තේ කොබෙයියන් හෝ පරෙවි පැටවුන් පිළිස්සීමෙනි හෙවත් සාම කුරුල්ලන් පිළිස්සීමෙනි.

ඇතීනා දෙවඟනගේ හිසෙහි ඔලිව් කොළ පළඳනාවක් ඇත. රෝමය සතුරන්ගෙන් ආරක්ෂා කළ ඇතිනා දෙව්දුව ඇතැන්සයේ වැසියන්ට ඔලිව් ගස පිරිනැමූ බව ප්‍රවාද කතාවල සඳහන් වෙයි. එය මනුෂ්‍යයාට ප්‍රයෝජනවත් වටිනා ශාඛයකි. අතීතයේදී ඔලිම්පික් තරග ජයග්‍රාහකයන්ටද ඔලිව් අතු ඔටුන්නක් පළඳවන ලදී. ඔලිම්පික් ක්‍රීඩා පැවැත්වෙන කාලයට රාජ්‍යයන් අතර සටන් නතර කිරීමද සිරිතකි. ඔලිව් ගස ලොකු මහත් වී එල දරන්නට දිගු කලක් ගතවෙයි. යුද්ධයක් පවතින දේශයක ඔලිව් ගස් හැදෙන්නට ඉඩක් නොමැත. ඒ සඳහා නිදහස් පරිසරයක් තිබිය යුතුය. ඔලිව් ගස් තිබීමෙන් කියැවෙන්නේ එම ප්‍රදේශයේ සාමය පවතින බවයි. ඔලිව් අත්ත සාමයේ සලකුණ ලෙස තෝරාගෙන තිබෙන්නේ මේ හේතුවෙනි.

සයිප්‍රසය, වර්ජින් දූපත්, අරාබි ලීගය වැනි රාජ්‍යයන් ගණනාවකම ජාතික කොඩිවල ඔලිව් අත්ත දක්නට ඇත. අමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය ලාංඡනයේ දැක්වෙන රාජාලියාගේ එක් අතක ඇත්තේ ඔලිව් අත්තකි. එයින් පෙන්වන්නේ සාමයයි. අනික් අතේ ඊතල මිටියකි. යුක්තිය සඳහා යුද්ධයට සූදානම් බව එයින් කියැවෙයි. ඔක්ලාහෝමා ප්‍රාන්ත කොඩියේ සාමය සනිටුහන් කරන්නට ඔලිව් අත්තකට අමතරව කැලුමට් නමින් හැඳින්වෙන දුම්බොන දිග පයිප්පයක්ද යොදා ඇත. දුම් පයිප්පය ආදිවාසී අමෙරිකානුවන් විසින් භාවිත මිත්‍රත්වයේ සංකේතයකි. ඩෙකෝටා, ඇල්ගොන්කියන් ආදී ගෝත්‍රික කණ්ඩායම් එක්රැස්ව එකිනෙකා අතිනත යවමින් පයිප්පයකින් මරිජුවානා දුම් උගුරක් උරා බීම සමගිය පෙන්වන චාරිත්‍රයකි. එයින් විශ්ව ශක්තිය ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයකි. හිබ්‍රෑවරුද සාමය සඳහා ඔලිව් අත්ත යොදාගනිති. එක්සත් ජාතීන්ගේ සංවිධාන ධජයේ ලෝක සිතියම දෙපැත්තේ ඇත්තේ ඔලිව් අතු දෙකකි. ලෝක සාමය උදාකිරීම සංවිධානයේ අරමුණ නිසා 1947 ඔක්තෝබර් 20 දින සිට එය භාවිතයට ගෙන තිබේ. සාමයේ සංකේතය ලෙස යුරෝපීය වැසියන් දේදුන්න යොදාගත් කාලයක්ද විය. බ්‍රිතාන්‍යයේ න්‍යෂ්ටික අවිහරණ ව්‍යාපාරය විසින් 1958 පෙබරවාරි 21 වැනි දින හඳුන්වා දෙන ලද සාම සංකේතයක්ද දැනට ලොව පුරා පැතිර පවතියි. එම සංකේතය සකස් කර තිබෙන්නේ නැව්වලට හා ගුවන් යානාවලට සංඥ කිරීමට යොදාගන්නා සෙමෆොර නමැති සංකේත භාෂාවේ අකුරු දෙකක් ඇසුරෙනි. සංඥා ලබාදෙන තැනැත්තා අතෙහි රැඳි කොඩි දෙක හසුරුවන ආකාරයෙන් ඔහු කියන දෙය නාවිකයෝ තේරුම් ගනිති. ඒ අනුව මඳක් අත් විහිදෙන ලෙස දකුණු සහ වම් කොඩිය පහත හෙළා ගෙන සිටීමෙන් ඉංග්‍රීසි බසේ 'එන්'හා 'ඊ' අකුර හැඟවෙයි. එසේම එක් කොඩියක් කෙලින්ම ඉහළට ඔසවාගෙන, අනික් කොඩිය පහතට හෙළාගෙන සිටීමෙන් හැඟවෙන්නේ ඉංග්‍රීසි 'ඩී' අකුරයි. එම අකුරු දෙක සාම සංකේතයට යොදාගෙන තිබෙන්නේ 'න්‍යෂ්ටික අවිහරණය' යන තේරුම දීමටයි. රවුමක් දෙපැත්තට බෙදෙන ලෙස මැදින් ඇඳි රේඛාවක්ද එහි පහත කොටසේ දෙපැත්තේ අංශක හතළිහක කෝණයක් සෑදෙන පරිදි ඉංග්‍රීසි 'වී' අකුරු පහළට හැරවූවාක් මෙන් රේඛා දෙකක්ද ඇඳීමෙන් එම සාම සංකේතය සකස් කර ඇත. මෙය කෙනකුට පහසුවෙන් තේරුම් ගන්නට නොහැකි නිසා විවේචන මතු වී තිබේ. ඉංග්‍රීසි 'වයි' අකුර යට පැත්තට හැරවූ ආකාරයේ එවැනි කුරුසයක් පස්වැනි සියවසේ රෝමයේ තිබිණි. එය හැඳින්වුණේ නීරෝ කුරුසය යනුවෙනි. සාන්ත පීටර් මැරුවේ නීරෝ කුරුසයේ ගැසීමෙනි. එය හැඳින්වෙන්නේ සාතන්ගේ මාර කුරුසය නමිනි. එම නිසා න්‍යෂ්ටික අවිහරණය ව්‍යාපාරය මගින් නිර්මාණය කෙරුණ සාම සංකේතය කිතුණු විරෝධී යැයි මතයක් ඇති වී තිබේ. 'මා කිතුණුවකු නොවන්නේ ඇයිද?' යනුවෙන පොතක් ලියූ බට්‍රන්ඩ් රසල් සාමිවරයාද එම සාම සංකේතය සැදූ කොමිටියේ සාමාජිකයෙකි.

පැබ්ලෝ පිකාසෝ බයිබලය ඇසුරෙන් සැකසූ තුඩෙහි ඔලිව් අත්තක් රැඳි පරෙවියාගේ සිත්තම සාමයේ සලකුණ ලෙස ලොව පුරා පතුරුවන ලද්දේ වියට්නාම් යුද්ධයට විරුද්ධව ක්‍රියාත්මක වූ සංවිධාන විසිනි. එම සාම සලකුණ අපේ රට තුළ පැතිරුණේ ත්‍රස්තවාදය පැවැති පසුගිය කාලයේ ජාත්‍යන්තර ක්‍රිස්තියානි රාජ්‍ය නොවන සංවිධාන මගින් දියත් කෙරුණ ව්‍යාපෘති හේතුවෙනි. නමුත් සාමය සංකේතවත් කිරීම සඳහා අතීතයේ සිට අද දක්වාම බොහෝ රටවල් යොදාගනු ලබන්නේ ඔලිව් අත්තයි. පරෙවියා සාමය නියෝජනය කරන බව පෙන්වීම පැබ්ලෝ පිකාසෝ සිදුකළ ආරෝපණයකි. සාමය සමඟ පරෙවියාගේ බැඳීමක් නොමැත. පරෙවියා යනු ක්‍රිස්තියානි දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයයි.

ජේසුතුමා බෞතීස්මය ලැබූ අවස්ථාවේ දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මය පරෙවියකුගේ වෙසින් එතුමාගේ පිටට පැමිණි බව බයිබලයේ සඳහන් වී ඇත. 'දෙවියන් වහන්සේගේ ආත්මයාණන් පරෙවියකු මෙන් බසිනවාද, තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටු සේක.' (මැතිව් 3.16) 'ශුද්ධාත්මයාණන් වහන්සේ රූපාකාරයෙන් පරෙවියකු මෙන් උන්වහන්සේ පිටට බැස්සේය.' (ශු. ලූක් 3.22)

කිතුනුවන්ගේ සොහොන් කොත් මත පියාපත් විහිදාගත් පරෙවියකුගේ රුවක් දකින්නට ලැබේ. ඔවුන් එය යොදන්නේ දෙවියන් වහන්සේ සමඟ එක්වීම නිරූපණය කිරීමටයි. බයිබලයට අනුව පරෙවියා සංකේතවත් කරන්නේ ශුද්ධාත්මයයි.






Andro Cakes
මංගල කේක්
ලාංකේය මංගල කේක්
මංගල හා ප්‍රිය සම්භාෂණ සඳහා තනි තනි අතුරුපස (Individual Desserts)
ඉල්ලීම අනුව නිර්මිත කේක් වර්ග (Custom Cakes)
කප් කේක් / කේක් පොප් / මැකරොන්
ප්‍රනීත ආහාර මේස (Sweet Tables)
ඩබල් චොක්ලට් ෆෞන්ටන්
චොක්ලට් වර්ග
සජීවී ද්‍රාවය නයිට්‍රජන් අයිස් ක්‍රීම් (Liquid nitrogen Icecream (Live)
සජීවී උදෑසන ආහාර මේස
ලාංකේය ක්‍රමයට බත් සහ ව්‍යංජන
සැන්ඩ්විච් වර්ග
ලාංකේය බේකරි කෑම වර්ග (Pastries)
පලතුරු, චොක්ලට්, සීනිමය හා මාසිපෑන් වලින් නිර්මිත ප්‍රධාන කෑම සැරසිල්ල
(Edible Carvings for centre pieces)
සඳහා විශිෂ්ඨයන්.
25ස් වසරක අත්දැකීම් හා සහජ කුසලතාවෙන් සපිරි, ඔලිම්පික් රන් පදක්කම් ලාබී,
සූපන ආචාර්ය ශිල්පී
දිමුතු පෙරේරා
අතින් හැඩගැන්වෙන සම්මානනීය ආහාර සැරසිලි,
අප ඇන්ඩ්‍රෝ කේක් ආයතනයෙන් එළි දැක්වේ.
අප හා සම්බන්ධ වීමෙන් ඔබගේ ඊළඟ විශේෂ උත්සවය සඳහා
අපගේ විශ්වාසනීය උපදෙස් නොමිලේ ලබා ගත හැක.
Andro Cakes
www.androcakes.ca
https://www.facebook.com/chefdimu
TP: 416-857-4566
order@androcakes.ca
ටොරොන්ටෝ හා තදාසන්න ප්‍රදේශ (GTA), ඇජැක්ස්,
බර්ලිංටන්, ඕක්විල් හා මුස්කොකා දක්වා සේවා සැපයේ.
අවම ඇනවුම දස දෙනෙකු සඳහා.
තම නිවසටම ප්‍රවාහනය කෙරේ.


Attrell Brampton Auto Mall
TOYOTA
NOW
0% INTEREST
$ 0 DOWN AND
CASH DISCOUNT UPTO $ 4000
(ON SELECTED 2018 MODELS)
TOYOTA
RED TAG DAYS
LEASE A 2018 COROLLA CE FOR ONLY $ 58 (Weekly)
TALK TO JAY IN SINHALA AND GET A NEW OR USED TOYOTA AT A GREAT PRICE
ඔබ කැමති වාහනය ඉතා විශ්වාසවන්තව, හොඳ වට්ටම් සහිතව ලබා ගැනීමට සිංහල භාෂාවෙන් කතා කරන ජේ (JAY) හමුවන්න.
Call Jay : 647 - 893 - 9661
110 Canam Crescent Brampton ON L7A 1A9
Attrell TOYOTA SCION EST. 1975

## සසරින් නික්මෙමි

ගංතෙර ගං දිය දෝතට ගත්තද පත්ලේ මිණිකැට නැහැ දුටුවේ
වෙරළෙන් සයුරට පිය මැන ආවද ගැඹරේ මායිම් නැහැ දුටුවේ
පොළොවේ වැලි කැට කැටි කොට ගත්තද මිහිකත සවිබල නැහැ දැනුණේ
ජීවිතයෙම දුක මේ යැයි කීවත් සසරක දුක තව නැහැ පෙනුණේ

ගං දිය පත්ලේ විශ්මය දකිනට දැය කැළඹූ කිසි විටක බැරී
කරදිය ගැඹරේ මායිම් සොයනට වෙරළේ සිට කිසි දාක බැරී
මිහිකත සවිබල පවසාලන්නට උඩු දුහුවිල්ලට නම් නොහැකී
සිත පත්ලෙන් එන තුන් සිත නොදකින සසල සිතත් නිවනට දුරකී

ගං දිය රැළි මෙන් නැගෙනා සිතුවිලි නවතා නිසලව සිටි මොහොතේ
සාගර පත්ලට කිමිදෙන විලසින් පීරා බලනෙමි සිත පතුලේ
දුක සැප දරනා මිහිකත මෙන් මා නොසැලී සිටිමින් මගෙ දැහැනේ
විදසුන් වඩලා හරසුන් බැමි බිඳ සසරින් නික්මෙමි මේ වාරේ

**ලිරාජි පතිනායක**

## කරුළමය

ඇස් ඇරගෙන
ඉන්න බෑ
නුඹ මා ළඟ
ඇස් පියාගෙන
ඉන්න බෑ
නුඹ හිත ළඟ

**චින්තක බාලසූරිය**

## වර්තමානයේ නන්දා තෙරුන්

හිමියනි,
බණ පොත අතට ගත් කල
ජනපද කල්‍යාණිය
දකිමි

**තිලානි ශානිකා විතානාච්චි**

## ගුරු ගීතය

(ශීත කාලය පැමිණේවි. තද ශීත කුණාටු හමාවී. හිම කැට සහිත මහ නපුරු සුළිසුළං හමාවී. එහෙත් වසන්තය එනවා සත්තකයි...)

අයිලයේ කඳුවැටිය මත
නුඹගේ උණුසුම් සුසුම් මැද
එදා සිටවූ සිඟිති පොප්ලර් පැළ
සර සර හඬින් මුමුනමින්
එකිනෙකා හා තුරුළුව
රහස් කොඳුරන සඳ
මගේ යෞවනයේ ප්‍රථම වසන්තය
නුඹ කොහිද අද?

හදවතම පණ ගැන්වූ
නුඹගේ හඬේ දිරියෙන්
මෘග වූ රතු මුහුණු මඟහැර
ලොව දිනා දිව එන සඳ
නුඹේ ශීතල අතින්
මගේ නළලත පිරිමදින්නට
මගේ යෞවනයේ ප්‍රථම වසන්තය
නුඹ කොහිද අද?

නුඹේ ගෙල බදා
සිප වැලඳ ගන්නට
සදා පෙරුමන් පිරූ
අල්තීනායි වෙමි මම
ආදරණීය දුයිෂෙන්
සහෝදරයා... මිත්‍රයා... ගුරුතුමා...
මගේ යෞවනයේ ප්‍රථම වසන්තය
නුඹ කොහිද අද?

**නදීරා රෝෂිණී නල්ලපෙරුම**



## අත්හැරිමි මම සසර කතරේ

අතර මගදී බැඳි පෙමින්
සසර සරනා විට දුකින්
බෙහෝ වෙති හමු වූ දනන්
සිටිමි උන් අත් හැර සිතින්

මතක නැත සිටි බව පෙමින්
ගැලූ කඳුළැලි යුග නෙතින්
සබඳ මතු සසරෙදි නිතින්
ඔබද හිමි නැත මට ඉතින්

දෙසූ සදහම් බුදු මුවින්
හදේ අලවා බැති සිතින්
පසක් කරනට අම නිවන්
සරණ වේවා මට නිතින්

**පියසීලි විජේනායක**

## සීගිරි ළඳකගෙ අම්මෙක් ඉකිබිඳියි

මගෙ පැදුරෙන් මිදී කෙල්ලට
වාසලට යන්නට වුණා
අනේ ඒකිගෙ කැකුළු ඇඟ කඳ
හැම වෙලාවෙම සිහිවුණා
මාලිගාවෙන් අපේ ගෙපැලට
තෑගි - බෝගත් හිමි වුණා

සිහිල් ජල කෙළි - දුහුල් සළුපිළි
දුවට හිමි බව සැලවුණා
මහා සීගිරි ගලේ මුදුනත
උඹේ රුව සිත්තම් වුණා
එය බලන්නට හොරෙන් හවසක
මාත් එතනට ගොඩ වුණා

කරඬුවක් වගෙ උඹේ උඩුකය
අනෙක් උන් මැද දිලිසුණා
මගේ හුස්මක් ගැටී වෙන්නැති
දුවේ කළුගල සෙලවුණා
පපුව ටික - ටික මෙළෙක් වෙන කොට

එන්න වෙයි මං දන්නවා
උඹේ දූවිලි සුවඳ තැවරුණු
පැදුර තාමත් තියෙනවා
දැනුත් සීගිරි සිංහයා
කට ඇරන් ඉන්නව පේනවා
ඒ ඉසව්වෙන් යද්දි මං
පොඩි කෙල්ල හංගා ගන්නවා

**මහින්ද ප්‍රසාද් මස්ඉඹුල**

## ලොකු දුවගේ පැනය

හැඩට වැඩට ගෙයි ඇති දැඩි වුණු — හිච්චි
උන් හිටි ගමන් ඇඳ බැඳගෙන — සැරසිච්චී
යනකොට කිව්ව දේ හරියට නෑ — නිච්චි
ඉඳි කඩුල්ල පැන හනිකට පිට — වෙච්චී

නන්නාදුනන නුවරක ඈ — නැවතිච්චී
කාලය ගෙවෙද්දී අප අමතක — වෙච්චි
නුවරදි නුවරුන්ට ටික ටික — රැවටිච්චි
හිච්චිට යන්න දුන්නේ ඇයි — අප්පච්චී

**කුසුම් විතාරණ**

## අපි

මහා ගස් නැති
මේ බිමේ
තුත්තිරිත් ගස් වෙලා
අපි
පුංචිම පුංචි නිසා
ඒ ගස් යට
අපි

**සේනක සමරසිංහ**

## ගලෙක මෙලෙක

ගල් වඩුවාණන්ගෙ බැතිබර ගුණය — බලා
නව අරහාදි සම්බුදු ගුණ ගඟුල — ගලා
කළුගල් පවා සිත්පිත් නැති මෙළෙක් — වෙලා
හිඳිහිටි හොවින බුදු රූ ඇත පහළ — වෙලා

කළුගල් කැටිය පෙන්වන මෙත් කුලුණු — ගුණ
මනසින් උසස් මිනිසා සිත් පිත් — තියෙන
දුරලන අයුරු අලුයම කෙළ පිඩක් — මෙන
රහසක් නොවේ අය හට ඇස් කන් — තියෙන

සදහම් දිවයිනෙන් ඔබ වැඩි තුන් — වරෙක
යහගුණ දම් හිඟය දුසිරිත් ඇත — නොයෙක
සෑසී සමිඳුනේ කළු ගල්වල — මෙළෙක
විතරක් හෝ හෙළනු මැන මිනිසුන් — හදෙක

**පයස් ප්‍රනාන්දු**



ALPC
AHANGAMA LAW
PROFESSIONAL CORPORATION
Real Estate Law
Immigration Law
Corporate Law
Wills and Estates
Family Law
Simple Divorce/ Separation and Marriage Agreements
4465 Sheppard Avenue East
Unit 21, Toronto, ON
M1S 5H9
Canada
Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com
Anoshan Ahangama
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC




SILVY FERNANDO LAW
✓ Personal Injury
✓ Real Estate Purchase/Sale/Refinance
✓ Family Law
✓ Wills
✓ Powers of Attorney
✓ Affidavits
✓ Immigration
✓ Commercial Property Sale/Purchase
✓ Landlord-Tenant
✓ Notarizing & Commissioning
✓ Incorporations
Silvy Fernando LL.B.
Barrister, Solicitor & Notary Public
350 Highway 7 East, Suite 213
Richmond Hill, ON L4B 3N2
Tel: 416-272-6587/ 905-597-1716
Email: Silvy@sfdolaw.com




Century 21
Leading Edge Realty Inc. Brokerage
invis
Canada's Mortgage Experts™
THUSITH WEERASURIYA
REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT
416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM
"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"
Bus: 905-405-8484 Fax: 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.
Markham
165 Main St N.
Scarborough
1825 Markham Rd.
Ajax
527 Kingston Rd. W
Toronto North
1053 McNicoll Ave.
Yorkville
1300 Bay St.
Stouffville
6393 Main St.
Whitby
408 Dundas St. W
Don Mills
801 York Mills Rd.
Designed@niukraids.ca

මාලඹේ ධම්ම විමුක්තා තෙරණින් වහන්සේ
කැනඩාවේ ටොරොන්ටෝ නගරයට
ජූනි මාසයේ
වැඩමවීමට නියමිතයි.

උන්වහන්සේ ජූනි 21 - 24, ජූනි 27 - ජූලි 02 යන දින කිහිපය තුළ භාවනා සහ ධර්ම සාකච්ඡා වැඩසටහන් මාලාවක් පවත්වනු ලැබේ.

ස්ථානය - නොබෝ දිනකින් දැනුම් දෙනු ලැබේ.

වැඩි විස්තර සඳහා

චින්තා : 647-300-5444
දිලිණී : 416-471-7942
(සවස 6 න් පසු)
මනෝරී : 647-721-3285 (සවස 3 න් පසු)
ඉෂාණී : 011 94 776109939

# OPENING SOON - SEPTEMBER 2018

## Shirdi Sai School of Canada

At 2701 Markham Road, Scarborough, Ont.
We are accepting registration for this brand new school for
(Junior/Senior Kindergarten, AND Grades 1-5)
To register
your interest please go to:

**http://shirdisaischoolofcanada.com**

HURRY To avoid disappointment

**(416) 298 3030**

SHIRDI SAI SCHOOL CANADA



DG CATERING SERVICE

ඔබගේ ඕනෑම උත්සව අවස්ථාවකටම

සිංහල අච්චාරු, මාළු ඇඹුල් තියල්,
අඹ මාළු ඇතුළු සිංහල ව්‍යාංජන වර්ග

සියළුම ආකාරයේ ඩෙවල් වර්ග,
ෆ්‍රයිඩ් රයිස් හා නූඩ්ල්ස් වර්ග

Specials Lump Rice & Biryani

Sri Lankan Foods
Hakka Chinese
Fried rice (pork/chicken/beef/veg)

For any Special Parties

**416 998 4658**
dgcatering@yahoo.com





# Jayasinghe
## Law Office

★ Real Estate Law ★ Immigration Law ★ Family Law
★ Wills & Estates Law ★ Power of Attorney ★ Notarizations

JAYASINGHE R. ARACHCHIGE.MCL.
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC
ATTORNEY-AT-LAW SRI LANKA

Office : 647 341 1540
647 795 3023
Cell : 647 995 3996
Fax : 647 795 3023

795 Birchmount Road
Toronto ON, M1K 1R7
Email - jayasinghera@gmail.com


The Power Tools To Sell Your Property
Renovation Cost upto $4000.00
Free
Advertising Signage & Photos
Free
Lawyer's Fee
Free
Market Evaluation & Home Inspection
Free
Home Staging
Free
Open Houses Showing
Free
**Some conditions apply.This promotion can be discontinued without prior notice.Not intended to solicit buyers or sellers currently under contract.
Save money when selling your home!
Selling real estate is what I do. I can help you save thousands when listing your property. You will pay less and get a full service listing with no hidden fees. My home marketing strategy will attract the greatest number of potential buyers and help you sell quickly and hassle-free for the best value.
Nishantha Donsiyambalapitiyage
Real Estate Sales Representative
Mobile: 416 417 0763
Email: nishan.don@gmail.com
Mississauga Office: 350 Burnhamthrope Dr. W. Unit 127
Scarborough Office:2250 Markham Road Unit #3 Scarbotough ON M1B2W4
Century 21
INNOVATIVE REALTY INC


A NEW VANNI MARKET.
40 Bristol Rd E. Unit 7. Mississauga, ON. L4Z 3K8
(NEAR BMO BANK)
Phone : 905-566-5550 Cell Phones : 416-456-5886/ 647-627-9013
We've put the finishing touches on our new Vanni Market in your neighborhood. Come in and take a tour of the new Vanni Market and buy all the Grocery, Vegetables, Fruits, Fresh Fish & Meat has to offer
under new management
FRESH GROCERIES, VEGETABLES, FRUITS, FISH & MEAT AVAILABLE !!

# රේඛාව හා ලෙස්ටර්ගේ සිනමාව



■ **ජයවිලාල් විලේගොඩ විසිනි**

රාජකීය වික්‍රමයෙන් සිංහල චිත්‍රපටයත්, කඩවුණු පොරොන්දුවෙන් සිංහල කථානාද චිත්‍රපටයත් උපන්නා නම් සිංහල සිනමාව කියා කිව හැකි දෙයක උපත සිදු වූයේ රේඛාවෙනි. සිනමා කැමරාවක් ඉදිරියට පමුණුවන ලද රූකඩ නැටුම් වර්ගයක් සිංහල චිත්‍රපට හැටියට ප්‍රදර්ශනය කෙරුණු යුගයක ප්‍රථම වරට සිනමා මාධ්‍යය හඳුනාගෙන නිෂ්පාදිත චිත්‍රපටය රේඛාවයි.

එය බිහි වූයේ සිනමාව ගැන අපමණ භක්තියකුත්, එකල නිපදවෙමින් තිබූ බහුබූත චිත්‍රපට ගැන එතරම්ම ද්වේශයකුත් ඇතිව සිටි තරුණ කණ්ඩායමක් විසිනි. 'චිත්‍ර ලංකා' නමින් සමාගමක් පිහිටුවා ගත් මේ පිරිසගෙන් මූලිකයා වූයේ ලංකාවේදී කලක් පුවත්පත් කලාවේදියකු හැටියට ජීවිතය අරඹා ඒ රක්ෂාවම කිරීමට ලන්ඩනයටද ගොස් සිටියදී සිනමාව ගැන ආශාවකුත් අවබෝධයකුත් ඇති කරගෙන අහම්බෙන් මෙන් ලංකා රජයේ චිත්‍රපට අංශයේ සේවයට බැඳුණු ලෙස්ටර් ජේම්ස් පීරිස්ය.

ලෙස්ටර් ජේම්ස් පීරිසුත් ඔහු සමඟ එකට සේවය කළ කැමරා ශිල්පී විලියම් බ්ලේක් සහ සංස්කාරක ටයිටස් තොටවත්ත (එකල ටයිටස් ද සිල්වා) 1955 සැප්තැම්බර් 1 වැනිදා රජයේ චිත්‍රපට අංශයෙන් අස් වී 'රේඛාව' නිපදවීම ආරම්භ කළහ. 'රේඛාව' පටන් ගන්නා කාලයේ එළිමහනේ චිත්‍රපට ගැනීම කියා දෙයක් ලංකාව අහලකවත් තිබුණේ නැත. චිත්‍රපටයක් නිපදවිය හැක්කේ චිත්‍රාගාරයක් තුළ පමණක් බවත්, හොඳ සිංහල චිත්‍රපටයක් නිපදවිය හැක්කේ දකුණු ඉන්දියානු චිත්‍රාගාර තුළ පමණක් බවත් එකල ඇදහීම විය. ෆියට් ස්ටේෂන් වැගන් රියක සිනමා කැමරාවකුත්, අනෙක් ආම්පන්නත් රැගෙන කුරුණෑගල, අලව්ව ආදී පළාත්වල හිරු එළියෙන් එළිමහනේ චිත්‍රපට ජවනිකා ගත් මේ 'පිස්සු මිනිස්සුන්' ට ඒ කාලයේ බොහෝ දෙනා ඔච්චම් කරමින් සිනාසුණහ. 'රේඛාව' ප්‍රදර්ශනය කළ විට 'මැස්සන් ඇහිරෙන' තත්ත්වයට සිනමාහල් පැමිණි වේලේ මේ සිනහව තවත් දැඩි විය. එහෙත් සිංහල සිනමාවට සිනමාව එක් වුණේ රේඛාවෙනි.

ලංකාවේ සම්මත සිනමා සම්ප්‍රදායයන්ට විරුද්ධව රේඛාව නිපදවීමට දරන ලද ප්‍රයත්නය වෙනස් චිත්‍රපටයකට කතා වස්තුවක් සැපයීමට තරම් සිද්ධීන්ගෙන් අනූනය.

එහි නළු නිළියන් තෝරා ගන්නා ලද්දේද සම්මතයට ඉඳුරා පටහැනි ක්‍රමයකටය. ලෙස්ටර් ජේම්ස් පීරිස් එකල පදිංචිව සිටියේ මොරටුවේ ලක්ෂපතියේය. ඒ ගෙවල් ළඟ සිටි පොඩි කොලුවෙක් චිත්‍රපටයේ ප්‍රධාන කොටස වූ සේනගේ ළමා චරිතයට තෝරා ගන්නා ලදී. ඒ තරම්ම වැදගත් වූ ළමා නිළියගේ කොටසට ගන්නා ලද්දේ 'පුදුම ලේලි' චිත්‍රපටයේ ළමා චරිතයක් රඟපෑ මර්ටල් ප්‍රනාන්දු දැරියයි. (ඇය අඩු වයසින්ම රෝගයක් වැළඳී මිය ගියාය) ලෙස්ටර්ගේ වාර්තා චිත්‍රපටයක රඟපෑ ඉංග්‍රීසි වේදිකා නිළියක වූ අයිරංගනී මීදෙනිය (පසුව සේරසිංහ) මවගේ චරිතයට ගන්නා ලදී. රේඛාවේ පෙම්වතුන්ගේ ලෝකයක්ද විය. ඒ කොටස්වලට සමකාලීන සිනමාවෙන් ආනන්ද වීරකෝන්නුත්, එකල රඟපෑමේ කිසිම පළපුරුද්දක් නොතිබූ මල්ලිකා පිලපිටියත් තෝරා ගනු ලැබීය. විමලවීරගේ චිත්‍රපටවල නාස්ති වෙමින් සිටි ඩී. ආර්. නානායක්කාර සහ එන්. ආර්. ඩයස් හමස් පෙට්ටියෙන් ගෙනා වැදගත් චරිත දෙකකට යෙදැවිණි.

එකල සිනමාවේ නියුක්තව සිටියවුන්ගෙන් 'රේඛාව' ට යන්තම්වත් අතක් දුන්නේ සිරිසේන විමලවීර බව මෙහිදී සඳහන් කළ යුතුය.

හින්දි තාල කොපි කළ යුගයක අලුත්ම තනු පිළිවෙළ කිරීම පිණිස සංගීත අධ්‍යක්ෂණයට සුනිල් ශාන්තව ගත් අතර ප්‍රථම වරට සිංහල චිත්‍රපටයක ගීත රචනය පූජකවරයකුට බාර දෙමින් මර්සලීනු ජයකොඩි පියතුමා ගීත රචනයට ගන්නා ලදී.

මෙසේ ඇරැඹි චිත්‍රපටයේ ජවනිකා ගැනීමේදී නොයෙකුත් නව ක්‍රම යොදනු ලැබීය. දර්ශන ගන්නා ලද්දේ වහලක් නැති ගෙයකය. ඒ හිරු එළිය යහමින් ලබා ගැනීමටයි. චිත්‍රපටයේ එක් තැනක සේනගේ දේව බලයෙන් අසනීප සුව කර ගැනීමට එන එක් ළමයකුට "ඔය ළමයාව පොඩ්ඩක් එළියට ගේනවා" යි කියන දෙබසක් ඇත. එය එසේ කරන ලද්දේ කතාවේ වුවමනාවට වඩා කැමරා ශිල්පියාගේ වුවමනාවටය. ජවනිකාව නිවස තුළ ගැනීමට තරම් එළිය මදි නිසා එසේ එළියට ගන්නා ලදී.

මේ අන්දමින් නිපදවන ලද චිත්‍රපටයේ රසායන කටයුතු සඳහා රජයේ චිත්‍රපට අංශයට බාරදීමට අදහස් කෙරිණි. එහෙත් එතැනින් 'පැනගිය' අයගේ වැඩ බාර ගැනීමට ඔවුන් කැමැති නැති බව නොකියා කියන ලදී.

ඉන්දියාවේ චිත්‍රාගාරයකට එය රසායන කටයුතු සඳහා ඉදිරිපත් කෙරුණි. සේදූ පසු චිත්‍රපටය බාර ගන්නා බවට රු: 1,50,000 ක ඇපයක් ඉල්ලන ලදී. එයත් ඉටු කෙරිණි. ඊළඟට චිත්‍රපටය එහි යවන ලද අවස්ථාවේ මදුරාසියේ ගින්දර ග්‍රීෂ්මයේ ටකරන් වහලවල් සහිත ගබඩා කාමරයක තුන් මාසයක් එය දමන ලද ගමන් තිබුණේය. පුදුමයකට මෙන් එයිනුත් චිත්‍රපටයට කිසිවක් නොවිය.

එදිනෙදා ගන්නා ජවනිකා ඊට පසුවදාම බැලීම සාමාන්‍යයෙන් චිත්‍රපට නිපදවීමේ සිරිත නමුදු 'රේඛාවේ' දර්ශන සෝදා බලන්න ලැබුණේ ඒවා කැමරාගත වී අවුරුද්දකට කිට්ටු කාලයක් ගිය පසුවය. ඒ ඉන්දියාවේ. ලංකාවේදී සිදුවුයේ ඊටත් වඩා අරුම පුදුම සිද්ධියකි.

රේඛාව කතාවේ එක ප්‍රධාන සිද්ධිය නම් දේව වරමකින් සාත්තර කීමේ වරම ලබාගන්නා ළමයාට යකෙක් වැහී ඇතැයි ගම්මුන් ඔහුට කරන අමානුෂික වධහිංසායි. කවදාවත් නැති නියඟයක් ගමට එයි. ඒ කොලුවාගේ යක්ෂ බැල්ම නිසා යැයි සැක කරන ගැමියෝ ඔහුට වධ දෙති. 'රේඛාව' ට ජවනිකා ගත් ගමේද ඒ දවස්වල නියඟයක් ඇති වී සරම්ප රෝගය පැතිර ගියේය. ඊට හේතුව කොළඹ චිත්‍රපටකාරයින් ගමට ඒම හැටියට සලකන ලදී. පුවත්පත්වලින් නොමසුරු පැසසුම් ලැබුණද 'රේඛාව' ජනප්‍රියත්වය අතින් එකල සාර්ථක නොවීය.

ලෙස්ටර් ජේම්ස්ගේ මුල්ම චිත්‍රපටය වූ 'සොලිලොකියු' නිෂ්පාදනය කෙරුණේ 1949 දීය. විනාඩි විස්සක කෙටි චිත්‍රපටයක් වූ එය 1951 දී ලන්ඩනයේ දී හොඳම කෙටි චිත්‍රපටය සඳහා කුසලානයක් දිනීය. ලන්ඩනයේ සිට ලෙස්ටර් ආපසු ලංකාවට එන විට මේ කුසලානය ලංකා රේගු නිලධාරීන් විසින් රාජසන්තක කරනු ලැබීය. එය ආපසු දෙන ලද්දේ කුසලානේ වටිනාකම රේගුවට ගෙවීමෙන් පසුවය. 'රේඛාව' නිපදවීමෙන් පසුවත් ලෙස්ටර්ට ලැබුණේ අර රේගු නිලධාරින්ගේ එවැනිම සැලකිල්ලකි.

එහෙත් මෙරටින් නොලද සැලකිල්ල එයට විදේශිකයින්ගෙන් හිමි විය. විදේශ සිනමා උත්සව කීපයකදීම එය ඉහළින් පිළිගනු ලැබිණි. රටවල් ගණනාවකම එය ප්‍රදර්ශනය කරනු ලැබිණි. පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක ඕනෑම චිත්‍රපටයක් බ්‍රිතාන්‍යයේ සිනමාහල්වල ප්‍රදර්ශනය කරන විට විකිණෙන සෑම ටිකෙට්ටුවකටම ආපසු පැන්සයක මුදලක් නිෂ්පාදකයින්ට දීමේ සිරිතක් ඇති නිසා 'රේඛාව' ආණ්ඩුවකින් විශේෂ දීමනාවක් ලත් මුල්ම සිංහල චිත්‍රපටය බවටද පත් විය.

සිනමාව පිළිබඳ ලෝ පතළ විශාරදයකු වන ප්‍රංශ ජාතික ජෝජස් සැඩුල් කාණ්ඩ කීපයකින් ලියූ 'හිස්ටොයිරේ සිනමා' (සිනමාවේ ඉතිහාසය) චිත්‍රපට පිළිබඳ බයිබලය හැටියට සැලකේ. පිටු හයසිය ගණනකින් යුත් එහි එක් කාණ්ඩයකට 1961 දී පමණ ලංකාව ගැනත් පේළි 40 ක් එක් වී ඇත. එයද ලංකාව ගැන නොව 'රේඛාව' ගැන යැයි කිව යුතු තරම්ය. මෙන්න එහි කොටසක්.

'1947 ත් 1960 ත් අතර චිත්‍රපට 30 ක් පමණ නිෂ්පාදනය කරන ලදී. මේ කාලය තුළ විශේෂයෙන් 1955 න් පසු අලුත් ලක්ෂණයක් නම් භාෂාව පමණක් සිංහල එහෙත් අනෙක් හැම දෙයක්ම ලාංකික ජීවන ක්‍රමයට සම්බන්ධයක් නැති නිෂ්පාදන මදුරාසියේදී තැනීමයි. එහෙත්, මෙවැනි නොවැදගත් කර්මාන්තයකට වුවද 1957 දී ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ රේඛාව නිර්මාණය වීම වැළැක්විය හැකි නොවීය. එය සත්‍යයෙන් හා ගීතවත්කමින් පිරි කැමරා ශිල්පයත් රඟපෑමත් විශේෂයෙන් අයිරාංගනී මීදෙනියගේ නිසා විශේෂත්වයෙන් පෙනෙන, උසස් තත්ත්වයක චිත්‍රපටයකි.

එවන් කලා කෘතියක් මෙවැනි නොදියුණු කර්මාන්තයකින් හදිසියේ බිහිවීම පීරිස්ගේ අනුපම නිර්මාණ කෞශල්‍යය නිසාම වූවක් නොවේ. එය ලංකාවේ ශ්‍රේෂ්ඨ වූත්, චමත්කාර ජනක වූත් කලාත්මක හා සංස්කෘතික දායාදයන්ගේ උරුමයකි. ප්‍රංශකාරයකුට පෙනුණු මේ සත්‍යය අදත් නොදුටු සිංහල පොට්ටයින්ගේ සංඛ්‍යාව සුළුපටු නොවේ.

රේඛාවෙන් යුගයක් ඇරැඹි දසකයක් ගියේය. 1947 න් ඇරැඹි ප්‍රථම සිනමා දසකයේ අවසාන චිත්‍රපටය වුයේ රේඛාවයි. සිංහල සිනමාවට පහළ වුණු ප්‍රථම අධ්‍යක්ෂවරයාත් අදත් සිංහල සිනමාවේ සිටින හොඳම අධ්‍යක්ෂවරයාත් ලෙස්ටර් ජේම්ස් පීරිස් බවට වාදයක් නැත.

ලෙස්ටර්ගේ චිත්‍රපටවල ප්‍රධාන ලක්ෂණය මානුෂික සම්බන්ධතා හා මිනිසුනුත් පරිසරයත් සමඟ ඔවුන්ගේ ගැටුම් දෙස කැමරාවෙන් බලන්න දරන උත්සාහයයි. 'සංදේශය' හා 'රන්සළු' හැරුණු කළ අප සාමාන්‍යයෙන් සලකන කතන්දර කීමේ සිරිත ලෙස්ටර්ගේ චිත්‍රපටවල නැත.

ඔහුගේ අනෙක් ප්‍රධාන හැකියාව නළු නිළියන්ගේද දක්ෂම රඟපෑම උලුප්පා ගැනීමයි. ඔබ සිංහල සිනමාවේ දුටු හොඳම චරිත නිරූපණයක් කල්පනා කරන්න. එය ජෝ අබේවික්‍රමගේ රඟපෑමක් නොවේ නම් එය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ චිත්‍රපටයක රඟපෑමක් වීමට බොහෝ දුරට ඉඩ ඇත.

ප්‍රකට නළු නිළියන් ගෙන දක්ෂම නළුවකු හා නිළියක කොට චිත්‍රපටයකින් දෙකකින් අතහැර දැමීම ලෙස්ටර්ගේ සාමාන්‍ය ක්‍රමයයි. ලෙස්ටර්ගේ ලොකුම දක්ෂකම නළු නිළියන්ගෙන් ඔහු ලබාගන්නා දක්ෂ රඟපෑමයි. කලින් කිසිම නමක් නැති කෙනෙක් සිනමාවට ගෙන ඔහු හෝ ඇය 'තරුවක්' කොට ඊළඟට අත්හැර දැමීම ලෙස්ටර්ගේ පුරුද්දක් බඳුය.

රේඛාවේ පළපුරුදු නළුවන් වූ ඩී. ආර්. නානායක්කාර හා ඉංග්‍රීසි වේදිකාවට සීමා වී සිටි අයිරාංගනී සේරසිංහගේ පටන් සෝමපාල ධර්මප්‍රිය හා අන්ධ තරුණියක හැටියට මර්ටල් ප්‍රනාන්දුගෙන් (තවත් ළමයෙක් කොරෙක් හැටියට සුළු කොටසක දක්ෂ ලෙස රඟපෑවේය) ඔහු ලබාගත් රඟපෑම්වල පටන් 'සංදේශයේ' ගාමිණී ෆොන්සේකා (තමාගේ චිත්‍රපටවලින් රඟපෑම් දුර්වලම එක සංදේශය බව ලෙස්ටර් පිළිගනී) 'ගම්පෙරළියේ' පුණ්‍යා හීන්දෙනිය 'දෙලොවක් අතරේ' ටෝනි රණසිංහ, 'රන්සළු' වේ යළිත් පුණ්‍යා සහ 'ගොළු හදවතේ' අනුලා කරුණාතිලක ඉදිරිපත් කළ රඟපෑම් අගය කළ හැකි වන්නේ මේ හැමෝම ඊට ඉහත වෙනත් අධ්‍යක්ෂවරු යටතේ කළ රඟපෑම් හා සසඳන කල්හිය.

සංදේශයේ රඟපෑවේ ඊට කලින් දෛවයෝගය හා පිරිමියෙක් නිසා චිත්‍රපටවල රඟපෑ ගාමිණී ෆොන්සේකා නොවන්නේ ලෙස්ටර්ගේ අධ්‍යක්ෂණ කුසලතාව නිසාය. අධ්‍යක්ෂවරයකු සතු විය යුතු ප්‍රධානතම ගුණය වන සෙසු සහාය ශිල්පීන්ගෙන් හොඳම උකහා ගැනීමට ලෙස්ටර් තරම් හොඳින් කරන තවත් අධ්‍යක්ෂවරයකු සිංහල සිනමාවේ නැත. ඔහුගේ චිත්‍රපටවල කැමරාව, සංගීතය, චිත්‍රපට කතා කෙටුම්පත, සංස්කරණය ආදී හැම

**44 වන පිටුව බලන්න**





**කැනඩා සිංහල සංගමය මගින් පවත්වන ලද හෙළ අවුරුදු උළෙලේ විශේෂ අවස්ථා.....**






























# ජාති ආලය

(ඉන්දියානු ලේඛක ආර්. කේ. නාරායන්ගේ Another Community කෙටිකතාවේ සිංහල පරිවර්තනය)

■ **ආචාර්ය ජගත් රූපසිංහ**
**ටොරොන්ටෝ, කැනඩාව**

කුලය හෝ ජාතිය ගැන සඳහනක් නොකරමි. මෑත කාලයේදි පුවත්පත් මගින් ජාතීන් හැඳින්වීම සඳහා කිසිම ජාතියකගේ සිත් නොරිදෙන ලෙස වචන භාවිත කරයි. ජාතියක නම නොකියා එක් ජන කොට්ඨාසයක් සහ තවත් ජන කොට්ඨසයක් ලෙස ඔවුන් විවිධ ජාතියේ මිනිසුන් හඳුන්වයි. එය අනුගමනය කරමින් මෙහි වීරයාටද නමක් ජාතියක් නොදෙමි. ඔබට කැමති නම් ඔහු කුමන ජාතියේද ජන කොට්ඨාසයේද කියා ඔබම හඳුනාගන්න. ඔහුගේ නියම ජාතිය කුමක්දැයි කියා ඔබට කිව හැකි යයි නොසිතමි. ඔහු ඇඳගෙන සිටින ඇඳුම ගැන ඔබට අනුමානයෙන් කිව හැකි මුත් එය මේ කතාවට අදාළ නොවේ. රක්ෂණ කටයුතු කරන ආයතනයක ලිපිකරුවෙකු ලෙස ඔහු රැකියාව කළේය. ඔහුගේ දිනපතා රාජකාරිය වූයේ මේසයක් ඉදිරිපිට වාඩි වී ලිපිලේඛන සහ ගණන් හිලව් පිරික්සීමයි. ඔහු සාමාන්‍යයෙන් සවස පහ වනතුරු වැඩකරයි. මාසේ අන්තිමට ලියුමක දැමූ පඩිය ඔහු අතට ලැබෙයි. දැන් මැදිවියට ආසන්න වෙමින් පවතින ඔහුගේ තරුණ කාලය මේ කන්තෝරුවටම ගෙවී ගියේය. කාමර දෙකක් සහිත කුඩා නිවසක ඔහු ජීවත්වෙයි. ගෙදරට අමුත්තෙක් පැමිණි විට නිවසේ ප්‍රමාණය පිළිබඳව ඔහුට තරමක මදිපුංචිකමක් ලැජ්ජාවක් දැනුණත් බිරිඳ සහ දරුවන් හතරදෙනාට නිවස ප්‍රමාණවත් බව ඔහු සිතයි. ඔහු නිවසට කැමතිය. කඩපොල ඉතා ආසන්නය. දරුවන්ගේ පාසල පයින් ඇවිදින දුරින්ය. අසල්වැසි සියලුදෙනාම වාගේ බිරිඳගේ හිතවතුන්ය.

1947 ඔක්තෝබර් වනතුරු ඔහු ඉතා සතුටින් කාලය ගත කළේය. එහෙත් දැන් දැන් අසල්වැසියන් සහ නගරයේ මිනිසුන් හැසිරෙනුයේ කතාකරනුයේ වියරු වැටුණු මිලේච්ඡයන් ලෙසය. සැතපුම් සිය දහස් ගණනක් ඈත සිදුවන මිනිමැරුමක් හෝ වෙනත් සිදුවීමක් ප්‍රදේශය තුළ ප්‍රචාරය වනුයේ යක්ෂයාගේ සිතුවිලිද සමගය.  මිනිසුන් තමන්ගේ හිතේ නැගෙන ක්‍රෝධය වෛරය දකින හමුවෙන හැමදෙනාටම පෙන්වයි. මෙය මෝඩ හැසිරීමක් වුවත් සිදුවන්නේද එයමය. ඈත ප්‍රදේශවල සිදුවන හොඳ දේ   සාමකාමී දේ  මේ ප්‍රදේශයේ කිසිකෙනෙක් නොදනී. එවැනි හොඳ දේ ගැන කතා කරන්නේද නැත. එහෙත් නරක ආරංචි ඉක්මනින් පැතිර යයි. දිනපතා පුවත්පත් කියවන අසල්වැසියන්ගේ කේන්තිය වැඩි වී ඉවසීමේ සීමාව ඉක්මවා යන බවක් ඔහුට පෙනෙන්නට විය.

"මෙහේ ඉන්න උන්ගෙ අයට ගහන්න ඕන" අසල්වැසියන් කේන්තියෙන් වෛරයෙන් කතා කරන්නට විය.

"උන් අපේ ගැහැනුන්ටත් ළමයින්ටත්  කරදර කරල" මිනිසුන් අඬමින් කියනු ඔහුට ඇසුණි.

"අපි උන්ට පාඩමක් උගන්නන්න ඕන. උන් එහේ අපේ අයට කරන දේවල් අපි මෙහේ උන්ගෙ අයට කරන්න ඕන. උන්ට තේරෙන බාසාවෙන් අපිත් කියල දෙන්න ඕන" මිනිසුන් කේන්තියෙන් කතා කරනවා ඔහුට ඇසුණි.

"මෙහේ බලන්න...." ඔහු කියන්නට උත්සාහ කළේය. කන්තෝරුවේ ඔහු ළඟම මේසයේ වැඩ කරන මිතුරාද, ලියුම් බෙදන්නාද, බුලත්විටි කඩේ බුලත්විට විකුණන්නාද, බැංකුවේ වැඩකරන ඔහුගේ මිතුරාද ඔහුට සිහිවිය. ඔවුන් සියලුදෙනාම අනිත් ජාතියේය. මේ වනතුරු ඔවුන් ගැන කිසිම ගැටලුවක් ඔහුට නොවීය. ඔවුන් සියල්ලම හිතවතුන් පමණි. ඔවුන්ගේ ජාතිය පිළිබඳව ඔහුට ප්‍රශ්නයක් නොවීය. ඒ සියල්ලෝම සිනහවෙන් මුව සරසාගත්, කියන දේට ඇහුන්කන් දෙන, එකිනෙකාට ගරුකරන හිතවතුන්ය. දැන් ඔවුන් පෙනෙනුයේ වෙනත් ජාතියක මිනිසුන් ලෙසය. තමන්ගේ අසල්වැසියන් අනෙක් ජාතිය කෙරෙහි තර්ජනාත්මකව කියන විට ඔහුට බොහෝ දේ මැවී පෙනෙන්නට විය. තැපැල් කන්තෝරුවේ මිතුරාව පාර මැද කපාකොට දමා තිබෙනවා මෙන් ඔහුට මැවී පෙනෙන්නට විය. ඔහුගේ මිතුරාගේ කුඩා සුරතල් දියණිය ඔහුට මතක් විය. මිතුරාගේ ගෙදරට ගිය විට දොඩම් යුෂ වීදුරුවක් ඔහුට ගෙන එන, ඔහු ඉදිරියේ ගයන නටන, සුරතල් දැරිය පාසල් යන විට ඔහු අයත් ජාතියේ දාමරිකයන් ඇය පසුපස  පන්නාගෙන යන අයුරු ඔහුට මැවී පෙනෙන්නට විය. මේ සිහිවන දේ දරාගැනීමට නොහැකි වූ ඔහු සිතින් වැලපෙමින් කොඳුරන්නට විය. "දෙවියනේ මට සමාවෙන්න"

තමාගේ මිනිසුන්ට කරුණු කියා දීමෙන් තත්ත්වය යම් ප්‍රමාණයකට පාලනය කිරිමට ඔහු උත්සාහ කළේය. "මේ බලන්න. ඔය කියන දේවල් කිසිදෙයක් මේ පැත්තෙ සිදුවෙලා නෑ." එහෙත් එය පලක් නොවන බව ඔහුට වැටහුණි. තමන්ගේ මිනිසුන් පිහි, පොලු, මුගුරු වැනි ආයුධ එකතු කරන බව ඔහු දනියි. යුද්ධයකට සැරසෙන්නාක් මෙන් ඔවුන් හොඳින් සංවිධානය වේ. මේ සියල්ල සංවේදි සිතක් ඇති ඔහුට දරාගත නොහැක. ගිනිතැබීම්, කැපිලි කෙටිලි, මංකොල්ලකෑම් පිළිබඳ කතාබහ මෙන්ම මැරවරයන් සංවිධානය කිරිම සහ ඔවුන්ට ගෙවීම් ආදි සියල්ලම සිදුවනුයේ ඔහුගේ මාමාගේ නිවසේය.

"අපි තවම මොකුත් කළේ නෑ. උන් තවත් නටාගෙන ආවොත් ඔක්කොම කම්මුතු කරනවා. අපි උන්ට තේරෙන බාසාවෙන්ම කියල දෙනවා."

මාමා නිතර කියනු ඔහුට ඇසුණි. ඉවසීමේ සීමාව ඉක්මවා ගොස් ඇති බව ඔහුට වැටහුණි. මේ සියල්ල දරාගත නොහැකි තත්ත්වයට පත් වී ඇති බව පෙනුණි. මිනිසුන් භේදභින්න වෙමින් එකිනෙකා දෙස සැකෙන් අවිශ්වාසයෙන් බලන්නට විය. සැමදෙනාවම ඔහුට පෙනෙනුයේ මිනීමැරුමකට සූදානම්ව සිටින මිනීමරුවෙක් ලෙසය. මිනිසුන් ඔවුනොවුන් දෙස ක්‍රෝධයෙන් වෛරයෙන් බලන්නට විය. පාර තොටේ හමුවන මිනිසුන් එකිනෙකා දෙස නන්නාඳුනන්නෙකු ලෙස අවිශ්වාසයෙන් සැකයෙන් බැලීම ගැන ඔහු ලජ්ජා විය. සැමතැනම බිය, ත්‍රාසය පැතිර යන්නට විය. ඔහු මිනිසුන් හමුවීමෙන් ඔවුන්ට ඇහුන්කන් දීමෙන් වැලකුණේය.

"දන්නවද වෙලා තියෙන දේ. අහවල් පාරේ බයිසිකල්කාරයෙක්ව කපල පිහියෙන් ඇනල. පොලිසිය ඔක්කොම තොරතුරු හංගල කිසිදෙයක් කරන්නෙ නැතිව ඉන්නවා." යමෙක් කියනවා ඔහුට ඇසුණි.

"අද අපේ ගෑනියෙක්ට ගහල" තවකෙක් කියනවා ඇසුණි.

"ආරංචිද.... උන් අද ගෑනු ළමයින්ගෙ ඉස්කෝලෙකට පැනල. ගෑනු ළමයි හතරදෙනෙක් අතුරුදහන් වෙලා. පොලිසිය වැඩක් නෑ. ඔවුන් නිකන් බලන් ඉන්නවා. මේවා අපිම නතර කරන්න ඕන. උන්ට තේරෙන බාසාවෙන්"

නිතර නිතර ඇසෙන මෙවැනි දේවලින් ඔහුගේ සිත පෑරෙන්නට විය. කෑමට ගත් දේ ඔක්කාරයට වමනයට එනවා සේ ඔහුට දැනුණි. කන කෑමවල කිසිම රසක් ඔහුට නොදැනේ. හිත සසල වී ඇත. තමන්ගේ බිරිඳ සහ දරුවන් දෙස බලන වාරයක් පාසා ඔහුගේ සිතට බියක් ඇති විය. මේ අහිංසකයන්වත් කිසිම දෙයක් තේරුම් ගන්නෙ නැති කාලකණ්ණි මැරවරයන් අතට අහුවුණොත් මොනවා වෙයිද කියල දෙවියො තමයි දන්නෙ. ඔහුගේ සිත වද දෙන්නට විය.

රාත්‍රියේදි ඔහුට නින්ද නොයයි. කොයි වෙලාවක හෝ කඩාවැදිය හැකි මැරවරයන්ගේ කෑගැසීම් ඇසේදැයි ඔහු නොනිදාම කන් යොමාගෙන සිටියි. මැරයන් නිවස මංකොල්ල කෑමට, පහර දීමට දොර කඩාගෙන ආවොත් යන සිතුවිල්ල නින්ද පලවා හරියි. තමන්ගේ දරුවන් භයෙන් මොර දෙන්නාක් මෙන් ඔහුට ඇසේ. කොයි මොහොතක හෝ හිරිහැර කිරීමට මැරවර කල්ලි පැමිණේ යැයි බලාපොරොත්තුවෙන් රාත්‍රිය පුරාවට නිදිකිරා වැටෙමින් ඔහු අවදිව සිටීමට උත්සාහ ගත්තේය. ඈතක බල්ලෙක් දිගටම බුරනු ඇසුනහොත් එක්වරම නැගිටින ඔහු ගින්නකින් ඇතිවන අහසට නැගි ගිනිදැල් මතු වී ඇත්දැයි බැලීමට එබී බලයි.

"මොකක්ද සද්දෙ" බිරිඳ නින්දෙන්ම අසයි.

"මොකුත් නෑ ඔයා නිදාගන්න." එසේ කියන ඔහු නැවතත් ඇඳට පැමිණ නිදා ගැනීමට උත්සාහ කරයි. කිසිවක් සිදුනොවීම ගැන ඔහුට සහනයක් දැනුණි. හදිසියේ කවුරුන් හෝ පැමිණියහොත්, යමක් සිදුවුවහොත් ආත්මාරක්ෂාව සඳහා ඔහු දරමඩුවේ තිබූ පොරව ගෙනවිත් රහසින්ම ළඟ තබාගත්තේය. වාහනයක් වේගයෙන් යන ශබ්දය ඇසුණු ගමන් කළුවරේම ජනේලය ළඟට ඇදෙන ඔහු එබී බලයි. එම වාහනය මිනිමරු දාමරික කොලහාලකරුවන්ට වෙඩි තියන්න පස්සෙන් පන්නන පොලිස් වාහනයක් නොවන බව සැක හැර ගැනීමට වාහනය යනතුරුම ඔහු බලාගෙන සිටියි. දිනපතා රාත්‍රියේ ඔහු මෙලෙස කල ගෙවයි. එළිය වැටෙන විට දහවල් කාලය එලඹෙන විට ඔහුට යම් අස්වැසිල්ලක් සහනයක් ලැබේ.

එලඹෙන 29 බදාදා දිනය තීරණාත්මක දිනයක් බව හැමදෙනාම කතාකරනු ඔහුට ඇසුණි. එදාට ලොකු දෙයක් සිදුවනු ඇත. මෙම දිනය යොදාගත්තේ ඇයිදැයි යන්න ගැන පැහැදිලි හේතුවක් නැති මුත් සියලුදෙනාම එම දිනය ගැන කතා කරයි. කන්තෝරුවේ සියලුදෙනාම කතා කරනුයේ 29 වෙනිදා ගැන පමණි. වෙන කිසිම කතාවක් නැත. මාමාගේ ගෙදර සිදුවන සංවිධානාත්මක කටයුතු දැන් උපරිම තත්ත්වයට පත්වී ඇත.

"මට සතුටුයි මේක 29 වෙනිදට සිදුවන එක ගැන" මාමා ඔහුට පැවසීය.

"එදාට මේ තියෙන බයයි, උණුසුම් තත්ත්වයයි සදහටම ඉවර වෙයි. අපි මේ නගරෙ සුද්ද කරනවා. මෙහේ උන්ගේ අය ඉන්නෙ ලක්ෂ එකහමාරක් විතර. ඒ වගේද අපි." ඔහු නගරයේ මිනිසුන්ගේ ජාති ප්‍රතිශතය ගැන කියවයි.

අවසන් හෝරාව ළඟා වෙමින් පවතියි. මේ සියලු සූදානම් සහ වැඩපිළිවෙළවල් සමගම ඔහුගේ  සිතට ප්‍රශ්ණයක්ද නැගුණි. "කවුද ඉස්සෙරලම වැඩේ පටන් ගන්නේ. කොයි පැත්තෙන්ද මුලින්ම වැඩේ පත්තු කරන්නෙ. වෙලාවක් බලල එක් ජාතියක කෙනෙක් අනෙක් පැත්තෙ එකෙකුට කම්මුලට ගහල නැකතට වගේ චාරිත්‍රානුකූලව වැඩේ පටන්ගන්නවද? හිතමු එහෙම කිසිදෙයක් වුණේ නෑ කියල" ඔහු මාමාට තමාට ඇති වුණු ප්‍රශ්ණය ඉදිරිපත් කළේය.

"කොහොමද හිතන්නෙ මොකුත් වෙන්නෙ නෑ කියල. අපි දන්නවා උන් මොනවද කරන්නෙ කියල. හැමදාම රෑට උන් එකතු වෙනවා. ඇයි උන් රෑට රෑට එකතුවෙලා කතා කරන්නෙ." මාමා පිළිතුරු දුන්නේය.

"ඔවුන්ට රෑට මිසක් වෙන වෙලාවක් නැතිව ඇති කට්ටිය එකතුවෙන්න." ඔහු කීවේය.

"අපි කැමති නෑ මිනිසුන් ඒ වෙලාවට එකතු වෙනවට. කලබල කරන්න අපේ කිසිම අදහසක් නෑ. ඒත් මොනවහරි වුණොත් අපි උන්ව නැත්තටම නැතිකරල දානවා. ඒක පැය කිහිපයක වැඩක්. හරියටම වැඩක් පටන් ගන්න ස්විච් බොත්තමක් ඔබනව වගේ. ඒත් අපි ඉස්සරවෙන්නෙ නෑ. පුළුවන් තරම් ඉවසනවා." මාමා නැවතත් කීවේය.

ආරක්ෂාකාරී පියවරක් අනුගමනය කරමින් බොහෝ කඩසාප්පු 29 වන දින වසා දමා තිබුණි. "අද ඉස්කෝලෙ නෑ" දරුවන් සතුටින් කෑගසන්නට විය. "තාත්තා දන්නවද ඇයි කියල? අද ලොකු සටනක් ඇතිවෙනවලු." දරුවන් එය ගැන සැහැල්ලුවෙන් සහ සතුටින් කතා කිරීම ගැන ඔහුට කේන්තියක් මෙන්ම යම් ඉරිසියාවක්ද දැනුණි. ඔහු රැකියාවට යාමට සූදානම් වීම ගැන බිරිඳ කැමැත්තක් නොදැක්වීය.

"ඇයි ඔයා යන්නෙ. කවුරුත් අද වැඩට යන්නෙ නෑ" අසල්වැසියන් ගැන සඳහන් කරමින් බිරිඳ පැවසීය. ඇගේ ප්‍රශ්ණයට ඔහු සිනාසුණි.

"ඔයාට ඕන නම් ගේ ඇතුළට වෙලා ඉන්න. ඔයා භය හින්දනේ එහෙම කරන්නේ"

"කවුරුත් භය නෑ. මාමා ළඟ ඉන්න නිසා අපිට භයක් නෑ" ඇය කිව්වාය.

කන්තෝරුවේ සගයන් වැඩිදෙනෙක් සේවයට පැමිණ නැත. පැමිණිය යුතුම නිසා ලොක්කා ඇවිත් සිටියි. නොපැමිණි සියලුදෙනාම හදිසි පුද්ගලික කාරණාවක් නිසා නිවාඩු ගෙන ඇත. පැමිණි සිටි කිහිපදෙනාද කතා කළේ අද දවසේ සිදුවිය හැකි දෙය ගැනය. ඔවුන් කියවන කටකතා සහ බියකරු තත්ත්වය නිසා ඔහුගේ හිස ගිනි ගත්තාක් මෙන් විය. ඔහු එම කතා ඇසීම පිළිකුල් කළේය. වැඩක් කිරීමට වාඩි වුවත් සිහියට එන්නේ වෙනත් දේය. එය මගහැරීම සඳහා ඔහු පරණ ලිපිලේඛන නැවත නැවත කියවන්නට විය. වෙලාව යනවා ඔහුට නොදැනුනි. ඔහු කන්තෝරුවෙන් එළියට බසින විට රෑ හතහමාරත් පසු විය. පරණ ලිපිගොනුවලට යොමුවීමෙන් ඔහුගේ සිතේ තිබූ තිගැස්සීම සමනය වෙමින් පැවතිය

**49 වන පිටුව බලන්න**

# අතීත ධර්ම දේශනා ක්‍රම

■ **නාලන්දේ විමලවංශ හිමි**

දේශනාවක ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ යහපත් ගුණධර්ම දියුණු කර ගැනීම මගින් ආධ්‍යාත්මික සංවර්ධනය කරා ළඟා වීමයි. ධර්මය නුවණැත්තන් සඳහාම දේශනා කර ඇතත්, දියුණු නොවූ මනසකින් යුතු පුද්ගලයන්ටද එයින් ලෞකික සතුටක් වුවද ලබා ගැනීම උගහට නොවේ. එහෙයින් අතීත මෙරට ජනතාව ධර්ම දේශනා පින්කම් සංවිධානය කිරීම අලංකාරවත්ව, උත්සවාකාරයෙන් සංවිධානය කිරීමට වග බලා ගත්හ. අතීත ලංකාවේ ධර්ම දේශනා ක්‍රම පිළිබඳ සිත් සතන් යොමා බැලූ විට ඒ බැව් මැනවින් පසක් වෙයි.

පැරැණි ලක්දිව ධර්ම දේශනා පැවැත්වීම උත්සවාකාරයෙන් කරන ලද්දේ රටෙහි සාමය සහ සමෘද්ධිය පැවති වකවානුවල බව ඉතිහාසය පිරික්සීමේදී පෙනෙයි. එකල බණ ඇසීමට භික්ෂූන් වහන්සේලා මෙන්ම ගිහි ජනතාවද සිව්දිගින් පැමිණෙති. සවස් භාගයේ රැස්වෙන ජනතාව උදෑසන වන තෙක් ධර්ම ශ්‍රවණය කරති. එහිදී ඒකාකාරී බවෙන් මිදෙනු වස් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. දිවාකථික, පද භාණක, ධම්මකථික යනුවෙන් තුන් නමක් සහභාගී වූහ. ඒ අතරතුර හේවිසි ශබ්ද පූජා, මඟුල් බෙර වාදන, ජාම කාසි එකතු කිරීම වැනි කටයුතු ප්‍රධාන තැනක් ගනියි.

දිවා කථික හිමියන් ජනතාව රැස්වන තුරු පොදු අනුශාසනාවන් පවත්වයි. පදභාණක හිමියෝ මාතෘකා සූත්‍ර කිහිපයක් කටපාඩමින් දේශනා කරති. වඩාත් උගත් ධම්මකථික හිමියෝ එම සූත්‍රවල අර්ථ විග්‍රහ කරමින් ධර්ම දේශනා කරති.

ධර්ම දේශනා සඳහා ජනප්‍රිය සූත්‍ර ගණනාවක් තිබුණි. මහාවංසය වැනි වංස කතාවල සඳහන් පරිදි, දක්ඛිණවිභංග සූත්‍රය, දේවදූත සූත්‍රය, ගිලාන සූත්‍රය, සතිපට්ඨාන සූත්‍රය, අරියවංස සූත්‍රය වැනි සූත්‍ර දේශනා සහ ජාතක කතා දේශනාවන් ප්‍රධාන තැනක් ගන්නා ලදී. මෙම දේශනා උත්සව සඳහා රාජ්‍ය අනුග්‍රහ නොමදව ලැබුණි. වෝහාරතිස්ස රජතුමා අරියවංස දේශනා උත්සවය සඳහා දානය පිරිනැමීම සම්පූර්ණයෙන් භාර ගන්නා ලදී. තෝනිගල සෙල් ලිපියට අනුව 'දේව' නමැත්තෙක් කාලසුමනක නම් බැංකුවෙහි වී, උඳු, මුං වැනි ධාන්‍ය තැන්පත් කොට එහි පොලියෙන් 'යහිසපවිය' විහාරයෙහි අරියවංස සූත්‍ර දේශනාවට ආධාර කරයි. ලබුඇටබැඳිගල සෙල් ලිපියට අනුව පුද්ගලයන් දෙදෙනෙක් කහවණු සියයක්ද විස්සක්ද තැන්පත් කර, එම පොලියෙන් දේවගිරි විහාරයෙහි අරියවංස සූත්‍ර දේශනා පින්කමට ආධාර කරයි.

පසු කාලෙයහි අතීත ධර්ම දේශනා ක්‍රම වෙනස් වී නව මුහුණුවරකින් එළි දකින්නට විය. ඒ අනුව 'ආසන ධර්ම දේශනා, යුගාසන ධර්ම දේශනා, ජාතක ධර්ම දේශනා, සඟි ධර්ම දේශනා, අභිධර්ම දේශනා, රත්නාවලී ධර්ම දේශනා' වැනි ක්‍රම ප්‍රධාන තැනක් ගනියි.මෙම ධර්ම දේශනා ක්‍රමද අභාවයට ගොස්, නාට්‍යානුසාරයෙන් රඟ දක්වන ධර්ම දේශනා ක්‍රම ආරම්භ විය. ඒවා අතරින් 'සච්චක දමනය, ආලවක දමනය, යමරජුගේ නඩු තීන්දුව, සඳකිඳුරු ජාතකය, වෙස්සන්තර ජාතකය' යන මේවා ප්‍රධාන තැනක් ගනියි.

මෙම ධර්ම දේශනා ක්‍රම පිළිබඳ දැනුමක් තිබෙන දේශකයන් වහන්සේලාද සොයා ගැනීම අපහසුය. එහෙත් ඇතැම් පිටිසරබද ප්‍රදේශවල අදද මෙම දේශනා ක්‍රම නොනැසී පැවතීම වාසනාවකි.

හුදෙක් ධර්මාවබෝධය ලබා ගැනීම පමණක් මේවා මඟින් අපේක්ෂා නොකළ අතර, දැයෙහි සමගිය, සමාදානය, සහජීවනය වැනි මානුෂික ගුණදම් පෝෂණය වීමද බලාපොරොත්තු වූ බවත් එම චාරිත්‍ර පිළිබඳ විමසීමේදී පෙනෙයි.

මෙම ධර්ම දේශනා ක්‍රම ජනතාව අතර ජනප්‍රිය වන්නටත්, ජනතාව මේවා නොකඩවා ග්‍රහණය කර ගන්නටත් මේවා ඉදිරිපත් කළ දේශකයන් වහන්සේලා අනුගමනය කළ ක්‍රියාමාර්ගයන් බෙහෙවින් බලපා ඇත. වත්මන් ධර්ම දේශනාවක් පැයකට පමණ සීමා වන බව කව්රුත් දනිති. එහෙත් ඉහත සඳහන් ධර්ම දේශනා රැයක් පුරාවට පැවත්වුණිඩ ගොවිතැන් කර, අස්වනු කපා, අටුකොටු පුරවා ගත් සරු සාර කාලයෙහි ගැමියාගේ සිත්සතන් ප්‍රබෝධයට පත් වෙයි. නිදහසේ මෙවැනි පින්කම්වලට සහභාගී වීමට හැකියාව ලැබුණිඩ එයින් ඔවුහු අසීමිත ආශ්වාදයක් ලැබූහ. ධර්ම දේශනාවක් පැවැත්වීමට පෙර ඒ ගැන ප්‍රදේශය පුරා ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කරයි. ආලවක දමනය, සච්චක දමනය වැනි නාට්‍යානුසාරයෙන් රඟ දක්වන ධර්ම දේශනා ඇසීමටද නැරඹීමටද ජනතාව බෙහෙවින් කැමති විය. එවැනි දේශනාවක් පැවැත්වෙන බව ප්‍රදේශය පුරා කටින් කට පැතිරෙයි. දැන්වීම් පත්‍රිකා මගින්ද ප්‍රචාරය කරයි. මුද්‍රණ කටයුතු පහසුවෙන් කර ගත නොහැකි එදා, අත් අකුරන් ලියන ලද දැන්වීම් මඟින්ද ප්‍රචාරය කරයි.

සම්බුදු පියා දෙසූ බණ ටික අහගන් න
බිහිසුණු අලවි යකු දමනය කරලන් න
දහ අට වන දිනය අමතක නොකරන් න
පිළිහුඩුගොල්ලෙ පන්සල වෙත පැමිණෙන් න

මෙය අදට වසර හැටකට පමණ පෙර ප්‍රචාරය කරන ලද දැන්වීම් පත්‍රිකාවකින් උපුටා ගත් කවියකි. ධර්ම දේශනාවක් පැවැත්වෙන දින ගෘහණියෝ වේලාසනින් ආහාර පිළියෙළ කරති. අඳුර වැටෙත්ම පන්දම්, හුළු එළි දල්වාගෙන කව්රුත් පන්සලට පැමිණෙති. පන්සලට උචිත ඇඳුමින් සැරසීමට කව්රුත් වග බලා ගත්හ. නොගැළපෙන ඇඳුමෙන් පැමිණීම අන්‍යයන්ගේ විවේචනයට ලක්වීමේ හේතුවක් විය. ධර්ම දේශනාව ආරම්භ වීමට පෙර මූලික කටයුතු රැසක් සිදු විය. බුදුන් උදෙසා මල් පහන් ගිලන්පස පිදීම විශේෂ විය. පංච තූර්ය වාදනය මැද්දේ එම කටයුතු සිදු විය. අනතුරුව මල් බඳුන් වෙන්දේසි ආරම්භ වෙයි.මෙවැනි ක්‍රියා මගින් ගැමියෝ අහිංසක විනෝදාස්වාදයක් ලැබූහ. මල් බඳුන් අලෙවියෙන් පසු සල්පිල් භාණ්ඩ අලෙවිය සිදු වෙයි. මේ සියල්ල සිදු කරන්නේ විහාරස්ථානයේ දියුණුව වෙනුවෙනි. මේවා අතරට පන්තේරු නැටුමක් වැනි නැටුමක් ඉදිරිපත් කරන්නේ විවිධත්වය අරමුණු කරගෙනය. ඒ සඳහා සුදුසු ශිල්පීන් ගමෙන්ම සොයා ගත හැකි විය. මෙම මූලික කටයුතුවලින් පසුව දේශකයන් වහන්සේ වැඩමවන්නේ හේවිසි හඬ මධ්‍යයේ අත් පුටුවෙන්ය. අත් පුටුව යනු ශක්තිමත් දායකයන් දෙදෙනකු හෝ සිව් දෙනකු ඔවුනොවුන්ගේ බාහුවලින් අල්ලා ගෙන පුටුවක් මෙන් සකස් කර ගත් එම අත් මත දේශකයන් වහන්සේ වාඩි කරවා ගෙන ඔසවාගෙන ධර්මාසනය මතට වැඩම වීමයි. මෙසේ දේශකයන් වහන්සේ ආසනය මත වැඩ හිඳීමෙන් පසු, මංගල භේරි නාදය පවත්වයි. රැස්ව සිටින සියලු දෙනා එකවර සාධු නාද පවත්වයි. අනතුරුව පන්සිල් සමාදන් වීමට සූදානම් වෙති. නිකම්ම පන්සිල් දෙන්නේ නැත. පන්සිල් ඉල්ලිය යුතුය. පන්සිල් ඉල්ලීමට හැකියාව ඇති හඬ නඟා මිහිරි සරෙන් ගායනා කළ හැකි බොහෝ දෙනකු ගම්මානයේ සිටියද, එක් අයකු දේශකයන් වහන්සේ ඉදිරියෙහි දොහොත් මුදුන් තබාගෙන,

බුද්ධමානි චිත්‍යපාද පුම්බුපේත රෝරුගම්
නිත්‍ය සත්‍ය සාගරන්තු දේව බ්‍රහ්ම වන්දිතම්
කාමනාථ සග්ග පාද නිබ්බුතේන අන්ත්‍යගම්
නිත්‍ය සත්‍ය සාගරේන පංචශීල දේථමං

මෙවැනි ගාථා සහ කවි කියමින් පන්සිල් ආයාචනා කරයි. පන්සිල් ඉල්ලීමෙන් පසු නමස්කාරය කීමට අවසර ඉල්ලන්නේ මෙසේය.

පවර විසිතුරු සත්ජනන්ගෙන් සැදුම් ලත් මෙම මන්දි රේ
එවෙනි සව්සත දහම් අසමින් නිවන් පුරයට සන්තො සේ
දිව පුරට ගොස් ඉසුරු විඳිනට සැම සතුන්ටම සිද්ධ වේ
මෙ අපි සැමටම නමස්කාරය කියන්නට දැන් අවස රේ

මෙලෙස නමස්කාරය කීමට අවසර ඉල්ලා නමස්කාරය කියති. අනතුරුව පන්සිල් දෙති. පන්සිල් සමාදන් වීමෙන් පසුව දහම් දෙසන මෙන් ආරාධනා කරයි. ඒ සඳහා කවි ගාථා රැසක්ම ඇත. මේ එවැනි කවියකි. මෙලෙස ආරාධනා කිරීමෙන් පසු දේශකයන් වහන්සේ "සග්ගේ කාමේච රූපෙ....." ආදී වශයෙන් වර්තමානයේද භාවිත වන ගාථා කිහිපය දේශනා කිරීමෙන් දේවාරාධනය කරති. අනතුරුව පැරණි තාල අනුව නමස්කාර ගාථා කියයි. එනම්,

ගගන තල මැද දිලෙන පුන් සඳ
ලෙසට බැඳි සොඳ උඩු වියන්
අවට වට තරු විලස බබළන
අඳුර දුරු කරලා පහන්
රුවට වගුරැළ පෙළට මලලොඹු
දොරටු වල සැදි පුන් කළස්
එමැද වැඩ උන් බණ අසුන් පිට
යතිඳු පාවැඳලා කියම්

සංපීන ලක්ඛණ විරාජිත රූප සාරං
සාරං විචිත්ත නයධාරිත ධම්ම දේහං
දේහං වරක්ත භවන්තය ඡෙදය්‍ය ලෝකං
ලෝකඤ්ඤදුතං ජිනවරං සිරසා නමාමී

සන්තින්ද්‍රියං චිත පාපමලං විසුද්ධං
සම්බුද්ධ සාසන නහේ විය පුණ්ණ චන්දං
යං අග්ග පුග්ගල පවග්ග මහග්ඝ දානං
ජිනේන්ද්‍ර සංඝ පවරං සිරසා නමාමී

අනතුරුව 'දීර්ඝ චූර්ණිකාව' කියයි. මෙය අනුප්‍රාස සමාසවලින් සපිරි කියමනක් නිසා උවසු උවැසියෝ සැදැහැයෙන් යුතුව අසාගෙන සිටිති. මෙලෙස චූර්ණිකාව දේශනා කිරීමෙන් පසු ත්‍රිවිධ රත්නයේ ගුණ ඇතුළත් 'සංග්‍රහවක්' කියයි. එය දීර්ඝ පාඨයන්ගෙන් සමන්විතය. මෙසේ පූර්ව කටයුතු රැසක් සිදු කිරීමෙන් පසු, මාතෘකා පාඨයක් හෝ සූත්‍රයක් කියයි. ධර්ම අවවාද කරයි. මාතෘකාව ඇසුරෙන් ධර්ම දේශනා කරයි.

'ආලවක දමනය' වැනි නාට්‍යානුසාරයෙන් පැවැත්වෙන ධර්ම දේශනාවලදී, බුදු හිමියන් සහ අලව් යකු අතර ඇතිවන සංවාදය මඟින් දහම් කරුණු ලිහිල්ව ඉදිරිපත් කරයි. අකුරු ශාස්ත්‍රය නොදත් බොහෝ දෙනකුට මෙම දේශනා පහසුවෙන් වටහා ගත හැකිය. දහස් ගණන් සෙනඟ රැස්වී පාන්දර ජාමයේ අලව් යකු පැමිණෙන තුරු බලා සිටිති. ඝෝරබිරං හඬ නංවමින් අලව් යකු පැමිණෙන විට නින්දට වැටී සිටි ළමා ළපටියන් බියට පත් වී හඬ නගති. එය ඉතා උණුසුම් අවස්ථාවකි. කෙසේ වෙතත් දේශනාව නිමාවත් සමඟ අලව් යකු දමනයට පත් වෙයි. සුරතල් බිලිඳු අලව් කුමරු අලව් යක්ෂයාට බිලි පිණිස පිළිගැන්වීමත්, යකු විසින් කුමරු බුදු හිමියන්ට පූජා කිරීමත් දකින සංවේදී කාන්තාවන්ගේ දෑසින් කඳුළු කඩා වැටීම අනුවේදනීය දර්ශනයකි.

සියල්ල අවසන් වීමෙන් පසු, 'මෛත්‍රී වර්ණනාවෙන්' ධර්ම දේශනාව නිමාවට පත් වෙයි. මෛත්‍රී වර්ණනාව මගින් පැවසෙන්නේ මෛත්‍රී බුදුන් දකින සහ නොදකින අය පිළිබඳවයි. පුණ්‍යානුමෝදනාව කිරීමෙන් පසු, හේවිසි මධ්‍යයේ දේශකයන් වහන්සේ පෙර පරිදිම අත් පුටුවෙහි තබාගෙන පන්සල තුළට වැඩමවනු ලබති. මේ පුරාණ ධර්ම දේශනා ක්‍රම සකස් වී තිබූ ක්‍රමයන්ය. මෙවැනි සද්කාර්යයන්ගෙන් එදා ජනතාව මෙන්ම මහා සංඝරත්නයද බලාපොරොත්තු වුණේ දැයේ සමගිය, සමාදානය, සෞභාග්‍යය වැනි කරුණු මිස යම් යම් ලාභ ප්‍රයෝජන අත්කර ගැනීම නොවන බව පැහැදිලිය.

## රේඛාව...

41 වන පිටුවෙන්

අංගයක්ම වෙනත් සාමාන්‍ය සිංහල චිත්‍රපටවලින් විශේෂ කොට දක්වන උසස් නිමාවක් ඇත්තේ එහෙයිනි.

ලෙස්ටර්ගේ අනෙක් දක්ෂකම ශිල්පය හුදෙක් ශිල්ප හරඹ සඳහාම භාවිත නොකිරීමය. ඔහු කැමරාවෙන් විජ්ජා පෙන්නන්න නොයයි. සමීප රූපයක් පවා ඔහු යොදන්නේ අත්‍යාවශ්‍ය අවස්ථාවකදී පමණි. ඒත් ඔහුගේ චිත්‍රපටවල ශරීරයේ අංගවල හෝ රූප කොටස්වල හෝ සමීප රූප යොදන ගතිය නැත්තටම නැති තරම්ය.

සංස්කරණයේදී පවා ඔහු ක්ෂණික කැපිලි (ගොළු හදවතේ අත්‍යවශ්‍ය කානිවල් ජවනිකා හැරෙන්න) යොදන්නේ නැත.

ඔහුට බොහෝ දුරට වරදින්නේ සින්දු යෙදීමෙහිය. ලෙස්ටර්ගේ චිත්‍රපටයක උචිත ලෙස සින්දු යෙදුණු තැන් ඇත්තේ රන්සළුවේ ගී ඛණ්ඩ පමණකි. රේඛාවේ සිට එන මේ දුබලකමට එක අතකින් වරදකරු මහජනතාවය. අනෙක් අතට ලෙස්ටර්ය. ලංකාවට සින්දු ඇතිවත් පිටරටවල සින්දු නැතිවත් පෙන්වීමට බලාපොරොත්තුව චිත්‍රපට නිපද වූ ලෙස්ටර් ඒවා ලෙහෙසියෙන් කපා දැමිය හැකි ලෙස යොදන්න පුරුදු වූයේය.

අධ්‍යක්ෂ විනය හා සංයමය අතින් ලෙස්ටර් ජේම්ස් පීරිස්ට කිට්ටු විය හැකි කෙනෙක් තවම අපේ සිනමාවේ නැත. ඔහුගේ සිනමාත්මක විනය පමණක් නොව ලෙස්ටර් චිත්‍රපටයක කිසිමදාක ඇතුළත් නොවන ග්‍රාම්‍ය හා අවිනීත ගතිය මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

**උපුටනය: සුනිල් මිහිඳුකුල සංස්කරණය කළ ජයවිලාල් විලේගොඩගේ 'නොපළ ලිපි' ග්‍රන්ථයෙනි.**

# දස්කොන් - ප්‍රමිලා ප්‍රේමයේ සැබෑ කතාව

■ මැදගම ධම්මානන්ද හිමි

ප්‍රේමය නිසා විපතට පත්වූවන් පිළිබඳ බොහෝ කතන්දර ජන සමාජයේ පවතියි. දිවි පරදුවට තබා ප්‍රේම රංගනයක යෙදුන දීඝගාමිණී-උන්මාද චිත්‍රා පුවත සහ ආදරය නිසා රජකම අහිමි කරගත් සාලිය-අසෝකමාලා පුවත ලංකා ඉතිහාසයේ මුල් යුගයට අයත් ඉතා ප්‍රකට සිදුවීම් දෙකකි. අසම්මත ප්‍රේමය නිසා අමාරුවේ වැටුණ ප්‍රේමවන්තයකු පිළිබඳ කතන්දරයක් ලංකා ඉතිහාසයේ අවසාන යුගයෙන්ද අසන්නට ලැබේ. එනම්, දස්කොන්-ප්‍රමිලා දෙදෙනාගේ ආදර අන්දරයයි.

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ හිතවතකු වූ දස්කොන් අදිකාරම රජ බිසවක වූ ප්‍රමිලා දේවිය සමඟ පෙම් සබඳකමක් ඇති කර ගත්තේය. එය හෙළිදරව් වීම නිසා කෝපයට පත් රජු දස්කොන්ගේ හිස ගසා මරා දමන්නට නියම කළේය. ඇතැම් වාර්තාවල සඳහන් වන අන්දමට නම් දස්කොන් මරණයට පත් කළේ උල හිඳුවීමෙනි. කෙසේ වුවද, දස්කොන්-ප්‍රේමිලා සම්බන්ධ රසවත් කවි කීපයක් අපේ සමාජයේ අදත් ප්‍රචලිතව පවතියි. ඒ අතර දස්කොන් විසින් ප්‍රමිලාවට ලියූ කවියක් මෙසේය.

රන්මාලය පැළඳගෙන ගත සුවිපුල්ලා  
ඉන් ආලය වඩයි මගෙ සිත නුඹ පල්ලා  
පන්දහසකට මැද තිබුණත් උඩ එල්ලා  
රන් භාජනය නොවිඳිද විදිනා ගුල්ලා

ප්‍රමිලාද කවිකාරියකි. ඇය දස්කොන්ගේ ඉහත කවියට පිළිතුරු දෙන්නේ මෙසේය.

යන්නෝ මෙමග රෑ දහවල තොර වෙත්ද  
බොන්නෝ මෙ ගඟ දිය බොර කරලා බොද්ද  
දන්නෝ පහස ගෙට අඬගහලා දෙත්ද  
දන්නෝ උපා මිණි බැඳි දොර නාරිත්ද

මෙයින් පෙනෙන්නේ මේ දෙදෙනා අතර ශෘංගාරාත්මක වූ දැඩි ආදර බැඳීමක් තිබුණ බවයි. එය රජවාසල බොහෝ දෙනකුට රහසක් නොවීය. ඒ නිසා උදාවන භයානක තත්ත්වය ගැන හිතවත්තු ඔවුන්ට කල් තියාම අනතුරු හැඟවීම්ද කළහ. මේ එවැනි කවියකි.

අකුරු කළේ කුමටද පොරණ ගුරුවරු  
හකුරු කැළේ දමත්ද දියව යනතුරු  
කපුරුමලේ සුවඳට වැනසෙති බමරූ  
නපුරු මලේ දැන දැන නොකරන් වියරූ

ජනප්‍රවාදයේ සඳහන් අන්දමට දස්කොන් අදිකාරම සහ ප්‍රමිලා දේවිය අතර පැවැති අසම්මත ප්‍රේමය නරේන්ද්‍රසිංහ රජුට දැනගන්නට ලැබුණේ විශේෂ සිද්ධියකිනි. ප්‍රමිලා බිසව වෙනුවෙන් පැවැත්වූ බලි තොවිල් යාගයකට ඇයගේ රූපය අඹන්නට වුවමනා විය. බලි ඇදුරෝ දේවියගේ සිරුරේ රහස්තැනක තිබූ ලපයක් එම රූපයේ නිවැරැදිව සළකුණු කළහ. එම ලපය තබන්නට කීවේ කවුරුන්දැයි විපරම් කළ රජුට දැනගන්නට ලැබුණේ දස්කොන් අදිකාරම්ගේ නියමයෙන් එය සිදු කෙරුණ බවයි. ඔහු දඬුවමට ලක්වන්නේ එයින් පසුවයි. අදත් ඇතැම් විට ගී පද වැල් සඳහා යොදා ගන්නා පහත සඳහන් කවිය ප්‍රමිලා බිසවගේ මුවින් පිටවන්නේ ඒ අවස්ථාවේදීය.

සක්මන් කරන මළුවේදී බැඳි හාද  
සිත් සන්තොසින් දුන් මුව මී බීවාද  
ඉක්මන් ගමන් අහො අද ඔබ යනවාද  
දස්කොන් මගෙ නමට ජීවිතෙ දෙනවාද

දස්කොන්ද ඇයට කවියෙන් පිළිතුරු දෙයි.

විසැස් කමලාව රස පහස නොවිඳ මා  
දසිස් දුනි පොරණ ඇසු දුටු පමණ මා  
වෙසෙස් ඔබගෙ අමයුරු පහස ලත් මෙමා  
මහිස් එකක් දුනි නම් ඔබ නමට කිමා

පුරාණයෙහි රාම කුමරුගෙන් සීතාව පැහැර ගත් රාවණ රජු ඇයගේ රස පහස නොලැබුවේය. ඔහුට ඉඩ ලැබුණේ ඇයගේ රූපය දෙස බැලීමට පමණි. නමුත් ඒ හේතුවෙන් ඔහු තම හිස් දහසම අහිමි කරගත්තේය. එසේ වුවද මම ඔබගේ රස පහස වින්දෙමි. එම නිසා ඔබ වෙනුවෙන් එක හිසක් දෙන්නට සිදුවූවාට කම් නැතැයි දස්කොන් ප්‍රේමිලාට පවසන්නේ සිතෙහි වේදනාව තුනීකර ගනිමිනි.

දස්කොන් යන නම ලංකා ඉතිහාසයේ පුද්ගලයන් දෙදෙනකු වෙනුවෙන් භාවිත කෙරේ. එනම්, පියා සහ පුතා හැඳින්වීමටය. දස්කොන් (පියා) ගැන මුලින්ම තොරතුරු ලැබෙන්නේ රොබට් නොක්ස්ගේ වාර්තාවලිනි. දෙවන රාජසිංහ රජු දවස ප්‍රංශ තානාපති ලෙස කටයුතු කළ ලැනරෝල්ගේ අශ්වයා බලාගත් තැනැත්තා පේද්‍රෝ දස්කොන්ය. විලියම් හබර්ඩ් ලියූ prisoner of Knox in Kandy 1660-1703 නමැති ලිපියෙන් එය අනාවරණය වෙයි. ඔහු පෘතුගීසි කුල කාන්තාවක විවාහ කරගෙන මහනුවර පදිංචි වී සිටි බව කියැවෙයි.

ප්‍රමිලා සමග පෙම් බැඳි දස්කොන්ගේ උපත සිදු වූ වර්ෂය පැහැදිලි නැත. එහෙත් ඔහුගේ උපත සහ නාමය ලැබුණ අන්දම පිළිබඳ පුවතක් ජනප්‍රවාදයේ තිබේ. දෙවන රාජසිංහ රජු සමග කරන ලද සටනේදී මැරුම් කෑ ප්‍රතිකාල් සෙබළකුගේ කුඩා දරුවකු කෝන් ගසක් මුල දමා සිටියදී හමුවූ බවත් ඒ අනුව දරුවාට ගස්කොන් නම ලැබුණ අතර පසුව දස්කොන් වී ඔහු රජමැදුරේ වැඩුණු බවක් කියැවෙයි. සර්. ඩී. බී. ජයතිලක මහතාගේ සිංහල සාහිත්‍ය ලිපි ග්‍රන්ථයේ එම ජනප්‍රවාදය සඳහන් කර ඇත. ඒ පුවතේ ඇත්ත නැත්ත කුමක් වුවත්, දස්කොන් උපන්නේ දෙවන රාජසිංහ රජුගේ රජ සමයේ බව පැහැදිලිය.

දස්කොන් පිළිබඳ තවත් තොරතුරු රැසක් පූජ්‍ය කොටගම වාචිස්සර හිමියන් ලියූ සරණංකර සඟරාජ සමය කෘතියෙහි සඳහන් වෙයි. දස්කොන් තම මෑණියන් සහ සොහොයුරිය සමඟ ජීවත් වූයේ හඟුරන්කෙත රාජ මාළිගය අසල නිවසකය. සමකාලීන ඉතිහාසයේ ප්‍රබල චරිතයක් වන ගොන්සාල්වේස් පියතුමා ඔරිටොරියානු මීසමට යැවූ ලිපියකින්ද ඒ බව තහවුරු වෙයි. එය උඩරට විත්ති පොතේ ඇතුළත් කර තිබේ.

"හඟුරන්කෙත මා පදිංචිව සිටියේ ඉග්නේෂියෝ පියතුමාගේ නිවසේය. නමුත් හුදෙකලාවය. ආවතේවයට කවුරුවත් නොසිටියේය. මේ අවස්ථාවේ ගස්කොන් අදිකාරම්ගේ මෑණියෝ මාවෙත පැමිණියාය. ඕ තොමෝ මා කැඳවාගෙන ගොස් ඇගේ දියණියගේ නිවසේ කාමරයක් පිළියෙළ කොට මට එහි නවතින්නට සැලැස්සුවාය"

දස්කොන් සිප්සතර හදාලේ වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ගුරුවරයා වූ කිත්සිරිමෙවන් රාජසුන්දර සාමණේරයන් හෙවත් සූරියගොඩ සාමිගෙනි. 1687 වසරේදී ඉන්දියාවේ සිට පැමිණ ලක්දිව ආගමික පරිසරයට විශේෂ බලපෑමක් ඇති කළ ජුසේවාස් පියතුමා ඇසුරට වැටීමෙන් පෘතුගීසි භාෂාව පිළිබඳව පුළුල් දැනුමක් ලබා ගන්නට දස්කොන් සමත් විය. 1713 වසරේ ඕලන්ද සමාගමක නියෝජිතයකු ලෙස පැමිණි කපිතාන් විල්ලෙම් හෙන්ඩ්‍රික්ද බෙවර් සමග දස්කොන් පෘතුගීසි භාෂාවෙන් චතුර ලෙස කතා කළේය. නමුත් තමන්ගේ පියාගේ භාෂාව වූ ප්‍රංශයෙන් කතා කරන විට දස්කොන් අදහස් හුවමාරු කළේ හස්ත මුද්‍රාවෙන් යැයි ලන්දේසි ආණ්ඩුකාර යාන් ෂොයිඩර් වාර්තා කරයි. ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාට සිංහල ඉගැන්වීම පමණක් නොව ඔහුගේ පොත්වල අඩුපාඩු බැලීම සිදු කළේත් දස්කොන්ය.

දස්කොන් තුළ පැවැති ශෘංගාරාත්මක කවි කීමේ හැකියාව රජ වාසල වැසියන්ගේ සිත් ගත්තේය. එපමණක් නොව ඔහුගේ කඩවසම් බවට බිසෝවරුන්ගේ මන ඇදුණේය. ප්‍රමිලා බිසව ඒ අතර ප්‍රධාන කෙනෙකි. ප්‍රමිලා යනු කවුදැයි පැහැදිලි කරගත යුතුව තිබේ. දස්කොන් චරිතය ඉස්මතු වන්නේ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමයේදීය. 1707 ජුනි මාසයේ ඒ රජු බලයට පත්වූයේ නව යොවුන් වියේදීය. එවිට ඔහුගේ වයස අවුරුදු 17 කි. ඔහු රජකමට පවා නොගැලපෙන අශීලාචාර ගති පැවතුම් ඇති කුරිරු කෙනකු බව ප්‍රන්සුවා වැලන්ටයින් වාර්තා කර ඇති අතර University of Ceylon Review ග්‍රන්ථයේ එය තහවුරු කර දක්වයි. කෙළිදෙළෙන් කල් ගෙවන්නට හුරු වූ නරේන්ද්‍රසිංහ රජු මත්ලෝලියකු බවට පත්විය. ඔහු මහජනයා අතර ප්‍රචලිත වූයේ සෙල්ලම් නිරිඳු නමිනි. එය එක්තරා අන්දමක උපහාසයකි. රජු උඩරට රදලයන් සමඟ සබඳකම් පැවැත්වීමට අකැමැති වූ බවක් පෙනේ. ඔහුගේ ජීවන රටාව නරක් වුණේ විදේශිකයන් ඇසුරට පත්වීම හේතුවෙනි. මෙරට ජාතික හා ආගමික පරිසරය වෙනස්වීම කෙරෙහිද එය බලපෑවේය. ඒ සඳහා කුමන්ත්‍රණද දියත් විය. නරේන්ද්‍රසිංහ රජුට ඉන්දියාවෙන් බිසොවක් ගෙනෙන්නට මැදිහත් වූයේද රජවාසල ඇසුරේ සිටි විදේශිකයන්ය. උල් සිටවූ වළක දමා රජු මැරවීමට පවා සිංහලයන් පෙළඹුණේ ඔහු විදේශිකයන්ට අවනත වීම ගැන ඇතිවුණ නොසතුට හේතුවෙනි.

නරේන්ද්‍රසිංහ රජුට බිසෝවරුන් සොයා ගිය ගමනේ අප්‍රකට තොරතුරු රැසක් විලියම් ටේලර් පියතුමා විසින් පරිවර්තනය කරන ලද අත්ලිපියකින් එළිදරව් වෙයි. කන්දඋඩරට රජුට බිසොවක් ගෙන ඒම පිළිබඳ සාකච්ඡා කිරීමට මදුරාවේ හෝ තිරුචිරා පල්ලියේ රජ පවුල හමුවට දූත පිරිසක් යැවීම ගැන එහි සඳහන් වෙයි. "නුඹලා අපේ කුලයේ අයද? මෙතෙක් කාලයකට නුඹලා සහ අප අතර ආවාහ විවාහ කටයුතු සිදු වී තිබේද? නුඹලා භය නැතිව මෙවැනි දෙයක් අසන්නට ආවාද?" යනුවෙන් කෝපයෙන් පැවසූ රජු දූතයන් නෙරපා ඇත. එහෙත් දිළිඳු හින්දු පුද්ගලයෙක් එයින් කම්පාවට පත්ව තම දියණිය කන්ද උඩරට රජුට පාවා දෙන්නට කැමැති විය. ඒ බිසව සමඟ පවුලේ ඥාතීහුද ලක්දිවට පැමිණියහ. මෙය සත්‍ය කතාවක්දැයි කිව නොහැක. පසු කාලයේ දකුණු ඉන්දියාවේ රජ පවුල් සමඟ අපේ රජවරුන් සබඳකම් පවත්වා ඇත. කෙසේ වුවද මදුරාවෙන් පැමිණි කුමරියක් බිසවක ලෙස 1708 වසරේදී සරණ පාවා ගත් බව සත්‍යයකි. නැවත 1710 ඕලන්දකාරයන් විසින්ද දකුණු ඉන්දීය කුමරියක් පවුල පිටින්ම ගෙනෙන ලදුව බිසෝ තනතුරට පත්කර තිබේ. රජු ඇය වෙනුවෙන් ලන්දේසීන්ට ලාභ ප්‍රයෝජන රාශියක් ලබා දී ඇත. එයින් පෙනෙන්නේ රජු මතට හුරුකරවීම මෙන්ම ඔහුට කාන්තාවන් සැපයීමත් තම අරමුණු ඉටුකර ගැනීම සඳහා විදේශිකයන්ගේ උපක්‍රමයක් බවයි. ඉන්දියාවෙන් ගෙනා එක් බිසවකටවත් දරු සම්පත් නොලැබුණි.

මොණරවිල පරපුරට අයත් කුල කතක්ද රජ මෙහෙසියක ලෙස සිටි බව වාර්තා වන අතර ඉන්දියාවෙන් මෙහෙසියන් ගෙන ඒමෙන් පසු ඇය රන්දෝලාව වෙනුවට යකඩ දෝලාවෙන් ගමන් යන පහළ මට්ටමකට පත්කර ඇත. රජුට දාව සාමාන්‍ය කුලයක කාන්තාවකගෙන් උපන් කුමරකු සිටි බවද වාර්තා වෙයි. උනම්බුවේ බණ්ඩාර යනු එම කුමරායි. කුල ප්‍රශ්නය නිසා ඔහුට රාජ්‍යය අහිමි විය. මාරවිල දිසාවගේ දියණියකද රජ බිසවක ලෙස සිටි අතර ඇයගේ පුත් කුමරුට පිළිමතලාවේ දිසාව නමින් තනතුරක් ලැබුණු බව කවි කීපයක දැක්වෙයි.

මදුරාපුරයෙන් පැමිණි පිරිස් ඉන්දියාවේ කුමන තත්ත්වයක පසුවූවද ශ්‍රී ලංකාවට පැමිණි පසු සූර්ය වංශිකයන් ලෙස පෙනී සිටියහ. එහෙත් එය බොරු කතාවක් යැයි ඉතිහාසඥ ලෝනා ශ්‍රී දේවරාජා මහත්මිය උඩරට රාජධානිය ග්‍රන්ථයේ සඳහන් කරයි. මදුරාවෙන් පැමිණි පවුල් උඩරට රදල පවුල්වලින් වෙන්ව සිටින්නටත් නිරතුරුව වෑයම් කළහ. ඔවුන් වෙනුවෙන් සෙංකඩගල පුරයේ වීදි පවා වෙන් වුණි. කුමරුප්පු වීදිය හෙවත් පසුකලෙක මලබාර් වීදියට සිංහලයකුට තබා භික්ෂුවකටවත් ඇතුළු වීමට අවසර නොතිබුණි. රජුගේ මේ බිසෝවරුන් අතුරෙන් දස්කොන්ට පෙම් බැන්දේ කවුදැයි නිවැරැදිව දැනගන්නට නොහැක. මදුරාපුරයෙන් කැඳවාගෙන ආ බිසෝවරු තම ආගමික හා සංස්කෘතික සිරිත් විරිත් අනුව කටයුතු කරමින් තම පවුල් අතරම කාලය ගත කළහ. ඔවුන් සිංහල භාෂාව ඉගෙනීමට හෝ බුදුදහම වැළඳ ගැනීමට හෝ පෙළඹුණ බවක්ද නොපෙනේ. එවන් බිසවක දස්කොන්ට පෙම්බැඳ ඉතා දක්ෂ අයුරින් ශෘංගාරාත්මක කවි කියන්නට සමත් වූයේ කෙසේද? යන්න විමසිය යුත්තකි. ඒ පිළිබඳ නිගමන දෙකකට බසින්නට අපට සිදුවෙයි.

දස්කොන් සමඟ පෙම් සබඳකම් ඇතිකරගෙන පෙම් කවි කීවේ රජුගේ සිංහල බිසවකි. ප්‍රමිලා යනු ඉන්දීය බිසවකි. එහෙත් පෙම් කවි කිසිවක් ඇයගේ නිර්මාණ නොවේ. සමකාලීනව හෝ පසුකාලීනව වෙනත් කිසිවකු විසින් ලියන ලද ඒවාය. එම කවිවල භාෂා ලක්ෂණ විමසන විට එය තහවුරු වෙයි. දස්කොන්ට මරණ දඬුවමක් ලබන්නට හේතුවුණේ ප්‍රමිලා සමඟ පෙම් බැඳීමද යන්න මෙහිදී විමසිය යුතු තවත් විශේෂ කාරණයකි. දස්කොන් රාජ සභාවේ උසස්ම තනතුර වන අදිකාරම් ධුරයට පත්කෙරිණි. උඩරට රදල පිරිසට එය ඉවසා දරාගත නොහැකි කරුණක් වන්නට ඇත. මේ අතර රාජ සභාවේ බලය තහවුරු කරගෙන සිටි ආගමික පූජකවරුන් ජාතික හා ආගමික පදනම බිඳ දැමීමට දැඩි ලෙස වෙහෙසුන බවක්ද සමකාලීන වාර්තාවලින් හෙළිවෙයි. සිංහල රාජ වංශය පවා වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් නිමාවෙයි. ජුසේ වාස් පියතුමා සහ ජාකොමේ ගොන්සාවේල්ස් පියතුමා රජුට සමීපව සිටි පිරිස අතර ප්‍රධාන වෙති. ඉතිහාසගත තොරතුරු ඇසුරෙන් එතුමන්ගේ ක්‍රියාකාරකම් අධ්‍යයනය කළ යුතුය. රජු මිය යන මොහොතේ පල්ලියෙන් ශුද්ධ ජලය ගෙන්වාගෙන පානය කරන්නට තරම් රජුගේ මනස වෙනස්ව තිබුණි.

බුදුදහමට එරෙහිව බුද්ධ බණ ප්‍රත්‍යක්ෂය වැනි පොත් ලියූ ජාකොමේ ගොන්සාවේල්ස් පියතුමාගේ පොත්වල හරි වැරදි බැලුවේ දස්කොන්ය. සරණංකර සඟරජ හිමියන්ට වස දීමට කාපිරියන් යෙදවීම, නායක භික්ෂූන් සිවුරු අරවා බෞතිස්ම කිරීම, සූරියගොඩ සාමණේරයන් ඝාතනයට ලක්වීම ආදිය සමකාලීන ආගමික හා සංස්කෘතික

48 වන පිටුව බලන්න

Saliroo Creations

All Your Publishing Needs under one roof

Graphics
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ
පරිගණක අලුත්වැඩියාවන් සඳහා
Tel : 416 201 0628

French Tutoring

Individual and small group classes for French learners
'French reading, writing, and conversing'
Any grade from grade 1-12,
university minors and French Immersion

Kumudu Abeywardena,
Masters (French Literature), BA (Modern Languages), Dip (AFC)

T.P - 647 824 1897

MARRIAGE PROPOSALS

Respectable Govi Buddhist parents from Colombo, wish to find a suitable daughter to their 32yr old son with fine personality. He is a non-smoker, teetotaler, brought up with Buddhist values and educated at leading schools in Colombo. He is the youngest of the family and runs the family business. His elder brother, ICT Engineer is married.

**Please email relevant details and a copy of the daughter's horoscope (which will be treated as confidential) to avindrad@gmail.com or contact +9477 147 9881 (mother).**

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි**

# ලෝකය හෙප්පුව වගේ

මෙය 1930 දශකයේ සිදුවූ රසවත් සිද්ධියකි. දුෂ්කර ගම්බද ප්‍රදේශයක පිහිටි කනිෂ්ඨ පාඨශාලාවකි. සිසුන් 250 ක් පමණ මෙහි ඉගෙනීම ලැබූවත් ගුරු සංඛ්‍යාව මුල්ගුරුතුමත් සමඟ හත් දෙනෙක් වූහ.

මුල්ගුරුතුමාට දිනක් ලෝක ගෝලය ගැන පාඩමක් උගැන්වීමට තිබුණි. එතුමාට ගෝලයට සමාන නොහොත් ගෝලාකාර කිසිවක් සොයා ගැනීමට නොහැකි වූයේ දුෂ්කර ගම්බද පාසලක් වූ එහි සම්පත් අඩුවීම නිසයි. එසේ වුවත් මෙහි ගුරුමණ්ඩලය ආදර්ශ භාවිතයෙන් තොරව හෝ උගැන්විය යුතු පාඩම් සියල්ලක් කිසි අඩුවක් නොමැතිව කියා දුන්හ.

මුල්ගුරුතුමා තුන්වැනි පන්තියට ලෝක ගෝලය සම්බන්ධ පාඩමද ආදර්ශයක් නොමැතිව උගැන්වූ අතර එහි ගෝලාකාර බව සිසුන්ට පෙන්වන්නේ කෙසේදැයි සිත සිතාම පාඩම කරගෙන ගියේය. අඩු ගණනේ රබර් බෝලයක්වත් වෙනත් ගෝලාකාර දෙයක්වත් සොයා ගන්නට නොහැකි විය. මේ මුල්ගුරුතුමා දුම්කුඩු පයිප්ප ඉරීමට පුරුදුව සිටියේය. මේ නිසා ඔහුගේ කෝට් සාක්කුවේ නිතරම දුම් උරන පයිප්පයත් දුම්කුඩු හෙප්පුවත් තිබුණේය. ඔහුට හොඳ නුවණක් පහළ විය. පාඩම අවසානයේ ඔහු දුම්කුඩු හෙප්පුව අතට ගෙන එහි රවුම් පැත්ත හෙවත් සිලින්ඩරාකාර පැත්ත පෙන්වා ලෝකය මේ වාගේ රවුම්ය. හොඳට මතක තියාගන්ට යැයි කියා දුන්නේය.

ඒ කාලයේ පාසල් අවසාන වාර විභාගය නොවරදවාම පැවැත්වූයේ පාඨශාලා පරීක්ෂකවරයා විසිනි. ඔහු පාසලට එන දවස එහි උත්සව ශ්‍රීයක් ගනී. පරීක්ෂකවරයා පාසලට ඇතුළු වන විට ගුරු මණ්ඩලයත් ශිෂ්‍ය ශිෂ්‍යාවනුත් නැඟිට "ආයුබෝවන්" කියා ශුභ පැතීම එකල පාසල්වල චාරිත්‍රයක් විය.

මෙවරද සිරිත්පරිදි පරීක්ෂකවරයා පාඨශාලාවට පැමිණියේය. ඔහු පන්ති කීපයක් විභාග කර තුන්වැනි පන්තියටද ගියේය. භූගෝල පාඩමද විභාග කිරීමට සූදානම් වූයේය. ඔහු ලෝකය ගැන ප්‍රශ්න කීපයක් අසා "ලෝක ගෝලය කොයි වගේද" කියා ඇසුවේය. මුල්ගුරුතුමාද මේ වේලාවේදී පාඨශාලා පරීක්ෂකවරයා වාඩි වී සිටි පුටුවට පිටුපසින් සිටගෙන සිටියේය. ළමෝ ඒ මේ අත බලන්නට වූහ. පරීක්ෂකවරයා නැවතත් එම ප්‍රශ්නයම නැඟුවේය. ළමයි මුල්ගුරුතුමාගේ මුහුණ දෙස බැලූහ. මුල්ගුරුතුමා තමාගේ කෝට් සාක්කුවේ තිබුණු දුම්කුඩු හෙප්පුව වහා අතට ගෙන පරීක්ෂකවරයාට නොපෙනෙන පරිදි ඔහුගේ හිසට උඩින් ළමයින්ට එය පෙන්වූවේය.

ළමයි එකවරම "ලෝක ගෝලය ලොකු මහත්තයාගේ දුම්කුඩු හෙප්පුව වගේ" යැයි මහ හඬින් ශබ්ද නඟා කීහ. මෙය ඇසූ පරීක්ෂකවරයා "ලෝක ගෝලය ලොකු මහත්තයාගේ දුම්කුඩු හෙප්පුව වගේද?" කියා මහත් පුදුමයට පත් වූ අතර ඔහුට පමණක් නොව අවට සිටි ගුරු පිරිසටද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද සිනාව වාවාගත නොහැකිව සෑහෙන වේලාවක් සිටිවනම සිටියෝය.

**විශ්‍රාමික විදුහල්පති**
**විජයරත්න බන්ඩාර යටවත්ත**

# ගුරුතුමියගේ විද්‍යා පාඩම

ගාලු දිස්ත්‍රික්කයේ පිහිටි මහවිල ගුණානන්ද විදුහල ළමයින් දාහක් පමණද, ගුරු භවතුන් තිහකට ආසන්න පිරිසක්ද සිටි ප්‍රදේශයේ විශාලතම පාසලකි. සෑම විෂයයකටම එක් ගුරු භවතකු බැගින් සිටි මෙම පාසලේ ළමුන් මහත් සේ කැමැත්තක් දැක්වූයේ විද්‍යා විෂයයටය.

ළමයින් විස්සක් පමණ සිටි නවවැනි පන්තියට සතියට විද්‍යා පාඩම් තුනක් ඇතුළත් කර තිබූ බැවින් ළමෝ කවුරුත් එම විෂයට මහත් සේ ඇලුම් කළහ. මෙම නවවැනි පන්තියේ සිටි ජයසේන ශිෂ්‍යයා පන්තියේ කිසිම පාඩමකට හරි හැටි ඇහුම්කන් නොදෙන නිතරම දඟවැඩ කරන සිසුවෙකි. මේ නිසා ඔහු මුල් ගුරුතුමාගෙන් දඬුවම් විඳි වාර ගණන බොහෝ වුවත් ඒ කිසි දෙයක් ඔහු ගණනකටවත් ගත්තේ නැත. පාසලේ විද්‍යා විෂයය උගන්වන ගුණවතී ගුරුතුමිය ඉතා සැර පරුෂ අකාරුණික තැනැත්තියක් වූවාය.

පන්තිවල වැඩ නොකරනා ළමයින්ට නිතරම වේවැල් පහර දීම හෝ පාසල් වේලාවෙන් පසු පාසලේ රඳවා තබා ගැනීමද ඇගේ දෛනික පුරුද්දක් විය. මැයගේ විද්‍යා විෂයයේ පරීක්ෂණ කටයුතු සඳහා ගෙම්බන්, කැරපොත්තන්, හූනන් වැනි සතුන් රැගෙන එන ලෙසද ඈ නිතරම සිසුනට අණ කළාය. මේ නිසා ඇතැම් සිසුහු සතුන් පණ පිටින්ද රැගෙන එති.

දිනක් ජයසේන ශිෂ්‍යයාගෙන් තමා ගෙන එන සතුන් මොනවාදැයි ප්‍රශ්න කළ ගුරුතුමියට දැන ගන්නට ලැබුණේ "සතුන් ඇල්ලීම පාපයක් නිසා තමා එම කාර්යය නොකරන බවය" මින් තදබල ලෙස කෝප වූ ගුණවතී ගුරුතුමිය ජයසේනට වේවැල් පහර කිහිපයක් ගසා ඊළඟ දිනයේදී කුමන සතකු හෝ රැගෙන එන ලෙසට තරයේ අණ කළාය.

'හොඳ වැඩක් කරන්නෙමැයි' සිතූ ජයසේන ගෙදර ගොස් අහුමුලු අවුස්සා කෙසේ හෝ කැරපොත්තන් විශාල ප්‍රමාණයක් අල්ලා ටින් එකකට දමා වසන ලද පියනේ හිල් කිහිපයක් සාදා පසුදින පාසලට රැගෙන ගියේය. විද්‍යා විෂයය උගන්වන කාල පරිච්ඡේදයේදී අනෙක් ළමයින් සමග විද්‍යාගාරයට ගිය ජයසේන පසෙකට වී වාඩි වී සිටියේය.

විද්‍යා විෂයය ඉගැන්වීමට ප්‍රථම ඒ ඒ ළමයින් රැගෙන ආ සතුන් සහිත බඳුන් තමාගේ මේසය මත තබන ලෙසට ගුණවතී ගුරුතුමිය සියල්ලන්ටම අණ කළාය.

ගුරුතුමියගේ අණට කීකරු වූ ළමෝ තම තමන් ගෙන ආ සතුන් සහිත බඳුන් ගුරු මේසය මත පිළිවෙළින් තැබූහ. මේ අතර ගුරුතුමියට එකවරම ජයසේන මතක් විය. " ජයසේන මොනවාදැයි ගෙනාවේ" අසත්ම සිරිසේනද තමා ගෙන ආ ටින් එක ගුරු මේසය මත තැබුවේය.

"ජයසේන නම් එකත් එකටම හිස් ටින් එකක් තමයි ගෙනත් ඇත්තෙ" යැයි කී ගුරුතුමිය ටින් එකේ පියන ඇරියාය. එක්වරම පනහක් හැටක් පමණ වූ කැරපොත්තෝ එළියට පැන ගුරුතුමියගේ ඇඟ පුරා දුවන්නට වූහ. මින් මහත් සේ කලබලයට පත් ගුණවතී ගුරුතුමිය සාරිය අස්සේ හා හැට්ටය අස්සේ රිංගාගත් කැරපොත්තන්ට බයේ මරහඬ දීගෙන විද්‍යාගාරයෙන් එළියට පැන අසල වූ මුල්ගුරු නිවසට දිව ගියාය. මෙම කලබලය ඇසී එහි දිවගිය මුල් ගුරු බිරිය ඇගේ ඇඟේ දුවමින් සිටි කැරපොත්තන් පලවා හැරියාය.

මෙම සිද්ධියෙන් පසු විද්‍යාව ඉගැන්වීමට ඈ නැවත විද්‍යාගාරයට නොගිය අතර පසුදා මෙම සිද්ධිය මුළු පාසල පුරාම පැතිර ගියේය. ගුරු මණ්ඩලයේ සියල්ලෝම ගුණවතී මිස්ගේ විද්‍යා පාඩම ගැන කියමින් විනෝද වූ අතර මේ කැරපොත්තන් ගෙන ආ ජයසේන ඇතුළු එම පන්තියේ සියල්ලන්ටම මෙම සිද්ධිය මහත් සේ විනෝදජනක විය. මේ සිද්ධියෙන් පසු පංතිවල සිසුන්ට සතුන් ගෙන ඒමට ඇය නොපැවරූ අතර කවුරු හෝ සිසුවකු ඇයගෙන් " කැරපොත්තන් ගේන්නදැයි" ඇසුවහොත් ඇය ඉවත බලා යෑම සිරිතක් විය.

ඊළඟ පාසල් නිවාඩුවෙන් පසු ඇය වෙනත් පාසලකට ස්ථාන මාරුවක් ඉල්ලා ගිය අතර විද්‍යාව ඉගැන්වීම සඳහා වෙනත් ගුරු භවතෙක් පාසලට අලුතින් පත්ව ආවේය.

**විශ්‍රාමලත් ආචාර්ය**
**බිංගිරියේ ඩී. එන්. දිසානායක**

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි**

# විස්ස සහ විසුරුවා හැරීම



■ ජයරත්න ගුණමුණි
ලේකම් - එතෙර අපි සංවිධානය - කැනඩා ශාඛාව

විධායක ජනාධිපති ක්‍රමය අහෝසිය ගැන බොහෝ සංවාද ආරම්භ වී ඇත. අවංකව ඒ ගැන අදහස් ඉදිරිපත් කරන අයද වංකව ඒ දෙස බලන අයද වෙති. අවංකව හිතන අය කියන්නේ රටේ ඒකීයභාවයට මින් හානියක් සිදුවන බවය. ඔවුන්ගේ ප්‍රධානතම තර්කය වන්නේ පළාත් සභා පිළිබඳ තීන්දු ගැනීමේ බලය ගිලිහී යන බවය. හැත්තෑ අටේ ව්‍යවස්ථාව අනුව ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ බලය ඇත්තේ, ජනාධිපතිවරයාටය. යම් පළාත් සභාවක් හෝ කිහිපයක් වෙන් වී යාමට උත්සාහ දරන්නේ නම්, එය වැළැක්වීම සඳහා සම්මත වූ වෙනම පනතක් ඇත්තේය. කොටින්ම කියතොත් 13 වැනි සංශෝධනයේ අඩංගු වූ බලය බෙදීමේ යෝජනාවල අවසන් තීරකයා ලෙස ජනාධිපතිවරයා කටයුතු කරන්නේය. විධායක බලතල අහෝසි කිරීමේදී මෙකී බලතලවලට හානියක් වන්නේ නම් රටේ ඒකීයභාවයට තර්ජනයක් එල්ල වේ යැයි සිතිය හැකිය. 20 ගැන අවංකව තර්ක කරන අයගේ ප්‍රධානතම කරුණක් වන්නේ මෙයයි.

ඒ වාගේම වංකව අදහස් ඉදිරිපත් කරන්නෝ මේ ගැන දැන හෝ නොදැන කියන්නන් වාලේ මොනවා හෝ කියති. ඔවුන්ගේ වුවමනාව මෙය ගෙන එන අයට විරුද්ධ වීමයි. එය මූලික පදනම සේ තබාගෙන බොරු තර්ක බොරු කරුණු මතු කරයි. ඉන් බොහෝ ඒවා පදනමක් නැති අවලාද පමණක්මය. 20 වැනි සංශෝධනයේ ඇත්තටම ඇති කරුණු හොඳින් කියවා බලා අදහස් ඉදිරිපත් කරන්නේ නම්, මෙවැනි තත්ත්වයක් මතු වන්නේ නැත. එය දකින්නත් කලින් බිල්ලෝ මවන්නේ දේශපාලන වාසි ගැනීමට හා ඒ තුළින් තමන් පොරවල් වීමටය. එවැනි බොරු කාඩ්බෝඩ් ටාසන්ලා 20 හි ඇත්ත අඩංගුවේ වන කරුණුවලින් මුළුමනින්ම ප්‍රතික්ෂේප වී යයි. කෙසේ වෙතත්, ඒ සංවාදය ආරම්භ වීම 20 ජනතාව අතරට වඩාත් හොඳින් ගෙන යාමට උදවු වී ඇත. ඒ අර්ථයෙන් පක්ෂව හෝ විපක්ෂව කරුණු දැක්වීමෙහි ලා 20 සම්මත කර ගැනීමට කරන උදව්වකි.

ජ.වි.පෙ. විස්තර කරන විදියට අලුත් විසි වැනි සංශෝධනයෙන් සිදු වන්නේ ජනාධිපතිවරයා සතු විධායක බලතල අහෝසි වීමක් පමණි. තවත් බොහෝ බලතල ප්‍රමාණයක් එලෙසම පවතී. එනම්, මූලික වශයෙන් ජනතාවගේ ඡන්දයෙන් පත්වනවා වෙනුවට පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාව පත් කරනු ලබයි. දැනට ඇති ව්‍යවස්ථාවට අනුව රජයේ නායකයා සහ ආණ්ඩුවේ නායකයා යන බලතල දෙකම ඇත්තේ, තනි පුද්ගලයකුටය. 20 සංශෝධනයට අනුව එය වෙනස් වේ. එනම්, රාජ්‍යයේ නායකයා ජනාධිපතිවරයාය. ආණ්ඩුවේ නායකයා අගමැතිවරයාය. ඒ කියන්නේ, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ අගමැතිවරයාය. ජනාධිපති කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකු නොවන්නේය. එහෙත්, ඔහුට හෝ ඇයට කැබිනට් මන්ඩලයට යෝජනා ඉදිරිපත් කිරීමටත්, කැබිනට් යෝජනා, තීන්දු තීරණ දැනගැනීමටත් හැකියාවක් ඇත. සේනාධිනායකයා ලෙස රටේ ආරක්ෂාවට සෘජුව බලපාන හමුදාපතිවරුන් පත් කිරීම ජනාධිපතිවරයාගේ වගකීමය.

13 වැනි සංශෝධනයට අනුව ජනාධිපති සතුව පැවැති කිසිදු බලතලයක් අන් අයකුට පැවරී නැත. ඒ සියල්ල ජනාධිපති සතුව දිගටම පවතී. එනම්, පළාත් ආණ්ඩුකාරවරුන් පත් කිරීම, ඉවත් කිරීම තීරණය කරන්නේ ජනාධිපතිවරයා ය. පළාත් සභාවල යම් ගැටලුවක් මතු වන්නේ නම්, ආණ්ඩුකාරවරුන් හරහා මැදිහත් වීමේ බලය දැනට පවතින ආකාරයෙන් එලෙස ම වන්නේය. පළාත් සභා ක්‍රමය ලංකාවට බලහත්කාරයෙන් පැටවූයේ ඉන්දියාව ය. ඉන්දියාවේ විධායක ජනාධිපතිවරයකු නැත. එහි ජනාධිපතිවරයාට පළාත් ආණ්ඩු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලයක් ඇත. කිසිදු ප්‍රාන්තයක් මේ වන තෙක් බෙදී වෙන් වී නැත. එය වැළැක්වීමේ බලය මධ්‍යම ආණ්ඩුවට ඇත. එහෙ ම බැලුවා ම මේ සිදු කරන වෙනස්කමින් කිසිදු පළාත් සභාවකට අමතර බලයක් ලැබීමක් හෝ අඩු වීමක් සිදු වන්නේ නැත. ඒ පිළිබඳව දැනට ඇති බලතල එලෙසින්ම පවතී.

එය එසේ නම්, අවංකව රටේ ඒකීයභාවය වෙනුවෙන් කතා කරන කිසි කෙනෙකුට බිය වන්නට කිසිදු හේතුවක් නැත. ගෞරවනීය හාමුදුරුවන් වහන්සේලා ඇතුළු ඇත්තට ම රටට ආදරය කරන බොහෝ පිරිස් ඉන්න බව කවුරුත් දන්නා දෙයකි. ඒ හැම දෙනාට ම සතුටු වන්නට පුළුවන් ආකාරයෙන් 20 සංශෝධනය සෑදීම රට පිළිබඳ ප්‍රශ්නයේ දී ඉතා වැදගත් ය. එය බටහිර හා ඉන්දීය වුවමනාවන් පැරදවීමකි. අධිරාජ්‍යවාදී වුවමනාව පරදවමින්, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම ඔවුන්ගේ මැදිහත් වීම්වලට ඉඩ ඇහිරීමකි. ප්‍රජාතන්ත්‍රවාදය ඇත්නම්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ කිසිදු රටකට ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්නට ඉඩක් ලැබෙන්නේ නැත. මානව හිමිකම් රැකීම ගැන කතා කරන්නට ඉඩක් ලැබෙන්නේ නැත. ඒ අර්ථයෙන් ගත් කල මෙය වැදගත් ඉදිරි පියවරකි.

1978 ව්‍යවස්ථාවට අනුව ඊළඟට විශාල බලයක් පැවරී තිබුණේ විවිධ පුද්ගලයන් ප්‍රධාන තනතුරුවලට පත් කිරීමේ දීය. 19 වැනි සංශෝධනයෙන් එය යම් ප්‍රමාණයකට වෙනස් විණි. එහෙත්, තවමත් අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීමේ බලය ඇතුළු යම් යම් බලතල ජනාධිපතිවරයා සතු ය. එය ද 20 න් වෙනස් වී ඇති බව කියැවේ. එයට ජනාධිපතිවරයා විසින් නම් කර එවන ලද පුද්ගලයන් පත් කිරීම වෙනුවට ව්‍යවස්ථා සභාව විසින් ප්‍රධානතම නිලයන් පත් කිරීමට යෝජනා වී ඇත. අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීම කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මඟින් සිදුවන බව කියැවේ. එනම්, ජනාධිපතිවරයා සතුව තිබූ බලතල අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයටත්, ව්‍යවස්ථා සභාවටත්, පාර්ලිමේන්තුවටත් පැවරීම මින් සිදු වේ. එක් පුද්ගලයකු සතුව තිබූ ඒකාධිපති බලය ආයතන කිහිපයකට බෙදී යයි. ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් මෙය ඉතා සාධනීය ඉදිරි පියවරකි.

ජ.වි.පෙ. කියන විදියට 20 ක්‍රියාත්මක වන්නේ වත්මන් ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන් වූ පසුව ය. එනම්, 2020 ජනවාරි 08 දිනෙන් පසුව ය. එසේ නම්, මෛත්‍රී සතු බලය රනිල් මත පැවරීමක් සිදු වන්නේ ද නැත. ඊළඟ ජනාධිපතිවරයා සහ අගමැතිවරයා කවුරුන් ද යන්න කාටවත් කිව නොහැක. එය තීරණය වන්නේ ද අනාගතයේ පත් වන මන්ත්‍රීවරුන් මඟින් ය. මුදලට විකිණෙන්නේ නැති වරදාන, වරප්‍රසාදවලට විකිණෙන්නේ නැති මන්ත්‍රීවරුන් පත් කර ගැනීම ජනතාවගේ පැත්තෙන් ඉටු විය යුතු වගකීමයි.

අද විධායක ජනාධිපතිවරයකු සිටියි. පහුගිය කාලය පුරාවට තුනෙන් දෙකේ බලයක් ද ආණ්ඩුව සතුව තිබිණි. එහෙත්. රටත්, ආණ්ඩුවත් අස්ථාවර විය. මෙ වන විට තුනෙන් දෙකේ බලයක් නැතත්, විධායක බලතල සමඟ බහුතර බලයක් ඇත. එනමුත්, රට අස්ථාවර ය. රාජ්‍යයේ බලය හා ආණ්ඩු බලය යන දෙක ම එක් පුද්ගලයකු සතුව පැවැතීමත්, ආණ්ඩුවේ සංයුතිය එයට හාත්පසින් ම වෙනස් වීමත් සමඟ මේ අස්ථාවරත්වය ඇති වී ඇත. සැබැවින් ම 20 න් සිදු වන්නේ මෙය වෙනස් කර ස්ථාවර තත්ත්වයක් ඇති කිරීම ය. එයට දැනට පවතින අස්ථාවරත්වය වෙනුවට ස්ථාවරත්වයක් ඇති කිරීම ය.

'දෙමළ හා මුස්ලිම් ජනතාව රටේ බහුතරය නොවන බැවින්, ඔවුනට විධායකයෙන් රැකවරණයක් ලැබුණා. එය ඉදිරියේ දී නොලැබී යනවා' යන්න ද මුළුමනින් ම අතාර්කික දෙයකි. රටක ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වන්නට වන්නට එහි වාසිය උපරිමයෙන් ජනතාවට ලැබෙන්නේ ය. එය සිංහල, දෙමළ හෝ මුස්ලිම් ලෙස භේදයක් නැත. සියලු ජනතාවට එහි වාසිය ලැබෙනු ඇත. එබැවින්, මනෝ ගනේෂන්ලා කලබල විය යුතු නැත. ඔහු කලබල වී ඇත්තේ, ඇමතිකම නැති වේවි යන බියෙන් ය. එහෙත්, 2010 මැතිවරණයේ දී මනෝ ගනේෂන් ප්‍රතිපත්තියක් ලෙස විධායක ක්‍රමය අහෝසි කරන්නට එකඟ විය. 2015 මෛත්‍රීට සහාය දුන්නේ ද එය අහෝසි කරන්නට ය. එබැවින්, මෙවර ද ඔහුට විරුද්ධ වන්නට හේතුවක් නැත.

විවිධ අය මෙයට සහාය ලබා දීමේ දී අමතර කෑලි එකතු කරති. එකවර ම කැමැති වන්නට ඇති ලැජ්ජාව නිසා ද විය හැකියි. කෙසේ හෝ මහින්ද මේ වනවිට ප්‍රතිපත්තියක් ලෙස විධායක බලතල අහෝසි කරන්නට එකඟ බව ප්‍රකාශ කර ඇත. දැන් ඇත්තේ, පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතු යැයි කියන කොන්දේසියයි. එය ඒ තරම් බරපතළ ප්‍රශ්නයක් කරගත යුතු නැත. ඒ කොන්දේසිය දාන කොට ම කාටත් ඔහුගේ අරමුණ තේරුම් ගත හැකි ය. කුමන අරමුණින් හෝ එසේ කළ හැකි නම්, අලුත් ම තත්ත්වයකට යා හැකි ය. එහෙත්, ප්‍රශ්නය වන්නේ එයට තුනෙන් දෙකක ඡන්දයක් සොයාග ැනීම ය. මේ පාර්ලිමේන්තුවේ අලුතින් පත් වූ මන්ත්‍රීවරු ගණනාවක් සිටිති. ඒ හැමෝ ම තමන්ගේ පළමු අවුරුදු පහ ගෙවා ගැනීමේ මූලික අරමුණක සිටිති. ඒ තමන්ගේ විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා ය. අවුරුදු පහකට කලින් විසුරුවා හැරියහොත්, එය ලැබෙන්නේ නැත. මහින්දගේ කොන්දේසිය ඉටු කරන්නට ඇති ප්‍රධාන ම බාධාව වන්නේ එයයි. සියලු මන්ත්‍රීවරු තමන්ගේ විශ්‍රාම වැටුප ගැන නොසලකා මේ කොන්දේසියට එකඟ වන්නේ නම්, ප්‍රශ්නයක් නැත. මොක ද? ජනතාවට මේ ආණ්ඩුව තව දුරටත් පවත්වාගෙන යාමේ කිසිදු වුවමනාවක් නැත.

කොහො ම වුණත්, ජ.වි.පෙ. ඉදිරිපත් කළ 20 අවසාන ලියැවිල්ල විය යුතු ද නැත. පාර්ලිමේන්තුවේ ඔවුන් සිටින්නේ හය දෙනෙකි. අනෙක් පක්ෂවලින් ඉතිරි 219 දෙනා සමන්විත වී ඇත. ඒ නිසා ඒ ඒ පක්ෂවල හා පුද්ගලයන්ගේ යෝජනා, අදහස් ද මෙයට එකතු වීම තවත් හොඳ ය. තව තවත් යෝජනා මඟින් මෙය වඩාත් සාධනීය දිශාවකට තල්ලු කර ගැනීම රටට වැදගත් ය. බොරු අවලාද, හුඹස් බිය ඇති කරනවා වෙනුවට සංශෝධන මඟින් මෙය වඩාත් ශක්තිමත් කිරීමට දායක වන්නේ නම්, එය කිසිදු වරදක් ඇති දෙයක් නොවේ ය. මැතිවරණ ක්‍රමය ද වෙනස් කිරීමට අවශ්‍ය යැයි කියන්නේ නම්, එයට ද විවෘත විය යුතු ය. පළාත් පාලන, පළාත් සභා ඡන්ද ක්‍රම වෙනස් වී ඇති තත්ත්වයක් යටතේ පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය ද වෙනස් වන්නේ නම්, එහි වරදක් නැත. එය මේ සමඟ ම කළ යුතු යැයි කෙනෙකු කියන්නේ නම්, එය ඉටු කර ගත හැකි ය. විධායක ක්‍රමයත් සමඟ සමානුපාතික මැතිවරණ ක්‍රමය ගැටගැසී ඇති බව සමහරුන් දිගින් දිගට ම කියූ දෙයකි. කරුණක් ලෙස එය වැරැදි ය. ජේ.ආර්. විධායක ක්‍රමය හඳුන්වා දුන්නාට පසුව ගෙන ආ සංශෝධනයක් මඟින් මැතිවරණ ක්‍රමය වෙනස් කළේය. ඒ දෙක එකවර ගෙන ආ දෙයක් නොවේ ය. කෙසේ වෙතත්, එය එසේ කළ යුතු නම්, ඒ කළ හැකි ය.

දැන් රට ඉල්ලා සිටින්නේ මේ තියෙන තත්ත්වයෙන් ඉදිරියට යා හැකි තවත් අලුත් දෙයක් ය. එක තැන පල් වෙවී රටකට කවදාවත් ඉදිරියට යා නොහැකි ය. විධායක ක්‍රමය අහෝසි කළ පමණින් මුළුමනින් ම රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති වන්නේ ද නැත. එය ඉතා පැහැදිලි ය. එනමුත්, ඒ තුළින් අබමල් රේණුවක තරම් හෝ දෙයක් ලබා ගත හැකි නම්, එය ලබා ගත යුතු ය. ආණ්ඩුවේ සහ රටේ දේශපාලනයේ ඇති වී තිබෙන ව්‍යාකූලත්වය වාසියක් සේ පාවිච්චි කර ගත යුතු ය. හැම දා ම රටට යමක් ලැබුණේ එවැනි අවස්ථාවල පමණක් ය. අනෙක් හැම මොහොතේ දී ම දරදඬු පාලනයක්, ඒකාධිපතිත්වයක් ගොඩනැඟුණේ ය. අද ඇති වී තිබෙන ව්‍යාකූලත්වය හෙට දවසේ යහපත වෙනුවෙන් පාවිච්චි කර ගත යුතු ය. අවසාන විග්‍රහයේ දී මෙහි උපරිම වාසිය ලැබෙන්නේ ජනතාවට ය. ජනතාව එය ලබා ගැනීමට උත්සුක විය යුත්තේ, එබැවින් ය.

"එතෙර අපි" සංවිධානය - කැනඩා ශාඛාව
"அக்கரையில் நாம்" அமைப்பு - கனடா கிளை
"Ethera Api" Organization - Canada Branch

# අස්වනු තහංචි

■ මහින්ද කුමාර දළුපොත

එක කතාවට එක හුවට හේන් කෙටීම වැව් ගම්මාන පිළිවෙතකි. එලෙස වගා කළ හේනේ අස්වනු නෙළන සමයට තහංචි ගණනාවක් පැනවේ. ඒවාද ජනසම්මත තහංචිය. එබැවින් අස්වනු නෙළන සමයේ හේන්කරේට බලපවත්වන මෙම තහංචි ඒ අයුරින්ම අනුගමනය කිරීමට වැව් ගම්මාන ඇත්තන් පෙළඹේ. මෙලෙස අස්වනු නෙළන සමයේ හේන්කරේට බලපවත්වන පළමු තහංචිය වන්නේ නෙළාගත් අස්වැන්න බුක්ති විඳීමේ තහංචියයි.

මේ අනුව නවදැලි හේනකින් හෝ අත්දඬුවා හේනකින් නෙළාගත් මංගල අස්වැන්නෙන් පළමු කොටහා දෙවියන් උදෙසා කැප කළ යුතුය. එතෙක් ගොවියන්ට ඉඳුල් කිරීම තහංචියකි. සිනී කැකිරි, පත්තක්කා, කොමඬු වැනි අමුවෙන් කන ගෙඩි ජාතිවලට මේ තහංචිය වලංගු නොවේ. කුරහං, මෙනේරි, බඩඉරිඟු, මයියොක්කා වැනි ජාති උදෙසා මේ අනුභව තහංචිය වලංගුවේ. ඒ අනුව හේන්කරයෙන් හා හා පූරා කියා අස්වනු නෙළා ගැනීමට සූදානම් වන විට මහ ගමරාල උන්දා නැතිනම් විදානේ උන්දා මෙන්ම ගංකරයේ දැනමුත්තන් එකතු වී අස්වනු නෙළීමට යෝග්‍ය දිනයක් බේරා ගනී. ඒ දිනයට සියලු හේන් ගොවීන් තම තමුන්ගේ අස්වැන්නෙන් ඉතා සාර කොටස නෙළා ගත යුතුයි. පසුව ඒ සියල්ල රැගෙන 'අහස් මුර පූජාවට' සූදානම් වේ. අහස්මුර පූජාව පවත්වන්නේ ගංකරේ සංහිඳ අද්දර හෝ හේන්කරේ තෝරාගත් සංහිඳක් අද්දරය. සියලු ගොවීන් නෙළාගත් සාර අස්වනු ගෙනවිත් ඒවා කෑමට උචිත ලෙස පිළියෙල කෙරේ. මයියොක්කා සහ වෙනත් අල වර්ග ගින්නේ ලා පලහා ගනී. බඩ ඉරිඟු පලහා ගන්නා අවස්ථාද ඇත. නැතිනම් කරල් තම්බා ගනී. එසේ නොවන විටක ඇට ගලවා කිරිබතක් පිළියෙල කෙරේ. කුරහං කරල් වූවද ඇට බේරා එයින් කුරහං තලප හෝ වෙනත් අහරක් පිළියෙල කෙරේ. මෙනේරි කැඳක් පිසීම නැතිනම් මෙනේරි බත් සෑදීම කරයි. මේ අයුරින් හේන්කරේ තෝරාගත් සංහිඳ අද්දර හෝ ගංකරේ සංහිඳේ අලුත් අස්වැන්නෙන් අහර තනා ඒවා දෙවියන් උදෙසා කැප කර සිටී. ඊට ගංකරේ වාද්දිංකාරයන්ද හවුල් කර ගන්නා අතර ගම්බාර, වීරමුණ්ඩ, දැඩිමුණ්ඩ, අයියනායක, පුල්ලෙයාර්, කතරගම දෙවිවරුන් උදෙසා කෝල්මුර කවි ගායනා කරයි. ඒ සමඟම දේව වතාවත් ඉටුකර ඇවරිකනුවල ගොටු තබා දෙවියන්ට අලුත් හේන් බෝග කැපකර සිටී, මෙලෙස අගස්මුර පූජාව සිදුකරන තෙක් හේන්කරයෙන් නෙළාගනු ලබන පලදාව මිනිස් අහරට එනම් ඉඳුල් කිරීමට තහංචි වේ. එය ඉතා බරසාර තහංචියකි. යම් විටක කිරි බඩිංගුරු අවදියේදී ඒවා කෑමට දොළදුක් කාරියන් මනාපය. එවිට පවා දොළදුක් කාරියන්ට කිරිබඩිංගුරු කඩා දෙන්නේ සංහිඳට ගොස් බාර වී කිරිබඩිංගුරුවලින් සංහිඳ පුදා දෙවියන්ගෙන් අවසර ගැනීමෙන් පසුය. එතෙක් ඉඳුල් කිරීම තහංචියකි.

හේන්කරේ අලුත් අස්වැන්නෙන් අගස් මුර පූජාව පවත්වන තෙක්, පලාවර්ග, මෑකරල්, අවර වැනි ව්‍යංජන වර්ග නෙළා ගැනීම තහංචියක් ලෙස නොසැලකේ. එහෙත්, මෑකරල්, අවර, දඹල වැනි බෝග ජාති පවා ගෙවිළිය කඩාගෙන ගොස් පළමුවෙන් ගංගෙදරදී උයා පිහාගත් විට ඒවා අහරට ගැනීමට කලියෙන් පංසලට ගෙන ගොස් බුද්ධ පූජාව ඇරීමට කටයුතු කරයි. පළමු අස්වැන්න බුදුන්ට, දෙවියන්ට, පන්සලට පූජා නොකර අහරට ගැනීම ජනසම්මත තහංචියක් වේ. ඒ නිසාම සංහිඳේ බාරහාර ඔප්පු කළද ගංගෙදරට ගෙනවිත් කුරහං, ඉරිඟු, මුං, කව්පි වැනි දෑ අහරට පිළියෙල කරන විට ඒවායෙන් බුද්ධ පූජාව ඇරීම ගෙවිලියන්ගේ සිරිතකි. එසේ බුද්ධ පූජාවට වෙන් නොකර අහරට ගැනීම ජනසම්මත තහංචියක්ද වේ.

අනෙක් අතට නවදැලිහේන් කොටන විට, මෙලෙස අලුත් අස්වැන්නෙන් කොටස් අගස්මුර පූජාවට වෙන් කෙරේ. පසුව පන්සලට බුද්ධ පූජාව සඳහාද වෙන් වේ. එහෙත් හා හා පුරා කියා හිරගත්ත ගැටවරයන් නවදැලි හේනක් කෙටූ විට එහි අස්වැන්නෙන් කොටස් මෙලෙස කැප කළද ඔවුන්ගේ ප්‍රයෝජනයට ගැනීම තවදුරටත් තහංචිය. මන්ද ඒ නවදැලි හේනක් මුල්වරට කොටා පවුල් වෙච්ච ගැටයන් ලද අලුත් අස්වැන්නෙන් කොටස් තව පිරිසකට කැප කළ යුතුය. එහෙත් ගෙදර ගෙනවිත් උයා පිහා කෑම ජනසම්මත තහංචියකි. එබැවින් ඔවුන් තම හතරපේරුවේ දෙමාපියන් වෙත දැකුම් ගෙන ගොස් දෙයි. තවද වක්කැත්ත ඇල්ලීමට, මුලං කෙටීමට අතපොත් තබා ඊට නිසි ගුරුහරුකම් දුන් දැනමුත්තන් හමු වී ඔවුනටද අලුත් අස්වැන්නෙන් කොටසක් දැකුම් හැටියට පිළිගන්වා සිටී. ඊට පසුව තමතමුන්ට වුවමනා හැටියට අහර පිළියෙල කරගෙන බුක්ති විඳීමට ඉඩ අවසර තිබේ. ඊට හේතු වී ඇත්තේ නවදැලි හේන් කෙටීම ඉතා බාරදූර කටයුත්තක් වීමය. තවද හිරයක් ගෙන පවුලක් වීම නිසා පැවරෙන වගකීම්ද තිබේ.

හේන් බෝගවලට පමණක් නොව කෙතේ බෝගවලටද අලුත් අස්වනු තහංචි බලපවත්වයි. කෙතේ අස්වැන්න නෙළාගනු ලබන්නේ යල - මහ දෙකන්නයටය. එයත් කමත් භූමියේදී සිදුවන්නකි. සිරිත් පිළිවෙත වූයේ කමතේදී අම්බරුවන් ලවා කොළ මඩවා මැඩුවම් වෙන්කර ගැනීමය. ඒ පිළිවෙත් අනුව කෙතේ අස්වැන්න නෙළා ගනී. පසුව මැඩවූවම් ඉවත් කර බැත බේරා ගනී. මෙලෙස බේරාගත් බැත හෙවත් අලුත් අස්වැන්න කමතේදී ගොඩකර තිබේ. ඒ බැතකන්ද කමත් භූමියේ තිබියදී 'අක්යාල' වෙන් කළ යුතුය. අක්යාල යනු දෙවියන් උදෙසා වෙන් කරන කොටසය. කමතේ මුදුන් බතයෙන් ඉහළම තියෙන කොටසින් දෝතට අක්යාල ලබාගෙන ඒවා 'හුණුමල්ල' පුරවා ගනී. එලෙස අක්යාල හුණුමල්ලට වෙන් කරන තුරු කමත් බිමෙන් අලුත් අස්වැන්න පිටතට ගෙන යෑම සිරිත් සම්මත කමත් තහංචියකි. අස්වැන්න කමතෙන් පිටතට ගැනීම පමණක් නොව අක්යාල බේරන තුරු බැතකන්ද 'යාල්ලීම' ද තහංචියකි. බැතකන්ද යාල ලනවා යනු බැත මැනීමට පටන් ගැනීමය. මේ කටයුතු සියල්ල කළ යුත්තේ පිරිමි ඇත්තන් පමණි. ඔවුන් ජන සම්මත කිසිදු කිල්ලකට ගොදුරු නොවී සිටිය යුතුය. ජනසම්මත කිල්ලකට ගොදුරු වූවන්ට අක්යාල ඇල්ලීම පමණක් නොව කමත් භූමියට ඇතුළුවීමද තහංචියකි.

මෙලෙස කමත් බිමේදී බැතකන්දෙන් අක්යාල වෙන්කරගත් විට ඒ අක්යාල පුරවන ලද හුණුමල්ල කමතෙන් පිටතට රැගෙන යා යුතුය. එහිදී ද හුණුමල්ල අඩක් පූරවා තිබීම තහංචියකි. හුණුමල්ලේ කටගාවට පුරවා තිබිය යුතුය. බැතකන්දෙන් හුණුමල්ලට පුරවන විට ඊට පසඟ පිහිටුවා වැඳීම සම්මතයකි. නොවැඳීමෙන් අක්යාල හුණුමල්ලට පිරවීමද තහංචියක් වේ. මේ අයුරින් කමත් වතාවත් සිදුකර පුරවාගත් හුණුමල්ල කමතෙන් පිටතට ගෙන යා යුත්තේ හිස පිට තබාගෙනය. එය ගොවිරාල විසින් සිදුකරන අතර ඔහු සුම්බරයක් බැඳ සිටී. සුම්බරය උඩ අක්යාල හුණුමල්ල තබාගෙන ගොවි ගෙදරට ගෙන ඒම කමත් චාරිත්‍රයකි. ගොවි ගෙදරට ගෙන ආ හුණුමල්ල බිම තැබීමද තහංචියකි. එය උඩකින් තැබිය යුතුය. බොහෝ විට සිදුවන්නේ හුණුමල්ල ගොවි ගෙදර බිස්සේ හත්තිය හෙවත් වහලයේ එල්ලා තැබීමය. මන්ද අක්යාල සහිත හුණුමල්ලට කිසිදු කිල්ලක් නොවැදිය යුතුය. හුණුමල්ලට කිල්ල තහංචියක් වේ. මේ අයුරින් ගංකරයේ ගොවීන් තම තමුන් වගා කළ කුඹුරු කොටස් පාගා ගන්නා විට වෙන වෙනම හුණුමල්ලට අක්යාල වෙන් කරයි.

ඒ සියලු අක්යාල දෙවියන් උදෙසා කැප කරන තෙක් ගංගෙදර තොවිල් පවිල් පැවැත්වීම, තෙල්වළං ලිප තැබීම, පළාපිළිහුඬු ජාති අනුභවයට ගැනීම, ජන සම්මත කිලි ආහාර ගෙට ගැනීම. කොටහලු මඟුල් හෝ කිරිඅම්මා දාන පැවැත්වීම සපුරා තහංචි වේ. දන්දිය හැක්කේ පන්සලට පමණි. ඒත්, ඊටද අලුත් සහල් ගැනීම තහංචියකි. අලුත් සහල් පෑහීම, පිටි කෙටීම, බත් පිසීම තහංචිය. ඒ තහංචි අකාමකා වන්නේ අක්යාල කොටස් සියල්ල ගෙනවිත් සංහිඳේ කිරි උතුරා දෙවියන් උදෙසා බාරහාර ඔප්පු කිරීමෙන් පමණි. මේ සඳහා යෝග්‍ය දිනයක් තෝරා ගැනීම පසුව දෙවියන් උදෙසා වතාවත් කරනු ලබන කපුරාල උන්දැගේ මූලිකත්වයෙන් සංහිඳ අද්දර හෝ ගංකරයේ දේවාලය අද්දර කිරිඉතිරුම් මංගල්ලයක් පවත්වයි. ඊට සහභාගි විය හැක්කේ ජනසම්මත කිල්ලකට ගොදුරු නොවූ පිරිමි ඇත්තන්ට පමණිඩ් ඒ ඒ වැව්ගම්මානවල කිරි ඉතිරුම් මංගල්ල පවත්වන රටාව වෙනස්ය. ඒ හැටියට කිරි ඉතිරීම සිදුකරයි. කිරි උතුරුවා, කිරිබත පිස දෙවියන්ට කැපකර සිටී. ඒ තෝත්‍ර සියල්ල හමාර වූ පසුව පැමිණි පිරිසට කිරිබත් හෙවත් අක්යාලවලින් පිසගත් කිරිබත් ආහාරයට ලබා දෙයි. ඒවායෙන් කොටසක්, කිරිදෙන අම්මාවරුන්ට, ගැබ්බර සිරියාවන්ට, මෙන්ම ගංකරේ බලවතුන් කාටත් ගෙන ගොස් දේ. ඊට පසුව අලුත් බත් අහරට ගැනීම හෙවත් ඉඳුල් කිරීමට මෙතෙක් පැණ වී තිබුණු ජනසම්මත තහංචි සියල්ල අහෝසි වේ. ඒ නමුත් හා හා පුරා කියා ගංගෙවල්වලදී වී කොටා අලුත් බත් පිසගත් විට ඒවායෙන් කොටහක් පන්සලට ගෙන ගොස් බුද්ධ පූජාව ඇරීම හා පංසලේ හාමුදුරුවන්ට කැප කර සිටී. ඊට පසුව ගංගෙවල ඇත්තන් කාටත් බිය සැක නැතිව අලුත් බත් කෑමට තහංචියක් නොවේ.

# මහනුවර දෙවැනි රාජසිංහ රජු විනෝදයට ඇති කළ සත්තු

■ එස්. කේ. ජයවර්ධන

මහනුවර රජ කළ දෙවැනි රාජසිංහ රජු (1636 - 1687) විනෝදකාමියෙකි. සත්වලෝලියෙකි. රාජසිංහ රජු යටතේ අවුරුදු දහඅටක් උඩරට සිරකරුවකුව සිට ලංකාවෙන් පලා ගොස් ලංකාව ගැන පොතක් ලිවූ රොබට් නොක්ස්ට අනුව රජුට සත්ව උද්‍යානයක් විය.

රජුගේ සත්තු වත්තේ ඉතා දුර්ලභ කළු කොටියෙක්, කිරිපාට සුදු මූවෙක් (දැනට ලංකාවෙන් වඳ වී ගොස් ඇති), ගවරෙක් හා ඇත් රංචු විය. ගවරා දැනට ලංකාවේ කැළෑවල සිටින කුළු මී හරකා වැනි එයට වඩා ශක්තිමත් පිට දිගට නහරයක් දිවගිය ඉතා දිගු දිවක් ඇති සතෙකු විය. (1800 පමණ පසු ගවරා ලංකාවෙන් වඳ විය.)

රජු හීලෑ අලි ඇතුන් යොදා දිය බීමට එන වනගත අලින් කොටු කරවා සුදුසු උන් අල්ලාගෙන හීලෑ කරයි. හීලෑ ඇතින්නක් යොදවා කැළෑවේ වල් අලින් රවටා නගරයට ගෙන ඒමට තරම් රජු සතු හීලෑ ඇතින්නියන් කපට විය. මිනිසුන් මැරීමට ඇතුන් යොදවන විට උන්ගේ දළවලට කොපු දමන ලදී. රජුට හීලෑ ඇතුන් සිය ගණනකි. ඔහු ඇත් ක්‍රීඩා නැරඹීම ප්‍රිය කළේය.

රජු විනෝදයට හඟුරන්කෙත මඟුල් මඩුව අවට පොකුණ වටා අශ්වයන් දුවවයි. දිවූ අසරුවන්ට සිලිම් දහයක් පහළොවක් තෑගි දෙයි. රජු ළඟ පර්සියානු අශ්වයන් දහයක් පහළොවක් විය. රජුගේ පොකුණ තුළ සුරතල් මාළුන් ඇත. රජුගේ අතින් කෑම කෑමට තරම් මේ මාළු හීලෑ වී ඇත. මහනුවර වැවේ (මෙය දැනට ගොඩ කර ඇති පැරණි බෝග ම්බර වැවයි) රජු දැවැන්ත කිඹුලන් දෙදෙනකු ඇති කරයි. ඒ සුරතලයට මෙන්ම ආරක්ෂාව සඳහාය.

රොබට් නොක්ස්ගේ විස්තර අනුව දෙවැනි රාජසිංහ රජු සත්වලෝලියෙකි. විදේශීය වාර්තා අනුව රාත්‍රි කල මුරට ඇතුන් යොදවා තිබිණි. උන්ගෙන් බේරී කිසිවෙකුට නගරයට ඇතුළු වීමට බැරි විය.

ලංකාව ගැන ග්‍රන්ථයක් ලියූ ඕලන්ද ජාතික බලදියෙස්ගේ ලංකා විස්තරය අනුව ඕලන්දවරුන් දෙවෙනි රාජසිංහ රජුට තෑගි ලෙස පර්සියානු අශ්වයන්, පර්සියානු බැටළුවන්, දඩ බල්ලන් එවා ඇත.

රජු ඉලක්කයට වෙඩි තැබීමට, දුන්නෙන් වෙඩි තැබීමට, අසුන් මෙහෙයවීමට ඉතා දක්ෂ විය. චූල වංශය අනුව මහවැලි ගඟේ පටුම ගැඹුරුම ප්‍රපාතය වූ රන්ටැඹේ කපොල්ල (දැනට මෙය රන්ටැඹේ ජලාශයට යට වී ඇත) හරහා අසු පිටින් පනියි. 'පවන' නමැති ප්‍රශස්ති කාව්‍යයට අනුව රජු දෙල්තොටදී ඇතෙකු දණ ගැස්වීය. දෙවැනි රාජාවලියට අනුව රජු දෙමළ හත්පත්තුවේ මිනීමරු ඇතෙකු හා මඩකලපුවේ සිටි මිනීමරු ඇතෙකු සමඟ සටන් කොට මරා දමා ඇත.

# දස්කොන් - ප්‍රමිලා...

45 වන පිටුවෙන්

සංහාරයේ ප්‍රතිඵල වෙයි. 'මන්දාරම්පුර පුවතේ' ඒ ගැන විස්තර තිබේ. මේ කුමන්ත්‍රණ හා අකටයුතුකම් සම්බන්ධයෙන් සිංහල ප්‍රභූන්ගේ උදහස දස්කොන් අදිකාරම් කෙරෙහිද එල්ල වුණි. එහෙත් ඔහුට ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදුවූයේ වෙනත් කරුණක් මුල් කරගෙනය. ඔහුට එරෙහිව කටයුතු කරන්නට විමසිල්ලෙන් සිටි පිරිසක් විසින් දස්කොන් ප්‍රමිලා බිසව සමඟ ඇති කරගෙන තිබූ අනියම් පෙම් සබඳකම රජුට දැනෙන්නට උපක්‍රම කරන ලදැයි සිතිය හැක. ඇය වෙනුවෙන් සෑදූ බිලි රූපයේ රහස් තැන්වල ලප තබා තමන්ගේ අසම්මත ප්‍රේමය එළිදරව් කරගන්නට තරම් දස්කොන් අදිකාරම් මෝඩයෙක් නොවේ. දස්කොන්ගේ විරුද්ධවාදී පිරිස ඔහුගේ දුබල තැන් හඳුනාගෙන රජුට කොටුකර දුන් බව පැහැදිලිය. එය දස්කොන්ට එරෙහි කුමන්ත්‍රණයකි.

සිරගත වී සිටි දස්කොන් තම වරද ගැන පාපොච්චාරණය කරමින් 'නෝක්කඩු මාලය' නමින් කවි පොතක් ලීවත්, එය රජු අතට පත්වීම වැළැක්වීමට ලෙව්කේ බණ්ඩාර කටයුතු කර ඇත. කුමන්ත්‍රණය පිළිබඳ දස්කොන් චෝදනා කරන්නේද ඔහුටය. ලංකා ඉතිහාසයේ විශාල පෙරළියක් කළ දස්කොන් අදිකාරම්ගේ එළිදරව් විය යුතු සැබෑ කතන්දරය යටපත් වී ප්‍රේම වෘතාන්තය පමණක් සමාජය තුළ ප්‍රචලිතව පවතියි.




















**ප්‍රවීණ ලේඛක චන්ද්‍රරත්න බණ්ඩාරයන්ගේ නවතම කෘතීන් වන 'ඊළඟට තනාගත් ලෝකය' කෙටි කතා සංග්‍රහය සහ 'පිංකම්පොළ' කාව්‍ය සංග්‍රහය ටොරොන්ටෝ පාඨකයන් වෙත පිළිගැන්වීමේ උළෙල පසුගියදා පැවැත්වුණි. එහිදී ප්‍රධාන ආරාධිතයා ලෙස ආචාර්ය ජයලත් මනෝරත්න සහභාගි වූ අතර ඔහු විසින් මෙම කෘතීන් පිළිබඳව අගනා දේශනයක්ද පවත්වන්නට යෙදුණි.**

"වෙන පාටක් තෝරාගන්න කැමතිම පාට විදිහට... නැත්තං මේ ජීවිතේ ලේ විලක් වෙයි කියලා සැක හිතෙනවා. පොරොන්දම්වත් නොබලපු එකේ ඔන්න ඔහේ ලා නිල් පාට තෝරා ගන්න. ඒක මං කැමතිම පාටක් නේ. එතකොට වර්ණ ගැලපීමවත් හරිනෙ"

අපි එක්වෙන කාලෙ එෆ්.බී, ට්විටර්, ඊමේල් එච්චර නෑ. ඒ නිසා කාට කාටත් තිබුණෙ වෙනස් ජීවිත. පක්ෂ ටික තමන්ගෙ පාක්ෂිකයො ටික හසුරුවා ගත්තා. කලාකාරයො වෙනමයි. ප්‍රේමවන්තයො වෙනමයි.

හඬ නගා හිනාවෙන්න ඕනෑ නම් අපි කොළඹින් පිට ගියා. බත්තලංගුංඩුවට... දඹුල්ලට.... කල්පිටියට.... අම්පාරට.... නුවරට ඔය ආදි වශයෙන්. එහෙමත් නැත්තං කාමරේට ගාල් වෙලා විහිළු චිත්‍රපටි ටෙලි නාට්‍ය බැලුවා. ලංකාවේ කන්දක් උඩ ඉඩෝරයටවත් කොල නොහැලෙන නොමැලවෙන මහලු වෙන්නෙ නැති රතු පාට කිරි එන ගහක් තියෙන වගක් අපිට ආරංචි වුණා. එතන හුඟක් හාස්කම් තියෙනවලු.........

**උපුටා ගැනීම 'ඊළඟට තනාගත් ලෝකය' කෙටි කතා සංග්‍රහයෙහි එන 'කල්-අකල් වැහිවලට තෙමුණු තුන් දෙනෙක්' කෙටිකතාවෙන්**

## මූකලාන

හෙමින් හෙමින්
කාන්තාරයක් වෙමින් තිබ්බ
හත්මුතු පරම්පරාවකට
පරවේණි වෙච්චි ඉඩම උඩින්
ඇවිදින කොට
පතිඟි කැලෑව ළඟ හති අරින තලගොයෙක්

කැලැන්ඩරේ ඉල් මාසෙට
ටක්කෙටම වහින කාලේ
මේ ඉඩමට නඩු පටන් ගත්තෙ
ඒ නඩුව වීසි වෙවී ඇසි ඇසී තියෙද්දී
කැපුණු හූනියන්
තිබ්බ පෙරේත කොටු
කතාවුණ එක එකා කන කැවුතු
බැලූ අංජනම්....
ගඳ ද සුවඳ ද නොදන්නා පුළුටු පස් වර්ග

**'පිංකම්පොළ' කාව්‍ය සංග්‍රහයෙනි.**




## ජාති ආලය...

43 වන පිටුවෙන්

මුත් එළියට පැමිණි වහාම ඉක්මනින්ම ගෙදර යා යුතු යැයි සිතිවිල්ල ඇති වුණි. ගෙදර මොනව වෙලාද කියල දෙයියො තමයි දන්නෙ. දිනපතා ඔහු ගෙදර යන පාර දුර වැඩි යැයි ඔහුට සිතුණි. අවුල් වූ හිතට දැනුණේ දිනපතා යන පාරෙන් යෑමට පැය ගණනාවක් ගත වේ යනුවෙනි. හොඳම සහ කෙටිම පාර කන්තෝරුව ඉදිරිපසින් ඇති පටු අඩිපාර දිගේ ගෙදර යාමය. සමහර දිනවල ඉක්මනින් ගෙදර යාමට අවශ්‍ය වූ අවස්ථාවලදිත් ඔහු මෙම පාර දිගේ ගෙදර යන මුත් දිනපතා එම පාරේ යාමට ඔහු එතරම් කැමැත්තක් නැත. පාර පටු වීමත් දෙපැත්තේම කුණු කාණු තිබීමත් සහ දඩාවතේ යන බල්ලන් බහුල වීමත් නිසා ඔහු එම පාර දිගේ යාමට වැඩි කැමැත්තක් නැත. වෙලාව බැලූ ඔහු කළුවරේම පටු පාර දිගේ ඉදිරියට ඇදුණේය.

ඔහුට යා හැකි වූයේ ටික දුරකි. කළුවරේම ඉදිරියෙන් ආ බයිසිකල් කරුවෙක් ඔහු ඉදිරියේ නැවතුණි. එකිනෙකාට ඉඩ දී පාරේ මොන පැත්තට අයින් විය යුතුදැයි දෙදෙනාටම එක්වර තීරණය කළ නොහැකි විය. එක් වතාවක් දෙදෙනාම පාරේ දකුණු පැත්තට අයින් විය. නැවතත් දෙදෙනාම පාරේ වම් පැත්තට අයින් විය. කොයි පැත්තට අයින් විය යුතුදැයි සිතමින් දෙදෙනාම එහාට මෙහාට වෙද්දී බයිසිකලයේ පැඩලයෙන් කකුල ලිස්සා ගිය බයිසිකල්කරු ඔහුවත් පෙරළාගෙන බිම වැටුණි. දෙදෙනාම පාරේ දූවිලි ගොඩ මතය. ඔහුගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියේය.

"බයිසිකල් පදිනව නම් පරිස්සමින් පදින්න බැරි ඇයි?" ඔහු බයිසිකල්කරුට බැන වැදුණේය.

"ඇස් පේන්නෙ නැද්ද? බයිසිකල් එකක් එනව දැක්කෙ නැද්ද?" නැගිටගත් බයිසිකල්කරුද කෑගැසීය.

"කෝ බයිසිකලේ ලයිට්?"

"මගේ ගෙවල් පැත්තෙ මගෙන් ලයිට් අහන්න උඹ කවුද?" එසේ කිවූ බයිසිකල්කරුවා ඔහුගේ කම්මුලට ගැසීය.

තරහගිය ඔහු බයිසිකල්කරුගේ බඩට ගැසීය. වටින් පිටින් සෙනඟ පිරෙන්නට විය.

"මූ අපේ පැත්තෙදිම අපේ එකෙකුට ගැහුවා. මුන්ට කොහොමද එහෙම හයියක්. මූට පාඩමක් උගන්වන්න ඕන. අපි භයවෙයි කියලද උඹල හිතන් ඉන්නෙ." පිරිස අතරින් කෙනෙක් කෑ ගැසීය. පිරිසගේ ශබ්ද වැඩිවන්නට විය. කේන්තියෙන් කෑගැසීම් උග්‍ර වන්නට විය. ඔහුගේ කන් බීරි වන තරමටම කෑගැසීම්ය. කෙනෙක් ඔහුට පොල්ලකින් පහර දුන්නේය. ඒ සමගම තවකෙක් මිට මොලවා ඇන්නේය. පිහියක් දිලිසෙනවා ඔහුට පෙනුණි. තමාගේ අවසානය ළඟා වී ඇති බව ඔහුට දැනුණි. තවතවත් කණ්ඩායම් පැමිනෙනවා ඔහුට පෙනුණි. එකිනෙකා අතර වු බැඳීම් සහ සබඳතාවල වැදගත්කම ගැන රැස්ව සිටි පිරිසට කියාදීමටත් මෙය වහාම නැවත්විය යුතු බව කීමටත් ඔහු උත්සාහ කළේය. එහෙත් ඔහුගෙන් කිසිම වචනයක් පිට නොවුණි. සැමපැත්තෙන්ම ඔහුව හිරවී ඇත. තවදුරටත් ඇතිවන තත්ත්වය දරාසිටීමට නොහැක. රැස්ව සිටි සියලුදෙනාම තමතමන්ගේ ශක්තිය ඔහු වෙත මුදා හරියි. ඔහුගේ ශරීරයේ කෑළි සමහරු ඉරා ගන්නවාක් මෙන් ඔහුට දැනුණි. ඔහුගේ දෑස් නොපෙනීගෙන යයි. ගත සැහැල්ලු වෙනවා සේ ඔහුට දැනේ.

"මෙතන සිදුවුණු කිසිම දෙයක් මම මගේ මාමාට කියන්නෙ නෑ. මේ කලබල පටන් ගත්තෙ මම නිසා කියනවට මම කැමති නෑ. නගරය විනාශ වෙන්න දෙන්න බෑ. කලබල ඇතිවෙන කිසිම දෙයක් මම කියන්නෙ නෑ. කලබල ඇති කරන ගිනිදල්වන බොත්තම ඔබන්න හේතුවන කිසිවක් මම කියන්නෙ නෑ. එහෙම වුණොත් ඔබ මම අපි ඔක්කොම විනාශ වෙනවා. කිසිම කෙනෙකුට වාසියක් වෙන්නෙ නෑ. ඔබේ ජාතිය මගේ ජාතිය කියල දෙයක් නෑ. අපි හැමෝම මේ රටේ. මම මගේ බිරිඳ සහ ළමයි, ඔබ ඔබේ බිරිඳ සහ ඔබේ ළමයි. අපි එකිනෙකාගේ බෙලි කපාගන්න දෙන්න එපා. කවුරු කාගේ බෙල්ල කපනවද කියල වැඩක් නෑ. හැමදෙනාම මට එකයි. අපි මේක කරන්න හොඳ නෑ. මම මාමාට කියන්නම් මාව කන්තෝරුවෙ පඩි පෙළෙන් වැටුනයි කියල. ඔහු කවදාවත් දැනගන්න එකක් නෑ ඇත්තට සිදුවුණේ මොකක්ද කියල. මම නිසා මාමා කලබල පටන් ගන්න බොත්තම එබිය යුතු නෑ" ඔහු තමාට පහරදෙමින් ළඟම සිටි කෙනෙකුට කෙඳිරි ගෑවේය.

එහෙත් ඒ වනවිට බොත්තම එබී සියල්ල ආරම්භ වී තිබුණි. අඩිපාරේ සිදුවූ සිද්ධිය පැය කිහිපයක් ඇතුළත නගරය පුරාම දැනුවත් විය. ඔහුගේ මාමා සහ අනෙකුත් මාමාලා වැඩ අරඹා තිබුණි. එයින් ඇතිවුණු තත්ත්වය මෙහි විස්තර කළ යුතු නැත. ඔහුට නැවතත් කතා කිරීමට හැකි වුණොත් ඔහු නගරය බේරාගැනීම සඳහා ඔහුට සිදුවූ දෙය සඟවා බොරුවක් කියනු ඇත.

නමුත් එය එසේ සිදු නොවීය. කුණු කාණුවක තිබූ ඔහුගේ මිණිය පසුදින පොලිසිය විසින් සොයාගන්නා ලදී. හඳුනාගැනීමට අපහසු වූ ඔහුව හඳුනාගනු ලැබුවේ කමිස සාක්කුවේ තිබූ භූමිතෙල් සලාක කූපනයෙනි.




# 'පුනරාවතරණය' දොරට වැඩුම

'පුනරාවතරණය' කෘතියේ ආරම්භක පිටු අතර 'ඇවිද්ද පය දහස් වටී' ලෙසින් සඳහන් කළ අලංකාර පිටුවක් වේ. එහි අරුතට අනුව යමින් 'පුනරාවතරණය' ඔබව සෞදි ආරාබිය වැනි බටහිර ආසියානු කලාපයේ රටවල් වෙතත් ඉන්දියාව, නේපාලය වැනි දකුණු ආසියානු කලාපයේ රටවල් වෙතත්, චීනය වැනි නැගෙනහිර ආසියානු කලාපයේ රටවල් වෙතත් ඇවිද්දවනු යනු ඇත.

ආනන්ද විජේසිංහ මහතා විසින් රචිත මෙම අගනා කෘතිය පසුගියදා ටොරොන්ටෝ මහා විහාරස්ථානයේදී දොරට වඩිනු ලැබුණි. ටොරොන්ටෝ මහා විහාරාධිපති පූජ්‍ය අහංගම රතනසිරි නායක ස්වාමීන්වහන්සේ ප්‍රධාන ස්වාමීන්වහන්සේලාද ටොරොන්ටෝවේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් ජවුහාර් මහතාද සහභාගි වූ මෙම උත්සවයට විශාල පිරිසක් සහභාගි වී සිටි ආකාරය දක්නට ලැබුණි.

ආනන්ද විජේසිංහ මහතා 'පුනරාවතරණය' කෘතිය ටොරොන්ටෝ මහා විහාරස්ථානයේදී එළි දැක්වීමෙන් මූලික කරුණු දෙකක් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වී ඇති අතර එම කරුණු දෙකම ඉතාමත් සාර්ථකව ඉටු වූ බව විජේසිංහ මහතාගේ දෙටු දියණිය තුෂාරි ලොකුගේ මහත්මිය අප වෙත පැවසීය. පුනරාවතරණය රචනා කොට බලවත් වෙහෙසක් දරා එය පාඨකයන් වෙත ලබාදීමේ මූලික බලාපොරොත්තුව සිතූ ලෙසම සාර්ථකව ඉටුවන ගමන්ම තම පියාගේ මහත් වූ ප්‍රාර්ථනා අතර තිබූ ඉතාමත් අගනා පුණ්‍යකර්මයක්ද ඉටුකර ගැනීමට හැකි වූ බව ඇය පැවසීය. මෙම කෘතිය දොරට වැඩීමේ පෙර දැනුම්දීම්වල සඳහන් කළ පරිදිම එදින 'පුනරාවතරණය' කෘතිය අලෙවි කිරීමෙන් ලබා ගත් සියලුම මුදල් 'ටොරොන්ටෝ මහා විහාර සංඝාවාසය හා දහම්පාසල් ගොඩනැගිලි අරමුදලට' පරිත්‍යාග කිරීමට හැකි වීම ආනන්ද විජේසිංහ මහතාගේ සිත තුළට ගෙන දී ඇත්තේ අප්‍රමාණ සතුටකි.

ආනන්ද විජේසිංහ මහතාණනි, මෙවැනි හරවත්, රසවත් වටිනාකමකින් යුත් කෘතීන් රචනා කිරීමට තව තවත් ශක්තිය හා ධෛර්යයත්, නිරෝගීභාවයත්, චිර ජීවනයත් සැලසේවායි දසත අපි සුභාෂිංශන කර සිටිමු.



























# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial Real Estate

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**5% DOWN ? No problem!**

I will guide you through obtaining your DREAM HOME through my proven system!

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX 100% Club Award

2016, 2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award

2015, 2012

The Diamond Realty Inc Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

RE/MAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

**Call me Today !**

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

# Gamini Abeysinghe. ABR, CNE

**Real Estate Sales Representative**

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

**Mobile : 416 822 2789**

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements

# KATPAKAM GROCERY

**TEL: 905 785 0444**

MASOOR DHAL
URID DHAL
URID DHAL

MD CORDIAL
CONDENSED MILK
JAM
NESTOMALT

EASTERN - DOSA PODI, PUTTU PODI, IDLY PODI, IDIYAPPAM PODI, APPAM P

PAPADAM
MALDIV CHIP
SESAME OIL
GREEN JACK TIN

FROZEN COCONUT
FROZ ROTI 30PC



TUSK BASMATI RICE
URITHIRA RED RAW RICE



MORE SPECIALS IN THE STORE

THANK YOU FOR A SUCCESSFUL SIX YEARS OF BUSINESS!




**6970 Lisgar Drive, Unit B1, Mississauga, L5N 8C8**

Derry/ 9th Line(Behind 7 Eleven Gas Station) **TEL: 905 785 0444**

---

දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

# වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Gamini - 416 822 2789**

---

# ඔබේ නිවසටම දසත Dasatha

**සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.**

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

**www.dasatha.com**